**327 වන කාණ්ඩය - 03 වන කලාපය**
**தொகுதி 327 - இல. 03**
**Volume 327 - No. 03**

**2026 ජුනි 11වන බ්‍රහස්පතින්දා**
**2026 யூன் 11, வியாழக்கிழமை**
**Thursday, 11th June, 2026**

# පාර්ලිමේන්තු විවාද

**(හැන්සාඩ්)**

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 429-472]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
උසස් අධිකරණවල විනිසුරුවරුන්ගේ විශ්‍රාම යාමේ වයස [තීරුව 473]

මහජන සෞඛ්‍යයට දුම්කොළවලින් වන බලපෑම සහ නීති විරෝධී දුම්කොළ වෙළෙඳාම හේතුවෙන් රජයේ ආදායම අහිමි වීම [තීරුව 478]

**වඩමාරච්චි මුහුදේදී ධීවරයින් අතුරුදහන් වීම:**
ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 480]

**දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව:**
කාලය දීර්ඝ කිරීම [තීරුව 484]

**සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 486-528]

**සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනත:**
නියමය [තීරුව 528]

**කල්තැබීමේ යෝජනාව:**
රටේ වත්මන් ආර්ථික තත්ත්වය [තීරු 529-610]

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 429-472]

**தனி அறிவித்தல் மூல வினா:**
மேனிலை நீதிமன்ற நீதிபதிகளின் ஓய்வுபெறும் வயது [ப: 473]

பொது மக்களின் சுகாதாரத்துக்கு புகையிலையால் ஏற்படும் பாதிப்பும் சட்டவிரோத புகையிலை வர்த்தகத்தால் அரச வருவாய் இழப்பும் [ப: 478]

**வடமராட்சி கடற்பரப்பில் மீனவர்கள் காணாமற்போனமை:**
கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரினது கூற்று [ப: 480]

**தித்வா புயலை எதிர்கொள்வதற்காக முன்னாயத்தத்துடன் இருக்கவில்லை என்பது தொடர்பில் முழுமையாக ஆராய்ந்து அறிக்கையிடுவதற்கும், அது தொடர்பிலான முன்மொழிவுகளையும் விதப்புரைகளையும் பாராளுமன்றத்துக்குச் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு:**
கால நீடிப்பு [ப: 484]

**மத்தியஸ்தம் (குடியியல் மற்றும் வர்த்தகப் பிணக்குகள்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 486-528]

**குற்றவியல் கருமங்களில் பரஸ்பர உதவியளித்தல் சட்டம்:**
கட்டளை [ப: 528]

**ஒத்திவைப்புப் பிரேரணை:**
நாட்டின் தற்போதைய பொருளாதார நிலைமை [ப: 529-610]

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Cols. 429-472]

QUESTION BY PRIVATE NOTICE:
Retirement Age of Judges of Superior Courts [Col. 473]

Impact of Tobacco on Public Health and Loss of Government Revenue Due to Illicit Tobacco Trade [Col. 478]

DISAPPEARANCE OF FISHERMEN AT VADAMARACHCHI SEA:
Statement by Minister of Fisheries, Aquatic and Ocean Resources [Col. 480]

SELECT COMMITTEE TO CONDUCT A COMPREHENSIVE STUDY ON THE LACK OF PREPAREDNESS TO FACE CYCLONE DITWAH AND REPORT TO PARLIAMENT AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD
Extension of Time [Col. 484]

MEDIATION (CIVIL AND COMMERCIAL DISPUTES) BILL:
Read a Second, and the Third time, and passed [Cols. 486-528]

MUTUAL ASSISTANCE IN CRIMINAL MATTERS ACT:
Order [Col. 528]

ADJOURNMENT MOTION:
Current Economic Situation of the Country [Cols. 529-610]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 ජුනි 11වන බ්‍රහස්පතින්දා***
*2026 யூன் 11, வியாழக்கிழமை*
*Thursday, 11th June, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2023 වර්ෂය සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මහා භාරකාර දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) නිට්ටඹුව, රන්පොකුණුගම, දෙවන අදියර, එෆ්-173 යන ලිපිනයෙහි පදිංචි එච්.එච්.ඩබ්ලිව්. හග්ගල්ල මහතාගෙන් ලැබුණු පෙත්සම;
(2) හෝමාගම, වලව්වත්ත, අංක 29/46 යන ලිපිනයෙහි පදිංචි අයි.ඒ. සුනිල් ඉන්ද්‍රපාල මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ
(3) කිරිදිවැල, වල්ගම්මුල්ල පාර, අංක 28/3/7 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඩී.එන්.ජී. කුමාරසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු කථානායකතුමනි, මහනුවර, මහයියාව, පිටකන්ද පාර, අංක 51 යන ලිපිනයෙහි පදිංචි එස්.කේ. මාපලගම මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු කථානායකතුමනි, පොල්ගස්ඕවිට, සියඹලාගොඩ, අංක 91/2 යන ලිපිනයෙහි පදිංචි ඒ.පී.ජී. සමන් ලක්ෂාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

Hon. Speaker, I present a petition from Mr. M. Anwer Sathath of Hajiyar Road, Pottuvil 07.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -122/202- (2), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 2 -209/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය: නීතිපති දෙපාර්තමේන්තුවේ පළාත් කාර්යාල පිහිටුවීම
### “வளமான நாடு - அழகான வாழ்க்கை” கொள்கைப் பிரகடனம்: சட்டத்துறை தலைமையதிபதி திணைக்களத்தின் மாகாண அலுவலகங்களை நிறுவுதல்
### "A THRIVING NATION - A BEAUTIFUL LIFE" MANIFESTO: ESTABLISH PROVINCIAL OFFICES OF ATTORNEY GENERAL'S DEPARTMENT

231/2024

**3. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙක් යටතේ නීතිපති දෙපාර්තමේන්තුවේ පළාත්බද කාර්යාල ස්ථාපිත කිරීමට "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය මඟින් පොරොන්දු වී තිබේද;

(ii) එසේ නම්, මේ වනවිට එක් එක් පළාතේ පළාත්බද නීතිපති දෙපාර්තමේන්තු කාර්යාල සඳහා අනුයුක්ත කර ඇති සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නීතිපති දෙපාර්තමේන්තුවේ පළාත්බද කාර්යාල ස්ථාපිත කිරීම සඳහා මේ වනවිට ආයෝජනය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிரேஷ்ட மேலதிக மன்றாடியார் தலைமை அதிபதியின்கீழ், சட்டத்துறை தலைமையதிபதி திணைக்களத்தின் மாகாண அலுவலகங்களை நிறுவுவதற்காக “வளமான நாடு - அழகான வாழ்க்கை” கொள்கைப் பிரகடனத்தில் வாக்குறுதி அளிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின், இன்றளவில் சட்டத்துறை தலைமையதிபதி திணைக்களத்தின் மாகாண அலுவலகம் ஒவ்வொன்றுக்குமென இணைக்கப்பட்டுள்ள பணியாளர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) சட்டத்துறை தலைமையதிபதி திணைக்களத்தின் மாகாண அலுவலகங்களை நிறுவுவதற்காக இதுவரையில் முதலீடு செய்யப்பட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) whether it has been pledged through the manifesto titled "A Thriving Nation - A Beautiful Life" that provincial offices of the Attorney-General's Department will be established under a Senior Additional Solicitor General;

(ii) if so, the number of employees who have been attached to each provincial office of the Attorney-General's Department at present; and

(iii) the amount of money that has been invested so far in establishing provincial offices of the Attorney-General's Department?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

අධිකරණ පද්ධති තුළ සිදු වන ප්‍රමාදයන් වැළැක්වීමේ යාන්ත්‍රණයක් ලෙස අධිකරණ පද්ධතියට වඩා නවුවක් ගොනු කිරීමේදී ඇති වන තාක්ෂණික ප්‍රමාදයන් වැළැක්වීමේ යාන්ත්‍රණයක් ලෙස ප්‍රධාන වශයෙන් අපි රජයේ ප්‍රධාන අභිචෝදක කාර්යාලයක් ස්ථාපිත කර ගැනීම සහ ඒ හා සමගාමීව පළාත්බදව උපකාර්යාල පිහිටුවීම සඳහා තමයි සාකච්ඡාව තිබෙන්නේ. කෙසේ වෙතත් මේ සම්බන්ධව "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය මඟින් යෝජනා කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුවත්, අභිචෝදක කාර්යාලයත් වෙන් වෙන් වශයෙන් ස්ථාපිත කිරීමෙන් පසුව තමයි ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙක් යටතේ නීතිපති දෙපාර්තමේන්තුවේ පළාත්බද කාර්යාල ස්ථාපිත කිරීමට ප්‍රතිපත්තිමය දැක්ම සකස් කොට තිබෙන්නේ. ඒ අනුව අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ලියා තිබෙන දේවල් සහ ඒවායේ මූලික අවශ්‍යතා හඳුනා ගනිමින්, prioritize කරමින් තමයි යන්නේ. මම පසුගිය අවස්ථාවේදීත් ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාට පිළිතුරු දුන්නා, අභිචෝදක කාර්යාලය පිහිටුවීම සහ එම අභිචෝදකවරයෙකුට ලැබෙන්නා වූ බලතල මොනවාද, නීතිපතිවරයා ළඟ තබා ගන්නා බලතල මොනවාද යන කරුණු මේ වනකොටත් එම කමිටුව සාකච්ඡා කරමින්

ඉන්නවාය කියලා. එම කමිටු සාකච්ඡාවෙන් පසු අභිචෝදක කාර්යාලය ස්ථාපිත කිරීමෙන් අනතුරුව ඒ හා සමගාමීව තමයි මෙම අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙක් පත් කිරීම පළාත්බදව කරන්න සාකච්ඡාව ආරම්භ කරන්නේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතුවල ප්‍රමාදය පිළිබඳව විශාල මැසිවිල්ලක් තිබෙනවා. විශේෂයෙන්ම ළමා අපචාර නඩු, ඒ වාගේම මත්ද්‍රව්‍ය සම්බන්ධ නඩු පිළිබඳව ඉතා බරපතළ ප්‍රමාදයක් තිබෙනවා. රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්තා ලැබීම වසරකට වඩා ප්‍රමාද වීම නිසා මේ තත්ත්වය තවත් බරපතළ වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම ඉතා වැදගත්. ඒක රජය එකඟ වුණු ප්‍රතිපත්තියක්. නමුත්, ඒක තවම ක්‍රියාත්මක නොවීම කනගාටුවට කරුණක්.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරුන්ගේ වෘත්තිය ජීවිතය තුළ ඇති ඉතා වැදගත් අවස්ථාවක් තමයි, ඔවුන් ඉහළ අධිකරණවලට, ඒ කියන්නේ උපරිමාධිකරණවලට - අභියාචනාධිකරණයට, ශ්‍රේෂ්ඨාධිකරණයට - ඇතැම් අවස්ථාවල මහාධිකරණයට පත්වීම් ලැබීම. අද වෙනකොට ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ ධුර අටක් හිස්ව තිබෙනවා. ඒ වාගේම මහාධිකරණයෙත් පුරප්පාඩු තිබෙනවා. මේ පුරප්පාඩු දැනට මාස හයක් විතර තිස්සේ පුරවන්නේ නැතිව ඉතිහාසයේ කවදාවත් නැති තරම් අධික ප්‍රමාදයක් තිබෙනවා. මේ තත්ත්වය නිසා නීතිපති දෙපාර්තමේන්තුවේ සේවය කරන නීතිඥවරුන්ගේ වෘත්තීය ජීවිතය පිළිබඳව, ප්‍රගතිය ගැන ලොකු ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේක ඉතා වැදගත් ජාතික ප්‍රශ්නයක්. ගරු අධිකරණ ඇමතිතුමනි, නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥවරුන්ගේ වෘත්තීය ප්‍රගතිය සම්බන්ධයෙන් බලපා තිබෙන, පොදුවේ රටේ යුක්තිය පසිඳලීම පිළිබඳ ප්‍රමාදයට හේතු වෙලා තිබෙන මේ පත්වීම් ඉක්මන් කිරීම සඳහා ඔබතුමා මැදිහත් වෙලා ගන්න පියවර මොනවාද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු සභාවේ රීති අනුව අතුරු ප්‍රශ්න නැඟිය හැක්කේ මූලික ප්‍රශ්නයෙන් පැන නඟින දෙයකට පමණයි. නමුත් පසුගිය අවස්ථාවෙත් අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා හිතාමතාම මේ ආකාරයටම මගෙන් අතුරු ප්‍රශ්නයක් ඇහුවා, මූලික ප්‍රශ්නයෙන් පැන නොනඟින. ඒ අවස්ථාවේ මම ඒකට උත්තර දුන්නේ නැහැ, පාර්ලිමේන්තුවේ රීති අනුව. කෙසේ වෙතත් අද මම මේ ප්‍රශ්නයට උත්තරයක් දෙනවා. නමුත් එතුමා කරන්නේ වැරැදි වැඩක්, අපේ රීති අනුව. කෙසේ වෙතත් මම උත්තරයක් දෙන්නම්.

පළමුවැනි කාරණය මෙකයි. නීතිපති දෙපාර්තමේන්තුවේ තිබෙන පමාවීම් නීතිපතිවරයාගේ වරද නිසා වෙන දෙයක් නොවෙයි. ඔහුගේ මානව සම්පත්වල සහ තාක්ෂණික සම්පත්වල තිබෙන අවමභාවය නිසායි ඒ පමාවීම් සිදුවන්නේ. ඒ වාගේම රස පරීක්ෂක වාර්තා පමාවීම සම්බන්ධයෙන් සලකා බලා මේ වන විට රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට බඳවා ගැනීම් ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම වැඩසටහනක් හදලා තිබෙනවා. ඉතා ඉක්මනින් - මාස තුනක් වාගේ කෙටි කාලයක් ඇතුළත - රස පරීක්ෂක වාර්තා ලබා දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් හදමින් යනවා. එහි ප්‍රතිඵල එන්න කොහොමත් තව මාස කිහිපයක් යයි.

දෙවන කාරණාව මෙකයි. ගරු නීතිපතිවරයා විසින් තව නීති නිලධාරීන් බඳවා ගැනීම සම්බන්ධයෙන් අපි සාකච්ඡා පවත්වනවා. ඒ අනුව, ඔහුට අවශ්‍ය සියලුම සම්පත් ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඒක තමයි උත්තරය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මුල් ප්‍රශ්නයට අදාළව අහන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න ඇසීමේදී ඒ විෂය පිළිබඳවයි අසා තිබෙන්නේ; නීතිපති දෙපාර්තමේන්තුව ගැන, නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥවරුන්ගේ ප්‍රගතිය ගැන ආදී වශයෙන්. ඒ නිසා ඒක අදාළ නැහැයි කියලා ගෙනාපු තර්කය වැරදියි. ඒකට මීට කලින් හිටපු මැති ඇමතිවරුනුත් පිළිතුරු දීලා තිබෙනවා. ඒ වාගේම, මෙතුමාට පිළිතුරු දෙන්නත් පුළුවන්. නමුත්, එතුමා වැදගත්ම ප්‍රශ්නයට පිළිතුරු දුන්නේ නැහැ. විනිශ්චයකාරවරුන් පත් කරන්නේ නැත්තේ ඇයි කියන ප්‍රශ්නයට එතුමා පිළිතුරු දුන්නේ නැහැ.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ විෂය පථය යටතේ තමයි තිබෙන්නේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව කියන දෙපාර්තමේන්තු දෙක එකට බැඳිලා තිබෙනවා. මොකද, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවයි, නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවයි, බලය විමධ්‍යගත කිරීමයි ඉතා වැදගත් එකක්, මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව. හිටපු බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහත්මයා සම්බන්ධ ප්‍රශ්නය ඉතා බරපතළ එකක්. ජනාධිපති සමාවක් වැරදි ලෙස දුන්නා කියලා අයුතු ලෙස චෝදනා කරලා ඔහුව අත්අඩංගුවට අරගෙන වැඩ තහනම් කළා. දැන් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඔහු නිර්දෝෂී බව ප්‍රකාශ කර තිබෙනවා. තවමත් ඔහුගේ පත්වීම කරලා නැහැ. ඒ වාගේම ඔහුව අස් කරලාත් නැහැ. ඒ තනතුර වෙනුවෙන් ස්ථිර පත් කිරීමක් කරලාත් නැහැ. බන්ධනාගාර දෙපාර්තමේන්තුවට තවමත් ඉන්නේ තාවකාලික නායකත්වයක්, ගරු අධිකරණ ඇමතිතුමනි. ඔබතුමා මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්න. දැන් ආපසු කියන්න එපා මේක විෂයෙන් පිට කියලා. ඔබතුමා මේ ප්‍රශ්නයට උත්තර දෙන්න. හැම දාම අපට අවස්ථාව ලැබෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා පත් කිරීම පිළිබඳ ප්‍රශ්නය අවසන් කරන්නේ නැත්තේ ඇයි? එක්කෝ, උපුල්දෙණිය මහත්මයා අස් කරන්න ඕනෑ, එක්කෝ අලුත් කෙනෙක් පත් කරන්න ඕනෑ. එහෙම පත් නොකර මේ වාගේ තත්ත්වයක් තිබීම අසාධාරණයි, රටටත්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 33(1) කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. එහි මෙසේ සඳහන්ව තිබෙනවා:

[ගරු කථානායකතුමා]

"........... එසේ වුව ද, එම අතුරු ප්‍රශ්න මගින් මුල් ප්‍රශ්නයෙහි ඇතුළත් නොවන කාරණා මත කරනු නොලැබිය යුතු අතර, වාචික පිළිතුරකින් පැන නගින යම් කාරණයක් වඩාත් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා පමණක් විමසනු ලැබිය යුත්තේ ය..........."

ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ වෙනත් කාරණාවක් නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමාට-*[බාධා කිරීමක්]* මමයි ඒක අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මෙහෙමයි. ඔබතුමා ස්ථාවර නියෝගවලට අනුවයි වැඩ කරන්න ඕනෑ. ඔබතුමාට ඕනෑ විධියට,- *[බාධා කිරීම්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමා ඒ රාජකාරිය බාර ගන්නේ නැතිව- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මගේ රාජකාරිය තමයි Standing Ordersවලට අනුව පාර්ලිමේන්තුව පවත්වාගෙන යන එක. *[බාධා කිරීම්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මගේ රාජකාරිය ප්‍රශ්න අහන එක. ඔබතුමාගේ රාජකාරිය ඔබතුමා කරන්න. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ඔබතුමා කියන කාරණය විසඳලා දෙන්න අපට.*[බාධා කිරීම්]* Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ඔබතුමා දැන් ස්ථාවර නියෝග 33 (1) කියෙව්වා නේ. මම ස්ථාවර නියෝග 34 (1) කියවන්නම්. එහි මෙසේ සඳහන්ව තිබෙනවා:

"ප්‍රශ්නයක නිසි අරමුණ විය යුත්තේ ප්‍රශ්නය යොමු කරනු ලබන අමාත්‍යවරයාගේ විශේෂ දැනුමට ගෝචර කාරණයක් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම හෝ ඒ සම්බන්ධයෙන් පියවර ගන්නා ලෙස අයැද සිටීම වේ."

ඒ අනුව, එතුමාගේ විශේෂ දැනුමට ගෝචර වන කාරණා ඇසීමේ අයිතිය ස්ථාවර නියෝග 34 (1)හි සඳහන් වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අතුරු ප්‍රශ්න නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. ඒ ප්‍රශ්නය ගැනයි කියන්නේ. ඔබතුමාට ඒක තේරෙන්නෙත් නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
විෂය පථයට අදාළව තමයි එතුමා ප්‍රශ්නය අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විෂය පථයට අදාළව තමයි අහන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමා. විෂය පථයට අදාළව අහන්න ඕනෑ ප්‍රශ්නයයි. *[බාධා කිරීමක්]* ගරු අධිකරණ අමාත්‍යතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න සම්බන්ධයෙන් තිබෙන රීතිය තමයි ස්ථාවර නියෝග 33(1) යටතේ තිබෙන්නේ. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන එක අතුරු ප්‍රශ්නවලට අදාළ වෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය ස්ථාවර නියෝග 33(1) රීතිය උල්ලංඝනය කරන බැවින් මම එම ප්‍රශ්නයට පිළිතුරු ලබාදීමට බැඳී නොමැති බව සඳහන් කරමින් ඉඳගන්නවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීම්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මෙතුමන්ලා කථා කරන නිසා මට ඇහෙන්නේ නැහැ නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ප්‍රශ්නය අහන්න. [බාධා කිරීම්] Headphone එක දමා ගන්න. [බාධා කිරීම්]

## ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව: 2020 සිට මූල්‍ය කාර්ය සාධනය

## இலங்கை காப்புறுதிக் கூட்டுத்தாபனம்: 2020 முதல் நிதிச் செயலாற்றுகை

## SRI LANKA INSURANCE CORPORATION: FINANCIAL PERFORMANCE FROM 2020

466/2025

**4. ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආදායම සහ ලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ දක්වා එම සංස්ථාවේ වෙළෙඳ පොළ කොටසෙහි ප්‍රතිශතය සහ මුළු ශේෂ පත්‍රයේ වටිනාකම කොපමණද;

(iii) ඉහත සංස්ථාවේ තරගකරුවන්ගේ නම් සහ ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ ඔවුන්ගේ වෙළෙඳ පොළ කොටසෙහි ප්‍රතිශතය සහ සමස්තය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2020 වර්ෂයේ සිට මේ දක්වා සංස්ථාව විසින් වාර්ෂිකව ගෙවන ලද සෘජු හා වක්‍ර බදු ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සංස්ථාවේ පරිපාලිත සමාගම්වල නම් සහ ඒවා සතු කොටස් ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) 2020 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂිකව ඉහත සංස්ථාවේ -

(i) සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව සහ ඔවුන්ගේ වැටුප් හා වේතන සඳහා වැය වූ මුළු මුදල;

(ii) ආයෝජන ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020 முதல் இற்றைவரை ஒவ்வோர் ஆண்டிலும் இலங்கை காப்புறுதிக் கூட்டுத்தாபனத்தின் வருமானம் மற்றும் இலாபம் யாவை என்பதை வெவ்வேறாகவும்;

(ii) இற்றைவரை அக்கூட்டுத்தாபனத்தின் சந்தைப் பங்குச் சதவீதம் மற்றும் மொத்த ஐந்தொகைப் பெறுமதி யாவை என்பதையும்;

(iii) மேலே குறிப்பிடப்பட்ட கூட்டுத்தாபனத்துடன் போட்டியிடுபவர்களின் பெயர்கள் மற்றும் ஆயுள், பொதுக் காப்புறுதியில் அவர்களுடைய சந்தைப் பங்கின் சதவீதம் மற்றும் மொத்தம் வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) 2020ஆம் ஆண்டு முதல் இற்றைவரை ஒவ்வோர் ஆண்டிலும் கூட்டுத்தாபனத்தால் செலுத்தப்படும் நேரடி மற்றும் மறைமுக வரிகளின் தொகை யாவை என்பதையும்;

(v) மேலே குறிப்பிடப்பட்ட கூட்டுத்தாபனத்தின் துணை நிறுவனங்களின் பெயர்கள் மற்றும் அவற்றுக்குச் சொந்தமான பங்குகளின் தொகை ஆகியன வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2020 முதல் இற்றைவரை ஒவ்வோர் ஆண்டிலும் மேலே குறிப்பிடப்பட்ட கூட்டுத்தாபனத்தில் -

(i) பணியாற்றிய ஊழியர்களின் எண்ணிக்கை, அவர்களின் சம்பளம் மற்றும் ஊதியங்களுக்காகச் செலவிடப்பட்ட மொத்தத் தொகை யாது என்பதையும்;

(ii) முதலீட்டு வருமானம் எவ்வளவு என்பதையும்;

வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) revenue and profit of the Sri Lanka Insurance Corporation in each year from 2020 to date, separately;

(ii) percentage of market share and the total balance sheet value of the Corporation as at to date;

(iii) names of the competitors of the above Corporation and the percentage of their market share in life and general insurance and in total, separately;

(iv) amount of direct and indirect taxes paid by the Corporation in each year from 2020 to date separately; and

(v) names of the subsidiaries of the above Corporation and amount of the shares owned by them, separately?

(b) Will he also inform this House, in respect of the above Corporation, separately for each year from 2020 to date, the-

(i) number of employees and the total amount spent for their salaries and emoluments; and

(ii) return on investment?

(c) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආදායම සහ ලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 01 වශයෙන් පහත පරිදි දක්වා ඇත.

[ගරු නිශාන්ත ජයවීර මහතා]

ඇමුණුම 01

| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 2020 රු. මිලියන | 2021 රු. මිලියන | 2022 රු. මිලියන | 2023 රු. මිලියන | 2024 රු. මිලියන | | | | 2025 රු. මිලියන (විගණනය නොකළ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | රක්ෂණ ව්‍යාපාරය | | | ඒකාබද්ධ කාර්ය සාධනය | රක්ෂණ ව්‍යාපාරය | | | ඒකාබද්ධ කාර්ය සාධනය |
| | | | | | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝප රේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) | | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝප රේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) | |
| ආදායම | 52,614 | 64,062 | 63,685 | 64,194 | 53,238 | 22,988 | 4,616 | 80,842 | 60,839 | 24,270 | 7,679 | 92,788 |
| ලාභය | 5,789 | 10,041 | 10,546 | 7,779 | 2,595 | 3,287 | 3,057 | 8,939 | 2, 316 | 2,528 | 6,233 | 11,077 |

- 2024දී වෙන් කිරීමේ ක්‍රියාවලියෙන් පසුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් - SLICLL - සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් - SLICGL - වශයෙන් නීතිමය ආයතන - අනුබද්ධිත සමාගම්- දෙකකට වෙන් කරන ලද අතර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම, කැනොවින් හෝටල් සහ ස්පාස් (පුද්ගලික) සමාගම, කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) සමාගම, ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සහ ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී ඇතුළු තවත් අනුබද්ධිත සමාගම් කිහිපයක් සහිත මව් සමාගමක් වශයෙන් පැවතුණි.

  ඒකාබද්ධ කාර්ය සාධනයට රක්ෂණ ව්‍යාපාරයේ කාර්ය සාධනය සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි ස්වාධීන කාර්ය සාධනය ඇතුළත් වන අතර, අනෙකුත් අනුබද්ධිත සමාගම්වල කාර්ය සාධනය සැලකිල්ලට නොගනී.

2025 වර්ෂයට අදාළ ආදායම හා ලාභය පහත පරිදි වේ.

(ii) මෙම ප්‍රශ්නයට පිළිතුර ඇමුණුම 02 වශයෙන් පහත පරිදි දක්වා ඇත.

ඇමුණුම 02

| සමාගම | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් | 18.69% | 17.62% | 15.36% | 13.78% | 14.38% | 14.36% |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් | 20.26% | 20.77% | 17.75% | 19.12% | 19.40% | 20.20% |

මුළු ශේෂ පත්‍රයේ වටිනාකම

| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 2020 රුපියල් මිලියන | 2021 රුපියල් මිලියන | 2022 රුපියල් මිලියන | 2023 රුපියල් මිලියන | **2024 රුපියල් මිලියන** | | | | **2025 රුපියල් මිලියන (විගණනය කළ නොකළ)** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | රක්ෂණ ව්‍යාපාරය | | | | රක්ෂණ ව්‍යාපාරය | | | ඒකාබද්ධ කාර්ය සාධනය |
| | | | | | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) | ඒකාබද්ධ කාර්ය සාධනය | ශ්‍රී ලංකා ඉන්ෂුව රන්ස් කෝප රේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) | ශ්‍රී ලංකා ඉන්ෂුව රන්ස් කෝප රේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) | ශ්‍රී ලංකා ඉන්ෂුව රන්ස් කෝප රේෂන් ලිමිටඩ් (SLIC) | |
| මුළු වත්කම් | 235,630 | 268,436 | 274,449 | 312,630 | 238,625 | 51,134 | 115,077 | 404,836 | 275,187 | 64,015 | 131,911 | 471,113 |

- 2024දී, වෙන් කිරීමේ ක්‍රියාවලියෙන් පසුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් - SLICLL - සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් - SLICGL - වශයෙන් නීතිමය ආයතන දෙකකට (අනුබද්ධිත සමාගම්) වෙන් කරන ලද අතර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම, කැනොවින් හෝටල් සහ ස්පාස් (පුද්ගලික) සමාගම, කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) සමාගම, ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සහ ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී ඇතුළු තවත් අනුබද්ධිත සමාගම් කිහිපයක් සහිත මව් සමාගමක් වශයෙන් පැවතුණි.

ඒකාබද්ධ කාර්ය සාධනයට රක්ෂණ ව්‍යාපාරයේ කාර්ය සාධනය සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි ස්වාධීන කාර්ය සාධනය ඇතුළත් වන අතර, අනෙකුත් අනුබද්ධිත සමාගම්වල කාර්ය සාධනය සැලකිල්ලට නොගනී.

(iii) සංස්ථාවේ තරගකරුවන්ගේ නම් සහ ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ ඔවුන්ගේ වෙළෙඳ පොළ කොටසෙහි ප්‍රතිශතය සහ සමස්තය වෙන් වෙන් වශයෙන් ඇමුණුම 03හි දැක්වේ. එය දීර්ඝ ඇමුණුමක්.

ඇමුණුම 03 **සභාගත*** කරමි.

(iv) 2020 වර්ෂයේ සිට මේ දක්වා සංස්ථාව විසින් වාර්ෂිකව ගෙවන ලද සෘජු හා වක්‍ර බදු ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් ඇමුණුම 04 වශයෙන් පහත පරිදි දක්වා ඇත.

ඇමුණුම 04

| | **2020** රු. මිලියන | **2021** රු. මිලියන | **2022** රු. මිලියන | **2023** රු. මිලියන | **2024** | | | **2025** | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | රු. මිලියන | | | රු. මිලියන | | |
| | | | | | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL) | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) |
| **සෘජු බදු** | | | | | | | | | | |
| ආදායම් බද්ද | 1,284 | 2,218 | 2,993 | 2,031 | 690 | 296 | 1,630 | 1,143 | 887 | 368 |
| භෝග රක්ෂණ බද්ද | 79 | 52 | 66 | 108 | 16 | 20 | 73 | 24 | 20 | - |
| අධිභාර බද්ද | - | - | 2,427 | - | - | - | - | - | - | - |
| ආර්ථික සේවා ගාස්තුව | 23 | - | - | - | - | - | - | - | - | - |
| **එකතුව** | **1,386** | **2,270** | **5,486** | **2,139** | **706** | **316** | **1,703** | **1,167** | **907** | **368** |
| **වක්‍ර බදු** | | | | | | | | | | |
| එකතු කළ අගය මත බද්ද | 951 | 1,310 | 1,539 | 2,521 | - | 2,566 | 557 | - | 3,900 | 75 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | - | - | - | 602 | - | 531 | 147 | - | 792 | 29 |
| මාර්ග ආරක්ෂණ අරමුදල | 10 | 12 | 25 | 18 | - | 14 | 3 | - | 19 | - |
| මුද්දර ගාස්තු | 22 | 23 | 26 | 28 | 2 | 17 | 10 | 6 | 30 | - |
| රඳවා ගැනීමේ බද්ද | 20 | - | - | 141 | 96 | 37 | 50 | 223 | 143 | 11 |
| **එකතුව** | **1,003** | **1,345** | **1,590** | **3,310** | **98** | **3,165** | **767** | **229** | **4,884** | **115** |

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නිශාන්ත ජයවීර මහතා]

(v)

| අනුබද්ධිත සමාගමේ නම | හිමිකාරිත්ව කොටස් ප්‍රමාණය (2025 දෙසැ.31 දිනට) | හිමිකාරිත්ව කොටස් ප්‍රතිශතය (%) |
|---|---|---|
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් | මිලියන 1,250 | 100% |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් | මිලියන 1,400 | 100% |
| ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී | මිලියන 114.86 | 51.34% |
| ලිට්රෝ ගෑස් ලංකා සමාගම | මිලියන 35.98 | 99.94% |
| ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්) සමාගම | මිලියන 158.71 | 100% |
| කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්) සමාගම | මිලියන 87.01 | 100% |
| කළමනාකරණ සේවා රක්ෂණ (පුද්) සමාගම | 5 | 100% |
| කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම | - | - |

සටහන 01

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි හිමිකම් පැවරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වූ, 2023 මාර්තු 17 වන දින 23/0431/604/046 දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහ අංක 23/1899/604/187 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි අනුබද්ධිත සමාගම් භාණ්ඩාගාර ලේකම් වෙත පැවරීමේ ක්‍රියාවලියට අනුව, කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ අයිතිය 2024 ජුලි 8 වන දින භාණ්ඩාගාර ලේකම් වෙත පවරන ලදී.

(ආ) (i) සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව සහ ඔවුන්ගේ වැටුප් හා වේතන සඳහා වැය වූ මුළු මුදල ඇමුණුම 05 මඟින් දැක්වේ.

2025 වර්ෂයට අදාළ තොරතුරු පහත පරිදි වේ.

| 2025 | |
|---|---|
| සේවක සංඛ්‍යාව (ස්ථිර + කොන්ත්‍රාත් පදනම මත) | 2,707 |
| කාර්ය මණ්ඩල (පිරිවැය රුපියල් මිලියන) | 9,103 |

(ii) ආයෝජන ප්‍රතිලාභ විස්තරාත්මකව ඇමුණුම 06 මඟින් දැක්වේ.

2025 වර්ෂයට අදාළ තොරතුරු පහත පරිදි වේ.

| | 2025 | | |
|---|---|---|---|
| | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් - SLICGL | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් - SLIC |
| ආයෝජන ප්‍රතිලාභය (%) | 11% | 9% | 14% |

(ඇ) පැන නොනඟී.

ඇමුණුම් අංක 05 සහ 06 **සභාගත*** කරමි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා දීලා තිබෙන උත්තර අනුව මා මේ ප්‍රශ්නය අහනවා. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් NDB බැංකුවේ කොටස් මිලදී ගන්නවා නේ. සියයට 11ක විතර කොටස් ප්‍රමාණයක් තියාගෙනත්, කිසිම අධ්‍යක්ෂකවරයෙක් NDB එකට පත් කරලා නැහැ. දැන් NDB එකේ රුපියල් බිලියන 13.4ක මූල්‍ය ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒකෙන් ඔබතුමන්ලාට dividends ලැබිලාත් නැහැ. ඒ වාගේම ඒ කොටස් ගත්ත ප්‍රමාණයට වඩා මිල අඩු වෙලා තිබෙනවා. මම ඔබතුමාගෙන් අහන්නේ, සියයට 11ක කොටස් තියාගෙන, තමන්ගේ හිමිකමක් වන අධ්‍යක්ෂ මණ්ඩලයේ seat එකක් ලබා ගන්නේ නැත්තේ ඇයි කියන එකයි.

ඒ විතරක් නොවෙයි, මොන හේතුවක් නිසාද මේ වාගේ තීන්දුවක් ගත්තේ? මොකද, යම් විධියකින් කඩා වැටීමක් තිබෙනවා කියලා දැනගෙනත්, ඔබතුමන්ලා කොටස් ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. ඒ නිසා කරුණාකරලා අපට කියන්න පුළුවන්ද, මේකේ ප්‍රතිවිපාකය මොකක්ද කියලා? රක්ෂණ අරමුදල් ගන්නා අයට මේක වාසියක්ද, අලාභයක්ද, එහෙම නැත්නම් තවම නිශ්චිතභාවයක් සොයා ගන්න බැරි වෙලා තිබෙනවාද?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ආයෝජන කරන්නේ ඒගොල්ලන්ගේ Investment Committee එක හරහා. ඒගොල්ලන් තමයි අදාළ නිර්ණායක අනුව අඩුම අවදානම තිබෙන තැන තීරණය කරලා ඒ ආයෝජන කරන්නේ. ඒ අනුව ඒගොල්ලන් ආයෝජන කරලා තිබෙනවා. ඔබතුමා කියනවා වාගේ NDB එකේ මතු වුණු ගැටලුව නිසා මේ වෙනකොටත් ඒ ගැන forensic audit එකක් යනවා. ඒ ගැන ඔබතුමාත් දන්නවා. ඒකේ හිමිකාරිත්වය පිළිබඳව, ඒ Investment Committee එකෙන් ගත්ත තීරණයක් මත තමයි ඒ ආයෝජනය කරලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ, දෙවැනි එක නොවෙයි පළමුවැනි එකේ - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, පළමුවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර ලබා දීලා අවසන් කරන්න. *[බාධා කිරීමක්]*

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එහෙම කටයුතු කරනවාද? මේ ප්‍රශ්නයට යම් විධියක flow එකක් තිබෙන්න ඕනෑ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නයකුත් එනවා නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, වේලාවත් ඉතුරු කරගෙන - *[බාධා කිරීමක්]* මේක පාර්ලිමේන්තුව, ප්‍රාදේශීය සභාවක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක වාද විවාද කරන අවස්ථාවක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රශ්නයේ (v) කොටසට පිළිතුර ලෙස ලබා දීලා තිබෙනවා සංස්ථාව සතු හිමිකම් ගැන අනෙක් ආයතන තුළ. ඒ අතර ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී සියයට 51.34ක්, ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සියයට 99ක් සහ කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්) සමාගම සියයට 100ක්. මේ අවස්ථාවේ ලෝක වෙළෙඳ පොළේ ගෑස් මිල වැඩිවීමත් එක්ක ලිට්‍රෝ එක මිල වැඩි නොකිරීමේ අලාභය කොතරම් එන්න පුළුවන්ද? ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී සහ කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්) සමාගම කොටස් වෙළෙඳ පොළට දාලා විකුණන්න, වාණිජකරණය කරන්න දැන් අවස්ථාව ඇති වෙලා තිබෙනවා. එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අවශ්‍යතාවක් ඉටු කිරීමක් කියලා තමයි අපි දැනුවත් වෙලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි. එය සැබෑවක් ද, එය කුමන කාල පරිච්ඡේදක් තුළදී ද කරන්නේ, ඒ තුළින් ඔබතුමන්ලා කොපමණ capital gain එකක් ලබා ගන්න බලාපොරොත්තු වනවා ද කියලා මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් මම කාරුණිකව අහනවා. ඒ පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කරන්න පුළුවන්ද?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ඒ පිළිබඳව තවම නිශ්චිතව ගණනය කරලා නැහැ. නිශ්චිතව ගණනය කරලා ඉදිරියේදී පැහැදිලිව ඉදිරිපත් කරන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ කියන්නේ එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ,- *[බාධා කිරීමක්]*

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ඒ වෙනකොට පැහැදිලිවම කෙරෙනවා. ඒක නිශ්චිතව බලලා ඔබතුමාට පැහැදිලිව ඉදිරිපත් කරන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අවශ්‍යතාව ඉටු කරගෙන, - *[බාධා කිරීමක්]*

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ඔබතුමා අහන ප්‍රශ්නයට අදාළ දත්ත මට මේ අවස්ථාවේ ලැබිලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, මූලික ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වෙන මුකුත් නොවෙයි මම අහන්නේ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් එකේ subsidiaries ගැන. මේක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, මූලික ප්‍රශ්නයෙන් පැන නඟින දෙයක් නිරාකරණය කර ගැනීමට තමයි අතුරු ප්‍රශ්න අහන්න තිබෙන්නේ. ස්ථාවර නියෝග කියවන්නකෝ. ඔබතුමන්ලා අතුරු ප්‍රශ්න අහද්දී මොනවා කරනවාද කියලා මම දන්නේ නැහැ. *[බාධා කිරීම්]* නැහැ, ගරු මන්ත්‍රීතුමා. වෙන සම්ප්‍රදායන් නොවෙයි. මේක දසවැනි පාර්ලිමේන්තුව. මේ ඉන්නේ දසවැනි පාර්ලිමේන්තුවේ කථානායක. ගරු මන්ත්‍රීතුමන්ලා ඒක මතක තියාගන්න.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, පිළිතුර ලබා දෙන්න.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
මම පිළිතුර ලබා දුන්නා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පිළිතුර ලබා දුන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා ඔබතුමාට පිළිතුරක් ලබා දෙනවා නේ, අදාළ නැහැ කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, Lanka Hospitals එකට අද උදේ ගියාම ගාස්තුව රුපියල් 3,000යි. ඒක හැන්දෑව වනකොට රුපියල් 3,500ක් වෙලා තිබෙනවා. ඒ කියන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ලාභ ලබන විධියත් පෙන්වන්න ඕනෑ කියන එකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඇසූ මුල් ප්‍රශ්නයෙන් පැන නඟින අතුරු ප්‍රශ්නයක් නොවෙයි ඔය අහන්නේ. ඔබතුමාට සිංහල තේරෙන්නේ නැද්ද කියන ප්‍රශ්නය මට තිබෙනවා.

ප්‍රශ්න අංක 5 -598/2025- (1), ගරු දයාසිරි ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ: පුරප්පාඩු
## இலங்கை போக்குவரத்துச் சபைக்குச் சொந்தமான டிப்போக்கள்: வெற்றிடங்கள்
## DEPOTS BELONGING TO SRI LANKA TRANSPORT BOARD: VACANCIES

644/2025

6. **ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝවල නම් කවරේද;

(ii) මේ වනවිට එම ඩිපෝවල මානව සම්පත් හිඟයක් තිබෙන බව දන්නෙහිද;

(iii) එසේ නම්, එම ඩිපෝවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை போக்குவரத்துச் சபைக்குச் சொந்தமான 'டிப்போ'க்களின் பெயர்கள் யாவை;

(ii) தற்போது மேற்படி 'டிப்போ'க்களில் மனிதவளப் பற்றாக்குறை நிலவுகின்றது என்பதை அறிவாரா;

(iii) ஆமெனில், மேற்படி 'டிப்போ'க்களில் நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை யாது;

(iv) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்காக மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the names of the depots which belong to the Sri Lanka Transport Board;

(ii) whether he is aware that there is a shortage of human resources in those depots at present;

(iii) if so, the number of vacancies in those depots; and

(iv) the measures that will be taken to fill those vacancies?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඩිපෝ 108ක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. උප ඩිපෝ 10ක් තිබෙනවා. එම නම් පහත ඇමුණුමෙහි දක්වා තිබෙනවා.

**කොළඹ ප්‍රාදේශිකය**

01. අංගොඩ
02. අවිස්සාවේල්ල
03. හෝමාගම
04. කටුබැද්ද
05. කැස්බෑව
06. මහරගම
07. මට්ටක්කුලිය
08. මීතොටමුල්ල
09. මොරටුව
10. රත්මලාන
11. තලංගම
12. උඩහමුල්ල

**ගම්පහ ප්‍රාදේශිකය**

13. දිවුලපිටිය
14. ගම්පහ
15. ජා-ඇල
16. කඩවත
17. කැළණිය
18. කිරිදිවැල
19. මීගමුව
20. නිට්ටඹුව
21. වැලිසර

**කළුතර ප්‍රාදේශිකය**

22. අළුත්ගම
23. හොරණ
24. කළුතර
25. මතුගම
26. පානදුර

**මහනුවර ප්‍රාදේශිකය**

27. මහනුවර උතුර
28. මහනුවර දකුණ
29. යටිනුවර
30. මාතලේ
31. වත්තේගම
32. තෙල්දෙණිය
33. උඩුදුම්බර

**නුවරඑළිය ප්‍රාදේශිකය**

34. ගම්පොල
35. හඟුරන්කෙත
36. හැටන්
37. කොත්මලේ
38. නාවලපිටිය
39. නුවරඑළිය
40. වලපනේ

**රුහුණු ප්‍රාදේශිකය**

41. ඇල්පිටිය
42. අම්බලන්ගොඩ
43. ගාල්ල
44. උඩුගම
45. මාතර
46. අකුරැස්ස
47. හක්මන
48. අම්බලන්තොට
49. තංගල්ල
50. කතරගම
51. කොග්ගල

**රජරට ප්‍රාදේශිකය**

52.දඹුල්ල
53. අනුරාධපුර
54. කැකිරාව
55. පොළොන්නරුව
56. හොරොව්පතාන
57. කන්තලේ
58. කැබිතිගොල්ලෑව

**සබරගමුව ප්‍රාදේශිකය**

59. බලංගොඩ
60. දැරණියගල
61. ඇඹිලිපිටිය
62. ගොඩකවෙල
63. කෑගල්ල
64. රඹුක්කන
65. රත්නපුර
66. කලවාන
67. මාවනැල්ල

**ඌව ප්‍රාදේශිකය**

68. බදුල්ල
69. බණ්ඩාරවෙල
70. බිබිල
71. දෙහිඅත්තකණ්ඩි
72. කැප්පෙටිපොළ
73. මහියංගණය
74. මොණරාගල
75. වැල්ලවාය
76. තණමල්විල

**වයඹ ප්‍රාදේශිකය**

77. අලව්ව
78. හලාවත
79. ගල්ගමුව
80. ගිරිඋල්ල
81. කුලියාපිටිය
82. කුරුණෑගල උතුර
83. කුරුණෑගල දකුණ
84. මහව
85. නිකවැරටිය
86. පුත්තලම
87. වාරියපොළ
88. වෙන්නප්පුව

**නැගෙනහිර ප්‍රාදේශිකය**

89. අක්කරෙයිපත්තු
90. පොතුවිල්
91. අම්පාර
92. මඩකළපුව
93. එරාවූර්
94. කලවංචිකුඩි
95. කල්මුණේ
96. කාත්තන්කුඩි
97. මුතූර්
98. ත්‍රිකුණාමලය
99. වාලච්චේන

**උතුරු ප්‍රාදේශිකය**

100. යාපනය
101. කරෙයිනගර්
102. කිළිනොච්චි
103. මන්නාරම
104. මුලතිව්
105.පේදුරුතුඩුව
106. වව්නියා
107. මධ්‍යම බස්රථ කාර්යාල පිටකොටුව
108. අධි සුඛෝපභෝගී සංචාරක ඩිපෝව කටුබැද්ද

මීට අමතරව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු උප ඩිපෝ 10 ක් ද ඇත. ඒවා නම්

01. ආණමඩුව
02. නාරම්මල
03. කින්නියා
04. දියසෙන්පුර
05. කුරුඳුවත්ත
06. කහවත්ත
07. වරකාපොල
08. දෙණියාය
09. සියඹලාණ්ඩුව
10. රිදීගම

(ii) ඔව්.

(iii) 2026.01.30 දිනට සේවක සංඛ්‍යා විස්තර අනුව රියදුරු - 1,034ක්, කොන්දොස්තර - 1,022ක්, කාර්මික - 429ක් හා වැඩ මූලික 59ක් වශයෙන් පුරප්පාඩු පවතී.

අද වන විට, එනම් 2026.06.10 වන විට රියදුරු - 647 ක් ද, කොන්දොස්තර - 770ක් ද, කාර්මික - 429ක් ද, වැඩ මූලික 59ක් ද වශයෙන් පුරප්පාඩු පවතී.

(iv) ප්‍රාථමික ගණයේ නොවන කාර්ය මණ්ඩල ගණවල දැනට පවතින පුරප්පාඩු සඳහා තාවකාලිකව කාර්යයන් ආවරණය කිරීමේ පදනම මත කාර්ය පැවරුම් ලබාදීම සිදු කරනු ලැබේ. ප්‍රාථමික ගණයේ රියදුරු/කොන්දොස්තර හා කාර්මික තනතුරුවලට බඳවා ගැනීම සඳහා රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ හා කාර්ය මණ්ඩලය කළමනාකරණ කිරීමේ කමිටුව මඟින් රියදුරු මහතුන් 450ක් ද, කොන්දොස්තර මහතුන් 300ක් ද, කාර්මික තනතුරු 429ක් ද, වැඩ මූලික තනතුරු සඳහා 17ක් ද බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබා දුන් අතර, 2026.06.03 දිනට රියදුරු මහතුන් 387ක්ද, කොන්දොස්තර මහතුන් 229ක් ද, කාන්තා කොන්දොස්තර 23දෙනෙක් ද කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇත.

කාර්මික හා වැඩමූලික තනතුරුවල පවතින පුරප්පාඩුවලට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මේ දිනවල ශ්‍රීලංගම ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වේ.

වැඩමූලික තනතුරවල පවතින පුරප්පාඩුවලට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මේ දිනවල ශ්‍රීලංගම ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වෙන අතර, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසු එහි ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

ශ්‍රීලංගම ප්‍රතිව්‍යුහගත කරන ක්‍රියාවලිය යටතේ කාර්ය මණ්ඩලයට අයත් සේවකයින් නව වැටුප් ව්‍යුහයට අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලියට අදාළ සම්මුඛ පරීක්ෂණ මේ වන විට සම්පූර්ණයෙන් පවත්වා ඇති අතර, එහි නිර්දේශ 2026.05.22 වන දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කිරීම සඳහා ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයට යොමු කර ඇත.

එකී නිර්දේශ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සලකා බලා අවසානයේ අනුමත කරනු ලබන සේවා ගණවල අදාළ සේවකයන් එක් එක් තනතුරු සඳහා අන්තර්ග්‍රහණය කිරීම හා උත්ශ්‍රේණිගත කිරීමට බලාපොරොත්තු වේ.

තවද, අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක එස්.සී.එෆ්.ආර්. 239/19 දරන නඩුව විභාග වෙමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ 107න්, ඩිපෝ 55ක්ම පාඩු ලබනවා කියලා තමයි වාර්තා වෙන්නේ. ඒ වාගේම ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ 7,131න්, බස් 5,181ක් තමයි ධාවනය වෙනවා කියලා වාර්තා වෙන්නේ. බොහෝ බස් අවුරුදු 10කට වඩා පරණයි. ඒ වාගේම පාඩු ලබන ඩිපෝ 55ක් වාර්තා වෙනවා.

මේවා ලාභ ලබන ආයතන බවට පත් කරගන්න ඔබතුමාගේ අමාත්‍යාංශය තුළ විශේෂ වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ඔව්, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා කියන පාඩු ලබන ඩිපෝ ලාභ ලබන ආයතන බවට පත් කිරීම සඳහා අපට වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒවා පාඩු ලබන්න ප්‍රධාන වශයෙන් හේතු වෙලා තිබෙන්නේ මෙන්න මේ කාරණාවයි. මේ සමහර ඩිපෝ පිහිටා තිබෙන්නේ ප්‍රාදේශීයව. එතකොට එම ඩිපෝවල සේවය කරන අයට ලැබිලා තිබෙන ගමන් මාර්ග වැඩි මගීන් පිරිසක් ප්‍රවාහනය කරන ලාභදායක ගමන් මාර්ග නොවෙයි. ඒ වෙනුවෙන් රජය මැදිහත් වෙලා තිබෙනවා, නොයෙක් ක්‍රමවේද මඟින්. ඉන් එක් ක්‍රමවේදයක් ගත්තොත්, පාඩු ලබන මාර්ගවල "ගැමි සැරිය", "නිසි සැරිය", "සිසු සැරිය" විධියට බස් රථ ධාවනය වනවා නම් ජාතික ගමනාගමන කොමිෂන් සභාව හරහා කිලෝමීටරයකට යම්කිසි මුදලක් ගෙවීමට තීරණය කරලා ඒ ගෙවීම දැන් කරගෙන යනවා. ඊට අමතරව ඒ අනාර්ථික මාර්ගවල, ඒ කියන්නේ බස් රථයක් ධාවනය කිරීම නිසා ඒ ලංගම ඩිපෝවට වන පාඩුව මඟහරවා ගැනීම සඳහා එහෙම මාර්ගයක බස් රථ ධාවනය කරන බව අපට දැනුම් දුන්නාට පස්සේ සෘජුවම - directly - ඒ ඩිපෝවට මුදල් බැර කිරීම සඳහා ජනාධිපතිතුමා අය වැයෙන් රුපියල් මිලියන 2,000ක් වෙන් කර තිබෙනවා. මේ ව්‍යාපෘතිය දැන් පටන්ගෙන තිබෙනවා. මේ හරහා යම්කිසි කටයුතු ප්‍රමාණයක් කළ හැකියි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය ඇත්ත. බස් රථ බළ ඇණිය පරණයි. ඒ නිසා ඒවායේ නඩත්තු වියදම වැඩියි. මේ හේතුව නිසා ලංගම ඩිපෝ යම්කිසි පාඩුවකට ලක්වීමක් සිදු වෙලා තිබෙනවා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2016 නිසා වැටුප් විෂමතාවක් වෙනවා. ඒ කියන්නේ, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විධායක ශ්‍රේණියේ, ඒ වාගේම VI, VII, VIII ශ්‍රේණිවල ඉන්න නිලධාරින්ගේ, ඩිපෝ පරීක්ෂකවරුන්ගේ, ඒ වාගේම මාර්ග පරීක්ෂකවරුන්ගේ, ඩිපෝ කළමනාකරුවන්ගේ, ලිපිකරුවන්ගේ වැටුප් වැඩිවීමක් 2018දී වෙනවා කියලා 02/2016 චක්‍රලේඛයේ ප්‍රකාශ වෙනවා. නමුත් තවම ඒ වැටුප් වැඩිවීම සිදු වෙලා නැහැ. මේ සේවයේ හිටපු බොහෝ අය දැන් මිය ගිහිල්ලා තිබෙනවා, ඒ වාගේම තවත් පිරිසක් විශ්‍රාම ගිහිල්ලා තිබෙනවා. ඒ අතරින් 2017දී විශාල පිරිසක් විශ්‍රාම ගිහින් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2016 ප්‍රකාරව ඔවුන්ගේ වැටුප් වැඩිවීමක් වෙනවාද, ඔබතුමන්ලා ඒ ගැන සාකච්ඡා කර තිබෙනවාද, ඒ අනුව සේවයේ ඉන්න අයට මොනයම් හෝ සාධාරණයක් ඉෂ්ට වෙනවාද කියා මා දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු මන්ත්‍රීතුමනි, මම ලබා දුන් පිළිතුර තුළත් අන්තර්ග්‍රහණය පිළිබඳව සඳහනක් තිබුණා. මොකද, ඩිපෝවකට අනුයුක්ත වුණාට පසුව එතුමන්ලාගේ සුදුසුකම් බලා නියමිත තනතුර මොකක්ද කියන එකට අන්තර්ග්‍රහණය කිරීමක් තිබිය යුතුයි. නමුත් කාලයක් තිස්සේම ඒක වෙලා නැහැ. එම නිලධාරි මණ්ඩලයේ, සේවක මහතුන්ගේ සියලු පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කර, සම්මුඛ පරීක්ෂණවලට කැඳවා ඒ අදාළ සුදුසුකම් - qualifications - සම්පූර්ණ කර තිබෙනවා නම් අන්තර්ග්‍රහණය කරන්න පුළුවන්, ඒ අය ඉන්න තනතුරට.

දෙවනුව, අපි ඒ වැටුප් ගණයේ ඒ අය පිහිටුවනවා. අපි බලාපොරොත්තු වනවා, ඒ හරහා වැටුප් විෂමතාව කළමනාකරණය කරන්න. දැනට සම්මුඛ පරීක්ෂණ අවසන් කර තිබෙනවා. දැන් අපට තිබෙන්නේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගන්නයි. නිතරම ඒගොල්ලන්ගේ directives අපට ලැබෙනවා. මේ සම්බන්ධව නඩුවකුත් විභාග වෙමින් පවතිනවා. අපි මේ සියල්ලම පරීක්ෂා කර බලා ඉදිරියේදී මේ ටික summarize කරලා කැබිනට් පත්‍රිකාවක් හරහා අනුමැතිය අරගෙන, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියත් අරගෙන එම කටයුත්ත අවසන් කරන්න බලාපොරොත්තු වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -655/2025- (1), ගරු රෝහණ බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 -1106/2025- (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, ලැබී ඇති ආයෝජන සම්බන්ධයෙන් වන එම ප්‍රශ්නය මා අහනවා.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## නුගේගොඩ, ශාන්ත ජෝන් විද්‍යාලයේ විදුහල්පතිවරයාට එරෙහි විමර්ශනය: නිර්දේශ
## நுகேகொடை, புனித. ஜோன்ஸ் கல்லூரி அதிபருக்கெதிரான விசாரணை: விதப்புரைகள்
## INQUIRY AGAINST PRINCIPAL OF ST. JOHN'S COLLEGE, NUGEGODA: RECOMMENDATIONS

1472/2025

**9. ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාට ලද පැමිණිල්ලකට අනුව නුගේගොඩ, ශාන්ත ජෝන් විද්‍යාලයේ විදුහල්පතිවරයාට එරෙහිව 2025.06.04 දින සිට 2025.07.04 දින දක්වා විමර්ශනයක් සිදු කරන ලද බව දන්නේද;

(ii) විමර්ශනය සිදු කරන ලද කමිටුව විසින් එම විමර්ශනය අපක්ෂපාතීව නිසි ආකාරයෙන් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම විමර්ශන කමිටුව විසින් ඉහත විදුහල්පතිවරයා සම්බන්ධයෙන් සිදු කර ඇති නිර්දේශ කවරේද;

(iv) මේ වන විට, එම නිර්දේශ ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மேல் மாகாண ஆளுநருக்குக் கிடைக்கப் பெற்றதொரு முறைப்பாட்டுக்கு அமைய, நுகேகொடை, புனித. ஜோன்ஸ் கல்லூரியின் அதிபருக்கெதிராக 2025.06.04ஆம் திகதி தொடக்கம் 2025.07.04ஆம் திகதி வரையில் விசாரணையொன்று மேற்கொள்ளப்பட்ட தென்பதை அறிவாரா என்பதையும்;

(ii) விசாரணையை மேற்கொண்ட குழுவால் மேற்படி விசாரணையானது பக்கச்சார்பின்றி முறையாக மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், குறித்த அதிபர் தொடர்பாக மேற்படி விசாரணைக் குழு முன்வைத்த விதப்புரைகள் யாவை என்பதையும்;

(iv) தற்போது மேற்படி விதப்புரைகள் செயற்படுத்தப் பட்டுள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether she is aware that an inquiry was conducted against the Principal of St. John's College, Nugegoda from 04.06.2025 to 04.07.2025 pursuant to a complaint received by the Governor of the Western Province;

(ii) whether the committee that conducted the inquiry has carried out the said inquiry impartially and properly;

(iii) if so, the recommendations that were made by the said committee of inquiry regarding the Principal concerned; and

(iv) whether the said recommendations have been implemented by now?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයේ විදුහල්පතිවරයා ගැනයි. මෙය පළාත් පාසලක්. මෙහිදී පිළිතුරු සැපයෙන්නේ මෙම පාසලේ විනය කටයුත්තක් සම්බන්ධයෙන්. මෙහි විනය බලධාරියා වෙන්නේ පළාත් සභාව. එම නිසා පළාත් සභාව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට මේ සම්බන්ධව යොමු කර තොරතුරු ලබාගෙන තිබෙනවා. ඒ අනුව, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

මෙම විදුහල්පති සම්බන්ධයෙන් අක්‍රමිකතාවක් නිරීක්ෂණය නොවූ බැවින් වෙනත් කලාප කාර්යාලයක් වෙත යොමු කිරීමට නිර්දේශ කර ඇත. මේ සම්බන්ධයෙන් වාර්තාවක් තිබෙනවා. එතැන විමර්ශන වාර්තා 3ක් තිබෙනවා. පිළියන්දල කලාප කාර්යාලයෙන්, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් විසින් පත් කරන ලද විමර්ශන වාර්තා මත මෙම නිර්දේශය කරලා තිබෙනවා.

(iv) නැත.

(ආ) මෙම විදුහල්පති අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු වන බැවින්ද, නිර්මාණශීලී කෙනෙකු වන බැවින්ද, අක්‍රමිකතා නිරීක්ෂණය නොවූ බැවින් සහ විදුහල්පතිගේ සේවය නැවත පාසලට ලබා දෙන ලෙස නියෝජ්‍ය හා සහකාර විදුහල්පතිවරු, ගුරු භවතුන්, පාසල් සංවර්ධන සමිතිය හා ආදි ශිෂ්‍යයන් විසින් කරන ලද ලිඛිත ඉල්ලීම් සලකා බලා පරිපාලනමය තීරණයක් අනුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත තාවකාලිකව අනුයුක්ත කර සිටි විදුහල්පතිවරයා පළාත් අධ්‍යාපන ලේකම්ගේ තීරණයක් මත නැවත එම විදුහලට 2025.07.23 දින සිට ස්ථානගත කර ඇත.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ නුගේගොඩ, ශාන්ත ජෝන් විද්‍යාලයේ විදුහල්පතිවරයා සම්බන්ධවයි. 2025 වසරේදී තමයි මේ විදුහල්පතිවරයා සම්බන්ධයෙන් පරීක්ෂණය කළේ, මේ ආණ්ඩුවේ ආණ්ඩුකාරවරයා. මේක පළාත් පාසලක්. ආණ්ඩුකාරවරයා විනය පරීක්ෂණ සඳහා යොමු කරපු විනය කමිටුවෙනුත් නිර්දේශ දීලා තිබෙනවා, මොහු පරිපාලන සේවයේ නිලධාරියෙක් නිසා විදුහල්පති ශ්‍රේණියේ තියන්න එපා, මුදල් වංචා කිහිපයකටත් හසු වෙච්ච විදුහල්පතිවරයෙක් කියලා. හැබැයි, විනය පරීක්ෂණ කමිටුවෙන් තීරණයක් අරගෙන තිබෙනවා, මේ විදුහල්පතිවරයා අයින් කරන්න කියලා. මේක අපි කාගේවත් තීරණයක් නොවෙයි, මේ ආණ්ඩුවේ විනය පරීක්ෂණ මණ්ඩලයෙන් පළාත් ආණ්ඩුකාරවරයා 2025දී ගත් තීරණයක්. හැබැයි, එහෙම නිර්දේශ කරපු කෙනා තාවකාලිකව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කළා. නමුත්, ආපසු ඔහු මේ පාසලටම අනුයුක්ත කර තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විනය පරීක්ෂණයෙන් වැරදිකාරයෙක් වෙච්ච කෙනෙක් තාවකාලිකව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරලා, නැවත මේ පාසලට ගෙනෙන එක අභවලාගේ ඉල්ලීම කියලා කියන්න බැහැ. විනය පරීක්ෂණයකින් වැරැදිකාරයෙක් වුණා නම් ඔහු වැරැදියි. ඒ වැරැද්දට විනය පරීක්ෂණයක් කරලා නිර්දේශය දීලා තිබෙනවා. ඔහු නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයේ විදුහල්පති. ඔහු පරිපාලන සේවයේ කෙනෙක් නේ. එහෙම නම්, විදුහල්පති පරිපාලන සේවයේ අයට තව තනතුරු තිබෙනවා. මුදල් වංචා,

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

දූෂණ කිහිපයක් තිබෙන නිසා තමයි ඔහුට විනය පරීක්ෂණයක් කළේ. ඒ විනය පරීක්ෂණයෙන් ඔහු වැරැදිකාරයා වුණා. වැරැදිකාරයා වුණු කෙනා තාවකාලිකව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරලා නැවත ඒ පාසලටම දැම්මා. එහෙම නම් විනය පරීක්ෂණයක් අවශ්‍යත් නැහැ. ඔහු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරලා වැඩකුත් නැහැ. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දවස් ගණනක් තියලා ආපසු ඒ පාසලටම ගත්තා. මේක සම්පූර්ණ වැරැදියි. ඔහු විනය පරීක්ෂණයෙන් වැරැදිකාරයා වෙලා තිබෙනවා. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට දාලා නිකම් සුදු ලූනු පොඩි කරන්න ඕනෑ නැහැ. එක සැරේ එක්කෝ දානවා නම් දාන්න, නැත්නම් හිටපු තැනම තියන්න. මේ විධියට විනය පරීක්ෂණයක් වැඩක් නැහැ, ගරු කථානායකතුමනි. බොරුවට නේ විනය පරීක්ෂණයක් තියන්නේ. විනය පරීක්ෂණ තුනකින් ඔහු වැරැදිකාරයා වෙලා තිබෙනවා. එහෙම විදුහල්පතිවරු දමන්න නොවෙයි මේ ආණ්ඩුව ආවේ. මේ ආණ්ඩුව ආවේ නිවැරැදිව වැඩ කරන්න. විනය පරීක්ෂණයකින් වැරැදිකාරයා වෙනවා නම් ඔහු වහාම ශාන්ත ජෝන් විද්‍යාලයෙන් අයින් කරන්න කියලා අපි මේ වෙලාවේදී කියනවා. ඒක තමයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, මට නිශ්චිත ප්‍රශ්නයක් නම් ඇහුණේ නැහැ. නමුත් මම පිළිතුරු සපයන්නම්. මම පොඩ්ඩක් කථා කරන්නම්, විනය ක්‍රියාදාමය සම්බන්ධයෙන්. මේක විමධ්‍යගත subject එකක් නිසා අනිවාර්යයෙන් පළාත් සභාව සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තමයි ඒකට වග කියන්නේ. මූලික විමර්ශන කටයුතු අවසන් වෙලා තිබෙනවා, ඒ විමර්ශන තුනේම.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
සමගාමීව පළාත් අධ්‍යක්ෂ ඉන්නේ මධ්‍යම රජයේ. දන්නේ නැත්නම් මගෙන් අහගන්න. මම හිටපු මහ ඇමති.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
මම කියන්නේ විනය සම්බන්ධයෙන් බලධාරියා වෙන්නේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කියන එකයි. ඔහු සම්බන්ධයෙන් විනය පරීක්ෂණ තුනක් කරලා තිබෙනවා. මූලික පරීක්ෂණ තුනෙන්ම දීලා තිබෙන නිර්දේශය මම සභාගත කරන්නම්. අවසාන නිර්දේශය සම්බන්ධයෙන් තමයි ඔය කථාව කියන්නේ. නමුත් තාක්ෂණ හැකියාවක් තිබෙනවා, විනය බලධාරියාට විනය සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා. මේ සම්බන්ධයෙන් නිශ්චිත වාර්තා ටිකක් තිබෙනවා. මේක පළාත් සභාවට අදාළයි. ගරු මන්ත්‍රීතුමනි, අපි කොහොමත් එළියේ උසාවි දාලා, දේශපාලනඥයෝ මැදිහත් වෙලා පාසල්වල විනය පරීක්ෂණ කරලා නැහැ. දණ ගස්සන්නේත් නැහැ. ඒක නිසා අපි ඒ නිශ්චිත ක්‍රියාදාමය කරනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඔය දණ ගස්සන කථා නොවෙයි, මේ සම්බන්ධයෙන් උත්තරයක් දෙන්න.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
අපි ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, දැන් පළාත් සභාවක් ක්‍රියාත්මක වෙන්නේත් නැහැ නේ.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
අපි නිශ්චිතව ඒ සම්බන්ධයෙන් හොයා බලන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමට මම භාර දෙනවා, අපේ දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාට. මොකද දන්නවාද? "යන්නේ කොහේද, මල්ලේ පොල්" න්‍යායෙන් පිළිතුරු දෙන නියෝජ්‍ය ඇමතිවරු නේ ඉන්නේ.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු කථානායකතුමනි, අපේ අධ්‍යාපන ඇමතිතුමියට තමයි මම මේ අතුරු ප්‍රශ්නය යොමු කරන්නේ. ළමයි 3,400ක් අධ්‍යාපනය ලබන මාතර මහින්ද රාජපක්ෂ විදුහලට විශිෂ්ට නායකත්වයක් ලබා දෙමින්, SLPS-1 තත්ත්වයේ තිබූ එම පාසල මීට වසර දෙකකට ඉහතදී අධ්‍යාපන පරිපාලන සේවයේ SLEAS-1 තත්ත්වයේ පාසලක් බවට පරිවර්තනය කර දිවයිනේ ප්‍රමුඛතම පාසලක් බවට පත් කළේ ගොඩවෙලගමගේ දූලානි කමල් රේණුකා විදුහල්පතිතුමියයි. එම විදුහල්පතිතුමිය මේ පාසල දියුණු කරන්න විශාල සේවාවක් කරලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ යුගයේ එතුමිය transfer කළාම සියලුම පක්ෂවල මන්ත්‍රීවරු එකතු වෙලා මේ විදුහල්පතිතුමිය රැක ගත්තා. මාතර දිස්ත්‍රික්කයේ මහින්ද රාජපක්ෂ විදුහලේ විදුහල්පතිනිය,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කරුණු ඉදිරිපත් කරන පාසල, මේ ප්‍රධාන ප්‍රශ්නයෙන් පැන නැඟුණු පාසලමද?

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ප්‍රශ්නය අහන්න තමයි හදන්නේ. දැන් ප්‍රශ්නය අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ප්‍රධාන ප්‍රශ්නය යටතේ අහලා තිබෙන පාසල ගැනමද ඔබතුමා ඔය අතුරු ප්‍රශ්නය අහන්නේ?

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මාතර දිස්ත්‍රික්කයේ මහින්ද රාජපක්ෂ විදුහලේ විදුහල්පතිනිය වන ගොඩවෙලගමගේ දුලානි කමල් රේණුකා මහත්මිය 2026 අප්‍රේල් මාසයේ 23වැනි දා හදිසියේම කලාප කාර්යාලයට මාරු කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බස්නාහිර පළාතේ පාසලක් ගැන නේ, ප්‍රධාන ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ලංකාවේ කොහේ තිබුණත් පාසලක ප්‍රශ්නයක් ගැන අහන්න පුළුවන් නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, අතුරු ප්‍රශ්න අහන්න ඕනෑ විධිය ඔබතුමන්ලාට තේරෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, අසන ලද ප්‍රධාන ප්‍රශ්නයෙන් පැන නැඟුණු ප්‍රශ්නයක් නොවෙයි ඔබතුමා ඔය අතුරු ප්‍රශ්නයෙන් අහන්නේ. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කළ ප්‍රධාන ප්‍රශ්නය තිබෙනවා නේ.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඔව්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග හොඳින් කියවන්න. මූලික ප්‍රශ්නය ඇහුවාට පස්සේ ඒ ප්‍රශ්නයට ලබා දුන් පිළිතුරෙන් පැන නඟින ප්‍රශ්නයක් නිරාකරණය කර ගන්න තමයි අතුරු ප්‍රශ්න අහන්න ඕනෑ. මූලික ප්‍රශ්නයෙන් අහන්නේ බස්නාහිර පළාතේ පාසලක් ගැන. නමුත්, ඔබතුමා දැන් අහන්නේ බස්නාහිර පළාතේ පාසලක් ගැන නොවෙයි, දකුණු පළාතේ පාසලක් ගැනයි.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
සියලුම පාසල් මේ විෂයයට නේ අදාළ වෙන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නැහැ.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු කථානායකතුමනි, මට මේ ප්‍රශ්නය යොමු කරන්න ඕනෑ නිසා තමයි මම චාමර සම්පත් මන්ත්‍රීතුමාගෙන් අවස්ථාව ඉල්ලා ගත්තේ. මට විනාඩියක කාලයක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් ඔබතුමා ඔය කාරණය වෙනත් ප්‍රශ්නයක් විධියට ඉදිරිපත් කරන්න. *[බාධා කිරීමක්]* ඔබතුමාට අහන්න පුළුවන්, නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයට අදාළ ප්‍රශ්නයක් විතරයි. *[බාධා කිරීමක්]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 1 -122/2024, ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 31හි සිට ප්‍රශ්න පිළිබඳව සඳහන් වෙනවා. ඒ අනුව පැහැදිලි කර ගැනීමට මට විනාඩියක් දෙන්න. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මේ ගරු සභාවේ ඉන්නවා. ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මුලින්ම කල් ගත්තේ අප්‍රේල් 10වැනි දා. ඒ කියන්නේ, මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට සති දෙකක් කල් ගත්තා, අප්‍රේල් 10වැනි දා. එහෙම කල් ගන්න පුළුවන්.

අපේ ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමා මට මේකට සාධාරණයක් කරන්න. ඔබතුමන්ලා, අපි මේ ගැන සාකච්ඡා කළා නේ. ගරු කථානායකතුමනි, අද තමයි මේ ප්‍රශ්නය නැවත න්‍යාය පත්‍රයට එන්නේ. මේ වනවිට පාර්ලිමේන්තු රැස්වීම් සති 4ක් පවත්වා තිබෙනවා. එදා අපි - පසුපෙළ මන්ත්‍රීවරුන් - මේ ගැන සාකච්ඡා කළා. ප්‍රශ්නයකට දෙවැනි අවස්ථාවේදී පිළිතුරු දීමට කල් ගත්තාම නව ප්‍රශ්නයක් එන්න පුළුවන් අවස්ථාව ගැන අපි ප්‍රශ්න කරනකොට කිව්වා, "ඔව්, එන්න පුළුවන්" කියලා. මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්න අහන්නේ පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරු 54දෙනායි.

ගරු කථානායකතුමනි, අප්‍රේල් 10වැනි දා කල් ගත්තා නම්, අප්‍රේල් 21වැනි දායින් ආරම්භ වන පාර්ලිමේන්තු සතියේ දවස් හතරක් තිබුණා. ඒ දවස් හතරේ ප්‍රශ්න 40ක් පිළිබඳව කථා

[ගරු චමින්ද විජේසිරි මහතා]

වෙනවා. ඊළඟට, මැයි මාසයේ මුල් සතියේ අගමැතිතුමියගෙන් අහන ප්‍රශ්න තිබෙන නිසා එදාට ප්‍රශ්න 5ක් ගත්තොත්, ඒ රැස්වීම් සතියේ ප්‍රශ්න 35ක් ගන්නවා. එතකොට ඔක්කොම ප්‍රශ්න 75යි. එතකොට මන්ත්‍රීවරු 54දෙනා ප්‍රශ්න භාර දුන් අනුපිළිවෙළට තමයි ඒ අවස්ථාව ලැබෙන්න ඕනෑ, ගරු කථානායකතුමනි. ඒ අනුව ප්‍රශ්න 75කට වැඩිය ගිහිල්ලා, අද දිනය ගත්තොත්. ඊයේ දිනයේ තමයි හරි නම් මට අලුත් ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබෙන්න ඕනෑ. ඒ කියන්නේ, දෙවැනි අවස්ථාවේදී පිළිතුරු දෙන්න කල් ගන්න පුළුවන්. ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා කල් ගත්තත් නව ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න පුළුවන් වෙන්න ඕනෑ, මම ඉන්නේ 54වැනියාට නම්. 54වැනියාට නව ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබෙන්න ඕනෑ කියන කාරණය තමයි එදා අපි පැහැදිලි කළේ, ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි. නමුත් මේ අසාධාරණය වෙන විධිය බලන්නකෝ. මට අලුත් ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මොකක්ද මේ ප්‍රශ්නය, ගරු මන්ත්‍රීතුමා?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න කල් ගත්තා. ඒක කමක් නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
කොයි එකටද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අද දින න්‍යාය පත්‍රයේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද පිළිබඳව මම අහලා තිබෙන පළමුවැනි ප්‍රශ්නය. ප්‍රශ්නයකට පිළිතුරු ලබා දෙන්න දෙවැනි වතාවට, තුන්වැනි වතාවට කල් ගන්න පුළුවන්. මම කියන්නේ, මේ ප්‍රශ්න රටාව අනුව මට අලුත් ප්‍රශ්නයක් අහන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ කියන එකයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එතුමා අහන අද න්‍යාය පත්‍රයේ තිබෙන පළමුවැනි ප්‍රශ්නයට පිළිතුර තිබෙනවා. ඔබතුමා ප්‍රශ්නය නැවත අහනවා නම් මට පිළිතුරු ලබා දෙන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
හොඳයි, මම ප්‍රශ්නය අහන්නම්. *[බාධා කිරීමක්]*

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්: නිල වරප්‍රසාද
பாராளுமன்ற உறுப்பினர்கள்: உத்தியோகபூர்வ சிறப்புரிமைகள்
MEMBERS OF PARLIAMENT: OFFICIAL PRIVILEGES

122/2024

**1. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මේ දක්වා හිමි වී තිබූ නිල වරප්‍රසාද කවරේද;

(ii) එම වරප්‍රසාද කප්පාදු කරන්නේද; නොඑසේ නම්, ඉවත් කරන්නේද;

(iii) එසේ නම්, කප්පාදු කරනු ලබන/ඉවත් කරනු ලබන වරප්‍රසාද කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති වරප්‍රසාද සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ නිර්දේශ කවරේද;

(ii) ඊට අදාළ වාර්තා සභාගත කරන්නේද;

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නිල වාහනයක් ලබා දීම සහ ඔවුන්ට පාර්ලිමේන්තු භෝජනාගාරයෙන් ආහාර පාන ලබා දීම සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பாராளுமன்ற உறுப்பினர்களுக்கு இதுவரை உரித்தாகவுள்ள உத்தியோகபூர்வ சிறப்புரிமைகள் யாவை என்பதையும்;

(ii) அச்சிறப்புரிமைகள் குறைக்கப்படுமா; இன்றேல், நீக்கப்படுமா என்பதையும்;

(iii) ஆமெனில், குறைக்கப்படும் / நீக்கப்படும் சிறப்புரிமைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) பாராளுமன்ற உறுப்பினர்களுக்கு வழங்கப் பட்டுள்ள சிறப்புரிமைகள் தொடர்பாக ஆராய்ந்து, அறிக்கை சமர்ப்பிப்பதற்காக நியமிக் கப்பட்ட குழுவின் விதப்புரைகள் யாவை என்பதையும்;

(ii) அதனோடு தொடர்புடைய அறிக்கைகள் சபையில் சமர்ப்பிக்கப்படுமா என்பதையும்;

(iii) பாராளுமன்ற உறுப்பினர்களுக்கு உத்தியோக பூர்வ வாகனமொன்றை வழங்குதல் மற்றும் அவர்களுக்கு பாராளுமன்ற உணவகத்திலிருந்து உணவு, பானங்கள் வழங்குதல் தொடர்பாக அரசாங்கத்தின் கொள்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the official Privileges that the Members of Parliament have been entitled to so far;

(ii) whether the said Privileges are expected to be curtailed or completely abolished; and

(iii) if so, the Privileges that are expected to be curtailed or abolished?

(b) Will she also inform this House -

(i) the recommendations of the Committee appointed to review and report on the Privileges granted to Members of Parliament;

(ii) whether the relevant reports will be tabled; and

(iii) the Government policy regarding the provision of an official vehicle to Members of Parliament and providing them with meals from the Members' Dining Room at the Parliamentary complex?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1. ලිපිද්‍රව්‍ය

2. ආරක්ෂක විදුලි පහන්

3. නිදහස් ගිනි අවි බලපත්‍ර

4. නිදහස් තැපැල් පහසුකම්

5. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන මාදිවෙල නිවාස සංකීර්ණය

6. නුවරඑළිය නිවාඩු නිකේතනය

7. කාර්යාල උපකරණ

8. වෛද්‍ය පහසුකම් සහ ප්‍රථමාධාර -

**<u>පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ</u>**

* පාර්ලිමේන්තු වෛද්‍ය මධ්‍යස්ථානය

* පාර්ලිමේන්තු ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය

* "හෙළ වෙද පුනරුද" ආයුර්වේද වෛද්‍ය විශේෂ සායනය

**<u>පාර්ලිමේන්තු පරිශ්‍රයෙන් පිටත:</u>**

* ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ නේවාසික වෛද්‍ය පහසුකම්

* පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වූ සමූහ රක්ෂණ ක්‍රමය

9. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හදිසි අනතුරු මරණ සඳහා වන්දිය

10. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලය

11. මන්ත්‍රීවරුන් වෙත තීරු බදු රහිත වාහන ආනයන බලපත්‍ර

ලබා දී ඇති ඉහත වරප්‍රසාද පිළිබඳ විස්තර **ඇමුණුම - 1**** මඟින් දක්වා ඇත.

(ii) ඔව්.

(iii) 1. 2026.02.17 දිනැතිව නිකුත් කරන ලද 2026 අංක 5 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනතට අනුව, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනතේ විධිවිධාන ප්‍රකාර, 1982 අංක 1 දරන පනතේ 9 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර හෝ 1990 අංක 47 දරන පනතේ 9 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම ඇති සහ ඉහත සඳහන් විධිවිධාන යටතේ විශ්‍රාම වැටුපක් ලබන යම් තැනැත්තකුට මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සහ එම දිනයට පසුව එම විශ්‍රාම වැටුප ලැබීම නතර විය යුතු බව සඳහන් කර ඇත. (**ඇමුණුම - II**** මඟින් දක්වා ඇත.)

2. තවද, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සමූහ රක්ෂණාවරණය 2025 අගෝස්තු 02 දිනැති අංක අපම/25/1297/821/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව රුපියල් මිලියනයේ (රුපියල් 1,000,000) සිට රුපියල් දෙලක්ෂ පනස් දහස (රුපියල් 250,000) දක්වා රක්ෂණාවරණය අඩු කර ඇත.

3. මන්ත්‍රීවරුන් වෙත ලබා දුන් තීරු බදු රහිත වාහන බලපත්‍ර සම්බන්ධව අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි සහ පවතින රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කරනු ලබයි.

(ආ) (i) මෙම වාර්තාවේ නිර්දේශ සම්බන්ධයෙන් නැවත සමාලෝචනයක් සිදුකොට කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට අදහස් කරයි.

(ii) අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත් පසු සභාගත කළ හැක.

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නිල වාහන ලබා නොදේ.

මන්ත්‍රී භෝජනාගාරය නමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණක් විශේෂ වූ භෝජනාගාරයක් පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ පළමු මාලයේ පිහිටා ඇත. පහත සඳහන් සහන මිල ගණන් මත උදය ආහාරය, දිවා ආහාරය සහ සවස තේ මන්ත්‍රී භෝජන ශාලාවේදී මන්ත්‍රීවරුන්ට සපයනු ලැබේ.

උදය ආහාරය රුපියල් 600.00

දිවා ආහාරය රුපියල් 1200.00

කෙටි ආහාර සමඟ තේ
(දිනකට එක්වරක්) රුපියල් 200.00

තවද, මන්ත්‍රීවරුන්ගේ අමුත්තන්ගේ භෝජනාගාරය සහ මන්ත්‍රීවරුන්ගේ පුද්ගලික භෝජනාගාරය නමින් භෝජනාගාර 02ක් පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටා ඇති අතර, ගරු මන්ත්‍රීවරුන්ගේ සහ ගරු ඇමතිවරුන්ගේ ආරාධිතයන් එක් අයෙකු වෙනුවෙන් දිවා ආහාරය සඳහා රුපියල් 900.00ක් අය කරනු ලබන අතර, පානීය ජලය මිලිලීටර් 500ක් සඳහා රුපියල් 40.00ක් අය කෙරේ.

(ඇ) අදාළ නොවේ.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මම මේ කියන්නේ මට වෙච්ච අසාධාරණයක් ගැන.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2,- *[බාධා කිරීමක්]* දැන් ඔබතුමාගේ ප්‍රශ්නයට අදාළ පිළිතුර සභාගත කළා. ඔය කාරණය සම්බන්ධයෙන් කමිටුව රැස් කරලා පැහැදිලිව පිළිතුරු ලබා දීලා තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මට වෙන අසාධාරණයක් ගැන මම කියන්නේ, ගරු කථානායකතුමනි,

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට අවස්ථාව දෙන්න, ගරු කථානායකතුමනි. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, මම කියන කාරණය අහන්න. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, මම කියන කාරණය අහන්න. ඔබතුමා අසාධාරණයි කියන කාරණාව සම්බන්ධයෙන් කමිටුව රැස් කරලා තීරණයක් ගත්තා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒක තමයි. නමුත්, ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය ගැන සොයා බලනවා, ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීමක්]* ඔය කාරණය ගැන සොයා බලනවා. *[බාධා කිරීමක්]* ඔබතුමා කියන කාරණය ගැන මම සොයා බලනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒක වැරදියි නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියන කාරණය ගැන මම සොයා බලනවා, ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රශ්න අංක 2, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

## "බෝයර්" එළුවන් බෝ කිරීමේ පස් අවුරුදු ව්‍යාපෘතිය: විස්තර
## "BOER" ரக ஆடுகளை இனவிருத்தி செய்யும் ஐந்தாண்டுக் கருத்திட்டம்: விபரம்
## FIVE-YEAR PROJECT TO BREED "BOER" GOATS: DETAILS

209/2024

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Nalin Bandara Jayamaha)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බෝයර් (Boer) වර්ගයේ එළුවන් 250ක් අභිජනනය කර ක්ෂේත්‍රගත කිරීමේ පස් අවුරුදු ව්‍යාපෘතිය, මාතලේ, ඉඹුල්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානයේදී ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ වාර්ෂිකව අභිජනනය කිරීමට අපේක්ෂා කරන ලද එළුවන් සංඛ්‍යාව සහ සත්‍ය වශයෙන්ම අභිජනනය කරන ලද එළුවන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ව්‍යාපෘතියේ ආදායම සහ වියදම අනුව එක් එළුවෙකු වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

(v) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) போயர் (Boer) ரகத்தைச் சார்ந்த 250 ஆடுகளை இனவிருத்தி செய்து பகிர்ந்தளிப்பதற்காக வகுக்கப்பட்ட ஐந்தாண்டுக் கருத்திட்டம், மாத்தளை, இம்புல்தண்ட ஆடுகள் இனவிருத்தி நிலையத்தில் எத்திகதியில் ஆரம்பிக்கப்பட்டது என்பதையும்;

(ii) இன்றளவில் மேற்படி கருத்திட்டத்துக்காகச் செலவிடப்பட்டுள்ள நிதி எவ்வளவு என்பதையும்;

(iii) அக்கருத்திட்டத்தின்கீழ் வருடாந்தம் இனவிருத்தி செய்வதற்கு உத்தேசிக்கப்பட்ட ஆடுகளின் எண்ணிக்கை மற்றும் உண்மையில் இனவிருத்தி செய்யப்பட்ட ஆடுகளின் எண்ணிக்கை என்பன ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iv) அக்கருத்திட்டத்தின் ஊடாக ஈட்டிய வருமானம் மற்றும் ஏற்பட்ட செலவுகள் என்பவற்றுக்கு அமைவாக ஒவ்வோர் ஆட்டுக்காகவும் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;

(v) மேற்படி கருத்திட்டம் தொடர்பாக எதிர்காலத்தில் மேற்கொள்ளப்படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the date on which the five-year project to breed 250 Boer goats and distribute them in the field was initiated at the Imbuldanda Goat Breeding Centre in Matale;

(ii) the amount of money that has been spent so far on the said project;

(iii) the number of goats that were expected to be bred annually under the said project and the number of goats that have actually been bred in each year, separately;

(iv) the amount spent per goat in terms of the income and the expenditure of the said project; and

(v) the future action that will be taken regarding the project concerned?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)

(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) 2017.10.08 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2019.04.04 දින එළුවන් ආනයනය කර මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

(ii)

| ව්‍යාපෘතිය සඳහා වැය කළ මුදල (2019-2025) | |
|---|---|
| වර්ෂය | වියදම (රු.) |
| 2019 | 48,453,413.90 |
| 2020 | 3,718,697.75 |
| 2021 | 9,982,712.20 |
| 2022 | 4,924,090.01 |
| 2023 | 4,636,533.65 |
| 2024 | 2,838,926.52 |
| 2025 | 1,669,299.47 |
| එකතුව | 76,223,673.50 |

(iii) අභිජනනය කළ එළුවන් පිළිබඳ තොරතුරු

| විස්තරය | වර්ෂය | | |
|---|---|---|---|
| | 2020 | 2021 | 2022 |
| ඉලක්කගත උපත් ප්‍රමාණය | 120 | 100 | 80 |
| සත්‍ය උපත් ප්‍රමාණය | 163 | 75 | 57 |

(iv) එක් එළුවෙකු වෙනුවෙන් වැය කළ මුදල ආසන්න වශයෙන් රුපියල් 376,414.00කි.

(v) මෙම එළුවන්ට CAE - Caprine Arthritis Encephalitis - රෝගය වැළඳී ඇති බව රසායනාගාර පරීක්ෂාවන්ගෙන් තහවුරු වූ බැවින් නීරෝගී එළු ගහනයට CAE රෝගය ප්‍රචාරණය වීම වළක්වා ගැනීම සඳහා විශේෂඥ කමිටු නිර්දේශය අනුව මහෙස්ත්‍රාත් අධිකරණ නියෝග ප්‍රකාරව ඉඹුලන්දණ්ඩ ගොවිපළේ සිටින සියලුම බෝයර් වර්ගයට අයත් එළුවන් සම්මත ක්‍රමවේදයක් යටතේ 2025.09.09 දින ඝාතනය කර බැහැර කරන ලදී.

(ආ) පැන නොනඟී.

## 2024 ජනාධිපතිවරණයෙන් පසු ලබාගත් ණය: විස්තර

2024 சனாதிபதித் தேர்தலின் பின்னர் பெறப்பட்ட கடன்கள்: விபரம்

LOANS OBTAINED AFTER PRESIDENTIAL ELECTION, 2024: DETAILS

598/2025

**5. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Dayasiri Jayasekara, Attorney at Law)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024 ජනාධිපතිවරණයෙන් පසුව මේ දක්වා කාලය තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් හැර රජය විසින් ලබාගෙන ඇති සම්පූර්ණ ණය මුදල කොපමණද;

(ii) එම ණය ලබාගෙන ඇති රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එක් එක් රටෙන් ලබාගෙන ඇති ණය මුදල සහ අදාළ පොලී ප්‍රතිශතය;

(ii) ණය මුදල් ලබාගැනීමට අදාළ හේතු;

(iii) ණය වාරික ගෙවීම ආරම්භ වන දිනය සහ ගෙවා අවසන් කිරීමට නියමිත දින;

ණය ලබා ගත් එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024 சனாதிபதித் தேர்தலின் பின்னரான காலப்பகுதியில் இற்றைவரை சர்வதேச நாணய நிதியத்தை விடுத்து, அரசாங்கம் பெற்றுக் கொண்டுள்ள மொத்தக் கடன் தொகை எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி கடன் பெறப்பட்டுள்ள நாடுகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) ஒவ்வொரு நாட்டிலிருந்தும் பெற்றுக் கொண்டுள்ள கடன் தொகை மற்றும் அதற்குரிய வட்டி வீதம்;

(ii) கடனைப் பெற்றுக்கொண்டதற்கான காரணங்கள்;

(iii) கடன் தவணை செலுத்துதல் ஆரம்பமாகும் திகதி மற்றும் செலுத்தி முடிக்கவிருக்கும் திகதி;

ஆகிய விபரங்கள் கடனைப் பெற்றுக்கொண்ட நாடுகளின் வாரியாக வெவ்வேறாக யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the total amount of loans obtained by the Government since the 2024 Presidential Election up to now, excluding the facility provided by the International Monetary Fund; and

(ii) the names of the countries from which aforesaid loans were obtained?

(b) Will he also inform this House, separately in respect of each country from which the loans were obtained -

(i) the amount of loans obtained and the applicable interest rate;

(ii) the reasons for obtaining the loans; and

(iii) the date on which the repayment of the loan instalments will be commenced and the scheduled date for the completion of the loan repayment?

(c) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2024 ජනාධිපතිවරණයේ සිට 2026.05.05 දක්වා කාලය තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් හැර රජය විසින් ලබාගෙන ඇති සම්පූර්ණ ණය මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 1,854.77ක් වේ. එම මුදල තුළ අන්තර්ගතව ඇත්තේ 2024 වර්ෂයේ ජනාධිපතිවරණයට පෙර ගිවිසුම්ගත වූ ව්‍යාපෘති 18කට අදාළව 2024 ජනාධිපතිවරණයෙන් පසු ප්‍රතිලාභී වූ ණය මුදල් වන අතර එහි බහුපාර්ශ්වික ණය ඇමෙරිකානු ඩොලර් මිලියන 1,752.46ක් සහ ද්විපාර්ශ්වික ණය ඇමෙරිකානු ඩොලර් මිලියන 102.31ක් ඇතුළත් වේ.

(ii)

| ණය දෙන ආයතනය/රට | මෙම කාලය තුළ ලබාගත් ණය මුදල (ප්‍රතිලාභී) (ඇමෙරිකානු ඩොලර් මිලියන) |
|---|---|
| ද්විපාර්ශ්වික | **102.31** |
| ජපානය (Government of Japan) | 46.37 |
| කොරියාව (Government of the Republic of Korea) | 3.49 |
| සෞදි අරාබිය (Saudi Fund For Arab Economic Development) | 28.35 |
| නෙදර්ලන්තය (Co-op Centrale Raiffeisen) | 3.46 |
| ඉන්දියාව (Export Import Bank of India) | 20.64 |
| බහුපාර්ශ්වික | **1,752.46** |
| එකතුව | **1,854.77** |

(ආ) (i), (ii), (iii) (මෙම ප්‍රශ්නවලට පිළිතුරු පහත වගුවේ දක්වා ඇත.)

(ඇ) පැන නොනඟී.

| ණය දෙන ආයතනය/රට | විස්තරය - මෙම ණය මුදල පහත ව්‍යාපෘති මූල්‍යනය කිරීම සඳහා ලබාගෙන ඇත. | කාලසීමාව තුළ ප්‍රතිලාභිවූ වටිනාකම (ඇමරිකානු ඩොලර් මිලියන) | පොලී අනුපාතය | ගෙවීම ආරම්භක දිනය | ගෙවීම අවසන් දිනය |
|---|---|---|---|---|---|
| නෙදර්ලන්තයේ මූල්‍ය ආධාර ඇතිව ග්‍රාමීය පාලම් ඉදිකිරීම සඳහා මධ්‍යම රයිෆයිසන් (නෙදර්ලන්තය) සහයෝගීතාවය | ග්‍රාමීය පාලම් ඉදිකිරීම | 3.47 | EURIBOR - මාස 06 | 2019 ඔක්තෝබර් 10 | 2034 ජනවාරි 05 |
| *එකතුව* | | *3.47* | | | |
| ඉන්දියානු අපනයන ආනයන බැංකුව | දුම්රිය අංශයේ සංවර්ධනය සඳහා ණය පහසුකම | 20.64 | 1.75% | 2017 ජූනි 06 | 2039 සැප්තැම්බර් 28 |
| *එකතුව* | | *20.64* | | | |

| ණය දෙන ආයතනය/රට | විස්තරය - මෙම ණය මුදල පහත ව්‍යාපෘති මූල්‍යකරණය කිරීම සඳහා ලබාගෙන ඇත. | කාලසීමාව තුළ ප්‍රතිලාභිව වට්නාකම (ඇමරිකානු ඩොලර් මිලියන) | පොලී අනුපාතය | ගෙවීම ආරම්භක දිනය | ගෙවීම අවසන් දිනය |
|---|---|---|---|---|---|
| ජපාන රජය | මහනුවර නගරයේ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 1.41 | 0.65% | 2010 මාර්තු 26 | 2050 මාර්තු 20 |
| | කඹරණ-වෙයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය | 3.29 | 0.30% | 2012 මාර්තු 28 | 2052 මාර්තු 20 |
| | අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (අදියර I) | 2.65 | 1.40% | 2013 මාර්තු 14 | 2038 මාර්තු 20 |
| | කැළණි ගඟෙහි නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 5.11 | 0.10% | 2014 මාර්තු 28 | 2054 මාර්තු 20 |
| | රූපවාහිනී විකාශන ඩිජිටල්කරණ ව්‍යාපෘතිය | 2.13 | 0.10% | 2014 සැප්තැම්බර් 23 | 2054 සැප්තැම්බර් 20 |
| | ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 17.20 | 0.30% | 2015 අගෝස්තු 11 | 2055 අගෝස්තු 20 |
| | අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (අදියර II) | 0.04 | 1.40% | 2016 නොවැම්බර් 17 | 2041 නොවැම්බර් 20 |
| | නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 13.90 | 1.40% | 2017 ජූලි 07 | 2042 ජූලි 20 |
| | කළු ගඟ ජල සම්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතිය (I) | 0.31 | 1.40% | 2017 ජූලි 07 | 2043 ජනවාරි 20 |
| | සෞඛ්‍ය සහ වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 0.32 | 0.10% | 2018 ජූලි 11 | 2058 අගෝස්තු 20 |
| | කොළඹ ඇතුළු දුම්රිය සංක්‍රමණ පද්ධතියක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 0.00033 | 0.10% | 2019 මාර්තු 11 | 2058 නොවැම්බර් 20 |
| එකතුව | | 46.36 | | | |
| කොරියානු රජය | රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය | 3.49 | 0.15% | 2014 දෙසැම්බර් 30 | 2054 දෙසැම්බර් 20 |
| එකතුව | | 3.49 | | | |
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල | මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (සෞදි අරමුදලින්) | 0.38 | 2% | 2012 ඔක්තෝබර් 30 | 2032 අගෝස්තු 15 |
| | පේරාදෙණිය - බදුල්ල - චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 5.65 | 2% | 2015 ඔක්තෝබර් 30 | 2040 අගෝස්තු 15 |
| | වයඹ විශ්වවිද්‍යාල නගරාශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිය | 4.32 | 2% | 2017 ඔක්තෝබර් 24 | 2043 අප්‍රේල් 30 |
| | සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 18.00 | 2% | 2019 සැප්තැම්බර් 18 | 2044 අප්‍රේල් 30 |
| එකතුව | | 28.35 | | | |
| එකතුව | | 102.31 | | | |

*සටහන්:*

1. EURIBOR - යුරෝ අන්තර් බැංකු පිරිනමන අනුපාතය
2. සලකා බලන ලද කාල සීමාව: 2024.09.23 සිට 2026.05.05 දක්වා

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සතු ගබඩා: නවීකරණය

### உணவு ஆணையாளர் திணைக்களத்துக்குச் சொந்தமான களஞ்சியசாலைகள்: நவீனமயப்படுத்தல்

### WAREHOUSES OWNED BY DEPARTMENT OF FOOD COMMISSIONER: MODERNIZATION

655/2025

**7. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹண பண்டார சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rohana Bandara)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සතු ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iii) එම එක් එක් ගබඩාවේ ධාරිතාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත ගබඩා අතරින් 2020 වර්ෂයෙන් පසු නවීකරණය කරන ලද ගබඩා සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(v) එම නවීකරණ කටයුතු සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(vi) එම ගබඩා නවීකරණය කිරීමේ අරමුණු කවරේද;

(vii) එම නවීකරණ කටයුතු පිළිබඳව විගණන වාර්තාවේ දැක්වෙන කරුණු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உணவு ஆணையாளர் திணைக்களத்துக்குச் சொந்தமான களஞ்சியசாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவை அமைந்துள்ள இடங்கள் யாவை என்பதையும்;

(iii) அத்தகைய களஞ்சியசாலை ஒவ்வொன்றினதும் கொள்ளளவு வெவ்வேறாக யாது என்பதையும்;

(iv) மேற்படி களஞ்சியசாலைகளில் 2020ஆம் ஆண்டின் பின்னர் நவீனமயப்படுத்தப்பட்ட களஞ்சியசாலைகளின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;

(v) மேற்படி நவீனமயப்படுத்தலுக்காகச் செலவிட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்;

(vi) மேற்படி களஞ்சியசாலைகளை நவீனமயப்படுத்தியதன் நோக்கங்கள் யாவை என்பதையும்;

(vii) அந்த நவீனமயப்படுத்தல் சம்பந்தமாக கணக்காய்வு அறிக்கையில் சுட்டிக்காட்டப்பட்டுள்ள விடயங்கள் தொடர்பில் எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) the number of warehouses owned by the Department of Food Commissioner;

(ii) the places in which they are located;

(iii) the capacity of each warehouse, separately;

(iv) the number of warehouses modernized after the year 2020, out of the above warehouses and their names;

(v) the amount of money spent on the said modernization;

(vi) the objectives of modernization of those warehouses; and

(vii) the actions taken regarding the matters mentioned in the audit report regarding the said modernization?

(b) If not, why?

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)

(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 103කි.

(ii), (iii)

| අංකය | ගබඩා පිහිටි ස්ථානයේ නම | ගබඩාව | ධාරිතාවය (මෙට්‍රික් ටොන්) |
|---|---|---|---|
| 1 | ඔරුගොඩවත්ත | ඔරුගොඩවත්ත - 01 | 4000 |
| 2 | | ඔරුගොඩවත්ත - 02 | 4000 |
| 3 | | ඔරුගොඩවත්ත - 03 | 4000 |
| 4 | | ඔරුගොඩවත්ත - 04 | 5000 |
| 5 | | ඔරුගොඩවත්ත - 05 | 4500 |
| 6 | | ඔරුගොඩවත්ත - 06 | 5000 |
| 7 | | ඔරුගොඩවත්ත - 07 | 5000 |
| 8 | | ඔරුගොඩවත්ත - 08 | 3750 |
| 9 | | ඔරුගොඩවත්ත - 09 | 3750 |
| 10 | | ඔරුගොඩවත්ත - 10 | 3300 |
| 11 | | ඔරුගොඩවත්ත - 12 | 3800 |
| 12 | | ඔරුගොඩවත්ත 14 | 3600 |
| 13 | | ඔරුගොඩවත්ත 15 | 2150 |
| 14 | | ඔරුගොඩවත්ත 16 | 2150 |
| 15 | රත්මලාන | රත්මලාන 05 | 4000 |
| 16 | | රත්මලාන 04 | 4000 |
| 17 | | රත්මලාන 03 | 7520 |
| 18 | වැල්ලවත්ත | වැල්ලවත්ත 01 | 2000 |
| 19 | | වැල්ලවත්ත 02 | 2000 |
| 20 | | වැල්ලවත්ත 03 | 2000 |
| 21 | වේයන්ගොඩ | වේයන්ගොඩ 01 | 5000 |
| 22 | | වේයන්ගොඩ 02 | 4000 |
| 23 | | වේයන්ගොඩ 03 | 1200 |
| 24 | | වේයන්ගොඩ 04 | 900 |
| 25 | | වේයන්ගොඩ 05 | 900 |
| 26 | | වේයන්ගොඩ 06 | 1400 |
| 27 | | වේයන්ගොඩ 07 | 5400 |

| | | | |
|---|---|---|---|
| 28 | | වෙයන්ගොඩ 08 | 5400 |
| 29 | | වෙයන්ගොඩ 09 | 5400 |
| 30 | | වෙයන්ගොඩ 10 | 5400 |
| 31 | | වෙයන්ගොඩ 11 | 6200 |
| 32 | | වෙයන්ගොඩ 13 | 4700 |
| 33 | | වෙයන්ගොඩ 16 | 1200 |
| 34 | | වෙයන්ගොඩ 17 | 1200 |
| 35 | පුත්තලම | පුත්තලම 01 | 600 |
| 36 | | පුත්තලම 02 | 1200 |
| 37 | මල්කඩුවාව | මල්කඩුවාව 01 | 2000 |
| 38 | | මල්කඩුවාව 02 | 2000 |
| 39 | ගැටවුවාන | ගැටවුවාන 02 | 2000 |
| 40 | | ගැටවුවාන 03 | 1000 |
| 41 | | ගැටවුවාන 04 | 2000 |
| 42 | | ගැටවුවාන 05 | 1000 |
| 43 | මල්කඩුවාව | මල්කඩුවාව GI | 2000 |
| 44 | මහව | මහව 01 | 800 |
| 45 | | මහව 02 | 1300 |
| 46 | යාපනය | නාවක්කුලිය | 4000 |
| 47 | | මුරුක්කන් | 1500 |
| 48 | වව්නියාව | වව්නියාව 01 | 775 |
| 49 | | වව්නියාව 02 | 165 |
| 50 | | වව්නියාව 03 | 160 |
| 51 | අනුරාධපුරය | සේනානායක 01 | 2880 |
| 52 | | සේනානායක 02 | 390 |
| 53 | | සේනානායක 03 | 390 |
| 54 | | සේනානායක 04 | 2400 |
| 55 | | ශ්‍රාවස්තිපුර 01 | 4200 |
| 56 | | ශ්‍රාවස්තිපුර 02 | 4200 |
| 57 | | කැකිරාව 01 | 1275 |
| 58 | | කැකිරාව 02 | 1275 |
| 59 | | කැකිරාව 03 | 1275 |
| 60 | පොළොන්නරුව | කදුරුවෙල 01 | 2880 |
| 61 | | කදුරුවෙල 02 | 3200 |
| 62 | | හිගුරක්ගොඩ 01 | 4400 |
| 63 | | හිගුරක්ගොඩ 02 | 4400 |
| 64 | නුවරඑළිය | බලැක්පූල් 01 | 280 |
| 65 | | බලැක්පූල් 02 | 150 |
| 66 | | බලැක්පූල් 03 | 435 |
| 67 | මාතලේ | මාතලේ 01 | 3000 |
| 68 | කටුගස්තොට | කටුගස්තොට | 1700 |
| 69 | පරගම්මන | පරගම්මන 01 | 1500 |
| 70 | | පරගම්මන 02 | 1500 |
| 71 | | පරගම්මන 03 | 350 |
| 72 | රත්නපුර | රත්නපුර | 1800 |
| 73 | ඹපනායක | ඹපනායක 01 | 1335 |
| 74 | ඇහැලියගොඩ | ඇහැලියගොඩ 01 | 435 |
| 75 | | ඇහැලියගොඩ 02 | 435 |
| 76 | | ඇහැලියගොඩ 03 | 900 |
| 77 | කහවත්ත | කහවත්ත | 590 |
| 78 | ඹපනායක | ඹපනායක 02 | 850 |
| 79 | මඩකළපුව | මඩකළපුව 01 | 6000 |
| 80 | | මඩකළපුව 02 | 6000 |
| 81 | | මඩකළපුව 03 | 6000 |
| 82 | | මඩකළපුව 04 | 2880 |
| 83 | අම්පාර | අම්පාර 01 | 2125 |
| 84 | | අම්පාර 02 | 2125 |
| 85 | හපුතලේ | හපුතලේ 01 | 130 |
| 86 | | හපුතලේ 02 | 120 |
| 87 | බදුල්ල | බදුල්ල 01 | 1380 |
| 88 | | බදුල්ල 02 | 1500 |
| 89 | මොණරාගල | මොණරාගල 01 | 3150 |
| 90 | | මොණරාගල 02 | 1250 |
| 91 | බුත්ත | බුත්ත 01 | 3750 |
| 92 | | බුත්ත 02 | 3750 |
| 93 | කටුගොඩ | කටුගොඩ 01 | 3825 |
| 94 | | කටුගොඩ 02 | 1775 |
| 95 | වැලිගම | වැලිගම | 1300 |
| 96 | මැද්දවත්ත | මැද්දවත්ත 01 | 965 |
| 97 | | මැද්දවත්ත 02 | 2000 |
| 98 | කහදාව | කහදාව නව | 1900 |
| 99 | | කහදාව -01 පැරණි | 1900 |
| 100 | හම්බන්තොට | හම්බන්තොට | 4500 |
| 101 | වීරවිල | වීරවිල 01 | 1700 |
| 102 | | වීරවිල 02 | 1700 |
| 103 | | වීරවිල 03 | 1500 |

(iv) 3කි.

හම්බන්තොට ගබඩාව, මඩකලපුව මන්මුනයි උතුර ගබඩාව, ඔරුගොඩවත්ත 06 ගබඩාව

(v)

| | | |
|---|---|---|
| හම්බන්තොට ගබඩාව | රු. මිලියන | 14.915 |
| මඩකලපුව මන්මුනයි උතුර ගබඩාව | රු. මිලියන | 21.79 |
| ඔරුගොඩවත්ත 06 ගබඩාව | රු. මිලියන | 36.95 |
| | රු. මිලියන | 73.655 |

ඔරුගොඩවත්ත 06 ගබඩාව ලෝක ආහාර වැඩසටහනේ අරමුදල් මඟින් ප්‍රතිසංස්කරණය කරන ලදී.

(vi) මෙම ගබඩා මේ වන විට වී අලෙවි මණ්ඩලය, ලංකා සතොස සහ ලෝක ආහාර වැඩසටහන මඟින් භාවිතයට ගනු ලබන අතර එම ගබඩා භාවිතයට සුදුසු තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා නවීකරණ කටයුතු සිදු කර ඇත.

(vii) 2020 වර්ෂයෙන් පසු සිදු කරන ලද අලුත්වැඩියාවන් සම්බන්ධව විගණන විමසුම් ඉදිරිපත් වී නොමැති අතර, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ, 2011-2019 අතර කාල සීමාවේදී වෙයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ මෙට්‍රික් ටොන් 34,300ක ගබඩා ධාරිතාවක් සහිත විද්‍යාත්මක ගබඩා 06ක් රුපියල් මිලියන 296ක් වැය කරමින් දෙපාර්තමේන්තුව විසින් අලුත්වැඩියා කර ඇති බව දක්වා ඇති අතර එම ගබඩා ඌන උපයෝජනය පිළිබඳ විමසීම් සිදු කර ඇත. ඒ අනුව මේ වන විට ඉන් ගබඩා 03ක් වෛද්‍ය සැපයුම් අංශය විසින් භාවිත කරනු ලබන අතර අනෙකුත් ගබඩා ලෝක ආහාර වැඩසටහනේ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීමටත් භාවිත කරනු ලබයි.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට පොඩි වේලාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ කාරණය සම්බන්ධයෙන් සොයා බලා මම ඔබතුමාට පිළිතුර ලබා දෙන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි,- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන සොයා බලන්නම්, ගරු මන්ත්‍රීතුමා.

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## උසස් අධිකරණවල විනිසුරුවරුන්ගේ විශ්‍රාම යාමේ වයස
### மேனிலை நீதிமன்ற நீதிபதிகளின் ஓய்வுபெறும் வயது
### RETIREMENT AGE OF JUDGES OF SUPERIOR COURTS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු ඉහළ අධිකරණවල විනිසුරුවන්ගේ විශ්‍රාම වයස ඉහළ නැංවීම සම්බන්ධයෙන් රට තුළ බරපතළ සංවාදයක් මතුව තිබේ. විශේෂයෙන්ම, ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් ද මෙහිදී අධිකරණ ස්වාධීනත්වය, නීතියේ ආධිපත්‍යය සහ මහජන විශ්වාසය පිළිබඳ ගැඹුරු අවධානයක් යොමු කළ යුතු බව අවධාරණය කර ඇත. එබැවින්, ජාතික වැදගත්කමකින් යුතු මෙම කාරණය සම්බන්ධයෙන් පහත ප්‍රශ්න සඳහා නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙමි.

01. ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස සංශෝධනය කිරීම සඳහා රජය විසින් යෝජනාවක් හෝ නීති සංශෝධනයක් ගෙන ඒමට කටයුතු කරමින් සිටින්නේ ද? එසේ නම්, එයට පදනම් වූ නිල අවශ්‍යතා තක්සේරුවක් - needs assessment, ප්‍රතිපත්ති වාර්තාවක් හෝ දත්තමය අධ්‍යයනයන් මොනවාද? ඒවා සභාගත කරන්නේ ද?

02. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණයේ විනිසුරුවන්ගේ සංඛ්‍යාව දැනටමත් වැඩි කර තිබියදී තවදුරටත් විශ්‍රාම වයස ඉහළ දැමීමේ අවශ්‍යතාව රජය විසින් සාධාරණීකරණය කරන්නේ කෙසේද?

03. දැනට සේවයේ නිරත විනිසුරුවන්ගේ සේවා කාලය සැලසුමකින් තොරව දීර්ඝ කිරීම, විනිසුරුවරුන්ගේ ගෞරවයට ද, අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් මහජන විශ්වාසයට අහිතකර බලපෑමක් එල්ල කළ හැකි බව ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් ජනාධිපතිවරයා වෙත 2026.05.25 දිනැතිව දන්වා ඇති පසුබිමක් තුළ ඒ සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශයේ නිල ස්ථාවරය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

04. මෙම යෝජනාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමය, අධිකරණ සේවා කොමිෂන් සභාව හෝ නීති ක්ෂේත්‍රයේ වෙනත් වෘත්තීමය පාර්ශ්ව සමඟ විධිමත් උපදේශන ක්‍රියාවලියක් සිදු කර තිබේද? එසේ නොමැති නම්, ජාතික වැදගත්කමක් ඇති ව්‍යවස්ථාමය සංශෝධනයක් එවැනි උපදේශනයකින් තොරව ඉදිරිපත් කරන්නේ කෙසේද?

05. අධිකරණ පද්ධතියේ ප්‍රමුඛ ගැටලු ලෙස නඩු ප්‍රමාදය, නඩු ගොඩ ගැසීම - backlog - විනිසුරු හිඟය සහ ජනතාවට සාධාරණය ප්‍රමාද වීම පිළිබඳව බරපතළ අර්බුදයක් නිර්මාණය වී තිබෙන අවස්ථාවක ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු ධුර 04ක් සහ අභියාචනාධිකරණයේ විනිසුරු ධුර 04ක් දීර්ඝ කාලයක් පුරප්පාඩුව පැවතීමට හේතුව කුමක්ද?

06. එවැනි පුරප්පාඩු කඩිනමින් පිරවීම වෙනුවට විනිසුරුවන්ගේ විශ්‍රාම වයස ඉහළ නැංවීම රජයේ ප්‍රමුඛතාවක් වී ඇත්තේ කුමන ජාතික අවශ්‍යතාවක් මතද?

07. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම මඟින් අනාගත ආණ්ඩුවලට ද තමන්ගේ දේශපාලන අවශ්‍යතා අනුව විටින් විට අධිකරණ ව්‍යුහය වෙනස් කිරීම සඳහා වන පූර්වාදර්ශයක්; භයංකාර පූර්වාදර්ශයක් - dangerous precedent එකක් - නිර්මාණය නොවන්නේ ද?

08. අධිකරණයේ ස්වාධීනත්වය, අපක්ෂපාතීභාවය සහ මහජන විශ්වාසය ආරක්ෂා කිරීම අධිකරණ අමාත්‍යාංශයේ වගකීමක් නම්, මෙම යෝජනාව හේතුවෙන් මතුව ඇති මහජන සැකය හා විවේචන දුරු කරලීම සඳහා රජය ගන්නා නිශ්චිත පියවර කවරේද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු විපක්ෂ නායකතුමා විසින් අද දින ඉදිරිපත් කරන ලද පැනයට දැනට දවස් දෙකකට කලින් අපේ කැබිනට් මාධ්‍ය ප්‍රකාශක, ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා උත්තරයක් දීලා තිබෙනවා. මම ඒ උත්තරයම නැවත පැහැදිලි කරන්නම්.

මූලික වශයෙන්, මේ වන විට නොයෙකුත් වෘත්තිකයන් - නීතිඥ සංගමය, වෙනත් වෘත්තිකයන් - ආණ්ඩුව වෙත කරුණු සැල කරමින් ඉන්නවා. ඒ, ශ්‍රේෂ්ඨාධිකරණ හෝ අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යාමේ වයස් සීමාව වැඩි කිරීම සඳහා පමණක් නොවෙයි, වෙනත් වෘත්තීන්ට අදාළවද එවැනි ඉල්ලීම් රාශියක් ලැබී තිබෙනවා. ඒ ඉල්ලීම්වලට හේතු විවිධාකාරයි. කොහෙන් ඉල්ලීම් ආවත් ඒවා සාධනීයව සලකා බලන එක තමයි ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය වගකීම වෙන්නේ. අපි මේ වන විටත් තිබෙන යෝජනා අනුව, ඒවා සලකා බලමින් ඉන්නවා. මෙහිදී නොයෙකුත් හේතු මත ඔවුන් ඉල්ලීම් කරනවා. ඒ කියන්නේ, ආයු අපේක්ෂාව වැඩි වීම, සෞඛ්‍ය සේවාවල වර්ධනය හා ආයු අපේක්ෂාවේ වර්ධනය, ආයතනික වශයෙන් වෘත්තිය විශේෂඥභාවයේ අවශ්‍යතාව, ආර්ථික හා ජන විකාශනය වෙනස් වීම වැනි කාරණා.

අපි යම් විදේශ රටවල් අරගෙන බැලුවොත්, එංගලන්තයේ - United Kingdomවල - විනිසුරුවන්ගේ විශ්‍රාම යාමේ වයස අවුරුදු 75යි; කැනඩාවේ Federal Court එක සහ Supreme Court එක ගත්තොත්, අවුරුදු 75යි; ඕස්ට්‍රේලියාවේ Federal Court එක ගත්තොත්, අවුරුදු 70යි; බ්‍රසීලය වාගේ රටක් ගත්තොත්, අවුරුදු

75යි; ජර්මනිය වාගේ රටක් ගත්තොත්, විශේෂයෙන්ම Federal Constitutional Court එකේ, අවුරුදු 68ක් දක්වා තිබෙනවා. ඒ නිසා විනිසුරුවන්ගේ සහ අධිකරණ නිලධාරින්ගේ සේවා කාලය, විශ්‍රාම යන වයස දීර්ඝ කිරීම සම්බන්ධයෙන් එය තහවුරු කරමින්, එය හොඳ පියවරක් බවටත් කරුණු ආණ්ඩුව වෙත ඉදිරිපත් වෙමින් පවතිනවා. ඒ වාගේම ගරු විපක්ෂ නායකතුමා කියපු ආකාරයට මේ හරහා යම් අයුක්තියක්, අසාධාරණයක්, යුක්තිය ඉෂ්ට කිරීමට බාධාවක්, අධිකරණයේ ස්වාධීනත්වයට බාධාවක් වෙයි කියලාත් කරුණු දෙපාර්ශ්වයක් විසින් ඉදිරිපත් කරමින් සිටිනවා. ඒ සියලු කරුණු අපි සලකා බලනවා. නමුත් මේ දක්වා, මෙලෙස විශ්‍රාම වයස දීර්ඝ කිරීම සඳහා නිල වශයෙන් කැබිනට් තීන්දුවක් අරගෙන නැහැ. එහෙම දීර්ඝ කරනවා නම් කොහොමද කරන්නේ, මොන ක්‍රමයක් යටතේද කරන්නේ යන කිසිවක් තීන්දු කරලා නැහැ. හැබැයි මේ වන විට වෘත්තිකයන් රාශියක් නොයෙකුත් ආකාරයෙන් කරුණු දක්වමින් සිටිනවා. සමහර ඒවා සාධනීයයි. සමහර ඒවා දේශපාලනිකයි. නමුත් ඒ හැමදේම අපි සලකා බලනවා.

ඒ අනුව ගරු විපක්ෂ නායකතුමනි, රජය එසේ නිල වශයෙන් තීන්දුවක් ගෙන නොමැති බැවින් සහ ඔබ විසින් ඉදිරිපත් කරන ලද අනෙකුත් ප්‍රශ්න උද්ගත වන්නේ නැති බැවින් මම මාගේ උත්තරය එලෙස කෙටියෙන් අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, පැහැදිලි කර ගැනීමකට ඔබතුමාට අවස්ථාව තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, කරුණු පැහැදිලි කර ගැනීමකට ඉස්සෙල්ලා කියන්න ඕනෑ, එම ප්‍රශ්නය මඟින් මා අහපු තවත් ප්‍රශ්න ගණනාවක් තිබෙන බව. මම ගරු අමාත්‍යතුමාට යෝජනා කරනවා, ඒවාට උත්තර දෙන්න කියලා. ගරු අමාත්‍යතුමනි, ඒ ප්‍රශ්නය සම්පූර්ණයෙන් ගත් කල මම ඒ යටතේ ඔබතුමාට ප්‍රශ්න 8ක් ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඔව්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නමුත් ඔබතුමා ඒවාට බොහොම සරල උත්තරයක් දීලා අවසන් කරලා තිබෙනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඔව්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මෙවැනි පියවරක් ගන්නේ නැහැ කියලා ඔබතුමා පිළිතුර එතැනින්ම අවසන් කර තිබෙනවා. හැබැයි මා ඉදිරිපත් කරපු 5 වැනි ප්‍රශ්නයට ඔබතුමා උත්තරයක් ලබා දුන්නේ නැහැ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
සමාවෙන්න. උත්තරය ලබා දෙන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒකෙන් පැහැදිලිව අසා තිබෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු ධුර 4ක් සහ අභියාචනාධිකරණයේ විනිසුරු ධුර 4ක් දීර්ඝ කාලීනව පුරප්පාඩුව පවත්වාගෙන යන්නේ ඇයි කියන එක. ඒකට ඔබතුමා උත්තරයක් දුන්නේ නැහැ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඒකට දැන් උත්තරයක් දෙන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ ප්‍රශ්න 8ම පරිශීලනය කරලා ඒ 8ටම මට උත්තරයක් දෙන්න කියලා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ප්‍රශ්න 8ම පරිශීලනය කළා, ගරු විපක්ෂ නායකතුමනි. නමුත් ඔබතුමා දැන් ඉස්මතු කරපු 5 වැනි ප්‍රශ්නයට මම උත්තරයක් දෙන්නම්. අනෙක් ප්‍රශ්න සියල්ලම පැන නඟින්නේ පළමුවැනි ප්‍රශ්නය මතයි, ගරු විපක්ෂ නායකතුමනි. පළමුවැනි ප්‍රශ්නයට උත්තරය විධියට "ඔව්" කියලා මා කිව්වා නම්, මේ ප්‍රශ්න 8ටම මම වෙන් වෙන් වශයෙන් උත්තර දෙන්න ඕනෑ. නමුත් ඒක පැන නඟින්නේ නැහැ. ඔබතුමා අහපු 5 වැනි ප්‍රශ්නය ගැන මම පැහැදිලි කිරීමක් කරන්නම්. මොකද, ඒක අර පළමුවැනි එකට සම්බන්ධ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට වේලාසනින්ම කියන්න ඕනෑ, මේක මගේ පැහැදිලි කර ගැනීම නොව, එතුමා උත්තරයක් නොදුන් එකට උත්තරයක් ඉල්ලීම බව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකද, මටත් අවස්ථාවක් තිබෙනවා ඊට පස්සේ පැහැදිලි කර ගැනීමකට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු විපක්ෂ නායකතුමනි, 5 වැනි ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්නම්. මෙම අභියාචනාධිකරණයේ විනිසුරුවන් 4දෙනා පත්

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

කිරීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන් 4දෙනා පත් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්නේ ජනාධිපතිවරයා මිසක් අධිකරණ ඇමතිවරයා නොවෙයි. ඒ සඳහා එතුමාට අධිකරණ ඇමතිවරයාගේ අවසරය අවශ්‍ය වෙන්නේත් නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් වන කටයුතු දැනටමත් ජනාධිපති කාර්යාලයෙන් කෙරෙනවා ඇති. නමුත් මම ඒ සම්බන්ධයෙන් තොරතුරු සොයා ඉදිරියේදී ඔබතුමාට වාර්තා කරන්නම්, ඒක මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන එකක් නොවන නිසා. ඒකට හේතුව මම පසුව පැහැදිලි කරලා කියන්නම්. ඒ සම්බන්ධයෙන් තොරතුරු ජනාධිපති කාර්යාලයෙන් කැඳවා ගන්නට ඕනෑ. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා අනෙක් ප්‍රශ්න ගැන ඇහුවොත් මම පැහැදිලි කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, කරුණු පැහැදිලි කර ගැනීමට දැන් ඔබතුමාට අවස්ථාව තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන දේ සත්‍යයක්. ඔබතුමා නොවෙයි අභියාචනාධිකරණ විනිසුරුවන්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් පත් කරන්නේ. හැබැයි, රටක් තුළ යහපත් රාජ්‍ය පාලනයේදී අධිකරණයේ ස්වාධීනත්වය, අධිකරණයේ වගකීම සහ වගවීම පිළිබඳව, ඒ පද්ධතියේ ශක්ති සම්පන්නභාවය පිළිබඳව ඔබතුමාටත් යම් වගකීමක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම පත් කරන්නා ජනාධිපතිවරයා වුවත් මාස 6ක් තිස්සේ අභියාචනාධිකරණ විනිසුරුවන් 4දෙනෙකු සහ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් 4දෙනෙකු පත් නොකර සිටීම තුළ, මම ඔබතුමාට කියන්න කැමැතියි, විනිසුරු ක්ෂේත්‍රයේ හොඳ, දක්ෂ විනිසුරුවන් - career judgesලා - ගණනාවක් retire වෙලා - pension ගිහිල්ලා - තිබෙන බව. අපි විශ්වාස කරනවා ඒ අය බොහොම විනිවිදභාවයෙන් යුක්තව, අපක්ෂපාතීව අධිකරණ ක්‍රියාවලිය ඉතාම හොඳින් ක්‍රියාත්මක කරපු අය බව. ඒ අයව එම පුරප්පාඩු ධුරවලට පත් නොකිරීමේ ක්‍රියාවලිය තුළ ඒ අයට ගෙදර යන්න සිද්ධ වෙලා තිබෙනවා. ඔබතුමා මතු කරන කාරණාව තමයි, "මේ පත් කිරීම් කරන්නේ ජනාධිපතිවරයා. ඒක මට අයිති දෙයක් නොවෙයි. ඒ නිසා ඒක ගැන ඉදිරියට කටයුතු කෙරෙයි" කියන එක. ඒ කාරණාවට ලඝු වෙන්නේ නැතිව කටයුතු කරන්න. ඔබතුමන්ලාට ජන වරමක් ලැබුණේ system change එකක් ක්‍රියාත්මක කරන්න. අපි විශ්වාස කරනවා ඒ system change එක තුළ මෙහෙම අභියාචනාධිකරණ විනිසුරුවන් 4දෙනෙකු සහ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් 4දෙනෙකු පත් නොකර සිටීම යෝග්‍ය නැහැ කියලා. ඒ වාගේම මම අවසාන වශයෙන් අහන්න කැමැතියි, ඒ පුරප්පාඩු ධුරවලට 8දෙනෙකු පත් නොකර ඉන්නේ ඇත්තටම හොඳ විනිසුරුවන් නැද්ද කියලා. ඒකද ඒකෙන් කියන්නේ? විනිසුරුවන් ඉන්නවා නම් පත් නොකර සිටින්නේ සුදුසු විනිසුරුවන් නැති නිසාද?

මේ සම්පූර්ණ ක්‍රියාවලිය ගැන කථා කරන කොට, මම බොහොම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා ඉදිරිපත් කළා විදේශීය රටවල විනිසුරුවන් විශ්‍රාම යන වයස් සීමා. ඇත්තටම Bar Association of Sri Lanka මේකට විරුද්ධ වෙන්නේ අසාධාරණ හේතුවක් මත නොවෙයි නේ. ඒ වාගේම Colombo High Court Lawyers' Association එකත් මේකට විරුද්ධ වෙන්නේ අසාධාරණ හේතු පදනම් කරගෙන නොවෙයි නේ.

ත්‍රෛපාර්ශ්වීය ප්‍රජාතන්ත්‍රවාදී system එක - tripartite system of government - ආරක්ෂා කරන්නට විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය කියන තුනේ checks and balances සහ බලය බෙදී යෑම - separation of powers - කියන සංකල්ප ආරක්ෂා වන ආකාරයට කරුණාකර පියවර ගන්න කියන ඉල්ලීම රජයට මා කරනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඔව්, අධිකරණය ස්වාධීන කිරීමට, එහි ස්වාධීනභාවය ආරක්ෂා කිරීමට ජාතික ජන බලවේගය රජය කැප වෙලා ඉන්නවා. හැබැයි, ඒ වාගේම යම් යම් දේශපාලනික හේතූන් මත යම් වෘත්තීය සංගම් මෙයෙවන දේශපාලන හස්තයන් පිළිබඳවත් අපට නිසි අවබෝධයක් තිබෙනවා. ඒකයි මා මුල ඉඳලාම කිව්වේ. නීතිඥ සංගමය වේවා, ඔවුන්ගේ කරුණු ජනාධිපතිවරයාට ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම කොළඹ නීතිඥ සංගමයත් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඒ සියලු කරුණු සාධනීයව සලකා බැලෙනවා. ඒකට විරුද්ධ වන අදහස් වාගේම වෘත්තිකයන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම සම්බන්ධයෙනුත් එන යෝජනා රාශියක් තිබෙනවා. ඒක අධිකරණ ක්ෂේත්‍රයට පමණක් සීමා වෙලා නැහැ. ඒ හැම දේටම කන් දීලා නිසි ක්‍රමවේදයකින් පසුව අවසාන තීන්දුවකට රජය, කැබිනට් මණ්ඩලය පැමිණෙයි. ඒක අධිකරණ ඇමතිවරයා කරන දෙයක්ම නොවෙයි.

අනෙක් ප්‍රශ්නය හැටියට, ඔබතුමා දිගින් දිගටම පැන නැඟුවේ, විනිශ්චයකාරවරුන් අභියාචනාධිකරණයට සහ ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කිරීම සම්බන්ධයෙනුයි. මා කලින් දීපු පිළිතුරම මම නැවත ඔබතුමාට කියනවා. එය ජනාධිපතිවරයා විසිනුයි කරන්නේ. එය අනිවාර්යයෙන්ම සිද්ධ වෙනවා. ඒක සිද්ධ වන ක්‍රමවේදය, කාලය කුමක්ද කියන එකේ තොරතුර විතරයි මා ළඟ නැත්තේ. එය ජනාධිපතිවරයාගෙන් කැඳවාගෙන පසුව ඔබට දැනුම් දෙන්න කටයුතු කරන්නම්. නමුත් කිසිම හේතුවක් නිසාවත් අපේ රජය විසින් අධිකරණයේ ස්වාධීනත්වයට කිසිදු ආකාරයක හානියක් වෙන්න දෙන්නේ නැහැ කියන පොරොන්දුව ජනතාවටත්, ඔබතුමාටත් මම දෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මහතා.

## II

## මහජන සෞඛ්‍යයට දුම්කොළවලින් වන බලපෑම සහ නීති විරෝධී දුම්කොළ වෙළෙඳාම හේතුවෙන් රජයේ ආදායම අහිමි වීම

பொது மக்களின் சுகாதாரத்துக்கு புகையிலையால் ஏற்படும் பாதிப்பும் சட்டவிரோத புகையிலை வர்த்தகத்தால் அரச வருவாய் இழப்பும்

IMPACT OF TOBACCO ON PUBLIC HEALTH AND LOSS OF GOVERNMENT REVENUE DUE TO ILLICIT TOBACCO TRADE

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මහජන සෞඛ්‍යය, රජයේ ආදායම් සහ නීති විරෝධී දුම්කොළ වෙළෙඳාම සම්බන්ධයෙන් ජාතික වැදගත්කමක් ඇති කරුණක් පිළිබඳව මම අවධානය යොමු කරමි.

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියට - NATA එකට - අනුව දුම්කොළ ආශ්‍රිත රෝග හේතුවෙන් වාර්ෂිකව ශ්‍රී ලාංකිකයින් 22,000කට ආසන්න පිරිසක්, එනම් දිනකට පුද්ගලයින් 60කට ආසන්න සංඛ්‍යාවක් මිය යති. ශ්‍රී ලාංකිකයන් දිනකට රුපියල් මිලියන 520කට අධික මුදලක් සිගරට් සඳහා වැය කරන අතර, දුම්කොළ භාවිතයෙන් රටට වාර්ෂිකව රුපියල් බිලියන 214ක පමණ ආර්ථික පාඩුවක් සිදු වන බව ඇස්තමේන්තු කර ඇත. එමෙන්ම නීති විරෝධී සිගරට් ජාවාරම, ජාවාරම් මාර්ගයෙන් ආනයනය කිරීම සහ ප්‍රමාණවත් නියාමනයකින් තොර බීඩි වෙළෙඳ පොළේ ව්‍යාප්තිය හේතුවෙන් මහජන සෞඛ්‍ය අරමුණු හා රාජ්‍ය ආදායම් දෙකම අඩාළ වන බවට කරුණු ඉදිරිපත් වී ඇත. තවද, වර්තමාන දුම්කොළ බදු ව්‍යුහය හේතුවෙන් රජයට වාර්ෂිකව රුපියල් බිලියන 17.3ක පමණ අමතර ආදායමක් අහිමි වන බවටද ඇස්තමේන්තු පවතී.

ඒ කියන්නේ ගරු කථානායකතුමනි, ඒ කියන්නේ උස අනුව. ඒගොල්ලෝ වැරදි උසක් අරගෙන නිසා, ඒකෙන් රුපියල් බිලියන 17ක් අවුරුද්දකට නැති වෙනවා.

ඒ අනුව, ගරු මුදල් අමාත්‍යතුමා පහත ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

1. දුම්කොළ භාවිතය හේතුවෙන් වාර්ෂිකව ශ්‍රී ලාංකිකයන් 22,000කට ආසන්න පිරිසක් මියයන බව රජය පිළිගන්නේද? ඒ නිල වාර්ෂික මරණ සංඛ්‍යාව කීයද සහ එම නිසා වැඩිපුර සෞඛ්‍ය වැයක් ඇතිවේද?
2. දුම්කොළ ආශ්‍රිත රෝග හේතුවෙන් රජයට වාර්ෂිකව දැරීමට සිදුවන ආර්ථික හා සෞඛ්‍ය වියදම කොපමණද? එය දුම්කොළ බදු ආදායම සමඟ සසඳන විට කෙසේද?
3. දුම්කොළ අයබදු වැඩි කිරීම සිගරට් භාවිතය, නීතිවිරෝධී වෙළෙඳාම, ජාවාරම් සහ රාජ්‍ය ආදායම් කෙරෙහි ඇති බලපෑම පිළිබඳව සිදු කර ඇති ඇගයීම් මොනවාද?
4. නීතිවිරෝධී සිගරට් හා බීඩි වෙළෙඳ පොළේ කොටස සහ ඒ හේතුවෙන් අහිමිවන වාර්ෂික රාජ්‍ය ආදායම පිළිබඳ රජයේ ඇස්තමේන්තු මොනවාද?

   ගරු කථානායකතුමනි, ඔබතුමා පොළොන්නරුව, අනුරාධපුරය හා ත්‍රිකුණාමලය පැත්තට ගියොත්, ඒ පැත්තේ ඕනෑ තරම් පිටරට සිගරට් තිබෙනවා. චීනයේ වෙන්න පුළුවන්, වෙනත් රටවල ඒවා වෙන්න පුළුවන්. ඒවාට කිසිසේත්ම බදු ගෙවන්නේ නැහැ. මෙහේ බීඩි කර්මාන්තය වුණත් නීත්‍යානුකූලව කරන එක ප්‍රශ්නයක් නොවෙයි. ඒකට යම් අය බදු නොගෙවීම තමයි අපේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය.
5. නීත්‍යානුකූල කුඩා පරිමාණ බීඩි කර්මාන්තයේ නියුතු ජනතාව ආරක්ෂා කරමින්, සහන ක්‍රම අවභාවිතය හා අවිධිමත් සැපයුම් ජාල වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර මොනවාද?
6. වර්තමාන දුම්කොළ බදු ව්‍යුහය හේතුවෙන් වාර්ෂිකව රුපියල් බිලියන 17.3ක පමණ ආදායමක් රජයට අහිමි වන බවට ඇති ඇස්තමේන්තු පිළිබඳ රජය දැනුවත්ද? එය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද?

   ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, මේ රුපියල් බිලියන 17 තිබුණා නම්, ඒකෙන් කරන්න බැරි මොනවාද? ඒ නිසා තමයි විධිමත්ව ඒක අය කර ගන්න කියන්නේ.
7. පසුගිය වසර දෙක තුළ නීතිවිරෝධී දුම්කොළ වෙළෙඳාම මැඩපැවැත්වීම සඳහා ක්‍රියාත්මක කළ දේශසීමා සහ නීති බලාත්මක කිරීමේ වැඩ පිළිවෙළ සහ ඒවායේ ප්‍රතිඵල මොනවාද?
8. දුම් පානය අඩු කරමින් රාජ්‍ය ආදායම ස්ථාවර කරන සෞඛ්‍ය හිතකාමී අයබදු ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් රජය සලකා බැලුවේද?
9. දුම් පානය නතර කිරීමේ වැඩසටහන්, වැළැක්වීමේ වැඩසටහන්, මහජන දැනුවත් කිරීම් සහ නීතිය බලාත්මක කිරීම සඳහා දුම්කොළ බදු ආදායමින් කොටසක් වෙන් කිරීමට රජය කටයුතු කරන්නේද?
10. දුම්කොළ ආශ්‍රිත මරණ අඩු කිරීම, නීති විරෝධී වෙළෙඳාම් මැඩපැවැත්වීම සහ නීත්‍යානුකූල රාජ්‍ය ආදායම් උපරිම කිරීම සඳහා සම්පූර්ණ ජාතික උපායමාර්ග රජය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද?

ගරු කථානායකතුමනි, වර්තමාන ප්‍රතිපත්ති රාමුව මහජන සෞඛ්‍ය ආරක්ෂා කරමින් රාජ්‍ය ආදායම් සුරක්ෂිත කිරීමට සැබැවින්ම සමත්ද යන්න පිළිබඳව මෙම සභාව දැනුවත් කළ යුතුය.

ස්තුතියි.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා කල් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන.

2026.06.10වෙනි දින ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුරු ලබාදීම. ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍ය ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මැතිතුමා.

## වඩමාරච්චි මුහුදේදී ධීවරයින් අතුරුදහන් වීම: ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## வடமராட்சி கடற்பரப்பில் மீனவர்கள் காணாமற்போனமை: கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரினது கூற்று
## DISAPPEARANCE OF FISHERMEN AT VADAMARACHCHI SEA: STATEMENT BY MINISTER OF FISHERIES, AQUATIC AND OCEAN RESOURCES

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට උත්තර දෙන්න කලින් මම ඔබතුමා දැනුවත් කරන්න කැමැතියි. මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. එතුමා මේ ප්‍රශ්නය අහනකොට මේ සිද්ධියට අදාළව හතරදෙනෙක් අතුරුදහන් වෙලා තිබෙනවා, පවුල් 3ක් පීඩාවට පත් වෙලා තිබෙනවා. එතුමා සඳහන් කරලා තිබෙන්නේ දෙන්නෙක් අතුරුදහන් වෙලා තිබෙනවා කියලා. ඒ අනුව පේනවා එතුමා මේ පිළිබඳව අවබෝධයකින්

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

තොරව, සොයා බලන්නේ නැතිව නිකම් media show එකක් පෙන්වන්න තමයි ප්‍රශ්නය අහලා තිබෙන්නේ කියලා. මෙහිදී හතරදෙනෙක් අතුරුදහන් වෙලා තිබෙනවා, ඒ වාගේම පවුල් 3ක් පීඩාවට පත් වෙලා තිබෙනවා. එයින් එක පවුලක වෙන කවුරුත් නැහැ, ළමයි දෙන්නෙක් විතරක් ඉන්නවා, ගරු කථානායකතුමනි. ඒ වාගේ සංවේදී ප්‍රශ්නයක් මේක. තමන්ගේ media show එකට, තමන්ගේ views වැඩි කර ගන්න මේ වාගේ කාරණා විහිළුවට ලක් කරමින් පහත් වැඩ කරන්න එපා කියලා පළමුවෙන්ම මම ඉල්ලා සිටිනවා.

දෙවනුව, එතුමාට ඒක media show එකක් වෙන්න පුළුවන්, එතුමා මේ ප්‍රශ්නය වෙනත් පැත්තකින් වචාගෙන කන්න පුළුවන්. නමුත් ධීවර ඇමතිවරයා හැටියට මට තිබෙනවා යුතුකමක් ඒ ප්‍රශ්නයට සාධාරණ උත්තරයක් දෙන්න. ඒ අනුව මම අදාළ උත්තරය ලබා දෙනවා.

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் கேட்கப்பட்ட வினாக்களுக்கான விடைகள் பின்வருமாறு:

1. கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களே, தாங்கள் மீனவர்கள் மீதான அக்கறையில் இந்த வினாவைக் கேட்டிருந்தீர்கள் என்றால், உண்மையிலேயே நான் மனமுவந்து பதிலளிக்கின்றேன். உங்களுடைய ஊடக விளம்பரத்துக்காக இந்த வினாவைக் கேட்டிருந்தீர்கள் என்றால், மனவேதனையுடன் பதிலளிக்கின்றேன். இந்தச் சம்பவத்தில் காணாமல்போனவர்கள் இரண்டு பேர் அல்லர்; நான்கு பேர். 27.05.2026 அன்று பருத்தித்துறைப் பகுதியிலிருந்து கடற்றொழில் நடவடிக்கைக்காக கடலுக்குச் சென்ற இரண்டு மீன்பிடிப் படகுகளும் நான்கு மீனவர்களும் காணாமல்போனதாகத் தெரிவிக்கப்படுகின்றது. அதுதான் உண்மை!

   27.05.2026 அன்று இரவு சுமார் 11.00 மணியளவில் பருத்தித்துறைப் பகுதியிலுள்ள முனை இறங்குதுறையிலிருந்து மீன்பிடிக்கப் புறப்பட்ட பின்னர் காணாமல்போன இரண்டு மீனவர்கள் குறித்த தகவல்கள் பின்வருமாறு:

   படகின் இலக்கம் : OFRP-A-3892 JFN

   1. திரு. க. சோதிலிங்கம் - 197433804016 (வயது 54)

   11. திரு. எஸ். சுகுமார் - 892243174V (வயது 37)

   27.05.2026 அன்று மாலை சுமார் 6.00 மணியளவில், பருத்தித்துறை பகுதியிலுள்ள கற்கோவளம் இறங்குதுறையிலிருந்து மீன்பிடிக்கச் சென்ற பின்னர் காணாமல்போன இரண்டு மீனவர்கள் குறித்த தகவல் பின்வருமாறு:

   படகின் இலக்கம் : OFRP-A-2286 JFN

   1. திரு. பி. ராமகிருஷ்ணன் - 720094380V (வயது 52)

   11. திரு. ஆர். ரவிராஜ் - 982421002V (வயது 26)

2. இரண்டு மீனவர்கள் அல்லர்; நான்கு மீனவர்கள். இவர்கள் 2026.05.27ஆம் திகதி முதல் காணாமல்போய் இருக்கின்றார்கள்.

3. ஆம்.

4. இவ்வாறான மீனவர்கள் சம்பந்தப்பட்ட விபத்துகள் மற்றும் காணாமல்போதல்களைக் கையாள்வது தொடர்பாக, கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் துறையால் ஒரு செயன்முறை பின்பற்றப்படுகிறது.

   அதன்படி, இந்த நிலைமை குறித்து அறிந்தவுடன், இலங்கை கடற்படைத் தலைமையகத்தில் அமைந்துள்ள கொழும்பு கடல்தேடல் மற்றும் மீட்பு ஒருங்கிணைப்பு மையத்துக்கு உடனடியாகத் தகவல் தெரிவிக்கப்பட்டது. மேலும், வடக்குப் பிராந்தியத் திலுள்ள இலங்கை கடற்படை அதிகாரிகளுக்கும் தகவல் தெரிவிக்கப்பட்டு, மீனவர்களைத் தேடும் பணி உடனடியாகத் தொடங்கப்பட்டது. அது மட்டுமல்லாமல், அனர்த்த முகாமைத்துவ நிலையத்தின் பிரதிப் பணிப்பாளர் அவர்களுக்கும் இது தொடர்பில் தகவல் தெரிவிக்கப்பட்டு, நடவடிக்கை எடுக்கப்பட்டது. இந்தச் சம்பவத்தைக் கேள்விப்பட்ட உடனேயே நான் பாதுகாப்புச் செயலாளர், கடற்படைத் தளபதி, இராணுவத் தளபதி மற்றும் அனர்த்த நிவாரணப் பிரிவினருடன் தொடர்புகொண்டு, அனைவரையும் இந்தச் செயற்பாட்டில் முன்னிற்குமாறு பணித்தேன்.

5. இலங்கை கடற்படை மற்றும் இலங்கை விமானப் படையிடமிருந்து தொடர்புடைய தகவல்களைப் பெறவும். ஒருசில கேள்விகள் எங்களுடைய அமைச்சின் விடயதானத்துக்கு உட்பட்டதல்ல. அவை பாதுகாப்பு அமைச்சோடு தொடர்புபட்டவை. கடற்படையினர் சென்ற நேரம், வந்த நேரம், தேடுதலுக்காகப் பயன்படுத்தப்பட்ட படகுகள், விமானங்கள் தொடர்பான தகவல்களை மேலதிகமாகப் பெற்றுக்கொள்ள வேண்டுமாக இருந்தால், உரிய அமைச்சுக்களிடம் அந்தக் கேள்விகளைக் கேட்கும்படி கேட்டுக் கொள்கின்றேன்.

6. இலங்கை கடற்படை மற்றும் இலங்கை விமானப் படையிடமிருந்து தொடர்புடைய தகவல்களைப் பெறவும். கௌரவ அர்ச்சுனா அவர்களே, நீங்கள் 'ட்ரோன்' குறித்தும் விளையாட்டுத்தனமாகக் கேட்டிருக்கிறீர்கள். எல்லாவற்றிலும் விளையாடுவது மாதிரி இதிலும் விளையாடுகிறீர்கள். பரவாயில்லை!

7. உண்மையிலேயே நாங்கள் இதில் அரசியல் செய்யவில்லை. அரசியல் செய்கின்றவர்கள் பலர் இருக்கின்றார்கள். எது எவ்வாறு இருந்தபோதிலும், நாங்கள் இந்தச் சம்பவத்தைக் கேள்விப்பட்ட அடுத்த நிமிடத்திலிருந்து பாதுகாப்புத் தரப்பினருக்கு அறிவித்திருக்கின்றோம்; தேடுதல் நடவடிக்கைகளில் ஈடுபடுத்தியிருந்தோம். அதுமாத்திரமல்ல, அந்தப் பிரதேசத்துக்கு எங்களுடைய பாராளுமன்ற உறுப்பினர்களான கௌரவ இளங்குமரன் அவர்களும் கௌரவ ரஜீவன் அவர்களும் சென்று, அந்த மக்களோடு நேரடியாக களத்தில் இருந்தார்கள்; தேடுதல் நடவடிக்கைகளில் ஈடுபடுத்தினார்கள். அத்தோடு, எங்களுடைய மீனவச் சங்கத்தினர், அங்கிருக்கின்ற எங்களுடைய பிரதேச சபை உறுப்பினர்கள், மீனவர்கள் எனப் பலரும் எந்தவித பாகுபாடும் இல்லாமல், தங்களிடமிருந்த பணத்தைச் செலவழித்து தேடுதல் நடவடிக்கையில் ஈடுபட்டார்கள். அப்போது, நாங்கள் அதற்குத் தேவையான ஊக்குவிப்பை நேரடியாகப் பெற்றுக் கொடுத்தோம். பாதிக்கப்பட்ட குடும்பங்களை நாங்கள் சென்று பார்த்தோம். அவர்களுக்குச் செய்யவேண்டிய அனைத்தையும் நாங்கள் இதுவரை செய்திருக்கின்றோம். அவர்களுக்கு அரசாங்கத்தின்

மூலம் மேலதிகக் கொடுப்பனவுகளை வழங்க வேண்டிய தேவை இருக்கின்றது. அது தொடர்பாக நாங்கள் அடுத்த வாரங்களில் நடவடிக்கை எடுக்க இருக்கின்றோம்.

8. இதுநாள்வரை எங்களுடைய கடற்பரப்பில் இவ்வாறான நிலைமைகள் ஏற்படும்போது, கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சால் மீனவர்களைப் பாதுகாப்பதற்குப் போதுமான நடவடிக்கைகள் எடுக்கப்படவில்லை. குறிப்பாக, படகுகள், வள்ளங்கள், விமானங்கள், விமானப் படையினருடனான தொடர்பு உட்பட எந்தவிதமான ஆக்கபூர்வமான செயற்பாடுகளும் முன்னெடுக்கப்படவில்லை. எனினும், நாங்கள் கடந்த இரண்டு மாதங்களுக்கு முன்பிருந்து இதற்கான ஏற்பாடுகளைச் செய்திருக்கின்றோம். பாதுகாப்பு அமைச்சர், பாதுகாப்புச் செயலாளர் உட்பட சம்பந்தப்பட்ட அனைவருடனும் இது தொடர்பாகக் கலந்துரையாடி, உரிய நடவடிக்கைகளை எடுத்திருக்கின்றோம். கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சால் எச்சரிக்கை விடுக்கப்பட்ட பிறகு, கடலுக்குச் செல்ல வேண்டாமென நாங்கள் மீனவர்களிடம் கேட்டுக்கொள்கின்றோம். பலர் பாதுகாப்பு அங்கிகளை அணியாது செல்கின்றனர். அதனூடாகவும் பாதிப்பு ஏற்பட்டு இருக்கின்றது. இவ்வாறு நாங்கள் மீனவர்களைப் பாதுகாப்பதற்கு தொடர்ச்சியாக நடவடிக்கை எடுத்து வருகின்றோம் என்பதைக் கூறிக்கொள்ள விரும்புகின்றோம். நன்றி.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

நன்றி! பாசத்துக்கும் நேசத்துக்கும் உரிய மீன்பிடித்துறை அமைச்சர் கௌரவ ராமலிங்கம் சந்திரசேகர் அவர்களே, நீங்கள் சொல்லியிருந்தீர்கள், நான்கு மீனவர்கள் என்று. நான் எனது கேள்வியில் இரண்டு மீனவர்கள் என்றே குறிப்பிட்டிருந்தேன். உங்களுக்கு ஒன்று, இரண்டு, மூன்று என எண்ணத் தெரியுமா என்றுதான் நான் பார்த்தேன். பரவாயில்லை எண்ணுகிறீர்கள்! உங்களுடைய அரசாங்கம் மக்களுக்குக் கொடுத்த வாக்குறுதிகளில் முக்கியமானது, மீன்பிடி app சம்பந்தமானது. அதாவது, எங்கு கூடுதலாக மீன்கள் நிற்கின்றன என்பதைக் கண்டறிகின்ற appஐத் தருவதாக உங்களுடைய சனாதிபதி அவர்கள் சொல்லியிருந்தார். எப்போது நீங்கள் அந்த appஐத் தருவீர்கள்? நீங்கள் அந்த appஐத் தருவீர்கள் என்றால், எங்கு கூடுதலான மீன்கள் நிற்கின்றதோ அங்கு போய் மீன்பிடிக்கலாம்.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

இந்தக் கேள்வியை இவர் தனியாகக் கேட்பாராக இருந்தால், இந்த app சம்பந்தமான தகவல்களை நாங்கள் சொல்வதற்குத் தயாராக இருக்கின்றோம். எனினும், அது தொடர்பில் உங்களுடைய கேள்வியில் உள்வாங்கப்படவில்லை என்பதை நான் சொல்லிக் கொள்கின்றேன். app சம்பந்தமான நடவடிக்கைகள் டிஜிட்டல் பொருளாதார அமைச்சின்கீழ் முன்னெடுக்கப்படுகின்றன. மீன்கள் எங்கு அதிகமாக இருக்கின்றன என்பதைவிட, மீனவர்களைக் கண்காணிக்கக்கூடிய VMS என்ற இயந்திரம் இருக்கின்றது. அந்த இயந்திரத்தின்மூலம் கண்காணிக்கின்ற நடவடிக்கைகள் மேற்கொள்ளப்படும். அதுமாத்திரமன்றி, மீனவர்களுக்கு மேலதிக உதவிகளைச் செய்யக்கூடிய appஐயும் நாங்கள் தயாரித்து வருகின்றோம்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ. භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 1.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතුය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව
## தித்வா புயலை எதிர்கொள்வதற்காக முன்னாயத்தத்துடன் இருக்கவில்லை என்பது தொடர்பில் முழுமையாக ஆராய்ந்து அறிக்கையிடுவதற்கும், அது தொடர்பிலான முன்மொழிவுகளையும் விதப்புரைகளையும் பாராளுமன்றத்துக்குச் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு
## SELECT COMMITTEE TO CONDUCT A COMPREHENSIVE STUDY ON THE LACK OF PREPAREDNESS TO FACE CYCLONE DITWAH AND REPORT TO PARLIAMENT AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2026 ජනවාරි 21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබා දී ඇති කාලසීමාව, 2026 සැප්තැම්බර් 19 දින දක්වා දීර්ඝ කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 ඉදිරිපත් කිරීම, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මැතිතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, රටට වැදගත් වන කාරණයක් සම්බන්ධයෙනුයි මම මේ කියන්නේ. බැංකුවලින් පොලිස් ස්ථානවලට සම්බන්ධ කර ඇති සයිරන් නළා සඳහා මාසයකට රුපියල් 10,000ක් ගෙවන්න ඕනෑ කියලා ඊයේ සියලු බැංකුවලට නියම කර තිබෙනවා. පොලීසිය කියන්නේ සේවයක් ඉෂ්ට කරන ආයතනයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එය point of Order එකක් නොවෙයි.

ගරු අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I am on a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ස්ථාවර නියෝග කියවන්න. රීති ප්‍රශ්නයක් මතු කළ හැකි අවස්ථා එහි තිබෙනවා. ඔබතුමා ඉදිරිපත් කරන්නේ රීති ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරයකු වශයෙන් මම මේ ප්‍රශ්නය අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister to move Items 1 and 2. You have 18 minutes.

## සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත
## மத்தியஸ்தம் (குடியியல் மற்றும் வர்த்தகப் பிணக்குகள்) சட்டமூலம்
## MEDIATION (CIVIL AND COMMERCIAL DISPUTES) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[පූ.භා. 10.53]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය ද අනුමැතිය සඳහා මා ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනත යටතේ අද දින ඉදිරිපත් කරන නියමය මාලදිවයින රජය සමඟ අපි ඇති කර ගත්තා වූ ගිවිසුම අනුව ඉදිරිපත් කරන එකක්. එය වැඩිය පැහැදිලි කළ යුතු නැහැ. එය අපරාධ නඩු සම්බන්ධ විමර්ශන කටයුතු සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමට මඟ පාදනු ලබනවා කියන එක ගැසට් පත්‍රය කියෙව්වාම පැහැදිලි වෙනවා.

ගරු කථානායකතුමනි, ඊට අමතරව අද දින ඉදිරිපත් වන වඩාත් වැදගත් පනත් කෙටුම්පත තමයි, the Mediation (Civil and Commercial Disputes) Bill එක.

All conflicts have a cost from direct and indirect consequences. From the perspective of Government, the cost of providing for conflict resolution must be mitigated without compromising the quality of relief. From the perspective of business, conflicts detract from achieving corporate objectives, resulting in economic stress and developmental setbacks. From a personal perspective, fractured relationships, whether within the workplace, between trading partners or within the family, are extremely harmful. The need for more meaningful options than currently available to resolve conflict is, therefore, urgent, and that is the lacuna this Bill is trying to fulfill.

Many countries tackling the issue of laws' delays have resorted to alternatives to avoid protracted and costly litigation. The search for alternatives began many years

ago primarily due to dissatisfaction with delays and expense and also because academics and policymakers debated on whether the adversarial process was the best to resolve every type of conflict. Globally, some interventions have been successfully implemented. The use of mediation for dispute resolution is one that has seen a phenomenal growth globally because of its proven benefits.

We already have two statutes which provide for community level dispute resolution using mediation. Those are, the Mediation Boards Act, No. 72 of 1988, as amended, which provides for community level minor dispute resolution and the Mediation (Special Categories of Disputes) Act, No. 21 of 2003, which provides for the establishment of panels for the settlement of identified categories of disputes in identified areas of the country. Those statutes are implemented by the State. There is, however, no subject-specific statute to govern the use of mediation for higher value civil and commercial dispute resolution. Therefore, it is that lacuna that this Bill is trying to fill.

This Bill incorporates globally accepted features that are intrinsic to the practice of facilitative mediation. The use of mediation guided by standards set out in this Bill will have a positive impact on the dispute resolution ecosystem in this country and will also help ease the case overload in courts. To understand the provisions in the Bill, Sir, it is important to first understand the key features of mediation.

Sir, mediation is a dispute resolution or an alternative dispute resolution mechanism, which is an alternative to litigation. It provides for a process that is carried out outside the courts, which is non-adversarial, informal, but disciplined, confidential and party-centric. It is very different to litigation, where a judge adjudicates on the opposing positions and hands down a decision that binds parties. That decision is based on the law alone. In mediation, an independent third party, the mediator, manages the process and supports and empowers the disputants to identify their own core issues and concerns and to focus on finding solutions to satisfy their interests and needs.

The mediator is independent and neutral and plays an important role during the mediation process as a communicator, a manager and a facilitator. The mediator, who is trained in the techniques and skills of mediation and who could be from any profession, plays a non-coercive role and has no authority to impose a decision on the disputants.

The focus is not on the right and wrong, like in litigation. There are no legal arguments to be submitted by lawyers, but disputants have the freedom to discuss all of their issues and concerns and to have them addressed. So, it is a totally non-adversarial process which provides the space to disputants to find creative solutions that are not confined to what is possible under applicable laws. Lawyers and other professionals can be present to assist the parties reach a settlement. The role of the lawyer is different to their role in a court of law, where everything is decided according to law. A settlement is possible only if the disputants agree to terms that are acceptable to them. Parties have complete control over the outcome.

Arbitration is also an Alternative Dispute Resolution - ADR - mechanism. In Sri Lanka, the Arbitration Act of 1995 governs arbitrations.

Sir, mediation has proved to have many benefits: it is cost effective and time efficient; it is confidential; it helps improve strained relationships and affords space for creative solutions that are not confined by law.

This Bill seeks to provide for a governance regime for the practice of mediation in compliance with principles and standards that are accepted the world over, which must be observed to ensure the integrity of the process. In enacting this legislation, we are providing for a legal regime that ensures the responsible use of mediation for civil and commercial dispute resolution. The Bill does not provide for mandatory reference to mediation outside the will of the parties or to establish panels, boards or any such entity.

Sir, if we take why mediation is important for Sri Lanka, there are several benefits of mediation. The option of resolving disputes through mediation serves to divert cases from courts and assists in reducing the case overload. Sri Lanka, like many countries across the globe, has a serious problem of laws' delays. As at end of June, 2025, there were over 1.13 million cases pending in courts. So, there is a serious need to divert disputes away from courts and to leave the courts to handle disputes that must necessarily be adjudicated within the adversarial process, based on the principles of law. Then, the use of mediation can result in savings for the State in the administration of justice. That is a benefit referred to in the Preamble to the UN Mediation Convention of 2018.

Sir, efficient dispute resolution also has a positive impact on the economy. Litigation delays have an adverse impact on trade, business and commerce, which, in turn, impacts on economic progress. That is a negative feature which is often not acknowledged. The need for smarter dispute resolution for the business sector devoid of expense, delay and unpredictability is important for economic development and to attract investors. The business and commercial community must have access to smart conflict resolution options that are time-efficient and cost-effective. Productivity is obviously enhanced due to these benefits with a significant impact on the economy. Businesses, whether large corporates or small enterprises, should be able to focus on their core objectives without being detracted by long-drawn legal battles.

Also, Sri Lanka's Ease of Doing Business performance is significantly hampered due to weak contract enforcement. The 2020 World Bank rankings showed Sri Lanka performing below the South Asian average in the contract enforcement indicator and the situation needs to be improved. Therefore, for Sri Lanka

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

to be accepted as an investor-friendly destination, the options for dispute resolution must be diverse and must offer internationally accepted methods that are not bogged down by the notorious evils of delay and expense as meaningful dispute resolution offers significant economic advantages.

Sir, mediation is a more meaningful process for certain categories of disputes with better prospects for sustainable settlement. It is accepted that certain categories of disputes are more meaningfully resolved using a process that is non-adversarial and which accords primacy to address the needs and interests of disputants in a creative way. Mediation is known to provide prospects to reduce instances where a dispute leads to the termination of a commercial relationship. This benefit is also articulated in the Preamble to the 2018 UN Mediation Convention. Settlements that are based on terms agreed to by disputants assure the sustainability of the outcome, as opposed to an outcome handed down by a third party such as through the adjudicatory process.

Now, Sir, I will explain the main features of the Bill. This Bill provides for a governance regime to ensure that the key features of mediation that are accepted internationally and the best practices adopted worldwide are complied with in providing mediation services in Sri Lanka. The Bill provides for the categories of disputes that can and cannot be mediated, as set out. Any civil or commercial dispute other than disputes that can be brought to closure only with a court decree, for example divorce, nullity of marriage, adoption et cetera, can be referred by disputants to mediation.

The role and the duties of mediators, disputants and service providers are set out in the Bill, Sir. The details of the mediation process are also set out. That is, the steps to be taken to initiate a mediation and to bring the sessions to a closure, the salient features that are intrinsic to the conduct of mediation sessions and the observance of confidentiality with regard to matters discussed in a mediation. The without prejudice rule is also recognized.

Sir, reference of disputes to mediation by courts is provided for in the Bill and it is a very common feature in many jurisdictions around the world. The concept of a mediation clause including the pre-dispute mediation clause is recognized by it. That is the same as the arbitration clause in arbitrations. Disputants can voluntarily agree to mediate even without a pre-dispute mediation clause. Where there is a mediation clause or where a mediation has commenced voluntarily, no action can be filed in court unless mediation has failed. Prescription ceases to run when mediation is resorted to until closure.

Disputants are required to attend mediation sessions personally and cannot be represented by any other person but can however be accompanied by any other person including a lawyer who can assist the disputant to reach a solution.

The mediation is brought to a close either by settlement agreed to by the disputants or when no settlement is possible. Where a settlement is reached, a Mediated Settlement Agreement is entered into and signed by the disputants. Such an Agreement is valid and binding as between the parties and is enforceable. Although valid and legally binding, a party can also apply to court to obtain a decree based on the settlement agreement, using the petition and an affidavit procedure. The grant of a decree can be objected to, only on specific grounds set out in the Act. Where a settlement is not reached, a certificate of non-settlement is issued. Importantly, as mentioned previously, unlike in the two community mediation statutes, this Bill does not establish any new entities or panels or boards and does not provide for mandatory reference to mediation.

Now, Sir, let us look at what the situation is globally. There have been some global developments. Globally, mediation is increasingly used for the resolution of many categories of disputes including commercial disputes, intellectual property disputes, family disputes and investor-State disputes, and many countries have enacted mediation legislation because of the benefits it offers.

If we take examples of mediation initiatives in other countries, India passed a new Mediation Act in 2023. Singapore is a thriving mediation service provider with inspiring success stories and a sound legal framework. The other countries in our region which have institutionalized mediation are, Hong Kong, Thailand, Malaysia, Pakistan, Bangladesh and the Maldive Islands. The UK Government has made an ADR - Alternative Dispute Resolution - pledge and has included provision in their Civil Procedure Rules for a pro-ADR imperative prior to litigation. Many other countries also have institutionalized this principle. The European Union adopted the Directive on Mediation in 2008. The USA has a long history of using mediation, which is extensively used in a wide range of disputes with the Federal as well as State courts requiring reference to mediation prior to a trial. Then, China provided leadership to launch, in 2025, the International Organization for Mediation - IOMed - intended to serve as a permanent intergovernmental organization dedicated to mediating international disputes, and to adopt the Regulations on Commercial Mediation, which provide for a dedicated administrative framework for commercial mediation. Because of the increasing popularity of mediation, international organizations such as the WIPO, the ICC, and the IBA have introduced their own Rules and offer dispute resolution services using mediation. Those organizations previously offered only arbitration services.

If we take the UN Mediation Convention, because mediation has been extensively used to settle trade and business disputes across the borders, the United Nations adopted the Convention on International Settlement Agreements Resulting from Mediation in 2018 to provide a uniform framework for the enforcement for international mediated settlement agreements. The UN Mediation Convention is on mediation and the UN New York Arbitration Convention is on arbitration. Sri Lanka

signed that Convention in 2019 and enacted the Recognition and Enforcement of International Settlement Agreements Resulting from Mediation Act, No. 5 of 2024 in January, 2024, ratifying it. Sri Lanka was the 14th country to ratify the Convention and as at now, the number of ratifications has increased to 22.

UNCITRAL, which is the dedicated body established by the United Nations to work on harmonizing trade laws across the globe and which drafted the text for the UN Convention, has also formulated a model law to govern international mediations and their enforcement and also has its own Mediation Rules as well as Guidelines for the conduct of mediations.

The International Centre for Settlement of Investment Disputes - ICSID - of the World Bank Group, too, established its Mediation Rules in 2022, specially designed for the resolution of investment-related disputes.

So, all those show the global advancements in mediation and that the Sri Lankan system is lagging behind. It is to address that lacuna that this Bill has been brought before Parliament today. If one is to ask the question whether Sri Lanka is ready to provide mediation services, the answer is, yes, Sri Lanka is ready.

Finally, I ask all of you, even the Members of the Opposition, to support this Bill as it would be extremely beneficial to the country. Thank you very much.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Chamara Sampath Dasanayake. You have 15 minutes.

Order please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH]took the Chair.*

[පූ.භා. 11.11]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මූලාසනයේ වාඩි වෙනකම් තමයි මමත් බලාගෙන හිටියේ. ඒක බොහොම හොඳයි.

අද දින අධිකරණ අමාත්‍යතුමා විසින් සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත සහ සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය විවාදය සඳහා ඉදිරිපත් කළා. ගරු අධිකරණ ඇමතිතුමනි, ඒ පිළිබඳව සාකච්ඡා කරන මේ වෙලාවේදී මම කියන්න කැමැතියි, අධිකරණය සම්බන්ධව අද ජනතාව තුළත්, අධිකරණය තුළත්, විනිශ්චයකාරවරුන් තුළත් ලොකු විශ්වාසයක් නැති බව. ඒකට හේතුව මොකක්ද? ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ වනවිට මාස අටක් තිස්සේ පවතින පුරප්පාඩු හතරක් තිබෙනවා. තවම එම පුරප්පාඩු පුරවා නැහැ. ඒ වාගේම අභියාචනාධිකරණයේ අද දවස වනවිට පවතින පුරප්පාඩුවත් එක්ක පුරප්පාඩු පහක් තවම පුරවා නැහැ. ඒ අනුව පුරප්පාඩු නවයක් තිබෙනවා. මේ පුරප්පාඩු මෙතෙක් කාලයක් පුරවා තිබුණේ ජ්‍යෙෂ්ඨතාව අනුව, පක්ෂ දේශපාලනයෙන් තොරවයි. ඉතිහාසය පුරාවට අධිකරණය ක්‍රියාත්මක වුණේ එහෙමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත් අද වනවිට ඒක මොන ආකාරයෙන් හෝ,- විනිශ්චයකාරවරුන් බලාගෙන ඉන්නවා, ඒ තනතුර අපට ලැබෙයි, අපට ලැබෙයි කියලා. නමුත් තවම ලැබී නැහැ. ඒක, එක කාරණයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණය මේකයි. මැයි 01වැනි දා ජනාධිපතිතුමා එක්ක ඉන්න මේ හැම නායකයෙකුම කිව්වා, 25වැනි දා වෙනකොට එක්කෙනෙකුට තීන්දුවක් දෙනවා කියලා. 25වැනි දා තීන්දුව දෙන්න තිබුණේ සරණ ගුණවර්ධනට. හැබැයි, ජනාධිපතිතුමා මැයි 01වැනි දා ඒ ගැන කිව්වා. කමක් නැහැ. නමුත්, මැයි 25වැනි දා තීන්දුව දුන්නේ නැහැ. 26වැනි දා ඒක කල් දැම්මා, ජූනි 09වැනි දාට. ජූනි 09වැනි දා සරණ ගුණවර්ධනට තීන්දුව දුන්නා, වසර 16ක සිර දඬුවමකට. මේ රටේ ඉතිහාසය තුළ නඩු තීන්දුවක් සම්බන්ධව රටේ ජනාධිපති සහ ඇමතිවරුන් එක එක තැන්වල ගිහිල්ලා කියපු පළමුවැනි වතාව තමයි, මේ සරණ ගුණවර්ධන සම්බන්ධ නඩු තීන්දුව. නියම නඩු තීන්දුව; නියම විධායක ජනාධිපති. ජේ.ආර්. ජයවර්ධන හිටියා; ප්‍රේමදාස හිටියා; චන්ද්‍රිකා හිටියා. මේ අයත් අපේ රටේ ජනාධිපතිවරු විධියට කටයුතු කළා. හැබැයි, මේගොල්ලන් නියම විධියට නඩු තීන්දු ලියනවා. ඒකට කමක් නැහැ. මේ, නියම අධිකරණය. අධිකරණය සාධාරණයි කියලා අධිකරණය ගැන තවදුරටත් විශ්වාසය තියාගන්න බැහැ.

මම අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා මේ රටේ හොඳ, වැදගත් පවුලකින් පැවත එන වැදගත් නීතිඥයෙක්. ඔබතුමා වැදගත් නීතිඥයෙක් හැටියට අධිකරණය මෙවැනි තත්ත්වයකට පත් කරන්න එපා. දැන් මේක කියනකොට කියයි, චාමරටත් නඩු තිබෙනවා, චාමර බයේ කියනවා කියලා. එක මනුෂ්‍යයෙක් විතරක් සතුටු කරන්න බැහැ. මේ රටේ එක මනුෂ්‍යයෙකුගේ සේවා කාලය අවුරුදු 67 වෙනකම් දීර්ඝ කරන්න පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, එහෙම කරන්න පුළුවන්ද? ඒ පුද්ගලයා විතරද මේ රටේ වැඩ කරන්නේ? ඒ පුද්ගලයා විතරද මේ රට කරන්නේ? ඔහුගේ බලාපොරොත්තුවක් තිබෙනවා, අවුරුදු 67 වෙනකම් සේවා කාලය දීර්ඝ කර ගන්න. ඒකට ඔහු පක්ෂවලට වාසි විධියට, ආණ්ඩුවට වාසි විධියට එක එක නඩු තීන්දු දෙනවා. එහෙම කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම ඉල්ලුවොත්, දොස්තරලාත් අවුරුදු 67 වෙනකම් සේවා කාලය දීර්ඝ කරන්න කියලා ඉල්ලයි. ඊළඟට, පරිපාලන සේවයේ අයත් අවුරුදු 67 වෙනකම් සේවා කාලය දීර්ඝ කරන්න කියලා ඉල්ලයි. මුළු රටේම ඉන්න හැමෝම ඉල්ලයි, අවුරුදු 67 වනකම් සේවා කාලය දීර්ඝ කරලා දෙන්න කියලා. එහෙම මැරෙනකම් එකම පුටුවක ඉන්න බැහැ; ඒ තනතුරුවල ඉන්න පුළුවන් කාලයක් තිබෙනවා. ඒ කාලයේදී වැඩ කරලා ගෞරවාන්විත විධියට ගෙදර යන්න කියන්න. ආණ්ඩුවට වාසි විධියට නඩු තීන්දු ක්‍රියාත්මක කරන්න නොවෙයි මේ රට තිබෙන්නේ කියන එක මේ වෙලාවේදී මම මතක් කරන්න ඕනෑ.

ඊළඟ එක තමයි, සලේ සම්බන්ධ ප්‍රශ්නය. 2017දී විජයදාස රාජපක්ෂ මැතිතුමා මේ පාර්ලිමේන්තුවේදී පාස්කු ප්‍රහාරය සම්බන්ධව පළමුවෙන්ම කියනකොට විපක්ෂය කිව්වා, කොරහේ

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

තිබුල්ලු දකින්න එපා කියලා. විජයදාස රාජපක්ෂ මැතිතුමා 2017දී ඒ ගැන කිව්වා නම්, එහෙම කියන්න මොකක් හරි හේතුවක් ඇති; විජයදාස රාජපක්ෂ හිටපු ඇමතිතුමාට කොහෙන් හරි ආපු තොරතුරු ඇති. හැබැයි, විජයදාස රාජපක්ෂ හිටපු ඇමතිතුමා බෝම්බ පුපුරන්න කලින් කිව්වා නේ, රටේ මෙන්න මෙහෙම ප්‍රශ්නයක් වෙනවා කියලා. නමුත්, එතුමා කියපු එක ඒ වෙලාවේදී ඇහුවේ නැහැ නේ.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම එතකොට මහ ඇමති. 2019 අප්‍රේල් 21වැනි දා තමයි බෝම්බ පිපිරුවේ. මම 2019දී මහ ඇමති හැටියට ඉන්නකොට, මට MSD එකේ IP කෙනෙක් සහ නිලධාරින් 8දෙනෙක් හිටියා. ඔවුන්ට messages එවපු පොත MSD එකේ තවම තිබෙනවා. ඒ පොත අරගෙන බලන්න. 2019 අප්‍රේල් 10වැනි දා message එක දුන්නා, මෙහෙම සිද්ධියක් වෙනවා, ප්‍රභූ ආරක්ෂකයින් දැනුවත් කරන්න කියලා. 2019 අප්‍රේල් 10වැනි දා තමයි messages pass කළේ. ඒ messages pass කරපු පොත MSD එකේ තිබෙනවා. දින11කට කලින් messages pass කළ නිසා අපට message එක ආවා. එවකට මගේ හිටපු MSD එකේ බදුල්ලේ පොලීසියේ IPට message එකක් ආවා, මෙහෙම සිදුවීමක් වෙනවා කියලා. එතකොට සහරාන් ගැන හැම එකක්ම සලේලාගේ පිටින් දාන්නේ කොහොමද?

බෝම්බ පුපුරන්න කලින් සහරාන්ට වරෙන්තුවක් නිකුත් කරලා තිබුණා. ඔහු අහු වුණේ කොහෙන්ද? කොළඹින්. සහරාන් කොළඹින් අහු වුණා. සහරාන් කොළඹින් අහු වෙච්ච වෙලාවේ ඔහුව සායින්දමරුදුවලට කවුද ගෙන ගියේ? ඔහු ගෙන ගිය නීතිඥයා කවුද? ඒ නීතිඥයා මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. සහරාන්ව සායින්දමරුදුවල උසාවියට ගෙන ගිය නීතිඥයාත් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ නිසා මේ ගැන කථා කරනකොට අපි කාටවත් අත පිහදා ගන්න බැහැ. අපි කියන්නේ නැහැ, මේකේ වැරදිකාරයෝ හොයන්න එපා කියලා. අපි කියන්නේ වැරදිකාරයෝ හොයන්න, රටට හෙළි කරන්න කියලායි. හැබැයි හැම මනුස්සයෙකුටම තිබෙනවා, මානුෂීය අයිතිවාසිකම්. ඔය CID එකේ ඉන්න ශානි අබේසේකරයි, රවී සෙනෙවිරත්නයි ඒ ආණ්ඩුව කාලයේ හිටියා නේ. ඒ වෙලාවේ පොලීසියේ රාජකාරි කරපු අය නේ, ඒගොල්ලන්. ඒ අය නේ, මේ සම්බන්ධව කටයුතු කළේ. මේවා ගැන කථා කරන්න ගියොත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොඩක් දේවල් කියන්න තිබෙනවා.

පුවත්පතක පළ වෙලා තිබෙන බොහොම සංවේදී කාරණයක් ගැනත් මේ වෙලාවේ මම කියන්න ඕනෑ. සභානායකතුමා දැන් මේ සභාවට ආපු හින්දා මම මේක කියන්නේ. මේක අධ්‍යාපනය සම්බන්ධ අමතර ප්‍රශ්නයක්. බණ්ඩාරවෙල ධර්මාශෝක විද්‍යාලයේ lab එකේ පරීක්ෂණයක් කරනකොට යම්කිසි ද්‍රව්‍යයක් වැදිලා ළමයෙකුගේ මුහුණ පිච්චිලා. ඒක පළාත් පාසලක්. තවම ආණ්ඩුකාරවරයාවත්, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයවත් මේ ගැන පරීක්ෂණයක් තියලා නැහැ. ඒ ළමයාගේ මුහුණ දැන් පිච්චිලා. ඒ ළමයාට ඉස්කෝලේ යන්න බැහැ. ඒ ළමයාගේ තාත්තා නැහැ. පවුලේ දරුවෝ 4දෙනායි. ඒ ළමයාට ප්ලාස්ටික් සැත්කමක් කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් කවුරුවත් උදවු කරන්නේ නැහැ. මේකේ වැරදිකාරයා හොයන්නෙත් නැහැ. Lab එකේදි වැරැද්ද වෙලා තිබෙන්නේ ගුරුවරියගෙන්; අපිට වාර්තා වෙලා තිබෙන විදියට lab එකේදි වැරැද්ද වෙලා තිබෙන්නේ ගුරුවරිය අතින්. මේ, අහිංසක ළමයෙක්. ඉස්කෝලෙ යාමත් නැවතිලා. දැන් ඒ ළමයාට උදව් කරන්න කවුරුවත් නැහැ. මේ වෙනකොට මේ ගැන අධ්‍යාපන අමාත්‍යාංශය හොයන්නෙත් නැහැ; පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හොයලාත් නැහැ. ඒ ගැන මම මේ වෙලාවේ දැනුවත් කරන්න ඕනෑ.

ඊළඟ කාරණාව මෙයයි. වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැටහිර කන්ද රක්ෂිතයේ, දෙබරආර වාරිමාර්ග වැව හරස් කරලා අමුණක් හදලා තිබෙනවා. වැවක් තිබෙනවා. මේ වෙනකොට ඒ වැවෙන් කුඹුරු අක්කර හාරසිය ගණනක් පෝෂණය වෙනවා. වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ වර්තමාන සභාපති මාලිමාවේ. එයාගේ නමත් මම මේ වෙලාවේ කියනවා; වලිමුණිගේ නිහාල් සහෝදරයා. ගරු සභානායකතුමනි, ගරු කථානායකතුමනි, මේ වැව හරස් කරලා වෙනම අමුණක් හදලා. දැන් Forest Conservation Department එකේ ලොක්කාට මේ සම්බන්ධව විටින් විට කියනවා. නමුත් මේකට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මේවා ගැන හොයන්න. මේවා අපිට එන තොරතුරු. මේවා හරිද, වැරදිද කියලා හොයන්න. මේක ලොකු ප්‍රශ්නයක්. ඉතිහාසය පුරාවට තිබුණු මේ රක්ෂිතයේ වැව මැදින් bypass කරලා වෙන වතුර පාරක් අරන් ගිහිල්ලා තිබෙනවා. ඒකත් මම මේ වෙලාවේදී කියනවා.

අනෙක් කාරණය මේකයි. ඊයේ පෙරේදා ගුරු විභාගය - ගුරුවරුන් බඳවා ගන්නා විභාගය - පැවැත්වුවා. රුපියල් තුන්දහස් ගණනක් බැගින් අය කරලා පවත්වපු ඒ ගුරු විභාගය සම්බන්ධයෙන් සංවර්ධන නිලධාරින් සහ උපාධිධාරින් අතර ගැටුමක් ඇති වෙලා තිබෙනවා, උපාධිධාරින්ට එක paper එකකුත්, සංවර්ධන නිලධාරින්ට තවත් paper එකකුත් දීලා. එක්කෝ, සංවර්ධන නිලධාරින්ට එක් විභාගයක් පවත්වලා ඉස්සෙල්ලා සංවර්ධන නිලධාරින් ටික ගන්න. ඊට පස්සේ අනෙකුත් උපාධිධාරින්ට දෙන්නේ මේ quota එක කියලා අනෙක් උපාධිධාරින්ට විභාගයක් තියලා වෙන paper එකක් දීලා ඒ උපාධිධාරින් ටික බඳවා ගන්න. මේ රටේ ඔය වාගේ ලොකු ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ඒවා ගැන හොයන්නේ නැහැ; බලන්නේ නැහැ. දැන් උපාධිධාරින් අතර ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the House?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ගන්නා මේ කාලය ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමාගේ කාලයෙන් ගන්න ඕනෑ නැහැ. ආණ්ඩු පක්ෂයේ කාලයෙන් අඩු කර ගන්න.

ගරු මන්ත්‍රීතුමා, අර දරුවා පිළිබඳ තොරතුරු හරියට ලබා දෙන්න. මම දැන් ජනාධිපති අරමුදලේ ලේකම්තුමාට කථා කළා. එතුමා කිව්වා, ඒ පිළිබඳ තොරතුරු ලබා දුන්නොත් දරුවාගේ වෛද්‍යාධාර සඳහා අරමුදලෙන් උදව් කරන්න පුළුවන් කියලා. අපට ඒ සඳහා මැදිහත් වෙන්න පුළුවන්.

ඒ වාගේම ගරු මන්ත්‍රීතුමාගෙන් මම තවත් ඉල්ලීමක් කර සිටිනවා. ඔබතුමා අර ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකු ගැන කිව්වේ සියයට සියයක්ම විශ්වාසවන්තව නම් ප්‍රශ්නයක් නැහැ. හදිසියේවත් ඔබතුමාගේ තොරතුර වැරදි වුණොත් එතුමාට ඇවිල්ලා උත්තර දෙන්න බැහැ. ඒ නිසා ඔබතුමා වගකීමක් අරගෙන නේද ඒක කියන්නේ?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඔව්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හරි, අපි ඒ ගැන හොයා බලන්නම්.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු සභානායකතුමා, ඔබතුමා හොඳ වැදගත් උදව්වක් කරන්න හදනවා. මම ඒකට ස්තුතිවන්ත වෙනවා. ගරු සභානායකතුමා ඔය කියපු දරුවාට එම අරමුදලෙන් ආධාර දෙන එක ගැන ස්තුතිවන්ත වෙනවා. නමුත්, වැරැද්ද කොහොමද වුණේ කියලා හොයන්න. ගරු සභානායකතුමනි, ඒක දරුවාගේ ඇඟට වීසි කරලා; වීසි කරලා කියලායි දැන් කියන්නේ. ඒ ගැන හරියට හොයන්න. හරියට පරීක්ෂණයක් පවත්වන්න, ඒ lab එකේ වෙච්ච සිදුවීම මොකක්ද කියලා. ඔය කියපු පත්තරේ සම්පූර්ණ වාර්තාව තිබෙනවා. අධ්‍යාපනය සම්බන්ධ වෘත්තීය සමිති නායකයාත් - නියෝජ්‍ය ඇමතිතුමාත් - මේ පාර්ලිමේන්තුවේ ඉන්න නිසා මම කියනවා, මේවා ගැන හොයන්න කියලා.

මම වගකීමෙන් කියන්නේ, වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ගැන කියන කාරණය. 'දෙබරආර වැව' තිබෙන්නේ මොනරාගල දිස්ත්‍රික්කයේ. මම ඌව පළාතේ මහ ඇමති විධියට ඒ කාලයේ කටයුතු කළා නේ. මොනරාගලත් ඒ පළාතට අයිති වෙනවා නේ. ඒ නිසා මම වගකීමකින් තමයි මෙතැනට ඇවිල්ලා ඒ ගැන කියන්නේ. වගකීම් විරහිත දේවල් මම කවදාවත් මේ පාර්ලිමේන්තුවේ කියන්නේ නැහැ. ඒ සිද්ධිය ගැනත් හරියටම සොයා බලන්න. මොකද, එතැන Forest Conservation Department එකේ ලොක්කා වැල්ලවායේ ඉන්නවා. ඒ සිද්ධිය ගැන, Forest Conservation Department එකේ වැල්ලවායේ ඉන්න ලොක්කාගෙන් අහන්න පුළුවන්, "චාමර සම්පත් පාර්ලිමේන්තුවේදී මෙන්න මෙහෙම කිව්වා. මේක ඇත්තද?" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණය මේකයි. මේ ආණ්ඩුව ආවේ ජනතාවට පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් හදන්නයි. අපේ ලස්සන සෞඛ්‍ය ඇමතිතුමාත් ඉන්න නිසා, අපේ ලස්සන සභානායකතුමාත් ඉන්න නිසා, අපේ ලස්සන නියෝජ්‍ය කථානායකතුමාත් ඉන්න නිසා ලස්සන ජීවිතයක්, ලස්සන රටක්, පොහොසත් රටක් අපට ලැබෙයි කියලා අපිත් බලාගෙන හිටියා. ජනාධිපතිවරණය පවත්වලා අවුරුදු දෙකකටත් කිට්ටු වෙනවා. ඒ කියන්නේ, සැප්තැම්බර් 21 දිනට අවුරුදු 2යි. නමුත්, පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ලබා ගන්න අපේ රටේ ජනතාව තවම බලා ගෙන ඉන්නවා. හැබැයි, එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහනෙන්, ඒ කියන්නේ World Food ..., ඉතිරි ටික මොකක්ද? කියන්න ඉතිරි ටික. උපදේශක කෙනෙක් ළඟ ඉන්නවා නේ. කියන්න ඕනෑ ඒවා. මේ අපි කියන එකක් නොවෙයි. ලෝක ආහාර වැඩසටහනෙන් කියලා තිබෙනවා ලංකාවේ මූලික ආහාර අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකිව සිටින ජනතාව මිලියන 1.3කින් වැඩි වෙලා කියලා. ඒ කියන්නේ, ඔයගොල්ලන් ආණ්ඩුව ගත්තාට පස්සේ. ඊට කලින් පැවැති සංඛ්‍යාව මිලියන 4.7යි. ඒ, 76 වසරක ශාපය කාලයේ; අපේ ආණ්ඩු පැවැති කාලයේ. ඔයගොල්ලන්ගේ පැත්තටම මේ හැම එකක්ම දාන්න බැහැ නේ. ඊයේ පෙරේදා ඒකට මිලියන 1.3ක් එකතු වෙලා තිබෙනවා. අපේ රටයි, සෝමාලියාවයි, ඇෆ්ගනිස්ථානයයි කියන රටවල් තුන තමයි දැන් කප් එක ගහලා ඉන්නේ. ඔයගොල්ලන් බලයට ආවාට පස්සේ දෙයියන්ගේ පිහිටයි! ශ්‍රී ලංකාව සෝමාලියාවක් බවට පත් වෙලා තිබෙනවා. ඒක ඉතින් කනගාටුවෙන් හෝ කියන්න වෙනවා, ගරු සභානායකතුමා. ඒක ලෝක ආහාර වැඩසටහනේ අලුත්ම සමීක්ෂණය අනුව තමයි කිව්වේ. ඒ ගැනත් අවධානය යොමු කරන්න. මොකද, පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ගත කරන්න ඉස්සෙල්ලා අපේ රට සෝමාලියාවේ තැනට වැටිලා තිබෙන එකෙන් උඩට ගන්නවත් උත්සාහයක් දැරුවොත් තවත් ටිකක් හොඳයි. දුප්පත්කම ගැන කියද්දී අපි ඉස්සර කිව්වේ, සෝමාලියාව ගැන නේ. දැන් සෝමාලියාවේ තත්ත්වයට අපි වැටිලා.

ඊළඟ එක, ඊශ්‍රායල රැකියා පිළිබඳ කාරණය. යුද්ධය කොච්චර තිබුණත් තරුණයෝ අද මැරෙන්න හරි රැකියා සඳහා ඊශ්‍රායලයට යන්න තමයි බලාගෙන ඉන්නේ. ඊශ්‍රායලයේ රැකියා සම්බන්ධව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒජන්සි එකේ කට්ටිය ඇවිල්ලා එතැන පොරකාලා අහිංසක ළමයින්ට ඊශ්‍රායලයට යන්න තිබෙන අවස්ථාව නැති කරලා තිබෙනවා. කවුරු ඇමති වුණත් කමක් නැහැ, අනේ, ගිහිල්ලා ඒ ගැනත් පොඩ්ඩක් හොයන්න. ඇමති කවුරු වුණත් කමක් නැහැ, අමාත්‍යාංශවලට දාන්න ඕනෑ, ඒවායේ කටයුතු ගැන හොයන්න වෙනම කට්ටියක්. සෞඛ්‍ය අමාත්‍යාංශය නම්, සෞඛ්‍යය අමාත්‍යාංශය ගැන හොයන්න දාන්න ඕනෑ වෙනම කෙනෙක්. සභානායකතුමාගේ අමාත්‍යාංශයේ වෙන්නේ මොනවාද කියලා හොයන්න වෙනම කෙනෙක් දාන්න ඕනෑ. ඒ විධියට ඒවා ගැන හොයන්න ඕනෑ. *[බාධා කිරීමක්]* අපට එන තොරතුරු ටිකයි අප කියන්නේ. අපි ඒවා පාර්ලිමේන්තුවේදී කියන්නම්. එතකොට මේවා ගැන හොයන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chamara Sampath Dasanayake, you have two more minutes.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව පොඩි වේලාවක් දෙන්න. මම ඊශ්‍රායල රැකියා ගැනත් ඔන්න කිව්වා.

ඊළඟ කාරණය අර ෆෝටෝන් බස් රථ සම්බන්ධවයි, ගරු ප්‍රවාහන ඇමතිතුමනි. මේ රටට - SLTB එකට හෝ වෙන මොකකට හෝ - ෆෝටෝන් ද මොකක්දෝ බස් වගයක් ගෙන්වනවාලු. අපේ ලේලන්ඩ් කොම්පැනිය තිබෙනවා නේ. ලේලන්ඩ් එකට සියයට 50යි, ආණ්ඩුවට සියයට 50යි- *[බාධා කිරීමක්]* හැබැයි, ලේලන්ඩ් එකෙන් ගන්නේ නැතුව ෆෝටෝන් බස් ගෙන්වන්න යනවා. අපේ පැත්තට ඔය ෆෝටෝන් බස් හරියන්නේ නැහැ. ඒ කියන්නේ, කන්ද උඩරට පැත්තට ෆෝටෝන් හරියන්නේ නැහැ, ගරු සභානායකතුමා. ලේලන්ඩ් කොට බස් තමයි අපේ පැත්තේ දුවන්නේ; එහෙම නැත්නම් ටාටා කොට බස් තමයි අපේ පැත්තේ දුවන්නේ. අපේ පැත්තේ වාගේම රටේ අනෙක් පැතිවලත්. තැනිතලා ප්‍රදේශවලට ෆෝටෝන් බස් හොඳයි. ලේලන්ඩ් බස් එකක් ගන්නවාට වඩා ලක්ෂ 60ක් වියදම්

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

කරලා තමයි ෆෝටෝන් බස් මිල දී ගන්න වෙලා තිබෙන්නේ. මා හිතන විධියට, ඉන්ද්‍රා ට්‍රේඩර්ස් එක හරහා ද කොහේදෝ තමයි ගෙන්වනවා කියලා තිබෙන්නේ. මම ඒක හරියටම දන්නේ නැහැ. ඒ ගැනත් පොඩි අවධානයක් යොමු කරන්න. මොකද, ඔයගොල්ලන් රට නිවැරැදි තැනට, නිවැරැදි විධියට හදන්න ආවා නම් අපට වඩා හොඳට ඒක ඔයගොල්ලන් කරන්න ඕනෑ. අපට වඩා නරකට කරන කොට තමයි අප ගාවට මේ ප්‍රශ්න එන්නේ. මේ ප්‍රශ්න අප ගාවට ආවාම අපි ඒවා මෙතැනදී කියනවා. ඒවා කිව්වා කියලා "චාමර ඇවිල්ලා අරවා කියනවා, මේවා කියනවා" කියන්න එපා. මේවා ඔක්කෝම මිනිස්සු කියන ඒවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම චීනයේ ගිය වෙලාවේත් මිනිස්සු කියනවා, "මේ ටිකේ චාමර ලංකාවේ පේන්න නැහැ නේ" කියලා. මම චීනයේ ගිය හින්දා මිනිසුන්ට තමන්ගේ කාරණා මට කියන්න වුණේ නැහැ. ඒක හින්දා මා චීනයේ ගිහින් ආපු ගමන් මිනිස්සු ආයෙත් වට්ස්ඇප් හරහා මට පණිවුඩ "ටක් ටක්" ගාලා දෙනවා. මගේ තිබෙන්නේ, දේශපාලන වශයෙන් පාර්ලිමේන්තුව තුළ - *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හැබැයි, ඔබතුමා අරගොල්ලන්ගේ ලණු කනවා නේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම එහෙම කාගේවත් ලණු කන්නේ නැහැ. නියපොත්තේ ඉඳන් හැම දෙයක් ගැනම මම දන්නවා. මම එහෙම ලණු කෑවා නම් මට ප්‍රාදේශීය සභාවේ ඉඳන් මේ පාර්ලිමේන්තුව දක්වා එන්න බැහැ. මම කාගේවත් ලණු කෑවා නම් ඇල්ල ප්‍රාදේශීය සභාවෙන් පටන් ගත්තු මට මෙච්චර දුර එන්න බැහැ. මම එහෙම ලණු කෑවා නම්, ආණ්ඩු පක්ෂයේ ඉස්සරහා පේළියේ කෙළවරේ ඉන්න අයත් එක්ක තරග කරලා මට මේ පාර්ලිමේන්තුවට එන්න බැහැ. නමුත්, මම මේ දක්වා ගාණට ඇවිල්ලා තිබෙනවා. බාධක මැදයි ආවේ. මම එහෙම ලණු කන මිනිහෙක් නොවෙයි.

තලංගම මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන කඳවුරක් තිබෙනවා. "තලංගම" කියන්නේ කොළඹ අවට. තලංගම මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන කඳවුර කියන්නේ කොළඹට ගොඩක් ළඟ තැනක තිබෙන එකක්. දැන් ඒක එතැනින් අයින් කරලා කොළඹින් පිට නිට්ටඹුව පැත්තට ගෙන යන්න හදනවා. කොළඹ අවට තිබෙන මේ වාගේ දෙයක් ගෙන යන්න එපා. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කරන ස්ථානයක් කොළඹට අවශ්‍යමයි. මොකද, කොළඹ තමයි මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු, පුනරුත්ථාපනය කළ යුතු අය වැඩිපුරම ඉන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණයත් කියන්න ඕනෑ. අම්පාර හුලංගමුව විද්‍යාලයේ ගුරු පුරප්පාඩු තිබෙනවා. ළමයින් 500ක් විතර ඉන්නවා. 175කට වැඩියි- *[බාධා කිරීමක්]* අධ්‍යාපන ඇමති, අපේ ගරු අගමැතිතුමිය නේ. අගමැතිතුමිය ආපු වෙලාවේ හොඳ ප්‍රශ්නයක් ඇහුවා. ඒ අර මා කියපු ළමයාගේ ප්‍රශ්නය. ඒක සංවේදී ප්‍රශ්නයක්. තාත්තා heart attack එකක් හැදිලා මැරිලා තිබෙන්නේ. ප්ලාස්ටික් සැත්කමක් කරගත්තේ නැත්නම් ඒ ළමයාට ඉස්කෝලේ යන්න බැහැ. මේවා සම්බන්ධව හොයා බලන්න. මම මහ ඇමති විධියට හිටපු කාලයේ මේ වාගේ දේවල් වුණා නම් දැන් ආණ්ඩු පක්ෂයේ ඉන්න ඔය සමහර මහත්තුරු රෙදි නැතුවයි අපට ගහන්නේ. අපි එළියේ ගහන්නේ නැහැ. හැබැයි අපි පාර්ලිමේන්තුවේදී මේවා කියනවා.

සුරාබදු දෙපාර්තමේන්තුව ගැනත් යමක් කියන්න ඕනෑ. සුරාබදු දෙපාර්තමේන්තුවට කොමසාරිස් කෙනෙක් ඉන්නවා. ඊට අමතරව, ඔබතුමන්ලා කැනඩාවේ ඉඳන් එක්කෙනෙක් ගෙනැත් දාලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කථාව නිමා කරන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට තවත් විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ කැනඩාවෙන් ආපු කෙනා හදනවා, සුරාබදු ස්ටිකර් එක නැති කරන්න. ඒ ස්ටිකර් එක නැති කළොත් අපට බිලියන ගණනක පාඩුවක් වෙනවා. අරක්කු හදන අය හරි සතුටුයි, ස්ටිකර් එක නැති වෙනවා නම්. ඒ ස්ටිකර් එක නැති කළොත් බිලියන ගණනක් මහා භාණ්ඩාගාරයට ආදායම අහිමි වෙනවා. ඒ මහත්මයා කැනඩාවේ ඉඳන් ඇවිල්ලා ඉන්නේ. ඕනෑ නම් එතුමාගේ නමත් කියන්නම්. හැබැයි නම කියන එක හරි නැහැ. ඕනෑ නම් මට එතුමාගේ නම කියන්න පුළුවන්. ප්‍රේමලාල් කියලා මහත්මයෙක්. ඔබතුමන්ලාට උදව් කරපු කෙනෙක් වෙන්න ඇති. එතුමා දැන් සුරාබදු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මහත්මයාගේ කාර්යයත් වුට්ට වුට්ට කරනවා. මේවා ගැන අවධානය යොමු කරන්න.

පාර්ලිමේන්තුව කියන්නේ, මහ ජනතාවගේත්, මේ රටේත් තිබෙන ප්‍රශ්න ගැන කථා කරන තැනක්. එහෙම නැතුව වෙන වෙන දේශපාලන ප්‍රශ්න ගැන කථා කරන තැනක් නොවෙයි. අපි ඒවා ඡන්ද කාලයට බලාගනිමු. ඒ ඒ වෙලාවට අපි දෙගොල්ලෝ ඒවා ගැන බලා ගනිමු. නමුත්, මේ රටේ වැදගත් ප්‍රශ්න ගැන අපි මේ පාර්ලිමේන්තුවට කියන්න ඕනෑ.

අවසාන වශයෙන්, මට මේ කාලය ලබා දුන්නාට ගරු නියෝජ්‍ය කථානායකතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ගැනත් වචනයක් කියන්න ඕනෑ. මෙන්න, නියම නියෝජ්‍ය කථානායක. ජොලි! මේ නියෝජ්‍ය කථානායකතුමා හරියට බැලන්ස් කරලා කථා කරනවා, මෙතුමා හොඳ නියෝජ්‍ය කථානායකවරයෙක් කියන පණිවුඩය දෙමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Mrs.) Hiruni Wijesinghe, you have nine minutes.

[පූ.භා. 11.30]

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ තවම හොයනවා, චාමර සම්පත් මන්ත්‍රීතුමා Mediation (Civil and Commercial Disputes) Bill එක ගැන කියපු මොනවා හෝ කාරණා එතුමාගේ

කථාව ඇතුළේ තිබෙනවාද කියලා. ඒ කෙසේ වෙතත්, එතුමාගේ කථාව අතරතුරදී කිව්වා, මේ පාර්ලිමේන්තුවේදී වගකීම් විරහිත ප්‍රකාශයක් තමන් කවදාවත් කරලා නැහැ කියලා. මා හිතන විධියට, මේ පාර්ලිමේන්තුවේ වගකීම් විරහිත ප්‍රකාශ කරලා තිබෙන අයගේ record එක ගත්තොත්, එකේ උඩින්ම නම ඇත්තේ චාමර සම්පත් මන්ත්‍රීතුමාගේ. ඒ කෙසේ වෙතත්, අද දවසේ අපි,-

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
Sir, I rise to a point of Order. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමිය මගේ නම කිව්වා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chamara Sampath Dasanayake, I will give you 30 seconds.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරන මේ ගරු මන්ත්‍රීතුමිය නීතිඥතුමියක්. ගරු මන්ත්‍රීතුමියනි, මම ඔබතුමියට කියනවා මගේ නම නොකියා මට කියන දෙයක් කියන්න කියලා. මොකද, එහෙම නැත්නම් මම දිගටම points of Order ගේනවා. ඒක පොඩ්ඩක් ඉගෙන ගන්න. ඒ ඇති, මට.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Hiruni Wijesinghe, you may continue.

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
ඒක ප්‍රශ්නයක් නැහැ ඉතින්. ඔබතුමාගේ නම mention කරලාම තමයි කියන්න ඕනෑ. ඔබතුමා නැඟිට්ටාට ප්‍රශ්නයක් නැහැ. අපි ආණ්ඩු පක්ෂයේ නේ. අපට කාලය ලබා ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ අපි සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම අපි ආණ්ඩු බලය ලබා ගන්නා අවස්ථාවට පෙර පටන්ම අධිකරණ ක්ෂේත්‍රය තුළ පුළුල් ලෙස දෝෂ දර්ශනයට ලක් වුණු කාරණයක් තමයි, "නඩු විශාල ප්‍රමාණයක් ගොඩගැසී තිබෙනවා, ඒ නඩු ප්‍රමාණය කඩිනමින් අවසන් කරන්නේ කොහොමද?" කියන එක. ඒවාට විකල්ප සොයන්න තමයි අපේ ආණ්ඩුව පැමිණ තිබෙන්නේ. මා හිතන විධියට, 2025 ජුනි මාසය වන විට මිලියන 1.13කට ආසන්න නඩු ප්‍රමාණයක් අධිකරණ තුළ ගොඩගැසී තිබෙනවා. නමුත්, අපි ආණ්ඩු බලය අරගෙන මෙවර අය වැයෙනුත් අවධානය යොමු කරලා, විශේෂයෙන්ම තඹුත්තේගම, අඟුණුකොළපැලැස්ස, බිබිල, හෙට්ටිපොල, ආණමඩුව වගේ ප්‍රදේශවල තිබුණු මහෙස්ත්‍රාත් අධිකරණ, circuit courts සහ දිසා මහෙස්ත්‍රාත් අධිකරණ බවට පත් කරලා තිබෙනවා. අධිකරණවල නඩු ගොඩගැහෙන එක අඩු කිරීමේ එක් විකල්පයක් හැටියට තමයි අප එය කළේ. මොකද, සමහර අධිකරණවල සවස 5.00, 6.00 පමණ වන තුරුම නඩු විභාග වෙනවා. ඉතින්, කාර්ය මණ්ඩලවලින් සහ නීතිඥ මණ්ඩලයෙන් චෝදනා එල්ල වෙලා තිබුණා. අපි ඒ වෙනුවෙන් පියවර ගැනීම් අවසන් කර තිබෙනවා. විශේෂයෙන්ම අලුත්කඩේ උසාවි සංකීර්ණයේ තවත් මහාධිකරණ සහ මහෙස්ත්‍රාත් අධිකරණ කිහිපයක් ඇති කිරීමට කටයුතු කරනවා. මා හිතන්නේ, ඒ කටයුතු සියල්ල අවසන් අදියරේයි තිබෙන්නේ.

විශේෂයෙන්ම සමථකරණය පිළිබඳව කලක පටන් - අතීතයේ පටන්ම - විවිධ අණ පනත් මේ පාර්ලිමේන්තුවට ගෙනැවිත් තිබෙනවා අපි දැකලා තිබෙනවා. අපි ප්‍රායෝගිකව දැකලා තිබෙනවා, වර්තමානයේ ක්‍රියාත්මක වන සංශෝධිත සමථ මණ්ඩල පනත ඉතා සාර්ථක විධියට නඩු load එක අඩු කරන්න අධිකරණ පද්ධතියට සහනයක් වන පරිදි ක්‍රියාත්මක වන ආකාරය. ඒ හින්දා තමයි වර්තමාන අධිකරණ ක්‍රියාවලිය තුළම තිබෙන සමථකරණය වෙනම පද්ධතියක් තුළට අරගෙන ඇවිල්ලා, සමථකරණයට එළැඹීමේ අවස්ථාව අධිකරණ ක්‍රියාවලියෙන් පිටතට ලබා දීම මේ පනත හරහා විශේෂයෙන්ම සිද්ධ කරන්නේ. මොකද, නඩු කටයුතු ප්‍රමාණය අවම කර ගැනීමේ සහ කාලය ඉතිරි කර ගැනීමේ අරමුණින්, ඊට විකල්පයක් විධියට සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනත 2022 වර්ෂයේදී මේ ආකාරයෙන්ම ගෙනාවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත්, ඒ අරමුණු ඒ ආකාරයෙන්ම සාක්ෂාත් කර ගැනීමට අපට හැකියාව ලැබී නැහැ. මොකද, මා දන්නා පරිදි අලුත්කඩේ අධිකරණයේ දිනකට එක් මූල්‍ය ආයතනයකට සහ විවිධ සමාගම්වලට ගොනු කිරීමට නියම කරන සුළු හිමිකම් ආරාවුල් සම්බන්ධ නඩු නිශ්චිත සංඛ්‍යාවක් තිබෙනවා.

මොකද, ඒ තරම් නඩු විශාල ප්‍රමාණයක් අධිකරණවල ගොනු වෙන්න පටන් ගත්තා. ලේඛනාගාරවල ඉඩ කඩ ප්‍රමාණවත් නොවන තත්ත්වයට පත් වුණා, එම පනත ගෙන ඒම හරහා. ප්‍රායෝගිකව මාස 18ක් ඇතුළත වාගේ නඩු තීන්දුව ලබා දීමට සහ නඩු කටයුතු අවසන් කිරීමට තිබුණත්, අපට ඒ පනතේ අරමුණු සාක්ෂාත් කරගැනීමට හැකියාව ලැබිලා නැති තත්ත්වයක් පවතිනවා. අන්න ඒ හින්දා තමයි අපි මේ පනත් කෙටුම්පත අද ඉදිරිපත් කර තිබෙන්නේ. බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රයේ වාණිජ නඩු විශාල වශයෙන් ගරු අධිකරණවල ගොනු වෙද්දී බොහෝ අවස්ථාවල සමථකරණයෙන්ම තමයි ඒ නඩු කටයුතු අවසානයට පත් වෙන්නේ. ඒ නිසා අධිකරණ පද්ධතිය තුළට සමථකරණය එන්නේ නැතිව, පිට ඉඳන් සමථ කරගෙන හෝ සමථ කිරීමට නොහැකි නම් ඒ නඩුවලට මැදිහත්වීමට මෙමඟින් අවස්ථාව ලැබෙනවා. ඊට අමතරව නඩු කටයුතු අතරතුරදී ගරු විනිශ්චයකාරවරුන් අවශ්‍යයි සලකන අවස්ථාවලදී අවශ්‍ය කොටස් සඳහා සමථකරණයට එළඹීමට අවස්ථාව මෙමඟින් උදාකර තිබෙනවා.

මේ පනත අදාළ වෙන්නේ නැහැ, පවුල් නීතියේ එන ආරාවුල් සම්බන්ධයෙන්. ඒ වාගේම මූලික අයිතිවාසිකම් නඩු, දේපළ බෙදීම සම්බන්ධ නඩු, උපත්, මරණ හා ලේඛන සම්බන්ධ නඩුවලට මේ පනත අදාළ වෙන්නේ නැහැ. විශේෂයෙන් බැංකු ක්ෂේත්‍රයේ, මූල්‍ය ක්ෂේත්‍රයේ, වාණිජ ක්ෂේත්‍රයේ ගොඩ ගැහෙන නඩු ප්‍රමාණය අඩු කරගැනීමට මෙය මහත් අස්වැසිල්ලක් වෙනවා කියලා අපි විශ්වාස කරනවා. මොකද, ණය ගිවිසුම් කඩවීම් සම්බන්ධයෙන් නඩු විශාල ප්‍රමාණයක් ගරු අධිකරණවලට ඉදිරිපත් වෙනවා. ඒවා නඩුවකින්ම සමථ වෙලා අවසන් වීමත් සිද්ධ වෙනවා වාගේම, මූල්‍ය ආයතනවල සිවිල් සහ වාණිජ නඩුවලදී දැන් අධිකරණ පද්ධතියෙන් එපිට ඉඳන් සමථකරණ ක්‍රියාවලියට එළඹිලා, අවශ්‍ය නම් අධිකරණයට පැමිණීමට දැන් අවස්ථාව උදාවෙලා තිබෙනවා. මේ ඔස්සේ අධිකරණ පද්ධතිය තුළ සිදුවන නඩු කටයුතු මාස දෙක තුන හතර ප්‍රමාද වීම වළක්වා ගැනීමට අපට හැකියාව ලැබිලා තිබෙනවා.

[ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහතා]

මෙම පනත ගෙන ඒමට පෙර මූල්‍ය සීමාවක් තිබුණා, රුපියල් ලක්ෂ 10ට අඩු නඩු අනිවාර්යයෙන් සමථකරණයට එළඹීමට අවශ්‍යයි කියලා. සමථ වීම හෝ නොවීම සඳහා නිරවුල් කිරීමේ සහතික ඉදිරිපත් කිරීමට අවශ්‍ය වෙනවා, මින් පෙර මෙවැනි නඩුවලට එද්දී. ඒ පිළිබඳව අධ්‍යයනය කරලා බලද්දී 2024 වර්ෂය වනවිට අපට දකින්න පුළුවන්, නඩු කටයුතුවලින් සියයට 59කට ආසන්න ප්‍රමාණයක් සමථකරණයෙන් අවසන් කර ගැනීමට හැකියාව ලැබිලා තිබෙනවා කියලා. මේ පනත හරහා ශක්තිමත් නීති පද්ධතියක් සකසලා ඒ තත්ත්වය වර්ධනය කිරීමට අවස්ථාව උදාකරලා තිබෙනවා. අපට මෙයින් අවස්ථාව ලැබෙනවා, අධිකරණ පද්ධතියට පරිබාහිරව සිට විශේෂ ආයතන සමඟ කථා බහ කරමින්, පනත් කෙටුම්පතේ ප්‍රතිපාදන අනුව යෝග්‍ය පරිදි සමථකරුවෙක් පත්කරගෙන, ව්‍යාපාරික ක්ෂේත්‍රයේ මිතුරන් සමඟ සාකච්ඡාවෙන් සුහදතාව ආරක්ෂා කරගෙන, හොඳ හිත තියාගෙන සමථකරණයකින් නඩු කටයුත්ත අවසන් කරගන්න. සාමාන්‍යයෙන් ප්‍රායෝගිකව දීර්ඝකාලීනව නඩු කටයුතුවලට යොමු වීමේ ප්‍රතිඵලයක් හැටියට ව්‍යාපාරික ලෝකයේ වාගේම වාණිජ ලෝකයේ ඒ ඒ පාර්ශ්ව අතර නඩු කටයුතු අවසානයේ අමනාපකම් ඇති වෙනවා. නමුත් මේ ඔස්සේ සමථකරණයෙන් කථා බහ කරගෙන, නඩුවලට නොයා කාලය සහ වියදම් අවම කර ගැනීමට ඔවුන්ට හැකියාව ලැබෙනවා. විශේෂයෙන් ආයෝජකයන්ට, ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ඉන්න අයට, මූල්‍ය ක්ෂේත්‍රයේ ඉන්න අයට තමන්ගේ ආයතනවල නඩු සඳහා ගතවන කාල වේලාව, ශ්‍රමය සහ අනෙකුත් සියලු දේවල් අඩුකරගෙන වඩාත් කාර්යක්ෂමව ඔවුන්ගේ මූල්‍ය ශක්තිමත්භාවය පවත්වා ගෙන යන්න මේ පනත වඩාත් යෝග්‍ය පනතක් බව මම විශ්වාස කරනවා.

ඉන්දියාව 2023 වර්ෂයේ මේ පනත ගෙනැල්ලා ඉතාම සාර්ථක විධියට රට තුළ ක්‍රියාත්මක කරමින් යනවා. සිංගප්පූරුව, මාලදිවයින වැනි රටවල් මේ වනවිටත් මේ පනත ක්‍රියාත්මක කරමින් සමථකරණය හරහා ව්‍යාපාරික හා ආයෝජන ක්ෂේත්‍රයේ ගැටලු සාර්ථකව නිරාකරණය කරගැනීම සිදු කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට අමතරව මේ ඔස්සේ නීතිඥවරුන්ටත් නව භූමිකාවක් විවර වෙනවා. අධිකරණ කටයුතුවලින් පරිබාහිරව සමථකරණයේදී පාර්ශ්වයක් හැටියට නීතිමය තර්කවලින් තොරව මැදිහත්භාවයක් ලබා දෙන්න ඔවුන්ට අවස්ථාව ලැබෙනවා.

ඒ වාගේම, වාණිජ ක්ෂේත්‍රයේ සහ විවිධ ප්‍රවීණතා ඇති වෘත්තීමය තැනැත්තන්ට ද ඒ වෘත්තීමයභාවය තවදුරටත් පුළුල් කරගෙන සමථකරුවකු ලෙස රැකියා අවස්ථා විවෘත කර ගැනීමටත් හැකියාව ලැබෙනවා. සමස්තයක් ලෙස අධිකරණ පද්ධතියට ඇතුළත් වන නඩුහබ ගොනු කිරීම් ප්‍රමාණය අඩු කිරීමටත්, නඩු කටයුතුවලින් පසුව පාර්ශ්ව අතර ඇති වන අමනාපකම් අඩු කරගෙන අධිකරණ ක්‍රියාවලිය සාර්ථකව නිමාවට ලක් කර ගැනීමටත් හැකියාව ලැබෙන පනතක් ලෙස මම මෙය විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Gnanamuththu Srineshan. You have eight minutes.

[மு.ப. 11.40]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஶ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் மத்தியஸ்தம் (குடியியல் மற்றும் வர்த்தகப் பிணக்குகள்) சட்டமூலம், குற்றவியல் கருமங்களில் பரஸ்பர உதவியளித்தல் சட்டத்தின் கீழான கட்டளை ஆகியன விவாதத்துக்கு எடுத்துக் கொள்ளப்பட்டு இருக்கின்றன. எமது நாட்டின் நீதிமன்றங் களில் வழக்குகள் தேங்கிக் கிடக்கின்றன. அநேகமான வழக்குகள் வழக்காடப்பட்டு 10-15 வருடங்கள் கடந்தும் தீர்ப்பு கிடைக்கப்பெறாத நிலைமையே காணப்படுகின்றது. எனவே, இந்த மத்தியஸ்தம் (குடியியல் மற்றும் வர்த்தகப் பிணக்குகள்) சட்டமூலம் கட்டாயம் தேவையான ஒன்றாகும். எல்லா விடயங்களும் நீதிமன்றுக்குச் செல்லும்போது, வழக்குகளில் தேக்கம் ஏற்படுவது இயல்பானது. மத்தியஸ்த சபைகளை நிறுவி அவற்றை ஆரோக்கியமான முறையில் கொண்டு செல்வதோடு, அவற்றுக்கு நியமிக்கப்படுகின்றவர்கள் மனிதநேயம் உள்ளவர்களாகவும் நடுநிலைத் தீர்ப்பாளர் களாகவும் இருக்க வேண்டியதும் அவசியமானது. எனவே, நாங்கள் இந்தச் சட்டமூலத்தை சாதகமாகப் பார்க்கின்றோம். வழக்குகளை விரைவாக முடிப்பதற்கும், வீண் செலவுகள் மற்றும் நேர விரயத்தைக் குறைத்துக் கொள்வதற்கும் மத்தியஸ்த சபைகளை நிறுவுதல் மற்றும் அவற்றைச் செயற்படுத்துதல் மிக முக்கியமானது. சமூகப் பிரச்சினை களைச் சமூகத்திலுள்ள பெரியவர்கள் மூலமாகத் தீர்த்துக்கொள்வது வரவேற்கத்தக்க விடயமாகும். அந்த வகையில், இந்தச் சட்டமூலம் அவசியமான ஒன்றென்பது உணரப்படுகின்றது.

உள்நாட்டிலும் சரி, வெளிநாடுகளிலும் சரி, குற்றவியல் விடயங்களில் பரஸ்பர ஒத்துழைப்புகளைப் பெற்றுக் கொள்ளுதல் என்ற விடயம் முக்கியமான ஒன்றாக இருக்கின்றது. குற்றவியல் சட்டங்கள் சம்பந்தமான விடயத்தில் சர்வதேச ரீதியாக பரஸ்பர ஒத்துழைப்பு இருப்பதன் காரணமாக, கடந்த காலங்களில் பல குற்றங்களைச் செய்துவிட்டு வெளிநாடுகளில் ஒளிந்திருந்த பாதாள உலகக் குழுக்களின் தலைவர்களைக் கைதுசெய்ய முடிந்தது. நீண்ட காலமாக எமது நாட்டைப் போதைப்பொருளின் இராச்சியமாக அல்லது அதன் களஞ்சியமாக மாற்றி வைத்திருப்பவர்களைக் கைதுசெய்யாமல், அவர்களின்கீழ் பணியாற்றுகின்ற சிறியவர்களைக் கைது செய்வதன்மூலம் போதைப்பொருள் இராச்சியத்தைக் கட்டுப்படுத்த முடியாது.

எனவே, குற்றவியல் சட்டம் சம்பந்தமான விடயங்களில் சர்வதேச நாடுகளுடன் பரஸ்பர ஒத்துழைப்பை ஏற்படுத்துவதன்மூலம் சமூகத்தைச் சீரழிக்கின்ற அல்லது சமூகத்தை அழிக்கின்ற போதைப்பொருள் வர்த்தகத்தைக் கட்டுப்படுத்த வேண்டும். இந்த விடயத்துடன் தொடர்புடைய முக்கிய தலைவர்கள் பல நாடுகளில் இருந்தும் கைது செய்யப்பட்டுக் கொண்டுவரப்பட்டு, அவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுக்கப்பட்டிருப்பதை நாங்கள் வரவேற்கின்றோம். ஏனென்றால், இந்த நாடு போதைப் பொருளால் அழியக்கூடிய ஒரு தேசமாக மாறிக்கொண்டு இருக்கின்றது. சில முக்கிய அரசியல்வாதிகள் மற்றும் சமூகத்தின் முக்கிய பிரமுகர்கள் என்று கூறப்படு கின்றவர்கள்கூட, பாதாள உலகக் கோஷ்டியினருடனும் போதைப்பொருள் வியாபாரம் செய்கின்றவர்களுடனும் இணைந்து செயற்படுகின்ற ஒரு துர்ப்பாக்கிய நிலைமை இந்த

நாட்டில் காணப்படுகின்றது. ஆகவே, மத்தியஸ்த சபையை நிறுவுதல், அதனை வினைத்திறனுடன் இயங்க வைத்தல் என்பன முக்கியமானது. அவற்றின் மூலமாக சமூகப் பிரச்சினைகளைத் தீர்க்க வேண்டும். அத்தோடு, குற்றவியல் சம்பந்தமான இணக்கப்பாட்டுடன் குற்றவாளிகளைத் தண்டித்தல் அவசியமானது.

எந்தவொரு சந்தர்ப்பத்திலும் அப்பாவிகள் தண்டிக்கப்படக் கூடாது. அதேநேரம், குற்றம் புரிந்தவர்கள் தண்டிக்கப்பட்டே ஆகவேண்டும். குற்றம் புரிந்தவர்களைப் பாதுகாக்கின்ற ஒரு பொறிமுறை கடந்த காலங்களில் காணப்பட்டது. மிக முக்கியமான குற்றவாளிகள்கூட தப்பித்துக்கொள்கின்ற ஒரு சூழ்நிலை காணப்பட்டது. குறிப்பாக, உயிர்த்த ஞாயிறு குண்டுத் தாக்குதல் நடந்ததன் பின்னர், மூன்று பேர் சனாதிபதிகளாக இருந்திருக்கிறார்கள். மைத்திரிபால சிறிசேன, கோட்டாபய ராஜபக்ஷ, ரணில் விக்கிரமசிங்ஹ ஆகியோர் முறையே சனாதிபதிகளாக இருந்திருக்கிறார்கள்.

உயிர்த்த ஞாயிறு தாக்குதலுடன் சம்பந்தப்பட்ட சூத்திரதாரிகளை - அழிவை ஏற்படுத்தியவர்களை - "Alpha", "Sam", "Pappa" என்றெல்லாம் சொல்கின்றார்கள். இவர்கள் யார் என்பது புரியாத ஒரு நிலைமை காணப்பட்டது. உண்மையிலேயே குற்றம் செய்தவர்கள் தண்டிக்கப் பட்டுத்தான் ஆகவேண்டும். குற்றவாளிகளைப் பாதுகாக்கின்ற ஒரு சட்டக் கட்டமைப்பு அல்லது ஓர் அரசியல் கட்டமைப்பு இருக்குமாக இருந்தால், நிச்சயமாக இந்த நாடு முன்னேறுவதற்கு இடமே இல்லை. இன்று இந்த அரசாங்கம் குற்றவாளிகளைக் கண்டுபிடிக்கக்கூடிய விதத்தில் செயற் படுவதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. அதேநேரத்தில், குற்றவாளிகளைக் கண்டுபிடித்து விடக்கூடாது, அவர்களைக் காப்பாற்ற வேண்டும் என்ற அடிப்படையில் செயற்படுகின் றவர்களையும் நாங்கள் நோக்கக்கூடியதாக இருக்கின்றது. எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்திலும் தேவாலயத்தில் வழிபாட்டில் ஈடுபட்டிருந்த அப்பாவி மக்கள் பலர் இந்த உயிர்த்த ஞாயிறு தாக்குதலில் கொல்லப்பட்டார்கள். ஆன்மீக வழிபாட்டுக்குச் சென்றவர்களைக் கொலைசெய்வது மிகப் பயங்கரமான, குரூரமான ஒரு செயலாகும். ஆகவே, சம்பந்தப்பட்ட முக்கிய குற்றவாளிகள் கைதுசெய்யப்பட வேண்டும்; தண்டிக்கப்பட வேண்டும். அதன் மூலமாக குற்றவாளிகளுக்குப் பய உணர்வு ஏற்பட வேண்டும் என்பதை நான் கூறிக்கொள்ள விரும்புகின்றேன். இது இன்றைய விவாதத் தலைப்போடு சம்பந்தப்பட்ட விடயமாகும்.

அடுத்து, தற்போது மட்டக்களப்பு மாவட்டத்திலுள்ள விவசாயிகள் எதிர்கொள்கின்ற பிரச்சினை சம்பந்தமாகக் கூற விரும்புகின்றேன். தற்பொழுது, அங்குள்ள விவசாயிகள் நெல் அறுவடைக்குத் தயாராக இருக்கின்றார்கள். இந்த நேரத்தில், ஒரு கிலோகிராம் நெல்லுக்கு 120 ரூபாயென விலை நிர்ணயம் செய்யப்பட்டு இருக்கின்றது. இதன்படி பார்த்தால், ஒரு மூடை நெல் கிட்டத்தட்ட 6,900 ரூபாய் வரை செல்லக்கூடிய நிலைமை காணப்படுகின்றது. 8,000 ரூபாய்க்குக் கொள்வனவு செய்ய வேண்டிய உர மூடை, தற்போது தனியார் கடைகளில் 17,000 ரூபாயுக்கும் அதிக விலைக்கு விற்கப்படுகின்றது. அதேநேரம், அரசாங்கம் கமநல அபிவிருத்தித் திணைக் களத்தின் ஊடாக 10,500 ரூபாய்க்கு உர மூடையை விற்பனை செய்கின்றது. எனினும், அவ்வாறு விற்பனை செய்யப்படுகின்ற உரத்தின் அளவு விவசாயிகளுக்குப் போதாமல் இருக்கின்றது. விவசாயிகள் அதிக விலை கொடுத்து - 17,500 ரூபாய் கொடுத்து - தனியாரிடமிருந்து உரத்தைக் கொள்வனவு செய்தாலும், உற்பத்தியின் பின்னர் நெல்லுக்கான உத்தரவாத விலை சரியாக நிர்ணயம் செய்யப்படாததால் திடீரென வீழ்ச்சியைச் சந்திக்கின்றார்கள். இவ்வாறு வீழ்ச்சியைச் சந்திக்கும்போது, விவசாயிகள் மிக மோசமாகப் பாதிக்கப் படுகின்ற ஒரு நிலைமை காணப்படுகின்றது. பொருளாதாரத்தில் விவசாயப் பொருளாதாரம் மிக முக்கியமானது. உற்பத்தியில் ஈடுபடுகின்ற விவசாயிகளைப் பாதுகாக்கக்கூடிய விதத்தில் உரிய காலத்தில் நெல்லுக்கான விலை நிர்ணயத்தைச் செய்ய வேண்டும். அந்த விலை நிர்ணயமானது அறுவடை செய்கின்ற காலத்தில் விவசாயி களுக்குப் பயனளிக்கக் கூடியதாக இருக்க வேண்டுமென கேட்டுக் கொள்கின்றேன்.

சொல்லிசைப் பாடகர் சங்கீத்சனன் என்பவர் பயங்கரவாத தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்டு இருப்பதாகக் கூறப்பட்டது. இருந்தாலும், அவருக்குப் பிணை வழங்குவது சம்பந்தமாகப் பரிசீலிப்பதாக அறிகின்றோம். சிறிய விடயங்களைப் பெரிதாக்கிப் பயங்கரவாதத் தடைச் சட்டத்துக்குள் உட்படுத்துவதும், பாரிய குற்றச் செயல்களைச் செய்தவர்கள் கைது செய்யப்படாமல் ஓடி ஒளிந்து கொண்டிருப்பதும் வரவேற்கத்தக்க விடயமல்ல. எனவே, அந்தப் பாடலோடு சம்பந்தப்பட்ட இளைஞன் விடுதலை செய்யப்பட வேண்டும்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Gnanamuththu Srineshan, your time is up.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Please give me one more minute, Sir.

இப்போது மக்கள் எதிர்பார்க்கின்ற விடயமான விளையாட்டு உத்தியோகத்தர்களுடன் சம்பந்தப்பட்ட ஒரு விடயத்தைக் கூற விரும்புகின்றேன். மாவட்டங்களில் 50 சதவீதத்துக்கும் குறைவான விளையாட்டு உத்தியோகத்தர் களைக் கொண்டுதான் விளையாட்டுப் பயிற்சிகள் கொடுக்கப்பட்டு வருகின்றன. ஆகவே, விளையாட்டு உத்தியோகத்தர்களின் நியமனங்களைச் செய்யவேண்டியதன் அவசியத்தை நான் இந்த இடத்தில் சுட்டிக் காட்டுகின்றேன். பல மாவட்டங்களில் ஒரு நிலையத்தில் இருக்கின்ற விளையாட்டு உத்தியோகத்தர், 3-4 நிலையங்களில் பதில் கடமையாற்ற வேண்டியவராக இருக்கின்றார்.

சுதேச வைத்தியத்துறையில் ஆயுர்வேதம், சித்த வைத்தியம், யுனானி போன்ற துறைகளில் கற்று வெளியேறியவர்கள் தங்களது உள்ளகப் பயிற்சியையும் முடித்திருக்கிறார்கள். எனினும், அவர்களுக்கு இன்னும் நியமனம் வழங்கப் படவில்லை. சுதேச வைத்தியத்துறையை நாங்கள் சுதேச நாட்டில் அபிவிருத்தி செய்யவில்லை என்றால், அவர்கள் எங்கு சென்றும் தொழில்வாய்ப்பைப் பெற முடியாது. ஆகவே, சுதேச வைத்தியத்துறையில் பட்டத்தைப் பெற்றவர்களுக்கு உரிய நியமனங்களை உடனடியாக வழங்க வேண்டுமெனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Susantha Dodawatta. You have nine minutes.

[පූ.භා. 11.49]

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ ගරු සභාවේ විවාදයට ගැනෙනවා සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත පිළිබඳවත්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමථකරණය කියන සංකල්පය ලංකාවටත්, වර්තමාන ලෝකයටත් කොයි තරම් වැදගත් ද කියන මූලික අදහසත් එක්ක මගේ කථාව පටන් ගන්න කැමැතියි. විශේෂයෙන්ම ලංකාව වාගේ මානව සම්බන්ධතා බිඳ වැටිච්ච සමාජයකට මේ සමථකරණය කියන සංකල්පය ඉතා වටිනවා. අපි දෛනිකව දකිනවා, නඩුවක් සම්බන්ධයෙන් අධිකරණයට එන පාර්ශ්ව දීර්ඝ කාලීනව ඒ නඩුව පවත්වාගෙන යන්නේ කොහොමද කියලා. දීර්ඝ කාලයක් නඩු කටයුතු ක්‍රියාත්මක කරලා, පරම්පරාගත තරහකාරයන් වෙලා අවසන් වන සංස්කෘතියක් ඇතුළේ සමථකරණය කියලා කියන්නේ ඉතාම වැදගත් සංකල්පයක් කියලා අපි විශ්වාස කරනවා. මොකද, අනෙකාගේ අදහසට ගරු කරමින්, අනෙකාගේ අනන්‍යතාවට ගරු කරමින්, ප්‍රශ්නයක් හුදු නීතිමය සීමාවන් තුළට සීමා නොවී එතැනින් එහා ගිය මානුෂීය තත්ත්වයක් තුළ විසඳා ගන්න සමථකරණය තුළින් ඉඩ ලැබෙනවා. ඒ නිසා මේ සමථකරණය කියන ක්‍රියාවලිය හුදු ආරාවුල් විසඳා ගැනීමේ ක්‍රියාවලියකින් එහාට ගිහිල්ලා මානව සමාජයේ ප්‍රගමනය සඳහා භාවිත කළ හැකි සාර්ථක ක්‍රියාවලියක්.

සමථකරණය කියන්නේ ශ්‍රී ලංකාවට අලුත් සංකල්පයක් නොවෙයි. සමථකරණය ශ්‍රී ලංකාව තුළ සාම්ප්‍රදායික වශයෙන් තිබුණා. එය ජාත්‍යන්තර තලයට ගෙන යාමේ අවස්ථාවක් විධියට තමයි මේ නව පනත් කෙටුම්පත අපි දකින්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ අධිකරණ තුළ මේ වන විටත් කොයි තරම් නඩු ප්‍රමාණයක් විසඳා ගන්න බැරිව ගොඩ ගැහිලා තිබෙනවා ද කියලා අපි දන්නවා. ඒ වාගේම මේ රටේ මහජනතාව තමන්ගේ නඩු වෙනුවෙන් කොයි තරම් මුදල් පිරිවැයක් දරනවා ද, ඒ වාගේම ජීවිතයෙන් කොච්චර කාලයක් කැප කරනවා ද කියලා අපි දන්නවා. ඒ වාගේම, මේ රටේ සිටින සීමිත විනිසුරුවරු ප්‍රමාණයෙන් කොයි තරම් ප්‍රමාණයක් ඔවුන් විසින් වඩාත් සංකීර්ණ නඩු සඳහා, වඩාත් ජාතික වැදගත්කමකින් යුතු නඩු සඳහා කැප කළ යුතු කාලය මේ පෞද්ගලික, සිවිල් සහ වාණිජ ආරාවුල් වෙනුවෙන් කැප කරනවා ද කියන එකත් අපි දන්නවා. මේ සියල්ල වළක්වා ගැනීමේ අවස්ථාව විශේෂයෙන්ම අද දින ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත තුළ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වන විට ආර්ථිකමය වශයෙන් වේගවත් දියුණුවක් අත්කර ගනිමින් තිබෙන ලංකාව වාගේ රටක් සම්බන්ධයෙන් මෙවැනි පනතක් වැදගත් වෙන්නේ කොහොමද? ලෝකය පුරා සිටින ආයෝජකයන් තමන්ගේ ආයෝජන සඳහා යම්කිසි රටක් තෝරා ගනිද්දී ඔවුන් සලකා බලන එක්තරා විශේෂ කාරණාවක් තමයි තමන්ගේ ව්‍යාපාර ඇතුළේ යම්කිසි වාණිජ ආරාවුලක් මතු වුණොත්, ඒක විසඳා ගන්නේ කොහොමද කියන එක. මේ වාණිජ සහ සිවිල් ආරාවුල් සමථකරණය කියන සංකල්පය ලංකාව තුළ ක්‍රියාත්මක වීම, විශේෂයෙන්ම ලංකාවට එන ආයෝජකයන්ට ආයෝජනය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට හේතු වෙනවා. ලෝකයේ ප්‍රධානම වාණිජ මධ්‍යස්ථාන වන සිංගප්පූරුව, එක්සත් රාජධානිය, හොංකොං වාගේ රටවල් ආරාවුල් නිරාකරණය කිරීමට මේ සමථකරණය භාවිත කරනවා. ඒ හරහා ඔවුන්ට ආර්ථිකමය සහ වාණිජමය වශයෙන් විශාල දියුණුවක් අත්පත් කර ගත් රාජ්‍යයන් බවට පත්වෙන්න හැකියාව ලැබී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කළොත්, මේක ශ්‍රී ලංකාවට අලුත් සංකල්පයක් නොවෙයි. බහුතර බෞද්ධ ජනතාවක් සිටින රටක සමථකරණය කියන එක ඓතිහාසිකව පුරුදු වෙලා තිබෙන තත්ත්වයක්. අද ජාතික ජන බලවේගය රජය විසින් මේ ඓතිහාසික තත්ත්වය, මේ ඓතිහාසික සම්ප්‍රදාය - practice එක - ජාත්‍යන්තර මට්ටමට ගෙනෙන්න තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අලුත් පනත් කෙටුම්පත ගැන මම මීට වඩා කථා කරන්නේ නැහැ. මොකද, දැන් මොහොතකට කලිනුත්, මේ දවස් කිහිපයේත් වෙනත් කාරණා සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේත්, එළියේත් විවිධ වැරදි මත නිර්මාණය කරමින් ඉන්නවා. පාස්කු ප්‍රහාරයට අදාළව කොටුව මහේස්ත්‍රාත් අධිකරණ නඩුවේ තුන්වැනි සැකකරු ලෙස අධිකරණයට ඉදිරිපත් කරලා දැනට රැඳවුම් නියෝග මත සිටින තුවාන් සුරේෂ් සලේ කියන සැකකරු සම්බන්ධයෙන් චාමර සම්පත් මන්ත්‍රීවරයා දැන් ටිකකට කලිනුත් යම්කිසි ප්‍රකාශයක් කළා. ඔවුන් එළියට ගිහිල්ලා ඉතා වැරදි සහගත තොරතුරු මාධ්‍යයට ප්‍රකාශ කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ අපරාධ නීතිය යටතේ පුද්ගලයෙක් සැකකරුවෙක් විධියට අධිකරණයට ඉදිරිපත් කරන්නේ, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 109 වන වගන්තිය යටතේ විමර්ශකයා විසින් ඒ තැනැත්තා එම අපරාධයට සම්බන්ධ බව ඔප්පු කිරීමට ප්‍රමාණාත්මක සාක්ෂි තිබෙනවා නම් පමණයි. ඒ නිසා කුඩා කුඩා කල්ලි, කණ්ඩායම් එකතුවෙලා පාරට බැහැලා, අට්ටාල ගහගෙන මෙවැනි අසාර්ථක වෑයමක් දරමින් සිටින්නේ අපරාධ නඩුවක සැකකරුවෙක් සම්බන්ධයෙන් කියන එක මේ වෙලාවේ මම කියන්න ඕනෑ.

එළියේදී ඒ තැනැත්තා සම්බන්ධයෙන් කරන ඉල්ලීම් මොනවාද කියලා බලන්න. මොනවාද ඒ ඉල්ලීම්? ඒ සියලුම ඉල්ලීම්වල තිබෙන්නේ ඔහුට සාධාරණයක් ඉෂ්ට කරන්න කියනවා වාගේ අදහසක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තැනැත්තාට සාධාරණය ඉෂ්ට කරවා ගැනීමේ හැකියාව තිබෙන්නේ ඒ තැනැත්තාටමයි. මම එහෙම කියන්නේ ඇයි? ඊයේ දවසේ මහජන ආරක්ෂක අමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කළා. එහිදී ඉතා පැහැදිලිව දැනුම් දුන්නා, - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවත් අධිකරණයට දැනුම් දීලා තිබෙනවා - ඒ සැකකරු විසින් ඔහු රඳවා ගෙන සිටි සමස්ත කාලය ඇතුළතදී විමර්ශනයට අවශ්‍ය සහාය ලබා දීලා නැහැයි කියලා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා අහනවා, "අපි බෝධි පූජා තියනවා තමයි, ඇයි මොකද?" කියලා. බෝධි පූජා නොවෙයි, කිරි කොරහ නැටුවත් අපට කමක් නැහැ. හැබැයි, තමන්ගෙන් අත්අඩංගුවට ගත් laptop එකේ, තමන්ගෙන් අත්අඩංගුවට ගත් ජංගම දුරකථනයේ මුරපද ටික ගිහිල්ලා දුන්නා නම්, මෙතැන කිරි කොරහ නටන්න වෙන්නේ නැහැ. එක්කෝ, මේ සැකකාරයා තමන් වැරදි බව දන්නා නිසා තොරතුරු සඟවනවා. එහෙම නැත්නම්, යම්කිසි පාර්ශ්වයක් ඔහුට තර්ජනය කරලා තොරතුරු ලබා දෙන්න ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා තැන් තැන්වල අට්ටාල ගහගෙන නාඩගම් නටනවා වෙනුවට මේ විමර්ශනයට සහාය දුන්නා නම්, නිසි විමර්ශන අවසන් කරලා අධිකරණයට කරුණු වාර්තා කරන්න ඒ විමර්ශන නිලධාරීන්ට හැකියාව ලැබෙනවා. ඉන්පසු ඒ සැකකරු සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග අධිකරණය මඟින් තීරණය කරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මොහොතේත් තැන් තැන්වල පුහු විරෝධතා කරමින් මේ අය දඟලන්නේ මොකටද? මේ අයට එහෙම වෙලා තිබෙන්නේ ඇයි කියන එක ඉතාම පැහැදිලියි. 2029දී බලය අත්පත් කර ගන්නවා කියලා නේ කියන්නේ. 2029දී බලය අත්පත් කර ගැනීම කෙසේවෙතත්, මේ වෙනකොට වැලිකඩ බන්ධනාගාරයේ බහුතර බලය - තුනෙන්

දෙකක බලය - නම් විපක්ෂය ජයග්‍රහණය කරමින් ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහින්දානන්ද අලුත්ගමගේ අවුරුදු 20කට හිරේ, නලින් ප්‍රනාන්දු අවුරුදු 25කට හිරේ, සරණ ගුණවර්ධන අවුරුදු 16කට හිරේ, එස්.එම්. රංජිත් අවුරුදු 16කට හිරේ, ශාන්ති චන්ද්‍රසේන අවුරුදු 16කට හිරේ, ජගත් සමන්ත අවුරුදු පහමාරකට හිරේ. දැන් ටිකකට කලින් නව ප්‍රවෘත්තියක් ආවා, ශෂී වීරවංශට මහේස්ත්‍රාත් අධිකරණයෙන් දීපු සිර දඬුවම සම්බන්ධයෙන් කළ අභියාචනය මහාධිකරණය මඟින් ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා කියලා. ඇයත් දැන් අවුරුදු 2කට සිර දඬුවම් ලබා තිබෙන්නේ. ඒ වාගේම අපි දන්නවා, ඊයේ දවසේ විමල් වීරවංශගේ සහෝදරයා වන සරත් වීරවංශට අධිකරණය මඟින් විදේශ ගමන් තහනමක් පනවපු බවත්; ඒ එක්කම අත්අඩංගුවට ගන්න කියපු බවත්. ඔහුගේ මාධ්‍ය ලේකම්වරයාත් ලබන 24වැනි දා දක්වා රිමාන්ඩ්. බැසිල් රාජපක්ෂ සම්බන්ධයෙන් ජාත්‍යන්තර වරෙන්තු ලබා ගැනීම සඳහා දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කරන්න කියලා අධිකරණය කිව්වා. මෙන්න මේක තමයි තත්ත්වය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නාමල් රාජපක්ෂ ඉන්නේ ඇප මත, යෝෂිත රාජපක්ෂ ඉන්නේ ඇප මත, ශෂීන්ද්‍ර රාජපක්ෂ ඉන්නේ ඇප මත, බැසිල් රාජපක්ෂ ඉන්නේ ඇප මත, ජොන්ස්ටන් ප්‍රනාන්දුයි, පුත්තු දෙදෙනායි ඉන්නේ ඇප මත, විමල් වීරවංශ ඉන්නේ ඇප මත, රාජිත සේනාරත්න ඉන්නේ ඇප මත. දැන් ටිකකට කලින් කථා කළ චාමර සම්පත් ඉන්නේත් ඇප මත. ඒ වාගේම රනිල් වික්‍රමසිංහ ඉන්නෙත් ඇප මත. ගෝඨාභය රාජපක්ෂ සම්බන්ධයෙන් විදේශ ගමන් තහනමක් පනවා තිබෙනවා. හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ඇපැලකට යටත්ව එළියේ ඉන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ලැයිස්තුව තවත් දිගයි. පළාත් පාලන ආයතන, ඒවාට සම්බන්ධ නිලධාරීන් මේ ලැයිස්තුවේ ඉන්නවා. මේ, සමස්ත ලැයිස්තුව නොවෙයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Susantha Dodawatta, your time is up

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද පොහොට්ටුව ප්‍රධාන විපක්ෂය කලබල වෙලා, මේ දේවල් සලේ පිටින් දමා අට්ටාල ගහගෙන මෙහෙම දහලන්නේ මොකද? මේ අය, සොහොනක් ළඟින් යනකොට බයට කෑ ගහන මිනිස්සු වාගෙයි. හිටපු ජනාධිපතිවරයාද, හිටපු ඇමතිවරයාද කියලා කිසිම තරාතිරමක් නොබලා හැමෝටම සමානව අද මේ රටේ නීතිය ක්‍රියාත්මක වන අවස්ථාවේදී තමන් විසින් කරන ලද අපරාධ තමන් දන්නා නිසා බය වෙලා තමයි මේ අය මෙහෙම හැසිරෙන්නේ. අවසාන වශයෙන්, මේ රටේ පාස්කු ප්‍රහාරයෙන් වින්දිතයන් වෙච්ච කතෝලික ජනතාවට වාගේම ඒ අවස්ථාවේදී දැඩි අපහසුතාවට පත් වුණු මුස්ලිම් ජනතාවටත් ජාතික ජන බලවේග රජය යටතේ සාධාරණය, යුක්තිය ඉෂ්ට කරනවාය කියන ප්‍රතිඥාව ලබා දෙමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Dilip Wedaarachchi. You have five minutes.

[මධ්‍යාහ්න 12.00]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද උදේ ප්‍රශ්න අහන වෙලාවේ මම යම් ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වුණා. එහෙත් ඒක බස්නාහිර පළාතේ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළයි කියලා මට එය අහන්න අවස්ථාව ලැබුණේ නැහැ.

හැබැයි, දැන් අගමැතිතුමිය - අධ්‍යාපන ඇමතිතුමිය - සභාවේ ඉන්න අවස්ථාවේදී ඒ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න මට අවස්ථාව ලබා දෙනවාද කියලා මම අහනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමියනි, ඔබතුමියගෙන් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා, බස්නාහිර පළාතේ අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dilip Wedaarachchi, this is the time for the main Business. You can ask it on another day, Hon. Member.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
Okay.

ගරු අධිකරණ ඇමතිතුමනි, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයේ ඇතිවෙච්ච ප්‍රශ්නයක් ගැන දැනුවත් කරන්නයි මම බලාපොරොත්තු වන්නේ. 2026.05.08වන දින ආර්. දිනේෂ් මහතා හෘදයාබාධයකින් මිය ගියා. පසු දින හදිසි මරණ පරීක්ෂණය පවත්වා ඒ කටයුතු කළා. ඒ බන්ධනාගාරයේ සිරකරුවන් 2,200ක් ඉන්නවා. ඒ වාගේම බන්ධනාගාරයේ තිබෙනවා, අංග සම්පූර්ණ රෝහල් පද්ධතියක්; පිරිමි අයට ඇඳන් 40ක්, කාන්තාවන්ට ඇඳන් 10ක් ඇතුළු අංග සම්පූර්ණ රෝහල් පද්ධතියක් තිබෙනවා. හැබැයි, රෝහල් පද්ධතිය තිබුණාට එක වෛද්‍යවරයායි ඉන්නේ. ගරු ඇමතිතුමනි, සිරකරුවන් 2,200ක් ඉන්න බන්ධනාගාරයක එක වෛද්‍යවරයෙක් දින 5ක් සේවය කරනවා. එම වෛද්‍යවරයා උදේ වරුවේ ඇවිල්ලා ඒ කටයුතු ටික කරනවා. නමුත්, රාත්‍රි කාලයේදී හෘදයාබාධයක් ඇති වෙලා තමයි මා සඳහන් කළ පුද්ගලයා මිය ගියේ. ඉතින් මම ඔබතුමාට යෝජනා කරනවා, මේ බන්ධනාගාරයට අංග සම්පූර්ණ රෝහලක් තිබෙන නිසාත්, ඊට අවශ්‍ය උපකරණ තිබෙන නිසාත් මේ බන්ධනාගාර රෝහලට වෛද්‍ය කාර්ය මණ්ඩලයක් පත් කරන්න කියලා. හදිසියේ රාත්‍රි කාලයක යම් අසනීපයක් ඇති වුණොත් කිසිම වෛද්‍යවරයෙක් නැහැ. වෛද්‍යවරයෙක් හිටියොත් තමයි ඒ ලෙඩ්ඩු බේරාගන්න පුළුවන් වෙන්නේ. එහෙම නැති නිසා තමයි බන්ධනාගාර රැඳවියෙක් පසුගිය මාසයේ මිය ගියේ. ඒ විතරක් නොවෙයි. මේකේ තව ප්‍රශ්න තිබෙනවා; අඩුපාඩු තිබෙනවා.

ගරු ඇමතිතුමනි, 2020 වර්ෂයේ ඉඳන් මේ බන්ධනාගාරයට body scanner machine එකක් නැහැ. බන්ධනාගාරයට කුඩු ගෙනියනවා. ඒවා අල්ලන්න body scanner machine එකක් නැහැ. කුඩු ග්‍රෑම් 220, 230, 240 ගුද මාර්ගයේ සඟවා ගෙන යනවා. ඒවා අල්ලා ගන්න කෙනෙක් නැහැ; අල්ලන්න විධියක් නැහැ. මොකද, body scanner machine එකක් නැහැ. ෆෝන් පවා ඇතුළට ගෙනියනවා. CCTV පද්ධතියත් අක්‍රිය වෙලා. එම පද්ධතිය වැඩ කරන්නේ නැතිව දැන් අවුරුදු එකහමාරක් වනවා. කැඩිච්ච දේවල් අවුරුදු ගණන් බන්ධනාගාරයේ තිබෙනකොට කුඩු වසංගතය නැති කරන්නේ කොහොමද? ලෙඩ්ඩු, බන්ධනාගාර රැඳවියන් රැකගන්නේ කොහොමද? ලංකාවේ

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

තිබෙන ලොකු බන්ධනාගාරයක් වන, රැඳවියන් 2,200ක් 2,300ක් ඉන්න මෙම බන්ධනාගාරයට ඒ body scanner machine එක අවශ්‍යයි; CCTV අවශ්‍යයි; ECG පද්ධතිය අවශ්‍යයි. ඒ කිසි දෙයක් මේ බන්ධනාගාරය තුළ නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, සෞඛ්‍ය ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කරලා හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන මේ බන්ධනාගාරයට වෛද්‍යවරුන් ලබා දෙන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න කියලා. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ මේ බන්ධනාගාරයේ රැඳවියන්ට රාත්‍රි කාලයේ අසනීපයක් වුණොත් එක වෛද්‍යවරයෙක්වත් නැහැ කියන කාරණය. රාත්‍රි කාලයට වෛද්‍යවරයෙක්, දෙන්නෙක් අනුයුක්ත කරලා අනිවාර්යයෙන් බන්ධනාගාරය තුළ සිටිය යුතුයි. "සිරකරුවෝ ද මනුෂ්‍යයෝය" කියලා ඔබතුමන්ලාම කිව්වා. ඒ නිසා මේ සිරකරුවන් රැකගන්න තංගල්ල, අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයේ තිබෙන අඩුපාඩු ටික සකස් කර ගන්න ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින්, අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. U.P. Abeywickrama. You have nine minutes.

[අ.භා. 12.05]

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ජාතික ජන බලවේග රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව අපේ රටේ විවිධ ක්ෂේත්‍ර ඉතා කඩිනමින් ප්‍රතිසංවිධානය කළ යුතු, නවීකරණය කළ යුතු තත්ත්වයක තමයි තිබෙන්නේ. විශේෂයෙන්ම දීර්ඝ කාලයක් තිස්සේ අවුල් කළ නූල් බෝලයක් වාගේ රටක් තමයි අපට විධිමත් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපනය, සෞඛ්‍ය ආදී සෑම ක්ෂේත්‍රයකම පවතින තත්ත්වය යහපත් නොවන බව අපි දන්නවා. මේ සෑම ක්ෂේත්‍රයක්ම නවීකරණය කරන්න, මේ සෑම ක්ෂේත්‍රයකම නව ප්‍රතිපත්ති සකස් කරන්නට වාගේම එය පරිවර්තනයකට ලක් කිරීමේ වගකීම අපේ රජය ඉටු කරමින් ඉන්නවා. මෙහිදී ජන ජීවිතයට තදින්ම බලපාන කාරණයක් තමයි, අධිකරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය. මේ සඳහා අපේ අධිකරණ ඇමතිතුමා ඇතුළු ඒ ක්ෂේත්‍රයේ වගකිව යුත්තන් ඉතා කඩිනමින් කටයුතු කරමින් ඉන්නවා. මේ වනකොට අධිකරණ 47කට වැඩි ප්‍රමාණයක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය අපි ආරම්භ කරලා තිබෙනවා. විශේෂයෙන්ම පූගොඩ අධිකරණ සංකීර්ණයේ කටයුතු අවසාන වෙමින් තිබෙනවා. ඒ වාගේම ගාල්ල අධිකරණ සංකීර්ණයේ කටයුතුත් අපි අවසන් කරමින් තිබෙනවා. මේ විධියට ගත්තාම, ලංකාවේ සියලු අධිකරණවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් රජය ඉතා කඩිනමින් ක්‍රියාත්මක වෙමින් ඉන්නවා. තවත් ව්‍යාපෘති 14ක් සඳහා අනුමැතිය ලැබිලා, ඒ සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම අධිකරණවලට අවශ්‍ය කරන බඳවා ගැනීම් කටයුතු කරගෙන යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ තනතුරු සඳහා බඳවා ගැනීම් සම්පූර්ණයෙන් රජය නවතා තිබුණා කියන කාරණය ඔබතුමා දන්නවා. ඒ තත්ත්වය තුළ අධිකරණ ක්ෂේත්‍රයත් විශාල කඩා වැටීමකට, විශාල අභියෝගයකට ලක් වෙලා තිබුණා. මොකද, අධිකරණ ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය කරන යතුරු ලේඛක ලේඛිකාවන් වාගේම විවිධ කාර්ය මණ්ඩලවල හිඟතාව නිසා එම ක්ෂේත්‍රය ගැටලු රාශියකට මුහුණ දෙමින් තිබුණා. අපේ අධිකරණ ඇමතිතුමා මීට මාස කිහිපයකට ප්‍රථම ඒ බඳවා ගැනීම් සඳහා අවශ්‍ය කරන කැබිනට් අනුමැතිය ලබා ගෙන ඒ බඳවා ගැනීම් කටයුතු කරගෙන යනවා.

ඒ වාගේම නීති ක්ෂේත්‍රය ගත්තොත්, කලින් කථා කරපු අපේ කථික මහත්වරු කිව්වා, ව්‍යවස්ථාදායකය හරහා අපි බලාපොරොත්තු වෙන්නේ රටේ නීති විධිමත් කිරීම, ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ඒ සඳහා අපේ ජනතා නියෝජිතයන්ගේ දායකත්වය ලබා ගැනීම කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) විධිමත් කිරීම සඳහා ගෙන එන මේ පනත් කෙටුම්පත සම්මත වීම හරහා එය ලංකාවේ නීති ක්ෂේත්‍රයේ නව මානයක් විවෘත කරන පනතක් බවට පත් වෙනවාට කිසිම සැකයක් නැහැ. හැබැයි, යම් යම් කාරණා සම්බන්ධයෙන් තමන්ගේ මොනවා හරි අදහස් දැක්වීම හැරුණාම, මේ පනත සම්බන්ධයෙන්, මේ පනතේ තිබෙන කාරණා සම්බන්ධයෙන් විරුද්ධ පක්ෂයේ කථික මහත්වරු මේ විවාදයේදී අදහස් දක්වනවා මම දකින්නේ නැහැ. අපි දන්නවා, අධිකරණයේ අප යම් කාරණාවක් සම්බන්ධව තර්ක කරනකොට, විවාදයකට ලක් කරනකොට ව්‍යවස්ථාදායකය මේ පනත පැනවීමේදී දක්වපු අදහස්, ව්‍යවස්ථාදායකය මේ පනත නිර්මාණය කිරීමේදී අපේක්ෂා කරපු අදහස් පිළිබඳව සැලකිල්ලට භාජන වන බව. මම හිතන විධියට, අපට මේ සංවාදය - කථා බහ - හරහා මතු කර ගත යුතු වැදගත්ම කාරණාවක් වන්නේ ඒකයි. ඒ අනුව මේ සිවිල් සහ වාණිජ ආරාවුල් නිරවුල් කර ගැනීමේ ඉතාම හොඳ ක්‍රමවේදයක් හැටියටත්, නූතන ලෝකයේ විශේෂයෙන්ම ආයෝජනවලට වාගේම ව්‍යාපාරවලට හිතකර හොඳ වටපිටාවක් නිර්මාණය කරන්න පුළුවන් පනතක් හැටියටත් මේ පනත අපට හඳුන්වන්න පුළුවන්. මෙහිදී හුඟක් වේලාවට වැඩි අවධානයක් යොමු කරලා තිබෙන්නේ අධිකරණයට යන පාර්ශ්වයන්ගේ කාලය, ඒ වාගේම ඔවුන්ගේ ධනය ආදී කාරණා සම්බන්ධයෙනුයි. එලෙස ගත්තාම දීර්ඝ ක්‍රියාවලියක් අධිකරණමය ප්‍රවේශය තුළ ආරාවුල් නිරාකරණය කිරීම වෙනුවෙන් ගත වෙලා තිබෙනවා.

මීට කලින් අදහස් ප්‍රකාශ වුණා, මේ වනවිටත් නඩු ලක්ෂ 11කට වැඩි ප්‍රමාණයක් අධිකරණයේ ගොඩ ගැහිලා තිබෙනවා කියලා. මම හිතන විධියට, ඒ සමහර ආරාවුල් සම්බන්ධ නඩු අධිකරණයට ගෙන යන්නේ නැතුව බේරා ගන්න පුළුවන්. ඉතාම සුළු ආරාවුල් පවා අධිකරණයේ ගොඩගැසීම හේතුවෙන් අධිකරණය මඟින්ම විසඳා ගත යුතු නඩුවල ප්‍රමාද වීමක් දකින්න ලැබෙනවා. ඒ නිසා මේ සමථකරණ ප්‍රවේශය අර්ධ අධිකරණමය ස්වරූපයකුත් ගන්නවා. ඒ වාගේම බොහෝ වේලාවට හැම කෙනෙකුගේම අවබෝධය සහිතව සමථකරණයන් හරහා කල් පවත්නා එකඟතාවන්ට පැමිණීම තුළින් සමාජය තුළ හොඳ වටපිටාවක් නිර්මාණය වෙනවා.

විශේෂයෙන්ම ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ ඇති වන වාණිජ ආරාවුල් සම්බන්ධයෙන් හොඳ ප්‍රවේශයක්, හොඳ සුපිළිපන් තත්ත්වයක් උදා කර ගැනීමේ අවස්ථාව මේ තුළින් නිර්මාණය වෙනවා. විශේෂයෙන්ම මෙහිදී ස්වේච්ඡා සමථකරණයට යොමු කිරීම පිළිබඳව වැඩි අවධානයක් යොමු වෙනවා. එහිදී එක පැත්තකින් අධිකරණයට එන නඩු සමථකරණය සඳහා යොමු කරන්න අධිකරණයට පුළුවන්. එහෙම නැත්නම් අධිකරණයේදී එකඟතාවකට ඇවිල්ලා, නීතිඥවරුන් හෝ අනෙකුත් පාර්ශ්ව සම්බන්ධ කරගෙන එළියේදි සමථකරණයට පත් වෙලා, අධිකරණමය තීන්දුවක් හරහා ඒක ක්‍රියාත්මක කර ගන්න පුළුවන්. මේ තත්ත්වය තුළ අපි විශ්වාස කරනවා, මේ පනත අපේ රටේ නීති ක්ෂේත්‍රයට නව මානයක් උදා කරනවාට කිසිම සැකයක් නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නව නීතිරීති හඳුන්වා දීම, පනත් කෙටුම්පත් හඳුන්වා දීම පාර්ලිමේන්තුවේ කාර්යභාරය පුළුල් කරන, අර්ථවත් කරන ක්‍රියාවක් බවට පත් වෙනවා. අපි දන්නවා, මේ මොහොත වනවිට අධිකරණය පිළිබඳව, විමර්ශන ආයතන පිළිබඳව රටේ විශාල කථා බහක් ඇති වෙලා තිබෙන බව. එවැනි කථා බහක් ඇති වෙන්න හේතුව තමයි, අපි බලයට පත් වෙලා ගෙවී ගිය කාලය තුළ මේ සෑම ක්ෂේත්‍රයකම ඇති කරලා තිබෙන නිදහස් වටපිටාව, විමර්ශකයන්ට, විමර්ශන ආයතනවලට ලබා දීලා තිබෙන පහසුකම් වැඩි කිරීම වාගේම අධිකරණවල සේවය කරන විනිසුරුවරුන්ට ඇති කරලා තිබෙන විශ්වාසය.

මේ ආදී වශයෙන් ගත්තාම ඉතා වේගවත් ක්‍රියාවලියක් සෑම ක්ෂේත්‍රයකම වර්ධනය වෙමින් තිබෙනවා. ඒ හරහා අපි බලාපොරොත්තු වෙන්නේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යනුවෙන් අපි ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව මම කලින් ප්‍රකාශ කළා වාගේම සෑම ක්ෂේත්‍රයකම නවීකරණයන්, නව ප්‍රවේශයන් ඇති කරලා, මේ රටේ ජනතාවගේ ජන ජීවිතය පහසු කරවන එකයි. ඒ වාගේම අපේ රට ලෝකයේ නූතන ශිෂ්ට සම්පන්න රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය කරන වටපිටාව සකස් කිරීම තමයි අපේ අපේක්ෂාව වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Dayasiri Jayasekera. You have 13 minutes.

[අ.භා. 12.13]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අද සමථකරණ, සිවිල් සහ වාණිජ ආරාවුල් ක්‍රියාවලිය යටතේ ඉතා වැදගත් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි ගරු අධිකරණ අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා.

පසුගිය කාල වකවානුව තුළ තිබුණු සමථකරණ ක්‍රියාවලිය - mediation system එක - 1998, 1999 කාලයේ විතර අපි ගෙනාපු ක්‍රියාවලියක්. ඇත්තවශයෙන්ම එතැනින් පස්සේ ඒ ක්‍රියාවලිය තවත් ශක්තිමත් කරන ක්‍රියාවලියක්, අද මේ සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම තුළින් ඇති වෙලා තිබෙනවා. කෙළින්ම උසාවියට යන්නේ නැතුව කටයුතු කිරීමේ හැකියාව ඒ තුළින් ඇති වෙලා තිබෙනවා. අපි දන්නවා, සිවිල් සහ වාණිජ ආරාවුල් සම්බන්ධව ලංකාවේ නීතිඥයන් විශාල මුදලක් අය කරන බව. ඒ වාගේම ඔවුන් ඒ වෙනුවෙන් විශාල කාලයක් ගත කරනවා. එක පැත්තකින් මේ ක්‍රියාවලිය යටතේ තවදුරටත් සමථකරණය තුළින් සිවිල් සහ වාණිජ ආරාවුල් ඉදිරියට ගෙනිහිල්ලා, එය සමථයකින් අවසන් කර ගන්න බැරි නම් ඊළඟට උසාවියට යන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. ඒ නිසා මේක ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්. නමුත්, මේ ගැන මම ගොඩක් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

විශේෂයෙන්ම මේ සම්බන්ධව නීතියත් එක්ක බද්ධ වෙලා තිබෙන කරුණු ගණනාවක් පිළිබඳව කථා කරන්න අවශ්‍යයි. මූලික කාරණය මේකයි. අද මම අහගෙන හිටියා, නඩු ගොඩ ගැහිලා තිබෙන ප්‍රමාණය පිළිබඳව මන්ත්‍රීතුමියලා කිහිපදෙනෙක් කථා කරනවා. ඒක මේ නීති ක්ෂේත්‍රය තුළ විශාල අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා. එක පැත්තකින් අපි අගවිනිසුරුතුමාටත් ස්තුතිවන්ත වෙනවා. එතුමා case disposal rate එක ගැන විශාල අවධානයක් යොමු කරනවා. හැබැයි, case disposal rate එක ගැන අවධානය යොමු කරනකොට අනික් පැත්තෙන් හොඳට මතක තබා ගන්න ඕනෑ කාරණයක් තමයි, fair hearing එකක්, එහෙම නැත්නම් දෙපැත්තටම සවන් දීමේ ක්‍රියාමාර්ගය අඩු වන බවක් අපට දකින්න ලැබෙනවාය කියන එක. මොකද, නීතිඥයන් විධියට අපි දන්නවා, උසාවියට ගිහිල්ලා සමහර නඩුවලට දින ගන්න කොට, අපේ දිනය හරියන්නේ නැත්නම්, විනිශ්චයකාරතුමා දෙන දිනයත් අපට හරියන්නේ නැත්නම් අපි මාසයක්, දෙකක්, තුනක්, හතරක් ඒ දිනය එහාට මෙහාට කර ගන්න බව. ඒකත් එක්ක අද විශාල අර්බුදයක් තිබෙනවා නඩු අහන ප්‍රමාණය ගැන. මොකද, විනිශ්චයකාරතුමන්ලාත් විශාල වෙහෙසක් ගන්නවා. සමහර වෙලාවට හොඳ නඩු දෙකක් තුනක් විතරයි දවසකට අහන්න වෙන්නේ. අනෙක් ඒවා ඔක්කෝටම දින දෙනවා, එහෙම නැත්නම් ඒ අවශ්‍ය කටයුතු කරනවා. එතුමන්ලා කරන කැපවීම අපි අගය කරනවා. විශේෂයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණය, දිසා අධිකරණය සහ මහෙස්ත්‍රාත් අධිකරණය දක්වාම නඩු විශාල ප්‍රමාණයක් ගොඩ ගැහිලා තිබුණත් ඒවා විසඳන්න විනිසුරුතුමන්ලා දක්වන සහාය, ශක්තිය අපි හැම වෙලාවකම අගය කරනවා.

විශේෂයෙන් case disposal rate එක ගැන කථා කරනවා වාගේම, fair hearing එකකුත් තිබෙන්නට ඕනෑ. සමහර වෙලාවට case disposal rate එක ගැන හිතනවා නම් දිසා අධිකරණයෙන්, නැත්නම් අභියාචනාධිකරණයෙන් කරුණු පිළිබඳව සාකච්ඡා කරන්න වෙලාවක් හම්බ වෙන්නේ නැහැ, ටක් ටක් ගාලා නඩු ටික විසි වෙන එක විතරයි වෙන්නේ. අඩුම තරමින් Court of Appealහිදීත් වෙලාවක් හම්බ වෙන්නේ නැහැ තමන්ට ඒ සම්බන්ධව කරුණු දක්වන්න. ඒ අනුව එක පැත්තකින් ඒක උභතෝකෝටිකයක් බවට පත් වෙලා තිබෙනවා. එක පැත්තකින් නඩු ඉවර කරන්නත් ඕනෑ, අනෙක් පැත්තෙන් fair hearing එකක් ලැබෙන්නත් ඕනෑ. ඒ නිසා මේ සම්බන්ධව අපේ ස්තුතිය අධිකරණ ක්ෂේත්‍රයට පුද කරනවා.

හෙට්ටිපොළ මහෙස්ත්‍රාත් අධිකරණය දිසා අධිකරණයක් කරන්න අපි විශාල කැප කිරීමක් කළා. මම විශේෂයෙන් විජයදාස රාජපක්ෂ මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා ඒ කාල වකවානුව තුළ ඒකට විශාල ශක්තියක් දීම ගැන. ඒ වාගේම අධිකරණ අමාත්‍යාංශයටත් ස්තුතිවන්ත වෙනවා. දැන් ඒ හදපු අධිකරණවලට අවශ්‍ය කරන ඩෙස්ක් ටික, පුටු ටික, උපකරණ ටික නැතිව ලොකු ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. අපි අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරනවා ඒකටත් මැදිහත් වෙන්න කියලා, විශේෂයෙන් හෙට්ටිපොළ දිසා අධිකරණයට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න. දිසා අධිකරණය කියන බෝඩ් එක තිබෙනවා, මහෙස්ත්‍රාත්තුමන්ලා ඉන්නවා, දිස්ත්‍රික් විනිශ්චයකාරතුමන්ලා ඉන්නවා. ගරු අමාත්‍යතුමා සභාවේ ඉන්නවා. එතුමා කියනවා ඒක ඉටු කරන්න පුළුවන් කියලා. ඒක ලොකු දෙයක්. මම ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, ඒ පහසුකම් ටික අත්‍යවශ්‍යයි.

ඊළඟට මම කියන්න යන මේ කාරණය පිළිබඳව අපේ මන්ත්‍රීතුමන්ලා කිහිපදෙනෙකුම කථා කරලා තිබෙනවා මම දැක්කා. සුරේෂ් සලේ පිළිබඳව මේ රටේ දැන් විශාල කථාබහක් ඇති වෙලා තිබෙනවා. පාස්කු ප්‍රහාරයෙන් අපේ ආදරණීය කතෝලික සහෝදර සහෝදරියෝ, වැඩිහිටියෝ, දරුවෝ 271දෙනෙක් මිය ගියා විතරක් නොවෙයි විශාල පිරිසක් තුවාල ලැබුවා. අදටත් ඔවුන්ගේ වේදනාව අපට අපේ වේදනාවක් බවට පත් වෙලා තිබෙනවා. මොකද, මගේ පවුලේත් කතෝලිකයෝ

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ පරීක්ෂණ ක්‍රියාවලිය තුළ නිවැරදිව එහි මහ මොළකරුවන් සොයා ගැනීමයි කළ යුත්තේ. ඒක තේ දැන් තිබෙන්නේ. මහ මොළකරුවන් සොයා ගැනීම පිළිබඳව විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව ඕස්ට්‍රේලියාවෙන් පරීක්ෂණ කළා, එංගලන්තයෙන් පරීක්ෂණ කළා, ඇමෙරිකාවෙන් පරීක්ෂණ කළා. ජාත්‍යන්තරව කළ ඒ පරීක්ෂණ හැම එකකින්ම අවසානයේ කියලා තිබෙන්නේ මේක ISIS එක හරහා වුණු, ඔවුන්ගේ ඉගැන්වීම් මත ක්‍රියාත්මක කළ, ලංකාවේ අන්තවාදී මුස්ලිම් පිරිසකගේ ක්‍රියාවලියක් බවයි.

ඊට පස්සේ තමයි මේක ගැන මේ පාර්ලිමේන්තුවේත් දේශපාලන ව්‍යාපාරයක් විධියට විවිධාකාරයෙන් කරුණු මතු වෙන්නේ. අවසාන වශයෙන් එය ගෝඨාභය රාජපක්ෂ මහත්තයා බලයට එන්න ගෙනාපු ක්‍රියාවලියක් විධියටයි කාරණා කියැවුණේ. මේ ප්‍රහාරය සම්බන්ධව පරීක්ෂණ විශාල සංඛ්‍යාවක් ගියා. ඒ පරීක්ෂණ නිසාම එක පැත්තකින් ආණ්ඩු පෙරළෙනවා, තව පැත්තකින් ආණ්ඩු බිහි වෙනවා. කතෝලික ප්‍රජාව බලාගෙන ඉන්නවා, නමුත් අද වෙනතුරු ඒ අයට සාධාරණයක් ඉෂ්ට වෙලා නැහැ. ඒ වින්දිතයන්ට, මිය ගිය අය වෙනුවෙන් අද වෙනතුරු කිසිම සාධාරණයක් ඉෂ්ට වෙලා නැහැ. ඒ නිසා ඒකේ අවසානයක් දකින්න මේ ආණ්ඩුව හරි කටයුතු කරනවා නම් හොඳයි. ඒ ගැන ගැටලුවක් නැහැ. ඒ පරීක්ෂණ ක්‍රියාදාමය තුළ සලේ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිද්ධ විය යුතුයි, අපට ඒ ගැන ගැටලුවක් නැහැ. හැබැයි ඒ ක්‍රියාවලිය යනකොට මේ රටේ සෑම කෙනෙකුටම, සෑම සිරකරුවෙකුටම තිබෙන අයිතීන් ආරක්ෂා විය යුතුයි. අඩුම තරමින් ඔවුන්ගේ ආහාර ගැනීම සම්බන්ධව, වධ හිංසාවලට ලක් නොවීම හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලට ලක් නොවීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11වෙනි ව්‍යවස්ථාවේ තිබෙන අයිතීන් ආරක්ෂා කරලා දෙන්න. එච්චරයි අපේ ඉල්ලීම තිබෙන්නේ. ඔවුන්ව නිරුවත් කරලා, ඔවුන්ට පහර දීලා ඒ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන්න හදනවා නම් නම් ඒක එක කාරණයක් බවට පත් වෙනවා.

දෙවැනි කාරණය මෙයයි. එම පරීක්ෂණ කරන රවී සෙනෙවිරත්න මහත්තයා සහ ශානි අබේසේකර මහත්තයාගේ දේශපාලන සම්බන්ධකම් ගැන දැන් ලංකාවේ හැම කෙනෙක්ම දන්නවා. ගරු බිමල් රත්නායක මැතිතුමා එදා මෙතැනදීම නැඟිටලාම කිව්වා, ඒ දෙදෙනාවම පත් කළේ කතෝලික සභාවේ කාදිනල්තුමා ඇතුළු ඒ අයගේ ඉල්ලීම නිසාය කියලා. ඒ දෙදෙනාම දිවුරුම් ප්‍රකාශ දීලා තිබෙනවා ශ්‍රේෂ්ඨාධිකරණයට, "අපි ජාතික ජන බලවේගයේ ක්‍රියාකාරී දේශපාලනය කරන අය" කියලා. විශ්‍රාම ගියාට පසුව එහෙම කරන්න පුළුවන්; ගැටලුවක් නැහැ. හැබැයි, තිබෙන ප්‍රශ්නය මෙයයි. විශ්‍රාම ගිහින් දේශපාලනිකව ජාතික ජන බලවේගයේ වැඩ කරන අය ගෙනැල්ලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කළායින් පසුව, ඒක දේශපාලනීකරණය වනවා. එහෙම තේ සිද්ධ වෙන්නේ. ලංකා ඉතිහාසයේ කවදාවත්, විශ්‍රාම ගිහිල්ලා දේශපාලනය කර කර සිටි අය, ඒ වාගේම ශ්‍රේෂ්ඨාධිකරණයට දිවුරුම් පෙත්සමක් දීලා, "මම full-timer කෙනෙක් විධියට දේශපාලනය කරනවා" කියලා කියපු කෙනෙක් ගෙනැල්ලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කරලා නැහැ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. "B" Report එකක් ඉදිරිපත් කර තිබෙනවා B 34097/24 නඩු අංකය යටතේ, පාලිත සිරිවර්ධන මහත්මයා DIG විධියට වැඩ කළ කාලයේ. මේකේ ඔහුගේ ප්‍රකාශය බොහොම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, මිනීමැරුම සම්බන්ධව. මොකද, හේතුව? මේ ආපු ලිපි සම්බන්ධව නිලන්ත ජයවර්ධන මහත්මයා දිගින් දිගටම කරුණු පැහැදිලි කළායින් පස්සේත් ආපු එක ලිපියක්වත් බලලා නැහැ. පාස්කු ප්‍රහාරය සිද්ධ වුණායින් පසුව 22වැනි දා තමයි රවී සෙනෙවිරත්න මහත්මයා එය බලන්නේ. "B" Report එකේ ඔක්කෝම විස්තර තිබෙනවා. මම ඒ "B" Report එක **සභාගත*** කරනවා.

ඒකේ ගොඩක් කාරණා තිබෙනවා. ඕනෑ නම් කියන්න පුළුවන්. නමුත්, එහෙම එකින් එක අරගෙන කියන්න අවශ්‍යතාවක් නැහැ. හැබැයි, "B" Report එකේ බොහොම පැහැදිලිව සඳහන් වනවා එම ලිපිය එන්නේ කවදාද කියලා. එහි මෙසේ සඳහන් වනවා:

> "... ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි සෙනෙවිරත්න මහතා විසින් 2019.04.16වන දින දැක ඇති බවට මොහුට නිරීක්ෂණය වූ බවත් එම ලිපියේ සටහන එතුමාගේ පුද්ගලික සහකාර වශයෙන් කටයුතු කළ පොලිස් අධිකාරි රංජිත් වෙදසිංහ මහතා යොදා ඇති බවද මෙම ප්‍රශ්නගත ලිපිය 2019.04.10 වන දින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය වෙත පොලිස් කොස්තාපල් 12163 රණසිංහ විසින් රැගෙන විත් ඇති අතර, මෙම ලිපිය රහසිගත ලිපියක් බැවින් එවැනි ලිපියක් ලැබුණු විට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි සෙවෙරත්න මහතා ලබා දී ඇති උපදෙස් පරිදි කාන්තා උප පොලිස් පරීක්ෂක දීප්ති නිලධාරිණිය විසින් භාර ගන්නා අතර, ඇය නොමැති අවස්ථාවලදී එම ලිපිය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තුමාගේ කාර්යාලයේ මේසය උඩ තබන බවත්, කාන්තා උප පොලිස් පරීක්ෂක දීප්ති නිලධාරිණිය කාර්යාලයට පැමිණි පසු ඇයට එම ලිපි සම්බන්ධව දැනුවත් කරන බවත්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තුමා වෙත ලැබෙන රහසිගත ලිපි ඇය ඇතුළු නිලධාරින් විවෘත නොකරන බවත්, එම ලිපි ඒ මහතා පැමිණෙන තෙක් තබා තිබෙන බවත්, හදිසි ලිපි සම්බන්ධයෙන් කුමන හෝ ආකාරයකින් ඒ මහතා වෙත දැනුම් දෙන බවත්, මෙම ලිපිය සම්බන්ධයෙන් කිසිදු අවස්ථාවක කිසිදු නිලධාරියෙකු දැනුවත් කර නොමැති බවත්,..."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 16වැනි දා එම ලිපිය ලැබුණාට, ලිපිය විවෘත කරන්නේ, 22වැනි දා; පාස්කු ප්‍රහාරය සිදු වුණායින් පසුව. ඒ කියන්නේ, මේ සම්බන්ධව කිසිම ආකාරයේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒ නිසා මොකද කරන්නේ? පාලිත සිරිවර්ධන මහත්මයා ගිහිල්ලා මේ සම්බන්ධව පැමිණිල්ලක් කරනවා, එවකට පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්ට. මිනී මැරීමේ චෝදනා යටතේ ඔවුන්ට විරුද්ධව දැන් නඩු පවරලා තිබෙන්නේ. නොසැලකිල්ල පිළිබඳව ඒ දෙදෙනාටම විරුද්ධව නඩු පවරලා තිබෙන්නේ. ඒ ප්‍රහාරය වළක්වා ගන්න, එම පුද්ගලයන් අත්අඩංගුවට ගන්න තිබියදී ඒ ක්‍රියාවලිය කළේ නැහැ කියලා තමයි මෙම "B" Report එකේ තිබෙන්නේ. දැන් අත්අඩංගුවට ගැනීම වැළැක්වීමේ නියෝගයක් ඒගොල්ලෝ ගිහින් ගන්නවා ශ්‍රේෂ්ඨාධිකරණයෙන්. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ගත්ත නියෝගය අනුව තමයි ඒ දෙදෙනා ඉන්නේ. ඒ අය තමයි දැන් පාස්කු ප්‍රහාරය සම්බන්ධ පරීක්ෂණ කටයුතු කරන්නේ. අපි අහන්නේ, ඒක සාධාරණද කියලා. ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න. මොකද, රවි සෙනෙවිරත්න මහතා පමණක් නොවෙයි, ශානි අබේසේකර මහතාත් විවිධ අවස්ථාවල කියනවා, - රන්ජන් රාමනායක මහතාගේ හඬ පටයේ බොහොම පැහැදිලිව එතුමා කියනවා - "පුතාලා දෙදෙනා බෝම්බ ගහන එක තාත්තා දන්නේ නැත්නම් ඒ තාත්තා තාත්තෙක් වෙන්න බැහැ" කියලා. කවුද ඒ අය? වෙන කවුරුවත් නොවෙයි. ජාතික ජන බලවේගයේ ජාතික ලැයිස්තුවේ හිටපු අපේක්ෂක ඊබ්‍රාහිම් මැතිතුමා සහ එයාගේ පුත්තු දෙන්නා. තමන්ගේ පුතුන් දෙදෙනාවත් මරාගෙන, දරුවෙක් බඩේ ඉන්නකොට තමන්ගේ ලේලියවත් මරාගෙන, තව මුනුබුරු මිනිබිරියන් තුන්දෙනෙකුත් මරාගෙන ගෝඨාභය රාජපක්ෂ බලයට ගෙනෙන්න කටයුතු

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

කළාය කිව්වාම මට තේරෙන්නේ, එහෙම නම් ගෝඨාභය රාජපක්ෂ බලයට ගෙනෙන්න කටයුතු කරලා තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණේ කට්ටිය කියලායි. ඒ විධියට බැලුවාම ඒකයි හිතෙන්නේ. ඒක උභතෝකෝටික ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. එම නිසා අපි කියන්නේ, කරුණාකරලා ඒ සඳහා ස්වාධීන පරීක්ෂණයක් කරන්න කියලායි. මොකද හේතුව, අධිකරණය විසින් දැන් විශේෂඥ වෛද්‍යවරුන් පත් කරලා තිබෙනවා. ඒ පත් කර තිබෙන අය ගත්තොත්, එක්කෙනෙක් චිත්තාහරි අබේනායක මැතිනිය. එතුමියගේ Facebook account එකට ගිහින් බලන්න. මේ රටේ ඉන්න හමුදා නිලධාරින්ට ඉතාම පහත් ලෙස කථා කරන කෙනෙක්. ඉතින්, ඒ අයගෙන් බලාපොරොත්තු වෙන්න පුළුවන්ද, සාධාරණයක්?

ඒ වාගේම මම තවත් කාරණයක් විශේෂයෙන්ම කියන්න කැමැතියි. අද විෂය භාර ඇමතිතුමා ඒකට උත්තර දෙනවා මම දැක්කා. අද ශ්‍රේෂ්ඨාධිකරණයට, අභියාචනාධිකරණයට විනිශ්චයකාරවරුන් පත් කරන්නේ නැහැ. අද ගරු සුසන්ත දොඩාවත්ත මැතිතුමා කියාගෙන කියාගෙන ගියා, ඇතුළට ගිය කට්ටියගේ ලැයිස්තුවක්. මම මෙහි එන ගමන් ඒක අහගෙන හිටියා. ඉතාම හොඳයි. ඒක වෙන්න ඕනෑ. තවත් අය අරගෙන සාධාරණව ඕනෑම නීතියක් ක්‍රියාත්මක කරලා ඇතුළට දමන්න. එහෙම ඇතුළට දැම්මා කියලා දඟලන්න, කථා කරන්න අපි කටයුතු කරන්නේ නැහැ. ඒ හොරු අනිවාර්යයෙන් ඇතුළේ සිටිය යුතුයි. ඒ ගැන ගැටලුවක් නැහැ. හැබැයි, මේ ක්‍රියාවලිය යනකොට ශ්‍රේෂ්ඨාධිකරණයේත්, අභියාචනාධිකරණයේත් තනතුරු පුරවන්නේ නැත්තේ ඇයි? අප ඒකයි අහන්නේ.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තනතුරු පුරවන්නේ නැතිව මාස 6ක් තිස්සේ තියාගෙන ඉන්නවා. ඇයි ඒ? ඒක සම්පූර්ණයෙන්ම ජනාධිපතිවරයාගේ වගකීම. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111වන ව්‍යවස්ථාව අනුව එතුමා මේ ක්‍රියාවලිය ඉස්සරහට අරගෙන යන්න ඕනෑ. හැබැයි, ඒක වෙන්නේ නැහැ. මේක චේතනාන්විතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක්. ඒ පුරප්පාඩුවලට ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු, අභියාචනාධිකරණ විනිශ්චයකාරවරු පත් කරන්නේ නැහැ. ඇයි, ඒ පත් නොකරන්නේ? එහෙම නම්, ඊළඟට එන්න තිබෙන නඩු කටයුතුවලින් ලැබෙන තීන්දුත් එක්කද මේ අයව පත් කරන්න හදන්නේ කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

අද ශෂී වීරවංශ මැතිනියව ඇතුළට දමනවා. ඒ වාගේම, පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ විමර්ශන මාස 3කින් ඉවර කරන්න කියලා බලපෑම් කරලාත් තිබෙනවා. අපි දන්නවා, ඒ කටයුතු කොහෙන්ද වෙන්නේ කියලා. ඒවා නොදන්නවා නොවෙයි. මේ සියල්ල සිද්ධ වුණාට පසුවද - ඒ කියන්නේ, මහාධිකරණයෙන් ඒ අයට වුවමනා කට්ටිය හිරේට දැම්මාට පසුවද - ඒ අභියාචනාධිකරණ තනතුරු දෙන්නේ? ඒකයි තිබෙන සැකය. වෙන එකක් නොවෙයි. ඇයි මෙහෙම පුරප්පාඩු තියාගෙන ඉන්නේ?

අපි සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත වැනි පනත් කෙටුම්පත් සම්මත කරන්නේ මේ රටේ නඩු කටයුතුවල පවතින ප්‍රමාදය නිසා. නඩු කටයුතු ප්‍රමාද වෙන්නේ නැද්ද, විනිශ්චයකාරවරුන් 10දෙනෙකු පත් කරලා නැති එකෙන්? අභියාචනාධිකරණයට විනිශ්චයකාරවරුන් 4දෙනෙකු පත් කරලා නැති එක නිසා අභියාචනාධිකරණයේ Benchesවල ප්‍රශ්නයක් එන්නේ නැද්ද? ඒ අය පත් කළා නම් නේද, ඒ නඩු කටයුතු ඉක්මන් වෙන්නේ? මාස 6ක් තිස්සේ ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චයකාරවරුන් 5දෙනෙකු පත් කරන්නේ නැතිව ඉන්න කොට නොවෙයිද මේ රටේ නඩු අහන එක ප්‍රමාද වෙන්නේ? ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, කරුණාකර මේ සම්බන්ධව බලන්න කියලා.

විශේෂයෙන්ම මම මේ කාරණයත් කියන්න කැමැතියි. අද වන විට වැඩිහිටි දීමනාව මාස 2කින් දීලා නැහැ. පසුගිය කාලයේ වැඩිහිටියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා වූ පොලිය සියයට 3කින් වැඩි කරලා දුන්නා. දැන් ඒක අඩු කර තිබෙනවා. ඒ සියයට 3 ඒ අහිංසක මිනිසුන්ට අද ලැබෙන්නේ නැහැ.

අ.පො.ස. උසස් පෙළ විභාගය පවත්වන්න හදනවා, අගෝස්තු මාසයේ 10වැනි දාට. අ.පො.ස. උසස් පෙළ හදාරන ළමයින්ට තමන්ගේ syllabus එක cover කර ගන්න සාමාන්‍යයෙන් අවුරුදු 2යි මාස 5ක කාලයක් තිබෙනවා. නමුත්, අද ඒ කාලය මාස 4කින්, 5කින් අඩු කර තිබෙනවා. දෙවැනි වතාවට විභාගය ලියන ළමයින්ට ගිය වතාවේ කාලය මාස 8ක් දුන්නා. නමුත්, මේ වතාවේ මාස 4යි. එතකොට ඒ ළමයින්ට විභාගය ලිවීම සම්බන්ධයෙන් විශාල අර්බුදයක් තිබෙනවා. ළමයින් 40,000කට වඩා අ.පො.ස. උසස් පෙළ විභාගය ලියනවා. ඒ අයට මොකක්ද ඉටු කර තිබෙන සාධාරණය? මම අධ්‍යාපන ඇමතිතුමියගෙන් අහන්න කැමැතියි, මොකක්ද මේකට කරන්නේ කියලා.

අද මේ රටේ විශ්වවිද්‍යාලවලින් එළියට ආපු උපාධිධාරින් විශාල ප්‍රමාණයක් ඉන්නවා. මේ ආණ්ඩුවේ ඇමතිවරු ගිහිල්ලා දවස ගාණේ පොරොන්දු දුන්නා, "මේ අය ඔක්කොම බඳවා ගන්නවා, කිසි ගැටලුවක් නැහැ" කියලා. දැන් මොකක්ද කරලා තිබෙන්නේ? විභාගයක් තිබ්බා. එක පැත්තකින්, සංවර්ධන නිලධාරින්ට එක විභාගයක් තිබ්බා; අනෙක් පැත්තෙන්, අනෙක් උපාධිධාරින්ට විභාගයක් තිබ්බා. එතකොට විභාග දෙකයි. විභාග දෙකක් තියලා, සියයට 70ක් ගන්නවා සංවර්ධන නිලධාරින්. ඒක හොඳයි. ඒක ඉතාම වැදගත් කාර්යයක්. හැබැයි, ඔය එකතු වන 16,000ට ඊළඟට මොකක්ද කරන්නේ? ඒ, 16,000ට අර උපාධිධාරින් 16,000ක් ගන්න ඇයි බැරි වුණේ? ඇත්ත වශයෙන්ම එතැනදී ඒගොල්ලන්ගෙන් ගන්නේ 6,900ක විතර ප්‍රමාණයක්. අපේ උපාධිධාරින් 196,000ක් විභාගයට ලියලා අවසානයේ ගන්නේ කීයද? 23,000යි. රුපියල් 2,700 ගණනේ එක් කෙනෙකුගෙන් අර ගත්තා, ඒ විභාගයට. ඒ අනුව මේ ආණ්ඩුව කෝටි 47ක් රැකියා විරහිත ඒ අහිංසක උපාධිධාරින්ගෙන් එකතු කරගෙන තිබෙනවා. අසාධාරණයක්, ඒක. *[බාධා කිරීමක්]* "හහ්, හහ්, හහ්" ගාන්න එපා! මොනවාද "හහ් හහ් හහ්" ගාන්නේ? මහින්ද ජයසිංහ මහත්මයා, මොකද හිනාවෙන්නේ? *[බාධා කිරීමක්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ඔබතුමා නීතිඥයෙක් නේද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, නීතිඥයෙක් තමයි. ඇයි මොකක්ද තිබෙන ප්‍රශ්නය? ඔබතුමන්ලා කථා කරලා ගත්තු දේවල් තමයි ඔය. ඔබතුමන්ලා කිව්වේ බොරු. මිනිස්සු පාරට ඇවිල්ලායි අද මේවා ගැන ප්‍රශ්න කරන්නේ. ඒකයි මම මේ කියන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමාට තවත් මොකක් හරි අහගන්න ඕනෑද? *[බාධා කිරීම්]* මම බොහොම පැහැදිලිව කියන්න කැමැතියි, මේ සම්බන්ධව නිවැරැදි ක්‍රියාමාර්ගයක් ගන්න කියලා. ඒක තමයි මම විශේෂයෙන්ම ඉල්ලා සිටින්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම මම මේ සම්බන්ධව ආණ්ඩුවේ ප්‍රතිචාරයත් බලාපොරොත්තු වෙනවා, විශේෂයෙන්ම ආණ්ඩුවේ ඉදිරි පෙළ ඉන්න ගරු අධ්‍යාපන ඇමතිතුමියගෙන් හෝ. එහෙම නැතුව අනෙක් කට්ටිය නිකම් නැඟිටින එක නොවෙයි වෙන්න ඕනෑ. එකී කාරණාවලට අදාළව අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගන්න කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මගේ නම සඳහන් කළා. ඒ නිසා - *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, he did not mention your name.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නම කිව්වේ නැහැ. දැන් වෙලාව ඉවරයි. පස් වරු 12.30යි. *[බාධා කිරීම්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මගේ නම කිව්වා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කිව්වේ නැහැ, කිව්වේ නැහැ. *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නම කිව්වේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, I will give you 30 seconds, Hon. Jayasinghe.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, his name was not mentioned. - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, his name was not mentioned. - *[Interruption.]* Anyway, Hon. Deputy Minister, if you want to clarify, I will give you 30 seconds. - *[Interruption.]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
There is nothing to clarify, Sir. - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You wanted him to clarify, Hon. Member, when you wound up. - *[Interruption.]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Now, we have to suspend the Sitting, Sir; it is 12.30 p.m.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
No, no. Sir, he mentioned my name.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, your name was not mentioned, Hon. Deputy Minister. But, the Hon. Member wanted it clarified when he wound up. - *[Interruption.]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, it is not relevant to his Ministry. He is the Deputy Minister of Labour.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මහත්තුරු හැම දාම මෙතැනට ඇවිල්ලා බොරු බෙගල් ඇද බානවා. 160,000කට වඩා විභාගයක් අයදුම් කරන කොට විභාග ගාස්තු ගෙවන්න ඕනෑ තමයි. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, that is totally irrelevant.

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. M.K.M. Aslam, please.

[பி.ப. 1.00]

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இன்றைய தினம் மத்தியஸ்தம் (குடியியல் மற்றும் வர்த்தகப் பிணக்குகள்) சட்டமூலம் தொடர்பான விவாதம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. ஏற்கெனவே எமது நாட்டில் மத்தியஸ்த சபைகள் சட்டம் நடைமுறையில் உள்ளது என்பது எங்களுக்குத் தெரியும். இந்தச் சட்டம் சம்பந்தமாகக் குறிப்பிடுகையில், நாட்டில் மூன்று முக்கியமான சட்டங்கள்

உள்ளன. அவை, 1988ஆம் ஆண்டின் 72ஆம் இலக்க, மத்தியஸ்த சபைகள் சட்டம், 2000ஆம் ஆண்டின் 44ஆம் இலக்க, வர்த்தக மத்தியஸ்த நிலையச் சட்டம் மற்றும் 2003ஆம் ஆண்டின் 21ஆம் இலக்க, மத்தியஸ்த (விசேட வகுதிகளைச் சார்ந்த பிணக்குகள்) சட்டம் ஆகியனவாகும். இந்த மூன்று சட்டங்கள் தொடர்பாக நாங்கள் பார்க்கும்போது, இவற்றில் இரண்டு பிரதான சட்டங்களே நடைமுறையில் உள்ளன.

இந்தச் சட்டங்களில் காணப்படும் சில குறைபாடுகளை நிவர்த்தி செய்யும் பொருட்டே, இன்று புதியதொரு சட்டமூலத்தை முன்வைக்கிறோம். இது, மத்தியஸ்த சபைகளில் இருதரப்பினரின் விருப்பங்களுக்கு மதிப்பளித்து, உடன்பாட்டின் அடிப்படையில் பிணக்குகளைத் தீர்க்கக்கூடிய ஒரு முக்கிய சட்டமூலமாக காணப்படுகின்றது. மேலும், இம்முறைமை இன்று சர்வதேச அளவில் ஏற்றுக்கொள்ளப்பட்ட ஒன்றாகத் திகழ்கின்றது. ஏற்கெனவே 1988ஆம் ஆண்டின் 72ஆம் இலக்க, மத்தியஸ்த சபைகள் சட்டத்தின்படி, கிட்டத்தட்ட ஒரு மில்லியன் ரூபாய்க்கும் குறைவான பிணக்குகள் மட்டுமே தீர்க்கப்பட முடியும் என்ற எல்லை உள்ளது. ஆனால், அந்த எல்லையைக் கடந்து இன்று நாங்கள் முன்வைக்கின்ற இந்தச் சட்டமூலமானது, உடன்பாடுகளின் அடிப்படையில் பிரச்சினைகளைத் தீர்க்க வழிவகுக்கும். இதனால் நீதிமன்றங்களின் பணிச்சுமை குறைவதுடன், பல பிரச்சினைகளுக்குப் பேச்சுவார்த்தைகளின் மூலமும் தீர்வு காண முடியும்.

இந்த மத்தியஸ்தம் (குடியியல் மற்றும் வர்த்தகப் பிணக்குகள்) சட்டமூலம் தொடர்பான விவாதத்தின்போது, கௌரவ எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர் தயாசிறி ஜயசேக்கர அவர்கள் சில குற்றச்சாட்டுகளை கேலியாக முன்வைத்தார்கள்.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මතු කරපු සමහර ප්‍රශ්න තිබෙනවා. ඒ කරපු චෝදනාවලට ආණ්ඩු පක්ෂය හැටියට අපි උත්තර දෙන්න බැඳිලා ඉන්නවා. එතුමාගේ කථාවේදී මතු වුණා සුරේෂ් සලේ ගැන. සුරේෂ් සලේ ගැන එතුමා කථා කළා. හැබැයි මම එකක් කියනවා. මේ පාර්ලිමේන්තුවේ වරප්‍රසාදයට මුවා වෙලා ඓතිහාසික වැරදි කරන්න එපා. මේ ඔක්කෝම එකතු වෙලා තමන්ගේ පටු දේශපාලන අරමුණු වෙනුවෙන් මේ ජාතියට රටට ලොකු හානියක් කරනවා. ඉතින් දයාසිරි මන්ත්‍රීතුමා කියනවා වද හිංසා කළා කියලා සුරේෂ් සලේට. නිරුවත් කළා, පහර දුන්නා කියනවා. හැබැයි, දයාසිරි මන්ත්‍රීතුමෝ ඔබතුමා ඔය කථාව එළියට ඇවිල්ලා කියන්න ඕනෑ. ඒ චෝදනාව කරන්න මොකක්ද ඔබතුමාට තිබෙන සාක්ෂිය? ඔබතුමා ඒකට එරෙහිව ගත්ත පියවර මොකක්ද? රටේ අධිකරණය තිබෙනවා. ගිහිල්ලා සීඅයිඩී එකට හරි පැමිණිලි කරන්න පුළුවන්. හැබැයි මේ පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට මුවා වෙලා රට නොමඟ යවන්න එපා. දැන් දයාසිරි මන්ත්‍රීතුමා අනිවාර්යයෙන් ඔය වාගේ කථා කියන්න ඕනෑ. ඇයි ඒ? පාස්කු ඉරිදා ප්‍රහාරයට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එදා එතුමා මන්ත්‍රී ධුරය දැරුවා යහ පාලන ආණ්ඩුවේ. පාස්කු ඉරිදා ප්‍රහාරය වෙනකොටත් ඇමති. පාස්කු ඉරිදා ප්‍රහාරයේ විමර්ශන කරනකොටත් එදා යහ පාලන ආණ්ඩුවේ ඇමති. එතකොට මේ හවුල තමයි ඔය තිබෙන්නේ. මේ විමර්ශනය අනිවාර්යයෙන් දයාසිරි මන්ත්‍රීතුමාටත් හානියක් කරනවාමයි. මොකද, අපි දන්නවා හෙට්ටිපොළ සිද්ධිය. අපි විවිධ අවස්ථාවලදී මෙතැන ඒක මතු කරලා තිබෙනවා. කතෝලික ජනතාව ඥාතීන් හැටියටත් ඉන්නවා කිව්වා. හැබැයි අද කියනවා ඕස්ට්‍රේලියාවේ, එංගලන්තයේ, ඇමෙරිකාවේ මේ පරීක්ෂණ කළා, ඒ පරීක්ෂණ අවසන් කළා කියලා. ඒ වාගේම තවත් කියනවා වින්දිතයන්ට තව සාධාරණය ඉෂ්ට වුණේ නැහැ කියලා. එක පැත්තකින් පරීක්ෂණ ඉවරයි කියලා දැන් යන පරීක්ෂණයට බාධා කරනවා. පරීක්ෂණය ඉවරයි නම් අර වින්දිතයන්ට සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ. ඉෂ්ට වෙලා නැහැ. ඒ කියන්නේ පරීක්ෂණය නිවැරදි විධියට කෙරිලා නැහැ. එහෙනම් මේ නිවැරදි විධියට යන පරීක්ෂණයට උදව් කරන්න. ඓතිහාසික වැරදි කරන්න එපා. මේ රටේ මේ අධිකරණ පද්ධතියට හානි කරන්න එපා. අපි විශ්වාස කරමු අධිකරණ පද්ධතිය ගැන. මේ සුරේෂ් සලේ ආරක්ෂා කරන්නේ මොනවාටද? අපි හිටගන්න ඕනෑ නිවැරදි තැන. අවසානයට එල්ලිලා, අවසාන වරට දයාසිරි මන්ත්‍රීතුමා මේ සැරේ මේ පාර්ලිමේන්තුවට ආවේ. ඊළඟ සැරේ අනිවාර්යයෙන් ජනතාව මේ දයාසිරි මන්ත්‍රීතුමාව ප්‍රතික්ෂේප කරනවා.

இன்று எமது நாட்டின் நிலைமை தொடர்பாக ஆராயும்போது, 'ஈஸ்டர்' தாக்குதல் தொடர்பில் சரியான முறையில் விசாரணை நடத்தி, குற்றவாளிகளுக்குத் தண்டனை பெற்றுக்கொடுப்போம் என்பது அரசாங்கத்தின் மிக முக்கியமான வாக்குறுதியாக இருந்தது. அந்த வாக்குறுதிக்கான நடவடிக்கைகள் தற்போது மும்முரமாக இடம்பெற்று வருகின்றன. இது ஒரு வரலாற்று முக்கியத்துவம் வாய்ந்த நிலையாகும். இந்தச் செயற்பாட்டில் அரசாங்கம் நேரடியாகவும் நடுநிலையாகவும் இருந்து செயற்படுகின்றது.

எமது நாட்டில் இத்தகைய சமூகப் படுகொலைகளைச் செய்தவர்கள் தண்டிக்கப்படும்போதுதான், எதிர்காலத்தில் நாம் அனைவரும் ஒரு நிம்மதியான நாட்டைக் காண முடியும். எனவே, இந்தச் செயற்பாட்டுக்கு ஆதரவளிக்குமாறு நாட்டிலுள்ள சிவில் அமைப்புகளுக்கு நாம் அழைப்பு விடுக்கின்றோம். சிவில் அமைப்புகள் இன்று போராட்டக்களத்தில் இருக்க வேண்டும். ஏனெனில், சுரேஷ் சலே போன்ற மிக முக்கியமானவர்கள் இனிவரும் காலத்தில் கைதுசெய்யப்படலாம்! நாங்கள் அந்த அச்சத்தைப் புறக்கோட்டையில் கண்டோம். இவர்களைப் பாதுகாப்பதற்கு முன்வந்தவர்கள் யார்? அவர்கள் முகங்களில் ஒரு மரண பயம் தென்படுகின்றது. இந்தச் சபையிலுள்ள எதிர்க்கட்சியினரில் ஒரு குழுவினர் அவர்களை நேரடியாகப் பாதுகாக்கின்றார்கள்; இன்னொரு குழுவினர் மறைமுகமாக உதவி செய்கின்றார்கள். இவ்வாறு நேரடியாகப் பாதுகாப்பவர்களும், மறைமுகமாக உதவி செய்பவர்களும் வரலாற்று ரீதியான தவறைச் செய்துகொண்டு இருக்கின்றார்கள்.

2019ஆம் ஆண்டு சூழலில் எவ்வாறானதொரு அச்ச நிலை நிலவியது? அப்போது, சமூக உணர்வோடு செயற்பட்ட பல நிறுவனங்கள் முடக்கப்பட்டன; சமூக உணர்வோடு தியாகங்களைச் செய்த நபர்கள் கைது செய்யப்பட்டார்கள். இவர்களுக்கு நாம் நியாயம் வழங்க வேண்டாமா? இவ்வாறான செயற்பாடுகளைத் தடுப்பதற்காகவா இன்று மக்களுடைய வாக்குகளைப் பெற்று பாராளுமன்றத்துக்கு வந்துள்ளீர்கள்? ஆனால், இந்தப் பாராளுமன்றத்தில் வெளிநாட்டு முஸ்லிம் பிரஜைகளுக்காகக் குரல்கொடுத்த முஸ்லிம் உறுப்பினர்கள், இப்போதும் அவர்களுக்காக கட்டாயம் குரல்கொடுக்க வேண்டும். ஆனால், அவர்களின் அந்தச் செயற்பாட்டை இன்று பாராளுமன்றத்தில் எங்களால் காண முடியவில்லை. எமது நாட்டில் ஒட்டுமொத்த முஸ்லிம் சமூகமும் பாதிக்கப்பட்ட ஒரு சம்பவம்தான் 'ஈஸ்டர்' தாக்குதல். இன்று கௌரவ முன்னாள் அமைச்சர் ரஊப் ஹகீம் அவர்கள் எங்கே? பாராளுமன்ற உறுப்பினர் கௌரவ றிஸாட் பதியுதீன் எங்கே? கௌரவ முஜிபுர் ரஹ்மான் எங்கே? கௌரவ இம்ரான் மஹ்ரூப் எங்கே? இந்த மோசமான தலையீட்டைத் தடுப்பதற்கு உங்களுடைய குரல் எங்கே? நீங்கள் சேர்ந்திருக்கின்ற,

[ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා]

உங்களது கூட்டணிக் கட்சியில் இருக்கின்ற தலைவர்கள் அவர்களோடுதான் கலந்துரையாடலில் ஈடுபட்டு இருக்கின்றார்கள். அது AI Sajith தலைவராக இருக்கலாம்! அல்லது செயலாளராக இருக்கலாம்! நீங்கள் எவ்வாறு, எப்போது அவர்களிடம் கேள்வி கேட்கப் போகிறீர்கள்?

இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்தி நாங்கள் கட்சி பேதம் இல்லாமல், அரசியல் இலாபம் கருதாமல், தூய்மையான நாட்டை, தூய்மையான நீதித்துறையைக் கட்டியெழுப்ப வேண்டும். இது எல்லோருடைய கட்டாய பொறுப்பாகும். தயாசிறி போன்றவர்கள் கூச்சலிடுவார்கள். அந்தக் குற்றத்தோடு சம்பந்தப்பட்டவர்கள் அல்லது நாமல் ராஜபக்ஷ, விமல் வீரவங்ஸ, உதய கம்மன்பில போன்றவர்களோடு கூட்டணியில் சேர உங்களுக்கு எவ்வாறு முடியும்? நீங்கள் முஸ்லிம் சமுதாயத்தின்மீது ஆர்வம், அக்கறை உள்ளவர்களாக இருந்தால், இந்தக் கேள்வியை உங்கள் கூட்டணியிடம் நீங்கள் கேட்க வேண்டும். இது சம்பந்தமாகப் பாராளுமன்றத்திலே பேசுங்கள்! சுரேஷ் சலேயைப் பாதுகாக்கத்தானே நீங்கள் மறைமுகமாகச் செயற்படுகின்றீர்களென்று கேட்கின்றேன். நாங்கள் நாட்டிலே சமாதான சூழலை ஏற்படுத்துவதற்காக சரியான முறையில் சட்டத்தை நிலைநாட்டிக்கொண்டிருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தில், அதற்கு உறுதுணையாக நின்று இந்நாட்டுக்கு ஓர் அழகான சூழலை உருவாக்குவோம் என்று சிவில் அமைப்புகள் உட்பட அனைவரையும் நான் விநயமாகக் கேட்டு விடை பெறுகின்றேன்.நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Mrs.) Chamindranee Kiriella. You have nine minutes.

[1.10 p.m.]

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
Hon. Deputy Speaker, first of all, I would like to thank you for giving me time to speak on this very important piece of legislation titled the Mediation (Civil and Commercial Disputes) Bill that has been presented today. It is indeed a positive and a long-awaited piece of legislation. So, I would like to congratulate the Hon. Minister for presenting it today.

Integrating mediation into legislation gives formal recognition to alternative dispute resolution, making the process enforceable, predictable and trustworthy. In particular, the Sri Lankan courts are burdened with a massive backlog of approximately 1.1 million unresolved civil and criminal cases. Therefore, alternative dispute resolution methods such as mediation, bypassing the traditional court litigation will eventually ease that burden.

Further, Sir, it would also reduce the cost for litigants because we know that in Sri Lanka, the cost of litigation is very high. If a particular person has an issue and he decides to go for mediation, it would definitely reduce the cost of litigation. So, overall, I would say this is a very positive move as it not only encourages the use of mediation, but also inspires trust in the process and in those who administer it.

However, Hon. Minister, I would like to point out a few areas of concern in the new piece of legislation. In particular, I draw your attention to Clause 2(1) of the Bill. It states that mediation could be initiated either by a mediation agreement, a court order or by a voluntary referral by a party to the dispute. The issue I have is with regard to this voluntary referral to mediation by one party to the dispute because it implies that one party alone could trigger mediation. So, essentially, even though there is no specific agreement, if one party wishes to go into mediation, it could do so. Basically, that, I feel, contradicts the basic principle that mediation requires the consent of all parties.

Further, Hon. Minister, I would like to draw your attention to Clause 5 of the Bill, which statutorily bars the court from entertaining a dispute merely because mediation has commenced, even in the absence of a mediation agreement. It forces parties to stay out of court until mediation certifies non-settlement, and that could turn mediation into a procedural deadlock. So, basically, this requirement of the non-settlement certificate could be used by parties to delay the whole dispute resolution process. In particular, you could have a litigant who, in bad faith, wants to delay the resolving of a particular dispute, especially in the case of unlawful rent and so on and so forth. So, that could definitely be taken on by such a party. For example, Hon. Minister, under Singapore's Mediation Act of 2017, the courts can only stay proceedings when there is a formal agreement. But, like I said before, in Sri Lanka, even in the absence of a formal agreement, if one party wants to go into mediation, it could do so and, in that event, the other party cannot go into litigation. So, that kind of act, basically, goes against the concept of mediation.

The other thing is the requirement of a Mediation Service Provider. That essentially means that if the parties wish to obtain the services of a mediator who is well-versed in a particular industry, they are precluded from doing so because they have to go with a registered service provider, which could create some sort of bureaucracy.

Overall, I would say that the Act could be looked at positively, especially in terms of Clause 19 of the Bill, which states that the Settlement Agreement is a legally binding agreement and also Clause 22, which states that the Settlement Agreement could converted into a decree of court by the High Court. So, those are, essentially, positive steps you could take towards improving it and I hope the Hon. Minister would take in our suggestions favourably as we all want to ensure that the delay in our court system is minimized.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ගරු සභාවට යම් කාරණාවක් කියන්න කැමැතියි. දැනට දින කිහිපයකට ඉහත දී මා අපේ අතිගරු මහනායක හිමිපාණන් වහන්සේ බැහැ දකින්නට ගියා. එම අවස්ථාවේ දී එම හිමිපාණන් වහන්සේ මේ ගරු සභාවට

උන් වහන්සේගේ අවසරය ඇතිව ඉදිරිපත් කරන්නට යම් කාරණාවක් කිව්වා. විශේෂයෙන්ම අපි දන්නවා, අපේ රටේ බුද්ධ ශාසනයට විශාල තර්ජනයක් එල්ල වෙලා තිබෙන බව. ස්වාමීන් වහන්සේලාටත් එසේමයි. විශේෂයෙන්ම මෙවැනි දේවල් බුදුරජාණන් වහන්සේගේ කාලයේදීත් සිදු වෙලා තිබෙනවා. පසුගිය කාලයේදීත් මෙවැනි දේවල් සිදු වෙලා තිබෙනවා, ඉදිරියේදීත් මෙවැනි තර්ජන සිදුවීමට හැකියාව තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ ස්වාමීන් වහන්සේලා නිසා තමයි මෙතෙක් කල් බුද්ධ ශාසනය රැක ගැනීමට හැකි වුණේ. අපේ රටේ බුද්ධ ශාසනයට අවුරුදු ගණනාවක් ගත වෙලා තිබෙනවා. යටත් විජිත රාජ්‍යයක් වශයෙන් කටයුතු කරනකොටත් අපේ රටේ බුද්ධ ශාසනය රැක ගන්න පුළුවන් වුණේ ගරුතර මහා සංඝරත්නය නිසායි; විශේෂයෙන්ම මිහිඳු මහ රහතන් වහන්සේ අපේ රටට වැඩම කිරීමෙන් අනතුරුවයි. අපේ රටේ ශ්‍රී ලාංකික සංස්කෘතිය හැඩ ගැසිලා තිබෙන්නේ බුද්ධ ශාසනය සහ බෞද්ධ ආගම එක්ක බද්ධ වෙච්ච සංස්කෘතියක් තුළයි කියලා කියන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු මහනායක ස්වාමීන් වහන්සේගේ යෝජනාවක් තිබෙනවා අපේ රටේ සිටින සියලු භික්ෂූන් වහන්සේලා පිළිබඳව. දළ වශයෙන් ගත්තොත්, අද වෙනකොට අපේ සංඝයා වහන්සේලා 40,000ක් විතර ලියාපදිංචි වෙලා තිබෙනවා. ඉතින් ඒ හිමිපාණන් වහන්සේ විශේෂයෙන්ම මේ රජයෙන් ඉල්ලීමක් කරන්න කිව්වා, උන්වහන්සේලාට හැඳුනුම්පතක් ලබා දෙන්න කියලා. මම හිතන විධියට, 40,000ක් කියන්නේ විශාල ප්‍රමාණයක් නොවෙයි. අධිකරණ ඇමතිතුමාත් මේ ගරු සභාවේ සිටින වෙලාවේ මා ඉල්ලා සිටිනවා, මේ සියලු සංඝයා වහන්සේලාට හැඳුනුම්පතක් නිකුත් කරන්න කියලා. මොකද, නිල හැඳුනුම්පතක් දුන්නොත් දැන් තිබෙන ප්‍රශ්නවලින් යම් කිසි දුරකට මිදෙන්න පුළුවන් කියලා මම හිතනවා. මට කාල වේලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Minister, you can clarify.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ස්තුතිවන්ත වෙනවා එතුමියට; I am grateful and respectfully thank her for her very constructive contribution.

However, Hon. Member, I would like to invite your attention to Clause 2(1) of the Bill, which refers to a party to mediation. You raised the point that it allows one party to drag the matter into mediation. But, that is not the thrust of the matter. One party may request for mediation, but if the other party does not agree to it, then it would not go into mediation. So, that is the point I wanted to clarify to you. A party could request for mediation, but if both parties do not agree, I mean, by the definition of mediation itself, it would not be referred for mediation. - *[Interruption.]* We will have a chat later on that, as we are running out of time. But, anyway, thank you for raising it.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That is a good clarification.

Next, the Hon. Mahinda Jayasinghe. You have nine minutes.

[අ.භා. 1.19]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේ අපි විශේෂයෙන්ම කථා කරනවා සමථකරණ (සිවිල් හා වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත පිළිබඳව. අද මේ ගරු සභාව තුළ විශේෂයෙන්ම විපක්ෂයේ සමහරුන් මතු කරපු කරුණු පිළිබඳව යම් පැහැදිලි කිරීමක් සහ ඒ පිළිබඳව අපේ මතය ඉදිරිපත් කරන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා. අපි දැක්කා, මේ දින කිහිපය පුරාවටම මේ ගරු සභාව තුළ මාතෘකාව බවට පත් වෙලා තිබුණේ සුරේෂ් සලේ ගැන බව. සුරේෂ් සලේ ගැන අධිකරණය තුළ ඇති තරම් වාද විවාද පැන නැඟෙමින්, ඔහුට සැලකුවේ කොයි ආකාරයටද කියන එක පිළිබඳව තර්ක විතර්ක ගණනාවක් මතු වෙමින් තිබෙනවා. ඒ පිළිබඳව පැහැදිලි කිරීම් කරලා තිබෙනවා. එසේ තිබියදී, මේ පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට මුවා වෙමින් දිගින් දිගටම පාර්ලිමේන්තුව ඇතුළේ විපක්ෂයේ මන්ත්‍රීවරු වැරදි, රට නොමඟ යවන ප්‍රකාශ සිදු කරමින්, විශේෂයෙන් මේ පාස්කු ප්‍රහාරය සම්බන්ධව සිදුවන විමර්ශනවලදී අධිකරණ ක්‍රියාවලියට යම් කිසි ආකාරයකට අනියම් ලෙස බලපෑම් කරමින් තිබෙන ආකාරය අපි දකිනවා. මීට කලින් කථා කරපු ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වේ මොකක්ද? සලේට අමානුෂික ලෙස සලකා තිබෙනවාලු. එතුමාගේ නම ඉදිරියෙන් "නීතිඥ" කියලා කොටසකුත් තිබෙනවා. අපි දන්නේ නැහැ, එතුමා මොන උසාවියේ නඩු අහනවාද, බලනවාද, මොකක්ද කියලා. කෙසේ වෙතත්, එතුමාගේ නම ඉදිරියෙන් "නීතිඥ" කියලා කොටසක් තිබෙනවා. ඒ නිසාම වෙන කෙනෙක් අදහස් දක්වනවාට වඩා වගකිව යුතු ලෙස එතුමා මේ සභාවේ අදහස් දක්වන්න ඕනෑ. අපි අහනවා, එවැනි ආකාරයෙන් අමානුෂික ලෙස සලේට සලකා තිබෙනවා නම් කොතැනකටද මානව හිමිකම් පැමිණිල්ලක් දාලා තිබෙන්නේ කියලා. කිසිම තැනක එහෙම කිසිම පැමිණිල්ලක් දාලා නැහැ. අපි අභියෝග කරනවා, පුළුවන් නම් ඔය කියන කථා ටික එළියට ගිහිල්ලා කියන්න කියලා. මොකද, පිටකොටුව ඉස්සරහ ඒගොල්ලන්ගේ යාළුවෝ ටික අට්ටාලයක් අටවාගෙන දවස් දෙක, තුනක් හිටියා. හැබැයි අට්ටාලය ගහනකොට කිව්වේ නම් සලේ නැවත හිටපු තැනට නොයවනවා කියන සහතිකය ලැබෙන තුරු අට්ටාලය ගලවන්නේ නැහැ, අඛණ්ඩව ඉදිරියට මේ සත්‍යාග්‍රහය කරගෙන යනවා කියලායි. කෙසේ වෙතත්, ඊයේ එය අකුළාගෙන යනවා අපි දැක්කා. මොකද, එය අකුළාගෙන යන තැනට වැඩ සිද්ධ වුණා. ඒ, ඇයි? ඒගොල්ලන් 10දෙනෙක්, 15දෙනෙක් එකතු වෙලා අට්ටාල ගහගෙන ඉන්නකොට මේ රටේ සිටින නිර්භීත පුරවැසියන් කිහිපදෙනෙක් තනි තනිව ඇවිල්ලා ඒගොල්ලන්ට අභියෝග කළා. ඒගොල්ලන් දන්නවා, තව ටික දවසක් හිටියා නම් ඔවුන් තනිවම නොවෙයි තව පිරිස් එක්ක

[ගරු මහින්ද ජයසිංහ මහතා]

එනවා කියලා. පාස්කු විමර්ශනවලට මෙහෙම බාධා කරන එකට එරෙහිව අන්න අද මීගමුවේත් උද්ඝෝෂණ පැවැත්වෙනවා. සලේ වෙනුවෙන් අට්ටාලයක් ගහගෙන හිටපු තැනට අද උදැසන යම් පිරිසක් ඇවිල්ලා විරෝධතා පළ කරනවා මම දැක්කා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එවැනි වටපිටාවක් නිර්මාණය වුණු නිසා ඒගොල්ලන් මේ දේවල් අකුළාගෙන පල්ලම් බැස්සා.

අද ඉඳලාත් ගහන්නකෝ, අට්ටාලයක්. තමන්ගේ බිරිඳ වසර දෙකක සිර දඬුවමට එරෙහිව කරපු අභියාචනය මහාධිකරණයෙන් ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා නේ. තමන්ගේ සහෝදරයාට විදෙස් ගමන් තහනම් කරලා තිබෙනවා නේ. ඉතින් තිබෙන්න එපායැ, ලේවල කැක්කුම. තමන්ගේ බිරිඳ වෙනුවෙන් අට්ටාල ගහගෙන අඛණ්ඩ උපවාසයක් නොවෙයි, මාරාන්තික උපවාසයක් කරන්න එපායැ. එහෙම එකක් කරන්න එපායැ. තමන්ගේ මාධ්‍ය ලේකම් රිමාන්ඩ් බන්ධනාගාරගත වෙලා ඉන්නවා. මේ සියල්ල මැද අද නිහඬව ඉන්නවා නේ. ඒ නිසා අපි කියන්න ඕනෑ, පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුව ඇතුළේත්, එළියේත් මේ කරන්නේ යුක්තිය, සාධාරණත්වය ඉටුවීමට එරෙහිව නැඟී සිටින එකයි කියලා. ඒ නිසා මම නැවත දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට කියනවා, පුළුවන් නම් එළියට ගිහිල්ලා ඔය දේවල් කියන්න කියලා.

ඒ වාගේම එතුමා වෛද්‍යවරියක් සම්බන්ධයෙනුත් කියනවා මම දැක්කා. සලේට ප්‍රතිකාර කරන වෛද්‍යවරුන් කවුද කියලා අධිකරණයෙන් නම් කළා. එහෙම නේද, ගරු අධිකරණ ඇමතිතුමනි? ඒ නම් කරපු වෛද්‍යවරුන් සම්බන්ධයෙන් ඒ මන්ත්‍රීතුමා මෙතැනට ඇවිල්ලා විවිධ අවලාද නඟනවා. මොකද, පාර්ලිමේන්තු වරප්‍රසාද තිබෙනවා නේ. විශේෂයෙන්ම මෙතැන ඉන්න සජබයේ මන්ත්‍රීවරුන්ගෙන්, මන්ත්‍රීවරියන්ගෙන් අපි මේ කාරණය අහනවා. දයාසිරි ජයසේකර මැතිතුමා පාර්ලිමේන්තු ආවේ සජබයෙන්. දැන් එතුමා මේ ඉදිරිපත් කරන්නේ සජබයේ මතයද, එහෙම නැත්නම් රාජපක්ෂලාගේ පොහොට්ටුවේ මතයද? පෙරේදා ද කොහෙදෝ නාමල්ලාත් ගිහිල්ලා අර අට්ටාලයේ වාඩි වෙලා ඉන්නවා මම දැක්කා. ඒගොල්ලන්ගේ මතයද එතුමා ඉදිරිපත් කරන්නේ? එතුමා මෙතැන ප්‍රකාශ කරන්නේ ඒගොල්ලන්ගේ මතය. පොහොට්ටුවේ, වීරවංශලාගේ, දිලිත්ලාගේ, ගම්මන්පිලලාගේ මතය තමයි දයාසිරි ජයසේකර මෙතැන ප්‍රකාශ කරන්නේ. ඒකද සජබයේ මතය?

මේ දයාසිරි ජයසේකර පාස්කු ප්‍රහාරය වූ කාල වකවානුවේත්, පාස්කු ප්‍රහාරයට අදාළ විමර්ශන නොමඟ යවනකොටත්, කැලෑ පාරේ එම විමර්ශන අරගෙන යනකොටත් ඇමති. අපි එහෙම කියන්නේ ඇයි? ඉතාම පැහැදිලිව දැන් මේ එකින් එක තහවුරු වෙමින් තිබෙනවා, පාස්කු ප්‍රහාරයට අදාළ විමර්ශන වෙනත් පාරවල්වල ගෙනියන්න පසුගිය ආණ්ඩු කාලවල උත්සාහ කළා කියලා. අද පාස්කු ප්‍රහාරයට එරෙහි, පාස්කු ප්‍රහාරය හා සම්බන්ධ විමර්ශන නිවැරදි මාවතේ නිවැරදි දිශාවට නිවැරදි ලෙස සිදුවෙමින් තිබෙනවා. අද ඒකට එරෙහිව අවි අමෝරා ගනිමින් සිටිනවා, පාස්කු ප්‍රහාරයට මුවාවෙලා බලයට ආපු, ඒ බලය භුක්ති විඳපු, ඒ බලයෙන් සියලු දේවල් යටපත් කරන් හිටපු මහත්වරුන්. අද ඔවුන් වියරු වැටිලා තිබෙනවා. අපි දන්නේ නැහැ, ඒ මන්ත්‍රීතුමා එක එක පැතිවලට පනින්නත් හොඳ පුරුද්දක් තිබෙන කෙනෙක් නේ. ඉතිහාසය දෙස බැලුවොත් පෙනී යනවා, පැනපු එකේ ඉවරයක් නැහැ කියලා. පැනලා, පැනලා, පැනලා දැන් නතර වෙලා ඉන්නවා, සජබයේ. හෙට කොහේ නතර වෙයිද දන්නේ නැහැ. හෙට කොහේ හරි නතර වෙන්න බලාගෙන දැන් කැසපට ගහනවාද කියලාත් මේ කථා දිහා බැලුවාම අපට සැකයක් මතුවනවා. අපි මේ රටේ ජනතාවට විශේෂයෙන්ම මේ දේ කියන්න ඕනෑ. මේ අය හැම මාසයකම පාර්ලිමේන්තු රැස්වීම් පවත්වන සති දෙක තුළ මේ පාර්ලිමේන්තුව ඇතුළේ වැරදි මත හදමින්, අසත්‍ය ප්‍රකාශ කරමින් රටේ ජනතාව නොමඟ යවන්න උත්සාහ කළත් අපි විශ්වාස කරනවා, මේ රටේ සාතිශය බහුතරයක් ජනතාව මේ දේවල්වලින් නොමඟ යන්නේ නැහැ කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! Does the House agree to extend the time until the current Business is concluded?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Deputy Minister, you have two minutes left.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

මේ රටේ ජනතාව 2024 සැප්තැම්බර් මාසයේදී අපේ ජනාධිපතිවරයා පත් කරද්දීත්, නොවැම්බර් මාසයේදී පාර්ලිමේන්තු මැතිවරණයෙන් අපේ ආණ්ඩුව බලයට පත් කරද්දීත් අප කෙරෙහි තැබූ විශ්වාසය, ඒ ජනතා අභිලාෂ දශමයකින් හෝ බිඳ වට්ටන්නේ නැතුව ඒ අභිලාෂ ඔස්සේ කටයුතු කරනවාය කියන සහතිකය අපි ලබා දෙනවා. ඒ නිසා තමයි අද අල්ලස් නඩු එකින් එක එමින් පවතින්නේ. ඊයේත් දකුණේ හිටපු මහ ඇමති ශාන් විජයලාල් ද සිල්වා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම විසින් අත්අඩංගුවට ගත්තා. අදත් තව නඩු තීන්දුවක් ප්‍රකාශයට පත් කළා. මේ විධියට අධිකරණය ඉතාම ස්වාධීනව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ඉතාම ස්වාධීනව, නීතිපති දෙපාර්තමේන්තුව ඉතාම ස්වාධීනව අද එම කටයුතු මෙහෙයවමින් තිබෙනවා. ඒ නිසා, තමන් ගහපු කතිරය පිළිබඳව අද මේ රටේ ජනතාවට තෘප්තියක් තිබෙනවා. ඒ කතිරය කොච්චර වටිනවාද කියනවා නම්, දැන් පිස්සන් කොටුවට රතිඤ්ඤයක් දැම්මා වාගේ සියලුදෙනා කලබල වෙලා තිබෙනවා. එක එක කඳවුරුවලට බෙදී වෙන් වෙලා හිටපු අය; සී සී කඩ වෙලා හිටපු අය අද කලබල වෙලා. ඒ සියලු බෙදීම්, විරසක, අමනාපකම්, ඉතිහාසයේ තමතමන් කර ගත් විවේචන පසෙකලා අද ඒ හැමෝටම එක කඳවුරකට ගාල් වෙන්න බල කෙරිලා තිබෙනවා, මේ ආණ්ඩුවේ මේ ක්‍රියාවලිය විසින්.

මම ඊයේ විපක්ෂ නායක ගරු AI සජිත් ප්‍රේමදාස මහත්මයාටත්, විපක්ෂයේ ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමාටත් යම් කාරණයක් කිව්වා. මොකද, එතුමන්ලා දෙදෙනාගේම පැත්තෙන් මේ සමාජයත්, රටත් නොමඟ යවන අසත්‍ය කරුණු කිව්වා, රටේ ජනතාවගේ රැකියා අහිමිවීම ගැන. මම කිව්වා, පුළුවන් නම් අදත්, හෙටත් කියන දවස් දෙක ඇතුළත ඒ පිළිබඳ සංඛ්‍යා දත්ත සහ කරුණු මේ සභාවට ලේඛන සහිතව ඉදිරිපත් කරන්න කියලා. නැත්නම් මේ මාසයේ ඊළඟ පාර්ලිමේන්තු සතිය තිබෙනවා. ඒ සතියේදී හෝ එම කරුණු ඉදිරිපත් කරන්න කියලා මම නැවතත් කියනවා. මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ රටත්, ජනතාවත් නොමඟ යවන්න නොවෙයි, රටටත්, ජනතාවටත් නිවැරදි මඟ කියා දෙන්න; රටටත්, ජනතාවටත් නිවැරදි මඟ කියා දෙමින්, අවශ්‍ය කරන නීති, අණපනත් සම්මත කරමින් මේ රට යහ මඟට ගන්න. මේ පාර්ලිමේන්තුව ඇතුළේදී ඉතිහාසයේ නටපු නාඩගම්, විගඩම් නැවත නටන්න එපාය කියන කාරණයත් අපි ඒ හැමෝටම නැවත නැවතත් අවධාරණය කරමින් මතක් කරලා දෙනවා.

ඉතිහාසයේදී මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඇති තරම් බොරු කිව්වා. බොරු කියනකොට ඒවාට උත්තර දෙන්න - උත්තර බඳින්න - කවුරුවත් හිටියේ නැහැ. මොකද, අනික් පැත්තේ හිටියේත් ඒ ජාතියේම බඩු ටිකක්. ඉතිහාසයේදී බොරු කියනකොට, ඒ බොරුව ඒ විධියටම සමාජගත වෙන්න ඉඩ ඇරලා හිටියා. මොකද, විපක්ෂය පැත්තේ වාගේම ආණ්ඩු පක්ෂය පැත්තේත් හිටියේ ඒ ජාතියේම බඩු ටිකක්. නමුත්, අද ඒ සෙල්ලම් කරන්න බැහැ. අද ඔබතුමන්ලා මතු කරන හැම වැරදි කරුණකටම, ඔබතුමන්ලා මතු කරන හැම ප්‍රශ්නයකටම උත්තර දෙන්න ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළ පිරිස් ආණ්ඩු පාර්ශ්වය තුළ ඉන්නවා. ඒ නිසා මම අද දවසේ නැවතත් ඉල්ලනවා, පුළුවන් නම් හෙට දවස ඇතුළත, එහෙම නැත්නම් මේ මාසයේ ඊළඟ පාර්ලිමේන්තු සතිය ඇතුළත රැකියා අහිමි වුණු ලක්ෂ ගණනක් දෙනාගේ තොරතුරු සංඛ්‍යාලේඛන සහිතව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. ඒ වාගේම, රටත්, ජනතාවත් නොමඟ යවන්න එපාය කියා මම නැවතත් අවධාරණය කරනවා.

කටුවාපිටිය පල්ලිය තිබෙන්නේ මගේ දිස්ත්‍රික්කයේ. කටුවාපිටිය කියන්නේ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයෙන් වැඩිම හානියකට ලක් වුණු ප්‍රදේශයක්. විශේෂයෙන්ම මම මීගමුව අවට අපේ කතෝලික බැතිමතුන්ටත්, කතෝලික ප්‍රජාවටත්, මුළු රටටත් අවධාරණය කරනවා, මොන අට්ටාල ගැහුවත්, මේ පාර්ලිමේන්තුව ඇතුළේ මොන බොරු, බේගල් ඇදබෑවත්, රාජපක්ෂලාගේ වුවමනාවට පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයට එරෙහි විමර්ශන අඩපණ කරන්න, නොමඟ යවන්න, වෙන පැත්තකට යොමු කරන්න මොන තරම් උත්සාහ කළත්, ඒ කිසිවකට ඉඩ දෙන්නේ නැතුව, අනිවාර්යය ලෙසම වූදිතයන්ට දඬුවම් දෙන තෙක් මේ විමර්ශන සාධාරණව, යුක්තිසහගතව ඉදිරියට අරගෙන යන බව. ඒ කාරණයත් සඳහන් කරමින්, මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු හර්ෂණ නානායක්කාර මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Harshana Nanayakkara]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee. -*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 සිට 30 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 30ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 30 ordered to stand part of the Bill.*

***උපලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*அட்டவணை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Schedule ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சட்டமாகு வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Enacting Clause ordered to stand part of the Bill.*

***නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*தலைப்பு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Title ordered to stand part of the Bill.*

***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Bill reported without Amendment..*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Sir, I move,

"That the Bill be now read the Third time."

Sir, I also request permission to correct the language errors, typographical errors, grammatical errors, numerical errors in the Bill and to make consequential amendments to the Bill.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## සාපරාධී කාරණාවල දී අන්‍යොන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනත: නියමය
## குற்றவியல் கருமங்களில் பரஸ்பர உதவியளித்தல் சட்டம்: கட்டளை
## MUTUAL ASSISTANCE IN CRIMINAL MATTERS ACT: ORDER

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Hon. Deputy Speaker, I move,

"That the Order made by the Minister of Justice and National Integration under Section 2 of the Mutual Assistance in Criminal Matters Act, No. 25 of 2002 in respect of the Treaty between the Government of the Democratic Socialist Republic of Sri Lanka and the Government of the Republic of Maldives signed in July, 2025 and published in Gazette Extraordinary No. 2470/04 of 05th January, 2026, which was presented on 19.05.2026, be approved.
(Cabinet approval signified.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
Sir, I move,

"That the Parliament do now adjourn."

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Adjournment Motion to be moved by the Hon. Kabir Hashim. You have 18 minutes, Hon. Member.

## රටේ වර්තමාන ආර්ථික තත්ත්වය
### நாட்டின் தற்போதைய பொருளாதார நிலைமை
### CURRENT ECONOMIC SITUATION OF THE COUNTRY

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පවතින අයහපත් ආර්ථික කළමනාකරණය නිවැරදි දත්ත මත පදනම් වූ පුරෝකථනයන්හි අඩුපාඩු සහ ප්‍රමුඛතා මත ක්‍රියා නොකිරීම හේතුවෙන් රට ආර්ථිකව, සමාජයීයව සහ උපාය මාර්ගිකව පිරිහීමට ලක්ව ජනතාව දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දෙමින් සිටී. විශේෂයෙන්ම රුපියලේ අගය අඛණ්ඩව අවප්‍රමාණය වීම හා උද්ධමනය ඉහළ යාම නිසා ජනතාවට දරා ගත නොහැකි ලෙස ජීවන වියදම ඉහළ ගොස් ඇත. බලශක්ති සුරක්ෂිතතාව සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග හේතුවෙන් ඉන්ධන හා විදුලිය සඳහා අධික පිරිවැයක් දැරීමට සිදු වීම නිසා භාණ්ඩ හා සේවා මිල ගණන් තවදුරටත් ඉහළ ගොස් ඇත.

එමෙන්ම, ඉදිරියේ අපේක්ෂිත එල් නිනෝ සහ ලා නිනෝ වැනි ගෝලීය පාරිසරික වෙනස්වීම්වලට නිසි ලෙස මුහුණ දීමට රට සූදානම් වන බවක් පෙනෙන්නට නොමැත. මීට අමතරව, ආහාර අනාරක්ෂිතතාව පිළිබඳ අනතුරු ඇඟවීම් ඉදිරිපත් වී තිබියදී පවා කෘෂි කර්මාන්තයට අවශ්‍ය පොහොර ලබා නොදීම හා යෙදවුම් සාධාරණ මිලකට ලබා ගත නොහැකි තත්ත්වය රටේ ආහාර නිෂ්පාදනය බරපතළ අනතුරකට ලක් කර ඇත. එමෙන්ම අවිධිමත් ලෙස සහල් ආනයනය දේශීය වී ගොවිතැනට එල්ල කොට ඇත්තේ තර්ජනයකි. එබැවින්, පවතින හා අනාගතයේ අපේක්ෂිත පාරිසරික හා ආර්ථික තත්ත්වයන් සමස්තයක් ලෙස සලකා බලමින්, ජනතාවගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම අරමුණු කර ගත් බලශක්ති හා ජීවන වියදම් ආරක්ෂණ සැලැස්මක් ආණ්ඩුව විසින් ගරු සභාවට ඉදිරිපත් කළ යුතු බව මෙයින් යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන ආර්ථික තත්ත්වය ගැන කථා කරනකොට අද "ලංකාදීප" පුවත්පතේ තිබෙන තොරතුරු හොඳටම ඇති. අද "ලංකාදීප" පුවත්පතේ headline එක ගත්තොත්, එම පුවත්පතේ මුල් පිටුවේ එක පැත්තක තිබෙනවා, "ලෝක ආහාර වැඩසටහනෙන් හෙළිදරව්වක්" කියලා; ඒ කියන්නේ, Food and Agriculture Organization එකෙන් කරන ලද හෙළිදරව්වක්. මේ headline එකෙන් කියනවා, "දුප්පතුන් ලැයිස්තුවට තවත් ලක්ෂ තුනක්" එකතු වෙනවා කියලා. 2024 වර්ෂයේ ලංකාවේ පෝෂ්‍යදායී ආහාර වේලක් ගන්න බැරි අය ලක්ෂ 33ක් හිටියා. 2026 වසර වනකොට ඒක ලක්ෂ 47කට වර්ධනය වෙලා තිබෙනවා. ඒ කියන්නේ, JVP ආණ්ඩුව යටතේ පෝෂ්‍යදායී ආහාර වේලක් ගන්න බැරි අය ලක්ෂ 47ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. යුද්ධය නිසා තවත් ලක්ෂ 13ක් මේකට එකතු වෙයි කියලා මෙහි සඳහන් වෙනවා. ඒ කියන්නේ, ඒ ප්‍රමාණය ලක්ෂ 60කට විතර ආසන්න වෙනවා. එතකොට මේ ගැන ආණ්ඩුවේ උත්තරය මොකක්ද? ඒ පත්තරේ මුල් පිටුවේ අනෙක් පැත්තේ headline එකේ, "වසර හයට දරුවන් දෙලක්ෂ හැටහත් දහසකට පාසල එපා වෙලා" යනුවෙන් සඳහන් වෙලා තිබෙනවා. දරුවන්ට පාසල් යන එක එපා වෙලා මේ කාල පරිච්ඡේදය තුළ. ඉතින්, මේවා බරපතළ ප්‍රශ්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ වෙලාවේදී කියන්න කැමතියි, වර්තමාන ආර්ථික අවිනිශ්චිතභාවය ඇති වෙලා තිබෙන්නේ බාහිර හේතු නිසා නොවෙයි කියලා. අභ්‍යන්තර හේතු නිසා තමයි මේ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ කියන එක තමයි අපේ මතය. මොකද, ආණ්ඩුවට IMF එකේ plan එක හැර මධ්‍යස්ථ ආර්ථික මතයක් හෝ ප්‍රතිපත්තියක් හෝ දර්ශනයක් තිබෙනවාද කියලා පෙනෙන්නේ නැහැ. ස්ථාවරයක් නොමැති වීම සහ මන්දගාමී ලෙස ආණ්ඩුව හැසිරීම නිසා මේ ප්‍රශ්න දවසින් දවස උග්‍ර වන බව පෙනී යනවා.

මහ බැංකුව විසින් දෙසැම්බර් 25වැනි දා නිකුත් කරපු "Market Operations Report" කියලා එකක් තිබෙනවා. 2025දී මහ බැංකුව කියනවා, ඩොලර් බිලියන දෙකක් - US Dollars 2 billion - මහ බැංකුව විසින් වෙළෙඳ පොළෙන් මිලදී අරගෙන තිබෙනවා කියලා. ඒ, වාණිජ බැංකු හරහා, වෙළෙඳ පොළ හරහා සහ බැංකු swap ක්‍රමය හරහා. ඒ ඩොලර් බිලියන දෙක මිලදී ගැනීම සඳහා මහ බැංකුව විසින් රුපියල් බිලියන 789ක් වෙළෙඳ පොළට නිකුත් කර තිබෙනවා. ඒ කියන්නේ, මුදා හැරලා තිබෙනවා, Rs. 789 billion put into the market. මහ බැංකුවේ "Weekly Economic Indicators" කියන 2026 පෙබරවාරි මාසයේ නිකුත් කරපු වාර්තාවේ පෙන්නුම් කරලා තිබෙනවා, ජනවාරි මාසයේ සිට පෙබරවාරි මාසය දක්වා සති අටක් ඇතුළත වෙළෙඳ පොළ ඇතුළේ ද්‍රවශීලතාව - liquidity එක - රුපියල් බිලියන 280කින් වැඩි වෙලා තිබෙනවාය කියලා. ඒ කියන්නේ, මුදල් ඇතුළට දාලා. 2026 අප්‍රේල් මාසයේ එක සතියක් තුළ ඒ ද්‍රවශීලතාව තව රුපියල් බිලියන 93කින් වැඩි වෙලා තිබෙනවා. මහ බැංකුව විසින්ම නිකුත් කළ ප්‍රස්ථාරයක් තිබෙනවා. මම ඒ ප්‍රස්ථාරය මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ ප්‍රස්ථාරය අනුව රුපියලේ අගය අවප්‍රමාණ වීම පටන් අරගෙන තිබෙන්නේ දැන් නොවෙයි. JVP ආණ්ඩුව බලයට පත් වෙලා 2025 ජනවාරි මාසයේ සිට රුපියල අවප්‍රමාණ වීම පටන් අරගෙන තිබෙනවා. ඒක දිගටම ඇවිත් තිබෙනවා. ඒ කියන්නේ, යුද්ධය පටන් ගන්න මාස හය හතකට කලින් රුපියල අවප්‍රමාණ වෙන්න පටන් අරගෙන තිබෙනවා. හැබැයි, ආණ්ඩුව පෙන්වන්නේ මේ රුපියල අවප්‍රමාණ වෙන්නේ යුද්ධය නිසා, තෙල් නිසා කියලා. එහෙම නැහැ. මහ බැංකුව විසින් නිකුත් කළ ප්‍රස්ථාරයෙන් මේ බව පෙන්නුම් කරනවා. මේ ලේඛනය මම හොයා ගත්තා. මේ ප්‍රස්ථාරය තිබෙනවා, Central Bank Report එකේ. මෙන්න මේ වාගේ තත්ත්වයක් ඇති වෙලා තිබෙන අවස්ථාවේදී, this graph shows the Movements of the Weighted Average Spot Exchange Rate in 2025. කිසිම සැකයක් නැහැ, ඒ ගැන. ඒක වාර්තාවේ පැහැදිලිව තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවයි, මහ බැංකුවයි අතර නිවැරදි අවබෝධයක් නැති වීම නිසාත්, ආණ්ඩුවේ මූල්‍ය ප්‍රතිපත්තියයි, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තියයි අතර ගැටුමක් තිබෙන නිසාත්, එහි ප්‍රතිඵලය වෙලා තිබෙන්නේ JVP රජය බලයට ආවාට පසුව 2024 දෙසැම්බර් සිට 2026 මැයි දක්වා සියයට 13කින් රුපියලේ අවප්‍රමාණයක් - a 13 per cent depreciation - සිදු වීමයි.

ආණ්ඩුව පෙන්වන්න යන්නේ තෙල් මිල වැඩිවීමක්, නැත්නම් මැද පෙරදිග යුද්ධයක් තිබුණු නිසා තමයි මේ තත්ත්වය උදා වුණේ කියලා. අපි එහෙම හිතන්නේ නැහැ. මොකද, මහ බැංකුව විසින් විවෘත වෙළෙඳ පොළ මෙහෙයුමක් - Open Market Operation එකක් - සිද්ධ කරලා, ඒ විවෘත වෙළෙඳ පොළ මෙහෙයුමෙන් මුදල් ඇතුළට යන එක නිසි වෙලාවට වඳ කිරීමක් නොකරපු නිසා - sterilization operation එකක් කළේ නැති නිසා - අතිරික්ත ද්‍රවශීලතාවක් වෙළෙඳ පොළේ ඇති වෙච්ච නිසා ඒකත් එක්ක සෘජුවම - ඒ අතිරික්ත ද්‍රවශීලතාව නිසා - ආපසු ආනයනය වැඩිවෙන්න පටන් ගත්තා. ආනයනය වැඩිවෙනකොට ඩොලර්වලට ඇති වන පීඩනය නැවතත් වැඩිවෙලා විෂම චක්‍රයක් ඇති වීමෙන් තමයි රුපියල දිගටම අවප්‍රමාණ වෙලා අද මේ අර්බුදය මතු වෙලා තිබෙන්නේ කියන එකයි අපේ හැඟීම. So, this is a policy error. There has definitely been some policy error, both on the part of the Government and the Central Bank. The Government is the full cause for this. They have to take the responsibility and the Central Bank has to take equal responsibility.

මා දන්නා තරමට අද ඩොලරයේ මිල රුපියල් 331යි. ආයෙත් වැඩි වෙලාද දන්නේ නැහැ. රුපියල් 340ට ගියාද දන්නේ නැහැ; රුපියල් 331යි, 340යි අතර. මේක ව්‍යුහාත්මක තිරණයක අනුපාතයක් නොවෙයි; this is not a structural stabilization. අපි හිතනවා, මේක කෘත්‍රිමව රඳවා ගන්නා අනුපාතයක් කියලා. දැනට තිබෙන්නේ කෘත්‍රිමව රඳවාගන්නා අනුපාතයක්. අපි තර්ක කරනවා ආණ්ඩුව සමඟ. නිදහසේ මේ ඩොලරයේ හැසිරීමට ඉඩ දුන්නා නම් හෙට වෙනකොට රුපියල කඩාගෙන වැටෙනවා. ඒක තමයි යථාර්ථය. මේක අපි තේරුම් ගන්න ඕනෑ. කොළේ වහලා කථා කරන්න අපිත් එක්ක බැහැ. මොකද, අපි මේ ගැන දැනගෙන කථා කරන්නේ. මහ බැංකුවේ දත්ත අනුව; 2025 දත්ත ගත්තාම, ගිය වසරේ මාසික අපනයනය ඩොලර් බිලියන 1.4ක්. හැබැයි, මාසික ආනයනය ඩොලර් බිලියන 1.7ක්. අපේ ආනයනය අපනයනයට වඩා වැඩියි. අපේ වෙළෙඳ ගිණුමේ හිඟය මාසිකව ඩොලර් මිලියන 300ක් වැඩි වෙනවා. ඒ කියන්නේ, අවුරුද්ද අවසානයේදී අපේ වෙළෙඳ ගිණුමේ හිඟය ඩොලර් බිලියන 3.6කට වැඩි වෙනවා. මම අහන ප්‍රශ්නය මෙයයි. අපේ විදේශ සංචිත ඩොලර් බිලියන 6යි තිබෙන්නේ. අපට ණය වශයෙන් ඩොලර් බිලියන 3ක් විතර වසරකට ගෙවන්න තිබෙනකොට, වෙළෙඳ ගිණුමේ හිඟය ඩොලර් බිලියන 3.6ක් ඒකට එකතු වෙනවා නම් අපට අපේ ණය ගෙවන්න පුළුවන් වෙයිද? අපට නැවත ණය අර්බුදයක් ඇති වෙන්නේ නැද්ද? ඒකට ආණ්ඩුව දෙන උත්තරය මොකක්ද? ආණ්ඩුව සූදානම් ද?

විදේශ ආයෝජන ගැන මහ ලොකුවට කථා කළා. System change ගැන කථා කළා. මේ ආණ්ඩුව බලයට ආවාට පසුව 2025දී ගෙනැල්ලා තිබෙන ආයෝජනය මොකක්ද? මම බැලුවා, BoI එකේ website එකේ දාලා තිබෙනවා, 2025 මුළු අවුරුද්දටම අලුතෙන් ගෙනාපු ආයෝජනවල වටිනාකම ඩොලර් මිලියන 113යි. ලජ්ජයි කියන්න. සිල්ලර සල්ලි වගයක් ඇවිත් තිබෙන්නේ. US Dollars 113 million is the greenfield investment that has come into this country in the whole of 2025! That is really absurd. So, what has the Government actually done? මොකක්ද, ඔබතුමන්ලා කරලා තිබෙන්නේ?

Hon. Deputy Speaker, according to the new Central Bank of Sri Lanka Act, No 16 of 2023, Section 6(1) specifies that the primary objective of the Central Bank is to achieve and maintain domestic price stability and Section 6(3) requires the Central Bank to support. The Government draws the economic policy, but output stabilization is not an equal objective of the Central Bank. Basically, the Central Bank has violated the Act by doing open market operations and at the same time, the Government has not been doing its job. That is why the Government is responsible because it has not done its job of output targeting or fiscal stimulation. They have only been harassing the public with taxes, pushing and charging more and more from them other than increasing the aggregate demand in the market.

2025-2026 ගත්තාම මහ බැංකුව ඉලක්ක කළා, සියයට 5ක නම්‍යශීලී උද්ධමන ඉලක්කයක්. Flexible inflation targeting සපුරා ගැනීමට මහ බැංකුව ලොකු උත්සාහයක් දැරුවා. පනතේ 6 (1) වගන්තිය උල්ලංඝනය කර ආර්ථිකය උත්තේජනය කරන්න මහ බැංකුව උත්සාහ කළා. ඒ කියන්නේ, බල්ලාගේ වැඬේ බූරුවා කරනවා වාගේ වැඩක්. ආණ්ඩුව කරන්න ඕනෑ වැඬේ මහ බැංකුව කරන්න බැලුවා. එතකොට මොකක්ද වුණේ? ඩොලරයේ මිල වැඩිවෙලා, රුපියලේ ද්‍රවශීලතාව වැඩිවෙලා රුපියල කඩාගෙන වැටුණා. හැබැයි, ඊට ප්‍රතිවිරුද්ධ දිශාවකට තමයි ආණ්ඩුව වැඩ කරන්නේ. ආණ්ඩුව මොකක්ද කළේ? ඔවුන් වෙළෙඳ පොළේ ඉල්ලුමේ උත්තේජනයක් ඇති කරන්නේ නැතිව, පාරිභෝගික භාණ්ඩවලින් අධික බද්දක් අය කරලා, VAT එකත් ඒක උඩින් ගහලා, ඒ වාගේම උපයෝගිතා ගාස්තු, තෙල් මිල, වතුර, ලයිට් බිල් ඔක්කොම වැඩි කරලා, ගෑස් මිල වැඩි කරලා, ඉවතලිය හැකි ආදායම - disposable income - අඩු කළා. එතකොට කොහොමද aggregate demand එක වැඩි වෙන්නේ? ප්‍රාග්ධන වියදම කප්පාදු කළා. එතකොට වෙළෙඳ පොළේ තිබෙන ඉල්ලුම අඩු වෙන්න පටන් ගත්තා. දැන් මේ අර්බුදය රජය විසින් නිර්මාණය කරපු එකක් කියන එක මේවායින් තමයි අපි සහතික කරන්න බලන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෝඨාභය රාජපක්ෂගේ පාලනය තිබෙනකොටත්, මේ සභාවේදී අපි බැසිල් රාජපක්ෂ මහත්මයාට මේ වාගේම පෙන්වා දුන්නා. විපක්ෂයක් හැටියට අපේ වගකීම අපි එදාත් ඉටු කළා, අදත් ඉටු කරනවා. රනිල් වික්‍රමසිංහ රජය යටතේ 2023දී ශ්‍රී ලංකා මහ බැංකු පනත ලෙස අලුත් පනතක් ඉදිරිපත් කරලා නම්‍යශීලී උද්ධමන ඉලක්කය - flexible inflation targeting - සියයට 5ක ඉලක්කයට ගෙනෙන්න යෝජනා කළා, එහි plus or minus two per cent විචලනයක් සහිතව. හැබැයි, ඒ වෙලාවේ සමගි ජන බලවේගයේ අපි ඒකට දැඩි ලෙස විරුද්ධ වුණා, ඒ ඉලක්කය ගෙනෙන්න එපා, ඒ සියයට 5ක ඉලක්කය වැඩියි කියලා. අපි යෝජනා කළා, සියයට 3ක නම්‍යශීලී උද්ධමන ඉලක්කයක් ගෙනෙන්න, එහි විචලනය plus or minus one per cent දමන්න කියලා. හැබැයි, අපි කියපු එකට ඇහුම්කන් දුන්නේ නැහැ. ඊට පස්සේ JVP එක බලයට ආවා. 2024 ඉඳලා ඔවුන් බලයේ සිටිනවා. IMF එක යෝජනා කරපු සියයට 5ක ඒ නම්‍යශීලී උද්ධමන ඉලක්කය මෙගොල්ලන් එහෙමම තබාගෙන යනවා. කිසිම වෙනසක් නැහැ. IMF එක කියන හැම එකක්ම කරනවා. උඩ පනින්න කිව්වාම ඒකත් කරනවා. ඒ නිසා ඒක වෙනස් කළේ නැහැ. මේක සම්පූර්ණයෙන්ම වැරදියි. බොහෝ සංවර්ධිත රටවල ඒ නම්‍යශීලී උද්ධමන ඉලක්කය සියයට 2-3 ලෙසයි තිබෙන්නේ. එම රටවල ඒ ඉලක්කය තමයි තිබෙන්නේ. ආචාර්ය ඩබ්ලිව්.ඒ. විජේවර්ධන මැතිතුමා, මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපතිවරයෙක්. එතුමා කියනවා, ලංකාවේ ඵලදායී වර්ධන දර්ශකය - Productivity

[ගරු කබීර් හෂීම් මහතා]

Index - සියයට 2යි කියලා. එතකොට Productivity Index එක සියයට 2ක් ලෙස තිබියදී අපේ උද්ධමන ඉලක්කය සියයට 5ක් වනකොට ලොකු පරාසයක් ඇති වෙනවා. මේවා වෙනස් කරන්නේ නැති නිසා පසුගිය අවුරුදු කිහිපයක ඇති වෙච්ච අර්බුද අනිවාර්යයෙන්ම නැවත නිර්මාණය වෙමින් පවතිනවා. මේ ආණ්ඩුවට තමන්ගේ කියලා වැඩ පිළිවෙළකුත් නැහැ; IMF එකට එහා ලෝකයකුත් නැහැ. ඒ නිසා අපේ රට මේ අර්බුදයට දිගටම තල්ලු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උද්ධමනය කියන්නේ දරුණු මෙවලමක්. උද්ධමනය එක්ක සෙල්ලම් කරනවා කියන්නේ ගින්දරත් එක්ක සෙල්ලම් කරනවා හා සමානයි. අද මේ රජය අඛණ්ඩ උද්ධමන ක්‍රියාමාර්ගය හරහා රටේ පුරවැසියන් සතු ධනයෙන් කොටසක් ඉතා රහසිගතව, ඒ වාගේම ඉතාම අපරික්ෂාකාරීව අපහරණය කරන්න කටයුතු කරනවා. කොටින්ම කියනවා නම්, මේ උද්ධමනය කියන අවිය භාවිත කරලා සාමාන්‍ය පොඩි මිනිසුන්ගේ සල්ලි සොරා කෑමට - හොරකම් කිරීමට - ආණ්ඩුව කටයුතු කරනවා. අන්තිමට මේ ක්‍රියාදාමයෙන් සිද්ධ වෙන්නේ මොකක්ද? අන්තිමට සිද්ධ වෙන්නේ, මේ රටේ ජනතාවගෙන් බහුතරයක් හිඟමනට පත් වෙලා, ඉතාම අතළොස්සක් ධනපතීන් බවට පත් වන එකයි. මේක ඉතා භයානක තත්ත්වයක්. ඒ නිසා අපි ආණ්ඩුවෙන් අහනවා, මේ රටේ නැවත මිල ස්ථාවරය ඇති කිරීමට, බඩු මිල අඩු කිරීමට ඔබ ගන්නා පියවර මොකක්ද කියලා. ඒක න්‍යායාත්මකව කරන්න පුළුවන්. ඔබට ඒ හැකියාව තිබෙනවාද, ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ මොකක්ද, ඒ වෙනුවෙන් කරන්නේ මොකක්ද කියලා අපි අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බැටළු බෑයා පිටුපස යන බැටළු පැටවෙකු මෙන් මේ ආණ්ඩුව අන්ධ ලෙස IMF එක පිටුපසින් යනවා; ඒ අය කියන ඔක්කෝම කරනවා. මේ ආණ්ඩුව විකල්ප ආර්ථික දැක්මක් හෝ වැඩ පිළිවෙළක් අද වනකල් ඉදිරිපත් කරලා නැහැ. System change එකක් ගැනත් කථා කළා. ඒක පෙන්වන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව මම මගේ අවසන් තර්කය හැටියට ඉදිරිපත් කරන්නේ මේකයි. අපේ විදේශ ණය තොගයක් තිබෙනවා. මෑතකදී සිදු වූ රුපියලේ අවප්‍රමාණය නිසා අපේ එම විදේශ ණය සංචිතය රුපියලේ අගයත් එක්ක බලන කොට විශාල ලෙස වැඩි වෙනවා. ඒ කියන්නේ, රුපියල්වලින් බලන කොට, ඒ විදේශ ණය ප්‍රමාණය විශාල ලෙස වැඩි වෙනවා. 2024 දෙසැම්බර් මාසයේ සිට 2026 මැයි මාසය දක්වා කාලය ගන්න කොට US Dollar එක රුපියල් 292 සිට රුපියල් 327ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ, එදා JVP ආණ්ඩුව රට බාර ගන්න කොට ඩොලරයක් රුපියල් 292යි. අද ඒක වැඩි වෙලා තිබෙනවා. මම දැනට අරන් තිබෙන්නේ ඩොලරයක් රුපියල් 327කටයි. හැබැයි, අද මට ආරංචි වුණා ඩොලරයේ වටිනාකම රුපියල් 340යි කියලා. නමුත්, ඩොලරය රුපියල් 327යි කියලාම ගනිමුකෝ. මේ ආණ්ඩුව යටතේ මේ අවුරුදු දෙක තුළ රුපියල සියයට 13කින් අවප්‍රමාණ වෙලා තිබෙනවා. එයින් ජනතාවට සිදු වන හානිය, උද්ධමනය සහ බඩු මිල වැඩි වීමට අමතරව ඇති වන හානිය ගැන මම කියන්න ඕනෑ. මම උදාහරණයක් කියන්නම්. රුපියල අවප්‍රමාණ වීම නිසාම 2024දී පැවැති විදේශ ණය තොගය ඩොලර් බිලියන 36යි. විදේශ ණය ඩොලර් බිලියන 36ක් ලෙස තිබෙන විට එදා ඩොලරයේ වටිනාකම රුපියල් 292කටයි තිබුණේ. අද ඩොලරයේ වටිනාකම රුපියල් 327යි. ඒ ඩොලර් බිලියන 36 රුපියල්වලට පරිවර්තනය කළාම අද රුපියලේ අවප්‍රමාණ වීමත් එක්ක අපේ ණය රුපියල් ට්‍රිලියන 1.3කින් නිකම්ම වර්ධනය වෙලා තිබෙනවා. ඒ වැඩි වීම අපේ මුළු රාජ්‍ය ආදායමෙන් සියයට 26යි. මේ වසරේ අපේ මුළු රාජ්‍ය ආදායම ලෙස ඇස්තමේන්තු කරලා තිබෙන්නේ රුපියල් ට්‍රිලියන 4.9යි. මේ වැඩි වීම ඒකෙන් සියයට 26යි; ඒ කියන්නේ, රුපියල් ට්‍රිලියන 1.3යි. කොහෙන්ද මේක හොයන්න යන්නේ? කොහොමද මේක ගෙවන්න යන්නේ? සාමාන්‍යයෙන් විදේශ ණය ඩොලර්වලින් තිබුණාට අපේ රටේ අපි ආදායම උපයන්නේ රුපියල්වලින්. මේ ණය භාරව ඉන්නේ භාණ්ඩාගාරයේ ලේකම්තුමායි. මේ ණය පැවරෙන්නේ එතුමාටයි. එතුමා මේ ඩොලර් ණය ගෙවන්න රුපියල් සොයා ගන්න ඕනෑ. රුපියල් සොයාගෙන ඒවා ඩොලර්වලට හරවා ගෙවන්න ඕනෑ. දැන් මේ ණය සංචිතය වැඩි වනකොට ඒ ඩොලර් ප්‍රමාණයම ගෙවන්න රුපියල් වැඩියෙන් දෙන්න එයාට සිදු වෙනවා. මේ වැඩි වන රුපියල් ප්‍රමාණය කොහෙන්ද හොයා ගන්නේ? එහෙම නම්, ඒ අමතර ආදායම හොයා ගන්න මේ ආණ්ඩුව නැවත මිනිසුන්ගේ බඩට ගහන්නද යන්නේ? මා අහන්නේ ඒකයි. දැනටමත් පෝෂ්‍යදායී ආහාර වේලක් ගන්න බැරි ලක්ෂ 60ක විතර ජනතාවක් මේ රටේ ජීවත් වෙනවා කියලා පත්තරේ තිබියදී, රුපියලේ අවප්‍රමාණය නිසා වැඩි වන විදේශ ණය ගෙවන්න යන්නේ මිනිසුන්ට බදු ගහලාද? VAT එක අය කරලාද? එහෙම නැත්නම්, විකල්ප වැඩ පිළිවෙළක් තිබෙනවාද? ඒ විකල්ප වැඩ පිළිවෙළ පිළිබඳව කරුණාකර මේ සභාවේ අපව දැනුවත් කරන්න කියා මම කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකෙන් බරපතළ ප්‍රශ්නයක් ඇති වෙනවා. අප ඔබතුමන්ලාට කියන්නේ, මේ ණය බර තවත් වැඩි වනකොට ඒක බදුවලින් අය කර ගන්නවාද, නැද්ද කියලා කියන ලෙසයි. මිල ස්ථායිතාව, මූල්‍ය ස්ථායිතාව සහ විනිමය අනුපාතයේ ස්ථායිතාව රජය සහ මහ බැංකුව ඒකාබද්ධව ඇති කරන්න අද අසමත් වෙලා තිබෙන බව මේකෙන් සනාථ වෙනවා.

සති දෙකකට හෝ තුනකට කලින් මේ පාර්ලිමේන්තුවට ගෙනාවා පනත් කෙටුම්පතක්, දේශීය ආදායම් පනත සංශෝධනය කරන්න. ඒක අපරාධ නීතියට ලක් කළා, TIN එකක් නැත්නම් තරුණයන් අල්ලලා හිරේ දමන්න පුළුවන් කියලා. අපට සැකයක් තිබෙනවා, මේ රට බංකොලොත් වෙන්න යනවා කියලා ඔබතුමන්ලා දැනගෙන, ඒ නිසා මිනිසුන්ගෙන් ආයෙත් බදු අය කර ගන්න මිනිස්සු බය කරන්න ඕනෑ කියලා හිතලා, ඒ වාගේ මර්දනකාරී නීති රීති, පනත් ගෙනැල්ලා, මිනිසුන්ගෙන් බලෙන් සල්ලි ගන්න යනවාද කියලා. ඒ සැකය අපට තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kabir Hashim, your time is over.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
I will wind up, Sir.

ඊයේ වනකොට, අපනයනකරුවන් සම්බන්ධයෙන් මොකක්ද කළේ? මේ රටේ දේශීය අපනයනකරුවන් තමයි කීයක් හරි මේ රටට හොයලා දෙන්නේ. ඔවුන්ගේ ආර්ථික නිදහසට බාධා කරලා, ඔවුන් ගෙනෙන මුදල් - ඩොලර් - මාසයක් ඇතුළත හෙවත් දවස් 30කින් රුපියල්වලට පරිවර්තනය කරන්න කියලා කියනවා. ඒ ගොඩක් අය අපනයනය කරන්නේ three months' creditවලට. ඒවා creditවලට දුන්නාම මාසයකින් ගෙනැල්ලා රුපියල්වලට හරවන්න සමහර විට බැහැ. මේ වාගේම තමයි බැසිල් රාජපක්ෂ මහත්මයාත් ක්‍රියා කළේ. අපට පෙනී යන පරිදි මේ ආණ්ඩුව ක්‍රියා කරන්නේත්, කලින් පැවැති ඒ ආණ්ඩුව ක්‍රියා කරපු ආකාරයටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නියෝජ්‍ය මුදල් ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ නැහැ; ආණ්ඩුවේ වග කියන්න පුළුවන් කවුරුවත් මෙහි නැහැ; මුල් පේළියම හිස්. බය වෙලාද දන්නේ නැහැ, මේ අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න. මේ ගරු සභාවේ දැන් ඉන්න කවුරු හරි කෙනෙකුට මා අහපු ප්‍රශ්නවලට උත්තර දෙන්න පුළුවන් නම්, අපි සතුටු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Gayantha Karunathilleka to second the Adjournment Motion moved by the Hon. Kabir Hashim. You have 11 minutes, Hon. Member.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. M.K.M. Aslam to the Chair?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
Sir, I propose that the Hon. M.K.M. Aslam do now take the Chair.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. M.K.M. ASLAM took the Chair.*

[අ.භා. 1.55]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පවතින අයහපත් ආර්ථික කළමනාකරණය නිසා මතු වී තිබෙන ගැටලු ගැන සාකච්ඡා කිරීමට ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා විසින් විපක්ෂය වෙනුවෙන් ගෙනෙන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මම මේ අවස්ථාවේදී ස්ථිර කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ වර්තමාන තත්ත්වය ගැන කථා කරද්දී මට මතක් වෙන්නේ, මීට වසර දෙකකට පමණ පෙර විශාල ජන වරමක් දීලා මේ ආණ්ඩුව පත් කර ගනිද්දී, වර්තමානය වනකොට තිබෙයි කියලා බලාපොරොත්තු වුණේ මොන වාගේ රටක්ද කියන එකයි. ඒක වචන දෙකතුනකින් කිව්වොත්, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්".

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන එක මේ වනකොට තවත් සුරංගනා කථාවක් බවට ඉතිහාසයට එකතු වෙලා ඉවරයි. නමුත් තමුන්නාන්සේලා භාර ගත්තේ, දෙකෝටි දාහත්ලක්ෂයක් ජනතාවගේ ඉරණමයි. ඒ බව අමතක කරන්න එපා. භූ දේශපාලනික වශයෙන් ගත්තත්, රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් ගත්තත්, ලෝක වෙළෙඳාම පැත්තෙන් බැලුවත්, ආර්ථිකය පැත්තෙන් බැලුවත් තමුන්නාන්සේලාට භාර දීලා තිබෙන්නේ ලෝකයේ වැදගත්ම මර්මස්ථානයක් බවත් අමතක කරන්න එපා. ඒ නිසා "මේවාත් රටවල්ද, මේ මොන හුණ්ඩුද?" කියලා හැල්ලුවට ගන්න පුළුවන්කමක් නැති බව මම කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, අර්බුදයක් එනකොට "මම වැස්ස වලාහක දෙයියෝ නොවෙයි, මට තෙල් ළිං ඇත්තේ නැහැ, මම ගල් අඟුරු පතල් හිමිකරුවෙක් නොවෙයි, මම ඩොලර් අච්චු ගහන්නේ නැහැ" කියලා කෙඳිරි ගාන්නවත්, වගකීම්වලින් පැනලා යන්නවත් මේ ආණ්ඩුවට පුළුවන්කමක් නැති බවත් අපි මතක් කර දෙන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම වර්තමානයේ ජනතාව මුහුණ දෙන මේ අර්බුද වටපිටාව තුළ මම නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයේත්, සමස්ත රටේත් සිටින රටට කිසිම බරක් නැති, රටට විදේශ විනිමය ගෙනැත් දෙන රටේ තේ නිෂ්පාදනයෙන් වැඩිම දායකත්වයක් සපයන ලක්ෂ 5ක් පමණ වූ අපේ රටේ කුඩා තේ වතු හිමියන් මේ වෙනකොට මුහුණ දෙන අර්බුදය වාගේම, වසර 150කට වැඩි කීර්තිමත්, දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන සමස්ත තේ කර්මාන්තයම මුහුණ දී සිටින අවිනිශ්චිත තත්ත්වය පිළිබඳව යමක් ප්‍රකාශ කරන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා. ලක්ෂ 5ක් පමණ කුඩා තේ වතු හිමියන් ඉන්නකොට ඒකෙන් යැපෙන සංඛ්‍යාව බැලුවොත් අඩු තරමින් මිලියන 2ක් විතර ඉන්නවා. සමස්ත තේ කර්මාන්තයෙන් යැපෙන පිරිස බැලුවොත් ලක්ෂ 30කට වැඩියි. මේක සුළුපටු සංඛ්‍යාවක් නොවෙයි. තමුන්නාන්සේලා බලයට එද්දී කුඩා තේ වතු හිමියන්ට අමු තේ දළු කිලෝවකට රුපියල් 265ක ඉතාම හොඳ මිලක් ලැබුණා. නමුත් කියන්න කනගාටුයි, මේ රජය බලයට පත් වෙලා මේ වෙනකොට කුඩා තේ වතු හිමියෙකුට අමු තේ දළු කිලෝවකට ලැබෙන්නේ රුපියල් 200ක් වාගේ ඉතාම අඩු මිලක්. මේක කිසිලෙසකින්වත් වතු නඩත්තු කරන්න, ඔවුන්ගේ ජීවනෝපාය ගෙනියන්න ප්‍රමාණවත් මුදලක් නොවෙයි. කනගාටුවට කරුණ තමයි, රුපියල් 265ට තිබ්බ අමු තේ දළු කිලෝව මේ ආණ්ඩුව යටතේ රුපියල් 200ට පහත දැම්මා විතරක් නොවෙයි, එදා තිබුණු තේ පොහොර මිලත් අද දෙගුණයකින් විතර අසීමිතව වැඩි කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඩොලරයට සාපේක්ෂව තේ දළු කිලෝවක මිල ඉහළ ගිහිල්ලාත් නැහැ.

ලෝකයේ පවතින යුද්ධමය තත්ත්වය වාගේම මේ වනකොට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පුරෝකථනය කර තිබෙන, ඉදිරි මාස කිහිපය තුළ ඇති වෙයි කියලා අනතුරු හඟවන මහා නියඟය නිසා අපේ තේ කර්මාන්තයේ පැවැත්මට ලොකු අභියෝගයක් තිබෙන බව අපට පෙනෙන්න තිබෙනවා. එහෙම තත්ත්වයක් ඇති වුණොත් ඒකට මුහුණ දෙන්න රජයේ තිබෙන සූදානම ගැන තවමත් කිසිම ඉඟියක් අපට නම් දකින්න නැහැ. වැවිලි කර්මාන්ත ඇමතිතුමාත් ගරු සභාවට ඇවිල්ලා ඉන්නවා. රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් මේ පිළිබඳව අවධානය යොමු කරලා ඉදිරි වැඩ පිළිවෙළක් හදනවාද කියන එක අපි එතුමාගෙන් දැනගන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, මේ වෙනකොට තේ වගාවෙන් මිනිස්සු ඈත් වෙන්න පටන් ගෙන තිබෙනවා. මිනිස්සු කල්පනා කරනවා තේ වවලා ඇති වැඩේ මොකක්ද, අනාගතයේ කොහොම වෙයිද කියලා. ඔවුන් විකල්ප වගාවක් ගැන හිතන්න පටන් ගෙන තිබෙනවා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ඒ විතරක් නොවෙයි, තේ කර්මාන්තශාලා ගැනත් ඔබතුමාට මතක් කරන්න ඕනෑ. මේ අර්බුදයේ ප්‍රතිඵලයක් හැටියට විදුලි බිල, ඉන්ධන මිල දරාගන්න බැරිව තේ කම්හල් රාශියක් මේ වෙනකොටත් වැහිලා තිබෙනවා. ඇත්තටම, තවමත් අපේ රටට ඩොලර් ලබා දෙන මාර්ගයක් තමයි තේ කර්මාන්තය. පසුගිය කාලයේ තමුන්නාන්සේලා දේශපාලන වේදිකාවේ කිව්වා වාගේ පිටරටවල ඉන්න සහෝදරවරු ඩොලර් එවන පාටක් අපට නම් පේන්නේ නැහැ. ඒ වාගේම උගන්ඩාවෙන් ගේනවා කියපු ඩොලර් ගෙනාපු ආරංචියකුත් අපට නම් ලැබිලා නැහැ. මේ රජය ආවාට පස්සේ පෝලිමේ එනවාය කියපු විදේශ ආයෝජකයෝ ගේනවාය කියපු ඩොලර් ඇවිල්ලාත් නැහැ. කොටින්ම කියනවා නම්, දේශපාලන වේදිකාවල පොරොන්දු වුණු විධියට මානව ප්‍රාග්ධනය වැඩි දියුණු කරලාත් නැහැ. දියුණු කරනවාය කියපු යටිතල පහසුකම් දියුණු කරලාත් නැහැ. රටේ කොහේ ගිහින් බැලුවත් ඇහැට පෙනෙන කිසිම මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතියක් අවුරුදු 2ක් ගියාට පස්සේ දැකගන්නත් නැහැ. බලයට ආපු දවසේ ඉඳලාම දිගටම කරලා තිබෙන්නේ මොකක්ද කියලා බැලුවොත් ඕනෑම කුඩා දරුවෙකුට තේරෙන දෙයක් තමයි රට ණය බරින් හිර කරන එකයි, ජනතාව මත අසීමිතව බදු පිට බදු පටවන එකයි කියන එක. මේ ආණ්ඩුවේ එකම ආර්ථික උපාය මාර්ගය වෙලා තිබෙන්නේ බදු ගහන එකයි, ණය බරින් හිර කරන එකයි කියන එක ඕනෑම කෙනෙකුට තේරෙනවා. තමුන්නාන්සේලා මැතිවරණයේදී පොරොන්දු වුණා අලුත් රටක් හදනවා කියලා. දැන් මිනිස්සු කියන්නේ "අලුත් රටක් නැතුවාට කමක් නැහැ, දෙයියන්ගේ නාමෙන් තිබුණු විධියට රට අතුගාන්න ඉතිරි කරලා පලයල්ලා" කියලායි. අපේ රටේ මෙවැනි තත්ත්වයක් ඇති වෙන්න ප්‍රධාන වශයෙන්ම බලපෑවේ ලෝක ප්‍රවණතා නොවෙයි. කබීර් හෂීම් මන්ත්‍රීතුමා කදිමට පැහැදිලි කර දුන්නා, මේ රජයේ අකාර්යක්ෂම පාලනය නිසා මේ තත්ත්වය ඇති වෙච්ච බව.

ලෝකයේ යුදමය තත්ත්වයක් ඇති වෙන්න ඉස්සෙල්ලා තමයි මේවා ආරම්භ වුණේ. ඒකට හේතුව තමයි රජයේ අකාර්යක්ෂම පාලනය. ඒ වාගේම අත්දැකීම් නැතිකම; නොදන්නා දේ දන්නා කෙනෙකුගෙන් අහලා ඉගෙන ගන්න අකමැති උද්ධච්චකම. ඒ නිසා අපි රජයට මතක් කර දෙන්න කැමැතියි, මේ වාගේ අර්බුද අවස්ථාවක රටක් පාලනය කරන්න නම් පන්ති පහේ දැනුමෙන් බැරි බව. ඒ පන්ති පහේ දැනුම හොඳයි කැළේ දේශපාලනය කරන්න නම්; කළුවරේ දේශපාලනය කරන්න නම් ඒක හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වෙනකොට මේ රටේ ඇති වෙලා තියෙන මේ තත්ත්වය ගැන අපි කවුරුත් අවධානය යොමු කළ යුතුවම තිබෙනවා. අද බලන්න, කවුරුවත් සතුටින්ද ඉන්නේ කියලා. වී ගොවීන්ගේ ප්‍රශ්න බලන්න. ඔවුන්ගේ නිෂ්පාදනවලට හරි මිලක් ලැබෙනවාද, ස්ථාවර මිල ලැබෙනවාද, පොහොර ටික වෙලාවට ලැබෙනවාද? ඒ වාගේම ධීවරයෝ දිහා බලන්න. මෙතුමාගේ කථාවේදී ඒ කරුණු කියයි. ඔවුන් ප්‍රශ්න ගණනාවකට මුහුණ දීලා ඉන්නවා. කම්කරුවා ගත්තත්, රාජ්‍ය සේවකයා ගත්තත්, පුද්ගලික අංශයේ සේවකයා ගත්තත් එහෙමයි. ඒ විතරක් නොවෙයි, විශ්‍රාමිකයන් දිහා බලන්න. අද විශ්‍රාමිකයන්ට ලැබෙන සොච්චමෙන් මේ ජීවන බරත් එක්ක ජීවත් වෙන්න අමාරුයි. ඔවුන් බෙහෙත් ටික ගත්තොත් කෑම ගන්න බැහැ. කෑම ගත්තොත් බෙහෙත් ගන්න බැහැ. මේ දෙකම නොගත්තොත් ජීවත් වෙන්න බැහැ. වන්දනා ගමනක් යන්න, පිනක් දහමක් කර ගන්න, ඥාතීන්ට, දරුවන්ට යුතුකම් ඉටු කරන්න බැරිව ඔවුන්ට බරපතළ ගැටලු ඇති වෙලා තිබෙනවා. මෙහෙම ගියොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

තමුන්නාන්සේලා බලය ගන්නකොට නම්, ජීවන වියදම අඩු කරන කතන්දර තමයි කිව්වේ. ආකර්ෂණීය විධියට කිව්වා, බදු සහ වැට් එක අඩු කරන විධිය. තෙල් මිල අඩු කරන හැටි කිව්වා. වරායට ගොඩබාන මිල ගණන් එක්ක කියලා කොමිස් ගහන ඒවා අඩු කරලා තෙල් මිල අඩු කරන කතන්දර ජනතාවට කිව්වා. ලයිට් බිල අඩු කරන හැටි මවලා පෙන්නුවා. නමුත් නටපු තොවිලෙකුත් නැතුව බෙරේ පලුවකුත් නැතුව ලස්සන කතන්දර විතරක් අහපු අවුරුදු කිහිපයක් බවට පත් වෙලා තමයි අන්තිමට තමුන්නාන්සේලාට මේ ආණ්ඩුව ආපහු භාර දෙන්න වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට නියමිත කාලය අවසන් කියන නිසා මගේ කථාව අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. දුප්පත් ගණයට වැටෙන පිරිස දවසින් දවස වැඩි වෙනවා. කබීර් හෂීම් මැතිතුමා මේ යෝජනාව ඉදිරිපත් කරනකොට ඒ ගැන සඳහන් කළා. තමුන්නාන්සේලා එනකොට රුපියල් 292ට තිබුණු ඩොලර් එක රුපියල් 300 ගාණකට නැගපු හැටි එතුමා කිව්වා. ඉතින් මේ අර්බුදය සුළුපටු එකක් නොවෙයි. ජනතාවගේ ප්‍රශ්න ගැන මීට වඩා ආණ්ඩුවේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමින්, රටේ වර්තමාන තත්ත්වය පිළිබඳ කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන මේ වේලාවේ මා එය නැවතත් ස්ථිර කරනවා. විශේෂයෙන්ම මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන්ගේ ප්‍රශ්න ඇතුළු අනිකුත් ජන කොටස්වල ප්‍රශ්න පිළිබඳව වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න ඉඩ ලබා දීම ගැන ඔබතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.06]

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව තුළ තිබුණු මූලික අන්තර්ගතය දිහා බැලුවාම, එහි තිබුණා කරුණු කිහිපයක්. අයහපත් ආර්ථික කළමනාකරණය, නිවැරදි දත්ත මත පදනම් වූ පුරෝකථනවල අඩුපාඩු, ප්‍රමුඛතා මත ක්‍රියා නොකිරීම හේතුකොටගෙන ඇති වී තිබෙන ආර්ථික, සමාජයීය හා උපාය මාර්ගික පිරිහීම කියන කාරණාවලට මූලික අවධානය යොමු කරලා, ඒ කාරණාත් එක්ක ගොනු කරපු තවත් කරුණු ඉදිරිපත් කරන්න තමයි එතුමා උත්සාහ කළේ.

අපි බලයට පත් වෙලා 2024 නොවැම්බර් ඉඳලා මේ දක්වා රට පාලනය කරගෙන ආපු කාලය සහ ඒ කාලයට අදාළව අපි රටට ඉදිරිපත් කරලා තියෙන ශේෂ පත්‍රය දිහා බැලුවාම, ආර්ථික, සමාජයීය සහ උපාය මාර්ගික පිරිහීම කියන කාරණාව ගත්තොත්, අපට පැහැදිලිවම පෙනෙන කාරණාව තමයි, විපක්ෂය ඉතා වුවමනාවෙන් අතිශයින්ම සංවේදී සහ සලකා බැලිය යුතු කරුණු මඟ හරිමින් සමස්ත සමාජය සහ රටේ ජනතාව නොමඟ යවනසුලු ආකාරයේ යෝජනාවක් ඉදිරිපත් කරන්න උත්සාහ කරන බව. ඇයි මම එහෙම කියන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

එතුමාගේ කථාවේදී කියන්න උත්සාහ කළා, රටක සමාජ, ආර්ථික, දේශපාලන සංවර්ධනය හෝ එහි පරිහානිය පිළිබඳව රටකට වැදගත් වෙන්නේ අභ්‍යන්තර සාධක පමණයි, ඒකට බාහිර සාධකවල බලපෑමක් නැහැ කියලා. ඒක කියන්න උත්සාහ කළා; එතුමාගේ කථාවේදී පැහැදිලිව ඒක කිව්වා. නමුත්, අපි දන්නවා රටක සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහාත්, දේශපාලන සංවර්ධනය සඳහාත් අභ්‍යන්තර සාධක මෙන්ම අද තිබෙන මේ geopolitical environment එකත් එක්ක බාහිර සාධකවලත් ඉතා වැදගත්කමක් තිබෙන බව. අපේ වාගේ රටවල බාහිර සාධක මතම තීරණය වෙන ආර්ථිකයක් හදලා තිබෙනවා. ඒක නිසා බාහිර සාධකවල ප්‍රබල බලපෑමක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, “What has this NPP Government actually done?" කියලා එතුමා ප්‍රශ්නයක් ඇහුවා. කිසිවක් කරලා නැහැ කිව්වා; ආර්ථිකමය වශයෙන්, ප්‍රතිපත්තිමය වශයෙන් අත්පත් කර ගත් කිසිදු ජයග්‍රහණයක් නැහැ කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, I would like to draw your attention to the Central Bank Report presented in 2025. What have we done as a Government? What have we achieved as a Government? The IMF projection was basically a 3.5 per cent economic growth, but as a Government working with very significant and important policies, we had been able to achieve a 5 per cent economic progress in that year.

Not only that, there were many other instances we can show you, where we had achieved a lot in 2025. 2025දී රටක් විධියට ආර්ථිකය ඇතුළේ ලබා ගත් ඉහළම ප්‍රේෂණ - highest remittances - ප්‍රමාණය ලබා ගන්න අපට පුළුවන් වුණා. We have been able to mark it as a landmark year in remittances. ඒ විතරක් නොවෙයි. අපේ highest export earnings තිබුණා. අපේ ආර්ථික වර්ධනය - වෘද්ධිය - ගත්තොත්, අපි අපේක්ෂා කළ මට්ටමට වඩා ඉහළ අගයක් පෙන්වන්න පුළුවන්කම ලැබුණා. ඒත් එක්කම අපේ ආර්ථිකය ඇතුළේ ඉතා හොඳ සංවර්ධනයක් අපි අත් කරගෙන තිබුණා. ඒ ආර්ථික සංවර්ධනය අත් කර ගනිමින් ජනතාවට ලබා දිය යුතු ප්‍රතිලාභ සහ ජනතාවට ලබා දිය යුතු යම් යම් සහන ලබා දෙමින් යනකොට, 2025දී මෑත ඉතිහාසයේ අපි රටක් විධියට මුහුණ දුන් බරපතළම ස්වාභාවික කම්පනයට, එහෙම නැත්නම් අභ්‍යන්තර අර්බුදයට මුහුණ දුන්නා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක මෑත ඉතිහාසයේ අපි රටක් විධියට මුහුණ දුන් බරපතළම අර්බුදය. ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක පමණ හානියක්, සාමාන්‍යයෙන් අපේ රටේ GDP එකෙන් සියයට 4ක වාගේ ප්‍රතිශතයක හානියක් සහිත බරපතළ කම්පනයකට අපි මුහුණ දුන්නා. හැබැයි, ඊට අපි සාර්ථකව මුහුණ දුන්නා. විදේශ ණය, එහෙම නැත්නම් ණය ලබා ගැනීමකින් තොරව රුපියල් බිලියන 500ක් ඒකට වෙන් කරලා, "ටකරමක් ගියත් ලක්ෂ 10ක් දෙනවා" කියපු ප්‍රකාශය මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කරමින්, ඒ මිනිස්සුන්ගේ ජීවිත නැවත නඟා සිටුවීමට අපි කටයුතු කරමින් සිටියා. එසේ කටයුතු කරමින් 2025දී අපි ලබා ගත් ආර්ථික ජයග්‍රහණ තිබුණා. ඒ ලබා ගත් ආර්ථික ජයග්‍රහණ මත පදනම්ව 2026 අවුරුද්ද අපි සැලසුම් කළා. එසේ සැලසුම් කරගෙන, 2026දී සමස්ත සමාජයේ තිබෙන අධ්‍යාපන, සෞඛ්‍ය ඇතුළු අනිකුත් ක්ෂේත්‍රවල යටිතල පහසුකම් දියුණු කරගෙන, අපේ රටේ සංවර්ධනය සම්බන්ධව ඉදිරිගාමී පියවරක් තියන්න යනකොට, අපට දෙවැනි බරපතළ බාහිර කම්පනයට මුහුණ දෙන්න සිද්ධ වුණා. "බාහිර කම්පන සලකන්න ඕනෑ නැහැ, ගණනය කරන්න ඕනෑ නැහැ, ඒවා එච්චර අදාළ නැහැ" කියලා ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා කියන්න උත්සාහ කළා. ඒවා මත නොවෙයි අපේ රටේ ආර්ථික හා දේශපාලන සංවර්ධනය තීරණය වෙන්නේ කියලා කියන්න එතුමා උත්සාහ කළා. ඒ සම්බන්ධව UNDP එක Report එකක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ UNDP Report එකේ සඳහන් වෙනවා, සමස්ත ලෝකයේ දළ ජාතික නිෂ්පාදනය - world GDP - සියයට 2.5කින් මේ අවුරුද්දේ අඩු වෙන්න ඉඩ තිබෙනවා කියලා. ඒක තමයි තිබෙන prediction එක. ලෝකයේ දළ ජාතික නිෂ්පාදනය සියයට 2.5කින් පහළට යනකොට, ලෝකයේ තිබෙන කුඩා ආර්ථිකයක් සහිත රටක් වන අපිටත් ඒකෙන් පැහැදිලිව බලපෑමක් එල්ල කරනවා.

මේ අර්බුදයේ ස්වභාවය ගත්තොත්, GIS වාර්තාවක මේ කාරණාව මෙසේ සඳහන් කරනවා: "The most immediate, long-term economic danger lies not in fuel prices themselves, but in rising food costs and disruptions to the production of advanced technology". මේ වාර්තාවේ කියනවා, ඉන්ධන මිල ඉහළ යන එක විතරක් නොවෙයි, ඒකත් එක්ක ආහාරවල මිලත් ඉහළ යන්න පුළුවන් කියලා. ඒ විතරක් නොවෙයි. නිෂ්පාදන කර්මාන්තවලට බලපෑම් ඇති වෙන්න පුළුවන්. මේ Middle East crisis එකත් එක්ක ඒවා බිඳ වැටීමකට ලක් වෙන්න පුළුවන් කියන කාරණාව මේකේ තිබෙනවා. ඒ නිසා අපට ඒක බලපානවා. ඒ මත අපේ රටේ ආර්ථිකයේ යම් යම් තීන්දු තීරණ ගන්න සිද්ධ වෙනවා. ඒක සෘජුවම අපේ රටේ ආර්ථිකයට බලපාන සාධකයක් වෙලා තිබෙනවා. මේ වාර්තාවේ තවදුරටත් සඳහන් කරනවා, දැන් පොහොර මිල ඉහළ ගිහිල්ලා, උද්ධමනය වැඩි වෙලා තිබෙනවා කියලා. ඒක තමයි කියන්නේ, ගෝලීය වශයෙන් සිද්ධ වෙන යම් යම් තත්ත්වයන් තුළ අපේ රටේ ආර්ථිකයට බරපතළ බලපෑම් ඇති වෙන්න පුළුවන්කම තිබෙනවා කියලා.

එහි තවදුරටත් මෙහෙම කියනවා: "Fertilizer markets, which depend heavily on ammonia, urea and natural gas from the Gulf, are facing major long-term risks due to disruptions in the Strait of Hormuz. The blockades caused prices to soar by 30 to 40 per cent in March, while nitrogen costs have doubled compared with 2024 levels. As of May, 2026, prices remain elevated, with the global fertilizer index projected to rise over 30 per cent for the year amid persistent supply risks and rerouting challenges." මේ කියන්නේ වෙන මොකක්වත් නොවෙයි. මේ ඇති වෙලා තිබෙන ගෝලීය තත්ත්වයත් එක්ක පොහොරවල මිල ගණන් බරපතළ විධියට ඉහළ යන්න පුළුවන්; ඒක සියයට 30කින්, 40කින් ඉහළ යන්න පුළුවන්, ඉන්ධන මිල ඉහළ යාමත් එක්ක බරපතළ ආර්ථික ප්‍රතිවිපාක ඇති වෙන්න පුළුවන් කියන එකයි. ඒ නිසා ඒ තත්ත්වයන් අපට බලපානවා. අපේ ආර්ථික ජයග්‍රහණ මත පදනම් වෙලා ජනතාවට සහන ලබා දෙන්න යන ගමනේදී මේ සාධක සැලකිල්ලට ගන්න සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම UNDP Report එකේ මෙසේද සඳහන් වෙනවා:

> "Military escalation in Middle East could push more than 30 million people into poverty worldwide, .... "

ඒ කියන්නේ, ලෝකයේ දැන් සිටින ප්‍රමාණයට වඩා අතිරේක වශයෙන් ලක්ෂ 300කට වඩා මිනිස්සු ප්‍රමාණයක් දිළිඳු බවට පත් වෙන්න පුළුවන් කියලා. අපට ඒක නොසලකා යන්න පුළුවන්කමක් නැහැ. ගෝලීය වශයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වය, ඒක අපට බලපාන විධිය, ඒ සම්බන්ධ සියලු සාධක සලකමින් අපි ආණ්ඩුවක් විධියට ජනතාවට සහන ලබා දෙන්න ඕනෑ කොහොමද ඒ සම්බන්ධව කෘෂි කර්මාන්තය හසුරුවන්න ඕනෑ, කොහොමද ඒ සම්බන්ධව බලශක්තිය හසුරුවන්න ඕනෑ, වැවිලි කර්මාන්තය ඇතුළු ආහාර සුරක්ෂිතතාව සම්බන්ධව අපි ගන්න ඕනෑ තීන්දු තීරණ මොනවාද කියන කාරණා සම්බන්ධව අපේ අමාත්‍යවරුන් විසින් කරුණු පැහැදිලි කරාවි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ගරු රුවන් විජේවීර මහතා]

මම අවසාන වශයෙන් මෙන්න මේ කාරණාව කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජන වරමක් සහිත ආණ්ඩුවක් විධියට ආර්ථික ස්ථාවරභාවය ඇති කළ යුතුයි, නීතියේ විධානය සහ නීතියේ අධිපත්‍යය සහිත නව දේශපාලන සංස්කෘතියක් හදන්න ඕනෑ කියන කාරණා පිළිබඳව අදහසක්, ඒ පිළිබඳව දැවැන්ත වැඩ පිළිවෙළක් සහ එය මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කිරීමේ වගකීමක් අපට තිබුණා.

පසුගිය දවසක සරණ ගුණවර්ධන කියන කෙනාගේ නඩු තීන්දුව ලබා දුන් විනිශ්චයකාරතුමා ඒ නඩු තීන්දුව ලබා දෙන ගමන් මෙන්න මෙහෙම කාරණාවක් සඳහන් කළ බව කියනවා: "The High Court Judge underscored the far-reaching consequences of corruption in State institutions, observing that such misconduct not only damages the country's economy, but has also contributed to its economic downfall."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ආර්ථිකය කඩා වැටීමට තුඩු දෙන අපරාධ රාජ්‍යයක් හදලා තිබුණා. ඒ අපරාධ රාජ්‍යය ඇතුළේ දැවැන්ත විධියට කළ විනාශයන් ප්‍රමාණයක් තිබුණා. ඒ විනාශයන් ප්‍රමාණය මේ රට කඩා වැටීමටත් බලපා තිබෙනවා. ජනතාවාදී ආණ්ඩුවක් විධියට අපි මේ රට ඒ විනාශයෙන් ගොඩ ගනිමින් නැවත නඟා සිටුවන්න, ජනතාවට අවශ්‍ය සහන දෙන්න, ජනතාව ඉන් බේරා ගන්නට සහ මුදා ගන්නට කටයුතු කරමින් සිටිනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.16]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවස තුළ ගොඩක් වෙලාවට ආර්ථික වර්ධන වේගය ගැන, එහෙම නැත්නම් රටේ ආර්ථිකය ගැන කථා කරද්දී මෙතුමන්ලා 2022 තමයි compare කරන්න උත්සාහ කරන බවක් පෙනෙන්නේ. සමහරවිට ඉස්සරහටත් එහෙම වෙයි. මෙතුමන්ලා කියයි තෙල් පෝලිම් තිබියදී තමයි අපි රට බාර ගත්තේ, විදුලි කප්පාදුවක් තිබියදී තමයි අපි රට බාර ගත්තේ, එහෙම නැත්නම් ලංකාවේ reserves නැතිව තමයි අපි රට බාර ගත්තේ කියලා. මේ, ඇමතිවරු කියපු ඒවා. "ඩොලර් මිලියන 2ක reserves තිබියදී තමයි අපි රට බාර ගත්තේ" වැනි කථා රාශියක් අද දවසේම ඇහෙන්න තිබෙනවා. ඒ වාගේම පොඩ්ඩකට කලිනුත් කියනවා ඇහුණා, growth rate එක සියයට 5ක් ලබා ගත්ත එක ගැන. ආර්ථික වර්ධන වේගය සියයට 5ක් ලබා ගත්ත එක ජයග්‍රහණයක් විධියට දකිනවා. ආර්ථික වර්ධන වේගය සියයට 5ක් හොඳයි. හැබැයි ඔබතුමන්ලා රට භාර ගන්නකොට අන්තිම කාර්තුවට ගිහිල්ලා බැලුවොත් ආර්ථික වර්ධන වේගය සියයට 5.3යි. ඊටත් වඩා ඉස්සරහා තිබුණේ. ආර්ථික වර්ධන වේගය සියයට 5.3ක් තිබුණු එක සියයට 5ට ආපු එකත් ජයග්‍රහණයක් විධියට තමයි පෙන්නුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බලාගෙන සිටියදී ඩොලර් එක කඩාගෙන වැටෙනවා. මෙතුමන්ලා කියන විධියට, ඊට පස්සේ ලබපු ජයග්‍රහණය මොකක්ද? විදේශ ප්‍රේෂණ වැඩි වුණාලු. විදේශ ප්‍රේෂණ වැඩි වුණේ කොහොමද? 2022දී, 2023දී හා 2024දී විවිධ රටවල් එක්ක, විශේෂයෙන් ඊශ්‍රායලය වාගේ රටවල් එක්ක සාකච්ඡා කරලා අලුත් රැකියා අවස්ථා හඳුන්වා දීලා ඒ රටවලට ගිහිල්ලා අපේ තරුණ තරුණියන්ට වැඩ කිරීමේ අවස්ථාව ලබා ගත්තා. ඒ අය එවන ප්‍රේෂණ, අද මේ අය ලබා ගත් ජයග්‍රහණ ලෙසට කියනවා.

ඊළඟට කියනවා, අපනයන ආදායම ගැන. අපනයන ආදායම වැඩි කර ගන්න ඔබතුමන්ලා මොනවාද කළේ? අලුතින් දාපු එක ෆැක්ටරියක් කියන්න. ඔබතුමන්ලා පටන් ගත්ත එක ව්‍යාපෘතියක්, ඔබතුමන්ලාගේ කාලයේ ආපු එක ආයෝජනයක් කියන්න. මම මීට මාස හයකට කලින් ඒ ගැන අග්‍රාමාත්‍යතුමියගෙන් ඇහුවා. එතුමියට කියාගන්න බැරි වුණා, ආපු එක ආයෝජනයක් ගැන. මම එතුමියගෙන් ඇහුවා, ඔබතුමියලාගේ කාලයේ ලංකාවට ආපු ලොකුම ආයෝජනය මොකක්ද කියලා. එතුමිය කියනවා, බලලා කියන්නම් කියලා. ඒ කියන්නේ, අඩුම ගණනේ අග්‍රාමාත්‍යතුමියවත් දන්නේ නැහැ, ආයෝජන ඇවිල්ලා නැහැ කියලා. ඍජු ආයෝජනත් ඇවිල්ලා තිබෙන්නේ, ඩොලර් මිලියන 129යි. ඒ, මේ ආණ්ඩුව විසින් ගෙනාපුවා. මේ සම්බන්ධව මේ ආණ්ඩුවට කිසිම වැඩ පිළිවෙළක් නැහැ. බලාගෙන සිටියදී රුපියලේ අගය කඩාගෙන වැටෙනවා. බලාගෙන සිටියදී උද්ධමනය වැඩි වනවා. මේ රට භාර දෙනකොට උද්ධමනය තිබුණේ ඍණ අගයක.

අද බලාගෙන සිටියදී ආහාරවල මිල ගණන් වැඩි වනවා, භාණ්ඩවල මිල ගණන් වැඩි වනවා. අද කියනවා, ලෝක ආර්ථික වර්ධන වේගය සියයට 2කින් කඩාගෙන වැටෙන බවට උපකල්පනය කර තිබෙනවා කියලා. ඇයි, අමතකද කොවිඩ් කාලයේදී IMF එක කිව්වා, ලෝකයේ ආර්ථික වර්ධන වේගය සියයට 5කින් කඩා වැටෙනවා කියලා. ඒ වෙලාවේ ඔයගොල්ලන් පාරට බැස්සා. හැබැයි, අපි එහෙම කරන්නේ නැහැ. මොකද, රටේ ආර්ථිකය කියන්නේ එක්කෙනෙකුට දෙදෙනෙකුට අයත් දෙයක් නොවෙයි. මේක රටක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ මට තව විශේෂ කාරණයක් කියන්න තිබෙනවා. ඒ, තව හැකර් ප්‍රහාරයක් ගැන. ඒ ගැන අපට තොරතුරු දැනගන්න ලැබී තිබෙනවා. අද ලංකාවේ තරුණ තරුණියන් ඊශ්‍රායලයේ රැකියා කරනවා. තමන්ගේ ජීවිත අවදානම ගැනවත් හිතන්නේ නැතුව ඔවුන් විශාල පිරිසක් ගිහිල්ලා ඊශ්‍රායලයේ වැඩ කරනවා. සාමාන්‍යයෙන් මාසයකට එක පුද්ගලයෙක් වැඩිම ප්‍රේෂණ ප්‍රමාණයක් එවන රට තමයි ඊශ්‍රායලය. ආසන්න වශයෙන් ගත්තොත්, එක පුද්ගලයෙක් මාසයකට ඩොලර් 3,000ක් එවනවා. පසුගිය අප්‍රේල් මාසයේ ඉඳන් ඒ එවන ඩොලර් ටික එක ආයතනයක හිර වෙලා තිබෙනවා. ඒ මුදල්වලට තව හැකර් කෙනෙක් ගහලා තිබෙනවා. ඒ ආයතනය තමයි, Global Remit. මොකක්ද ඒ Global Remit කියන ආයතනය? Global Remit කියන ආයතනය හරහා මුදල් එවන්න කියන්නේ, ලංකාවේ ප්‍රධාන රාජ්‍ය බැංකුවක්. මම ඒ බැංකුවේ නම කියන්නේ නැහැ. මේකට මැදිහත් නොවුණොත් බැංකුවේ නම සාක්ෂි එක්කම ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වනවා. ලංකාවේ ප්‍රධානම රාජ්‍ය බැංකුවක් ඊශ්‍රායලයේ ඉන්න තරුණ තරුණියන්ට කියනවා, Global Remit කියන ආයතනය හරහා සල්ලි එවන්න කියලා. ඒ වාගේම තව පෞද්ගලික බැංකුවකුත් කියනවා, Global Remit කියන ආයතනය බැංකුවේ agent කියලා; visiting cards පවා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් තිබෙන ප්‍රශ්නය මෙයයි. ඒ තරුණ තරුණියන් ඩොලර් 3,000 ගණනේ අප්‍රේල් මාසයේදීයි, මැයි මාසයේදීයි එවපු සල්ලි ටිකට වෙච්ච දෙයක් නැහැ. ඒක block වෙලා ලු. ඒ ගැන ගිහින් පැමිණිලි කළාම BoC එකට, -

සමාවෙන්න, නමත් පිට වුණා වාගේ. රජයේ බැංකුවට ගිහිල්ලා කිව්වායින් පස්සේ ඒ බැංකුවෙන් කියනවා, ලංකාවේ Embassy එකට යන්න කියලා. ලංකාවේ Embassy එකට ගියාට පස්සේ කියනවා, බැංකුවට යන්න කියලා. ඊට පස්සේ කියනවා, ඔවුන්ගේ කිසිම සම්බන්ධයක් නැහැ කියලා. හැබැයි, මෙන්න බැංකුවෙන් ඒක market කළ විදිය. මා ළඟ තිබෙන මේ පත්‍රිකාවේ තිබෙනවා, ඊශ්‍රායලයට ගිය තරුණ තරුණියන්ට රුපියල් ලක්ෂ 25ක loan එකක් ගන්න ඕනෑ නම් එම අයදුම්කරුවන් Global Remit එක හරහා ගිණුමට මාස 3ක වැටුප් යවා ගනුදෙනු කර තිබිය යුතුයි කියලා. මේ, බැංකුවෙන් ගහපු leafletවල තිබෙන්නේ. මේ වට්ස්ඇප් පණිවුඩ හරහා ඊශ්‍රායලයේ වැඩ කරන තරුණ තරුණියන්ට බැංකුවේ නිලධාරින් යවපු පත්‍රිකා. මේ සියලු සාක්ෂි ඇතුළත් එම පත්‍රිකා මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

මේ පත්‍රිකාවල කියනවා, රුපියල් ලක්ෂ 25ක loan එකක් ඕනෑ නම් Global Remit එක හරහා අයදුම්කරුවන්ගේ ගිණුමට මාස 3ක වැටුප යවා ගනුදෙනු සිදු කර තිබිය යුතුයි කියලා. දැන් මාස දෙකක් තිස්සේ සල්ලි අතුරුදහන්. ඒ ගැන ගිහිල්ලා ඇහුවාම කියනවා, "අනේ, ඔයගොල්ලන් Embassy එකට යන්න" කියලා. Embassy එකට ගියාම Embassy එකෙන් කියනවා, බැංකුවට යන්න කියලා. බැංකුවෙන් Embassy එකට යවනවා; Embassy එකෙන් බැංකුවට යවනවා. හැබැයි, මේ වනකල් ඒ මුදල්වලට වෙච්ච දෙයක් නැහැ. ආණ්ඩුවේ හැකර් ගැහුවා ද, මාලිමාවේ හැකර් ගැහුවා ද, බැංකුවේ හැකර් ගැහුවා ද දන්නේ නැහැ. හැබැයි, මේ වනකල් වෙච්ච දෙයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊශ්‍රායලයේ තවත් ප්‍රශ්නයක් තිබෙනවා. සාමාන්‍යයෙන් ඕනෑම රටකට ගියාට පසුව තමන්ගේ පාස්පෝට් එක renew කර ගන්න ඕනෑ වුණාම අදාළ embassy එකට ගිහිල්ලා ඒ forms ටික භාර දුන්නාම embassy එකෙන් ඒ ටික ලංකාවට එවලා අලුත් passport එක හදලා එව්වාම එය ලබා දෙනවා. මොකද, වෙනත් රටවලට ගිහිල්ලා සරණාගතයින් ලෙස ඉඳලා asylum visa ගත්ත අයත් ඉන්නවා. හැබැයි, ඊශ්‍රායලය මොකද කරලා තිබෙන්නේ? ඒ රටේ තිබෙන ලංකාවේ Embassy එක මේ සම්බන්ධව තීරණයක් අරගෙන තිබෙනවා. මේ පාස්පෝට් ගිහින් දුන්නාම ඔවුන් කියනවා, ලංකාවට ගිහිල්ලා renew කරන්න කියලා. මේ භාර දුන් පාස්පෝට් එකක්වත් renew කරලා නැහැ. මේ වෙද්දි ඒ තරුණ තරුණියන්ගේ පාස්පෝර්ට් ටික හිර වෙලා තිබෙනවා. මේකද, මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ? මේ අය ජීවිත අවදානමක් තිබියදී ඒ රටට ගිහිල්ලා වැඩ කරද්දි සල්ලි ටිකත් හැකර් ගහනවා. ඊට පස්සේ පාස්පෝට් එක renew කරන්න ගියාම ඒකට අවශ්‍ය කටයුතු කරන්නේ නැත්නම් මොකටද ලංකාවේ Embassy එකක් එහේ තිබෙන්නේ? අපි දැක්කා, කලිනුත් ඒ Embassy එකට චෝදනා එනවා. එවැනි දේවල් එක්ක මේ ශ්‍රමිකයින්ට තිබෙන පහසුකම් සම්පූර්ණයෙන්ම නැති වෙලා තිබෙනවා.

දැන් එන්න එන්න තත්ත්වය බරපතළයි. එක පැත්තකින් එල් නීනෝ තත්ත්වයක් එනවා කියනවා. එල් නීනෝ තත්ත්වයක් ආවොත් ඒක කෘෂිකර්මයටත් බලපානවා, විදුලිය උත්පාදනයටත් බලපානවා. එක පැත්තකින් ආහාර උත්පාදනය අඩාළ වනවා, අනෙක් පැත්තෙන් විදුලිය උත්පාදනය අඩාළ වනවා. හැබැයි, විදුලි උත්පාදනයට ගෙනාපු ගල් අඟුරුත් බාලයි. මේ නිසා ජල විදුලි නිෂ්පාදනය අඩු වනකොට ඒකට මුහුණ දෙන්න ආණ්ඩුවට තිබෙන වැඩ පිළිවෙළ පිළිබඳවත් අපි දැනගන්න කැමැතියි.

ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්න නිසා අපට දැන් ලැබුණු තොරතුරු වගයක් මම කියන්නම්. පස්වැනි නැවේත් calorific value එක අඩුයි කියලා අපට දැනගන්න ලැබුණා. ඒ නිසා මම ඇමතිතුමාගෙන් මේ කාරණය දැනගන්න කැමැතියි. මේ පස්වැනි නැවේ Load Port Report එකෙත් කියනවා calorific value එක අඩුයි කියලා. සාමාන්‍ය ක්‍රමය අනුව නම් මේක reject කරලා අලුත් නැවක් ඉල්ලන්න ඕනෑ. ඒ වාගේම ඒ නැවෙන් වෙච්ච පාඩුවත්, ඒ කියන්නේ දවස් ගණනක් ප්‍රමාද වුණොත් ඒ පාඩුවත් රජයට දෙන්න ඕනෑ. ඒ සම්බන්ධව ඔබතුමා ගන්න යන ක්‍රියාමාර්ගය මොකක්ද? අළු ප්‍රතිශතය වැඩි වෙච්ච ගල් අඟුරු නැවත් ගත්තා වාගේ calorific value එක අඩු එකත් ගන්නවාද කියලා මම අනුර කරුණාතිලක ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මනෝජ් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.25]

**ගරු මනෝජ් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மனோஜ் ராஜபக்ஷ)
(The Hon. Manoj Rajapaksha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කර තිබෙන යෝජනාවට අදාළ විවාදය තමයි දැන් පැවැත්වෙන්නේ. මේ රට ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් හා උපාය මාර්ගිකව බරපතළ පිරිහීමකට ලක් වෙලා තිබෙන බව කබීර් හෂීම් මන්ත්‍රීවරයා මේ යෝජනාවෙන් ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම මේ සභාව තුළත් ඒ ගැන කරුණු මතු වුණා. මේ යෝජනාවට අදාළව පිළිතුරු ලබා දෙනකොට ආණ්ඩු පක්ෂය පැත්තෙන් පැහැදිලි කළා, සමාජ, ආර්ථික වශයෙන් සහ උපාය මාර්ගයක් නැතිව මේ ආණ්ඩුව වැඩ කරනවාද කියන එක සම්බන්ධයෙන්.

අපි බලයට එනකොට මේ රටේ ආර්ථික, සමාජයීය, දේශපාලන තත්ත්වය වාගේම සංස්කෘතිය, සදාචාරය කියන හැම පැත්තකින්ම නස්පැත්තියක් වෙලා තිබුණේ. එවැනි තත්ත්වයක, එවැනි යථාර්ථයක සිටිමින් තමයි අපට රට ඉදිරියට අරගෙන යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එහෙම නැත්නම්, හැම අතින්ම කඩා වැටුණු රටක් ගොඩ නඟන්න තමයි අපට සිද්ධ වෙලා තිබෙන්නේ. අපි බලය ගන්නකොට, මාරුවෙන් මාරුවට මේ රට පාලනය කරපු පාලක කණ්ඩායම් අපේ රට විනාශයෙන් විනාශයට ඇද දමලා ඉවරයි. හැම පැත්තකින්ම රට බිඳ වට්ටලා තිබුණේ. අපේ රටේ කර්මාන්ත පද්ධතිය අඩපණ වෙලා තිබුණා, කෘෂි කර්මාන්තය කඩාගෙන වැටිලා තිබුණා. ඒ වාගේම අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහන සේවය වාගේම මහජන සුබසාධන කටයුතු සියල්ලම පාහේ විනාශයෙන් විනාශයට ඇද දමලා තිබුණේ. ඒ වාගේම රටේ විදේශ සංචිත හිඳිලා තිබුණේ. ඒක කොපමණද කියනවා නම්, අපට විදෙස් රටකින් ණයක් ගන්න බැරි තත්ත්වයට පත් වුණා. ඒ වාගේම රටේ අත්‍යවශ්‍ය සේවා, දෛනික අවශ්‍යතා පවත්වාගෙන යන්නවත් අවශ්‍ය විදෙස් සංචිත අපේ රට තුළ නැති වුණා. ඉතින්, මේ තත්ත්වය ඇතුළේ තමයි අපට අපේ රටේ ආර්ථිකය සම්බන්ධ ඉදිරි සැලසුම් කරගෙන යන්න සිද්ධ වුණේ. එතැනදි අපි ආණ්ඩුව විදියට ආරම්භයේ සිටම මනා සැලැස්මක් ඇතිව තමයි කටයුතු කළේ. ඒ සඳහා අපේ ආණ්ඩුව බලයට පත් වූ වහාම මොනවාද කළේ? විශේෂයෙන්ම

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු මනෝජ් රාජපක්ෂ මහතා]

පසුගිය කාලයේ රට පාලනය කළ පාලකයින් විසින් අපේ රට නාස්තිකාරී ක්‍රමයකට තමයි අරගෙන ගිහිල්ලා තිබුණේ. ඒ නිසා නාස්තිය අවම කරන එක අපේ රජයේ මූලික වැඩ පිළිවෙළක් බවට පත් වුණා. ඒ වාගේම පොදු දේපළ විශාල වශයෙන් අවභාවිත කර තිබුණා. ඒ හින්දා නාස්තිය අවම කිරීම වාගේම පොදු දේපළ අවභාවිත කිරීම නැවැත්වීමත් විශාල කාර්යයක් බවට පත් වුණා.

ඒ වාගේම සෑම ක්ෂේත්‍රයකම අනවශ්‍ය වියදම් විශාල ප්‍රමාණයක් සිදු වෙමින් තිබුණා. ඒ අනවශ්‍ය වියදම් ප්‍රමාණය නැවැත්වීමත් මම හිතන විධියට අපට විශාල අභියෝගයක් බවට පත් වෙලා තිබුණා. ඒ අනුව එය ඉතාම සාර්ථකව කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම සෑම ධාරාවකම තිබුණු හොරකම්, වංචා සහ දූෂණ කියන මේ සියල්ලම අද වනකොට අවම කරමින්, රටක් විධියට අපට සාර්ථක ගමනක් එන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. විශේෂයෙන්ම 2025 වසර තුළ මේ හැම දෙයම කර ගන්න ගමන්ම, නිවැරදි ආර්ථික දැක්මක් මත සැලසුම් වුණු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමින්, 2025 වසර අවසන් වනකොට රුපියල්වලින් ස්ථාවර ආර්ථිකයක් ගොඩනඟන්න අපට පුළුවන් වුණා. ඒ වාගේම තිබුණු තත්ත්වයට වඩා ඩොලර්වලින් ස්ථාවර වුණු සංචිත ප්‍රමාණයක් අපට එකතු කර ගන්නත් පුළුවන්කම ලැබුණා.

එවැනි තත්ත්වයක් තුළ තමයි ඔබ අප කවුරුත් දන්න, කිසි කෙනෙකුගේ පාලනයෙන් තොර - අපට පාලනය කර ගන්න බැරි - "දිට්වා" වැනි ආපදා තත්ත්වයකට අපේ රට මුහුණ දුන්නේ. ඒ ආපදාවෙන් සිදු වුණු හානිය කොච්චරද කියනවා නම්, එය ඩොලර් බිලියන 4.2ක තරම් අගයක් කියන එක ඉලක්කම් සහිතව, තොරතුරු සහිතව අපි දැන ගත්තා. අපේ රටේ ආර්ථිකය ඒ වනවිට ඉතා හොඳම තැනක නොවෙයි තිබුණේ. ඒ වාගේම අපි ආර්ථිකය ගොඩනඟමින් හිටපු තත්ත්වය තුළ වුණත් "දිට්වා" ආපදාවෙන් සිදු වුණු හානිය ඉතාම කෙටි කාලයක් තුළ යථාවත් කරගෙන, ඒ තුළින් වූ හානිය ඉතා ඉක්මනින් පූරණය කර ගැනීම සඳහා මැදිහත් වීමක් කරන්න අපේ ආණ්ඩුවට සිද්ධ වුණා. ඒ කටයුත්ත අපි ඉතාම සාර්ථකව කරමින් ඉන්නවා. "දිට්වා" ආපදාවෙන් හානි වුණේ දේපළවලට විතරක් නොවෙයි. කර්මාන්ත, කෘෂි කර්මාන්තය වාගේම අධ්‍යාපනය ඇතුළු සෑම ක්ෂේත්‍රයකටම මේ තුළින් විශාල හානියක් සිද්ධ වුණා. ඒ හානිය යථාවත් කිරීම කියන්නේ සුළුපටු වැඩක් නොවෙයි. විපක්ෂයට මේක නොතේරෙනවා නොවෙයි. ආණ්ඩුව විධියට අපි ඒ සියල්ලම කළමනාකරණය කරගෙන ඉදිරියට යන ගමනක් තමයි මේ තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බඩු මිල ඉහළ යාම, ජීවන වියදම ඉහළ යාම ගැන මේ සභාව කල් තැබීමේ යෝජනාව තුළින් කථා කරලා තිබෙනවා. ඉතිහාසය ගත්තොත්, බඩු මිල ඉහළ යාමට සියලුම රජයන් වග කියන්න ඕනෑ. ඒ වාගේම රජයක් විධියට අපි තමයි බඩු මිල ඉහළ යාම සම්බන්ධයෙන් ස්ථිරසාර විසඳුමකට යන්න ඕනෑ කියන මූලාරම්භය තබා තිබෙන්නේ. ඒ අනුව බඩු මිල ඉහළ යාම නිසා මිනිස්සුන්ගේ වැඩි වන ජීවන වියදම අඩු කිරීම සඳහා විසඳුම විධියට අපේ රටේ නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ කියන එක අපි හඳුනාගෙන තිබුණා. ඒ වාගේම කර්මාන්ත පැත්තෙන් අපි භාණ්ඩ නිෂ්පාදනය කරන්න ඕනෑ. කෘෂි කර්මාන්තය පැත්තෙන් අපට අවශ්‍ය ආහාර පාන ටික ඇතුළු අනෙකුත් දේවල් ටික අපි නිෂ්පාදනය කරන්න ඕනෑ. සේවාවන් ටික පුළුල් කරන්න ඕනෑ. ලාභදායී සේවාවන් අපි සපයන්න ඕනෑ. මේවා දියුණු කළොත් තමයි අපට බඩු මිල අඩු කරන්න පුළුවන්කම තිබෙන්නේ කියන දැක්ම අපේ රජයට - ආණ්ඩුවට - තිබුණා. ඒ මත පදනම් වෙලා තමයි අපේ වැඩ පිළිවෙළ සකස් වෙලා තිබුණේ. ඒ අනුව අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් නඟාසිටුවීම සඳහා සුවිශේෂී වැඩ පිළිවෙළවල් ආරම්භ කළා.

විශේෂයෙන්ම පසුගිය කාලයේ ආර්ථික කඩා වැටීම් තුළ අත්හැර දාලා තිබුණු කර්මාන්ත, සුළු කර්මාන්ත, කුඩා කුඩා ව්‍යාපාර නඟාසිටුවීම සඳහා ඔවුන්ට විශේෂ ණය පහසුකම් ලබා දුන්නා. "අපනයන කෘෂි මහිම - පොකුරු ගම්මාන" වැනි වැඩසටහන් ආරම්භ කරමින් අපනයන කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ නව පිබිදීමක් ඇති කිරීමට කටයුතු කළා. ඒ වාගේම ග්‍රාමීය දිළිඳු බව නැති කිරීමට ග්‍රාමීය මට්ටමෙන් නිෂ්පාදන ඇති කරමින්, අපේ රටේ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ආරම්භ කරපු ජාතික වැඩසටහනක් තිබුණා. ඒක තමයි, "ප්‍රජා ශක්ති" වැඩසටහන. එවැනි ජාතික වැඩසටහන් ආරම්භ කළේ වෙන මොකකටවත් නොවෙයි. ජාතික ආර්ථිකය, නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම ඉලක්ක කර ගනිමින් තමයි අපි ඒ වැඩසටහන් ආරම්භ කළේ.

ඒ වාගේම අපේ රටට අවශ්‍ය කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා විශේෂයෙන්ම dairy hubs වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් තිබෙනවා. ග්‍රාමීය ජනතාවට දැනෙන, දිළිඳු ජනතාවට දැනෙන විධියට බඩු මිල අඩු කිරීම සඳහා අපේ ආර්ථිකයට ක්‍රමානුකූලව හිස එසවිය හැකි මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් ඒවා මේ රට තුළ ක්‍රියාත්මක කරමින් ඉන්නවා.

කබීර් හෂීම් මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ මේ යෝජනාව තුළ යම් කුහකත්වයකුත් තිබෙන බව අපට දැනෙනවා. සත්‍ය, සත්‍ය ලෙස දකින්න අකැමැතිකමක් තිබෙනවා. මොකද, බිඳ වැටිච්ච රටක් නැඟිට්ට වීම කියන්නේ සරල, පහසු කටයුත්තක් නොවෙයි. එහෙම රටක් කරගෙන යනකොට හැම වෙලාවේදීම අභ්‍යන්තර සාධක මත පමණක් රටක ආර්ථිකය තීරණය වෙන්නේ නැහැ. ඒක ඔවුන් නොදන්නවා නොවෙයි. ඔවුන්ට ඒක නොතේරෙනවාත් නොවෙයි. ඔවුන් මේ තත්ත්වයට හදපු ආර්ථිකය අභ්‍යන්තර කාරණා මත පමණක් තීරණය වෙන එකක් නොවෙයි.

විශේෂයෙන්ම බලශක්ති අවශ්‍යතාවෙන්, ඛනිජ තෙල් අවශ්‍යතාවෙන් සියයට සියයක්ම අපට පිටින් ගෙනෙන්න සිදු වෙලා තිබෙනවා. රටට අවශ්‍ය ආහාර පාන ඇතුළු අනෙකුත් බොහෝ දේවල් පිට රටින් ගෙනෙන්න සිදු වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ අපේ ආර්ථිකය හැසිරවීමේදී ඊට බාහිර සාධකත් බලපානවා. මම විශ්වාස කරනවා, රජය විධියට අපි ඉදිරියට යාමේදි මේ යෝජනාවේ තිබෙන බොහෝ කාරණා අපේ පැත්තෙන් අප ඉටු කරමින් ඉන්නවා කියලා. ඒ හින්දා ආණ්ඩුව විධියට අපට ඉතාම සාර්ථක ගමනක් යන්න පුළුවන්කම තිබෙනවා. ඒ සඳහා ආණ්ඩුව විධියට අපි කටයුතු කරනවා කියන කාරණය සිහිපත් කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.35]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කබීර් හෂීම් මැතිතුමා ඉදිරිපත් කරපු සභාව කල් තැබීමේ යෝජනාවේ කිසිම කුහකත්වයක් නැහැ. ඒ යෝජනාවේ අඩංගු වන්නේ වර්තමාන යථාර්ථය. ඇත්තටම මම අහන්න කැමැතියි, ප්‍රජා ශක්ති ව්‍යාපාරය තුළින් රටේ දුගී දුප්පත්කම තුරන් කරන්නේ කොහොමද කියලා. දුගී දුප්පත්කම තුරන් කරන්න නම් ඉතිරි කිරීමක් තිබෙන්න ඕනෑ; ආයෝජනයක් තිබෙන්න ඕනෑ; නිෂ්පාදනයක් තිබෙන්නට ඕනෑ; පරිභෝජනයක් තිබෙන්නට ඕනෑ; අපනයනයක් තිබෙන්නට ඕනෑ. ප්‍රජා ශක්ති ව්‍යාපාරයේ ඒ ප්‍රධාන කොටස් අඩංගුද කියන එක මම අහන්න කැමැතියි. ඇත්තවශයෙන්ම අද අපේ රටේ සාර්ව ආර්ථික විචල්‍යයන් දිහා බැලුවාම ඒවායේත් ඉතාම සෘණාත්මක පැත්තක් තිබෙන්නේ. ඒ කියන්නේ, macroeconomy එකේ. ඒ වාගේම, ක්ෂුද්‍ර ආර්ථිකය, එහෙම නැත්නම් සූක්ෂ්ම ආර්ථිකය - microeconomy එක - දිහා බැලුවාමත් ඇත්තවශයෙන්ම ඛේදනීය තත්ත්වයක් තමයි තිබෙන්නේ. මේ කාරණාව පිළිබඳව අපි පුනපුනා කරුණු ඉදිරිපත් කර තිබෙනවා.

මේ අවස්ථාවේදී මම වෙනත් වැදගත් මාතෘකාවක් පිළිබඳව කථා කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් රජය ගැසට් කර තිබෙනවා, ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීම සඳහා වූ පනත් කෙටුම්පත. ඇත්තවශයෙන්ම බැලූ බැල්මට අපිට පෙනී යනවා, මේක මාධ්‍ය ක්ෂේත්‍රය වෘත්තීයකරණයකට ලක් කරනවා කියලා පෙන්වලා එම ක්ෂේත්‍රය රාජ්‍ය පාලනයට, රාජ්‍ය බලපෑමට ලක් කරන ව්‍යායාමයක් හැටියට. මාධ්‍ය පාලනය කරන්නට අතුරු පාලක සභාවක් පත් කරන්න පුළුවන්. විෂය භාර ඇමතිවරයාට බලය තිබෙනවා, මේ අතුරු පාලක සභාව පත් කරන්නටත්. අමාත්‍යාංශ ලේකම්වරයාත් ඒකට නිල බලයෙන්ම පත් වෙනවා. ආරම්භක ව්‍යුහයේ ඉඳලාම මේ රටේ නිදහස් මාධ්‍ය මර්දනය කරන්නට; මැඩ පවත්වන්නට, ඒ මාධ්‍ය නිදහස නැති කරන්නට රජයේ සෘජු බලපෑමට ලක් වන පනත් කෙටුම්පතක් තමයි මේ ගැසට් කර තිබෙන්නේ. ඒ වාගේම, ජනමාධ්‍යවේදීන් හැටියට කටයුතු කිරීමේදී හැඳුනුම්පත් අනිවාර්ය බව මේ පනත් කෙටුම්පතේ කෙළින්ම කිව්වේ නැති වුණත්, විශේෂයෙන්ම මාධ්‍යවේදියෙක් හැටියට කටයුතු කළ හැක්කේ කාටද කියන එක පිළිබඳව කියන්න රජය දොරටු පාලකයෙක් බවට පත් වෙලා තිබෙනවා. මේක ඉතාම බරපතළ තත්ත්වයක්. විශේෂයෙන්ම ඒ සාමාජිකත්වය අත්හිටුවීමේ බලය ලබා දෙනවා, විෂමාචාරය සම්බන්ධයෙන් සාමාජිකත්වය අත්හිටුවීම කියලා. වෘත්තීමය විෂමාචාරය තුළ ඒක කරන්න පුළුවන් බලයක් ලැබෙනවා. මේ විෂමාචාර ක්‍රියාවන් මොනවාද කියන එක පිළිබඳව හරියට නිර්වචනය කරන්නේ නැතුව ඇත්තවශයෙන්ම මාධ්‍ය මර්දන ව්‍යාපාරයක නියැළෙන්නටයි මේ රජය කටයුතු කරන්නේ.

විශේෂයෙන්ම වැදගත් තොරතුරු, රෙගුලාසි, සාමාජික සුදුසුකම් තීරණය කිරීමේ බලය මේ පනත් කෙටුම්පත හරහා විෂය භාර අමාත්‍යවරයාට සහ කවුන්සලයට පැවරෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායය වන්නේ මෙවැනි බලතල ප්‍රාථමික නීති සම්පාදනයේදීම පැහැදිලිව අර්ථ දැක්වීමයි. නමුත්, මෙහි එහෙම පැහැදිලි අර්ථ දැක්වීමක් නැහැ. ඒ වාගේම, ස්වයං නියාමනය වෙනුවට නිදහස් මාධ්‍ය ක්ෂේත්‍රය තුළ රාජ්‍ය නියාමනයක් ගෙන ඒමේ මර්දනකාරී ව්‍යායාමයක් හැටියට අපි ඇතුළු බොහෝදෙනා මේක දකිනවා. ඒ නිසා විශේෂයෙන්ම රාජ්‍යය මැදිහත් වී සිදු කරන ප්‍රතීතන ක්‍රියාවලිය, ඒ කියන්නේ සහතිකකරණය, මාධ්‍යවේදීන් පාලනය කිරීමේදී ඇති විනය බලතල, ඒ වාගේම මාධ්‍ය වෘත්තියේ නියැළී සිටින්නට පුළුවන් සාමාජිකත්වය ඇතුළු කරුණු කාරණා පිළිබඳව පැහැදිලි සහතිකයක් නොමැති වීම අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට මරු පහරක් හැටියට සඳහන් කරන්න පුළුවන්.

ඇත්තවශයෙන්ම මේ රජය කථා කරන්නේ බොහොම කාර්යක්ෂම, කාර්යශූර, ක්‍රියාශීලී, දක්ෂ, පක්ෂ, හපන්කම් තිබෙන, ජංගම පුස්තකාල හැටියට කටයුතු කරන දැවැන්ත හැකියාවක් තිබෙන පක්ෂයක් හැටියටයි. මම එක නිදසුනක් විතරක් පෙන්නුම් කර දෙන්නම්, මේ රජයේ අකාර්යක්ෂමතාව පිළිබඳව. 13වැනි සෙනසුරාදා Asia Rugby Emirates Men's Championship එක තිබෙනවා. දෙවැනි match එක තිබෙන්නේ කොරියාවත් එක්ක. ඊයේ දවසේ ක්‍රීඩා අමාත්‍යාංශයට මේ කණ්ඩායම් ඔක්කෝම ඇවිල්ලා, හමු වෙන්න ඕනෑ කට්ටිය හමු වෙලා, media briefing එකකුත් තිබ්බා. හැබැයි, මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ ක්‍රීඩකයින්ට ඒ match එකට යන්න වීසා නැහැ. වීසා නැතුව ඒ ක්‍රීඩකයෝ දැන් අතරමං වෙලා ඉන්නේ. එතකොට, මේ වාගේ තත්ත්වයක් තුළ මොකක්ද වෙන්නේ? බැරි වෙලාවත් අද දවසේ වීසා හම්බ වුණොත් අද මහ රෑ යන්න වෙනවා. යන්න වෙන්නේත් හොංකොං හරහා. ඒක පැය අටක ගමනක්. කිසිම rest එකක් නැහැ. මේ වෙනකොටත් වීසා නැති නිසා අපේ ක්‍රීඩකයෝ ළත වෙනවා, ඒ match එකට යන්න බැරුව. මම මේ සරල උදාහරණයක් ඉදිරිපත් කළේ. අපේ රටේ ක්‍රීඩා කණ්ඩායමකට විදේශීය තරගාවලියකට යා යුතු දිනය තිබෙනවා, යන්න ඕනෑ වෙලාව තිබෙනවා. හැබැයි, වීසා නැහැ. මේ සරල උදාහරණයෙන්ම පෙනෙනවා, මේ රජයට ඒ ටිකවත් කරගන්න බැහැ කියන කාරණය. ඒ ටිකවත් කරගන්න බැරි රජය කොහොමද, දුප්පත්කම තුරන් කරන්නේ, උද්ධමනය පහත දමන්නේ, විරැකියාවට විසඳුම් ලබා දෙන්නේ?

අද වනවිට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් විශාල ප්‍රමාණයකගේ ජන ජීවිත කඩා වැටිලා, ව්‍යාපාර කඩා වැටිලා. කෘෂිකර්මාන්තය කඩා වැටිලා, ධීවර ක්ෂේත්‍රය කඩා වැටිලා, ස්වයං රැකියා ක්ෂේත්‍රය කඩා වැටිලා, ව්‍යවසායක ක්ෂේත්‍රය කඩා වැටිලා. ඒ ඔක්කෝම කඩා වැටිලා. අද business startups කොච්චරක් අපේ රටේ ක්‍රියාත්මක වෙනවාද? අද සෘජු විදේශ ආයෝජන අපේ රටට කොපමණ ලැබෙනවාද? අපේ අපනයන ක්ෂේත්‍රයට මොකක්ද වෙලා තිබෙන්නේ? මේ කරුණු කාරණා සමූහය දිහා බැලුවාම පෙනී යනවා, රට පාලනය කරන්නේ දුර්වල, අකාර්යක්ෂම, වැඩ බැරි ආණ්ඩුවක් බව. ඒ නිසා මේ අවස්ථාවේ අපි යෝජනාවක් කරනවා. රජය යන දිශාව නිවැරදිද, වැරදිද කියන එක ගැන තීන්දුවක් ගැනීම සඳහා කරන්න හොඳ litmus test එකක් තිබෙනවා. ඒ litmus test එක තමයි පළාත් සභා ඡන්දය. පළාත් සභා ඡන්දය කල් දමන්නේ නැතුව වහාම ඒක පවත්වන්න. එතකොට රටේ ජනතාවට පුළුවන් රජයේ හැකියාව සහ නොහැකියාව පිළිබඳව ඔවුන්ගේ මතය පළ කරන්න.

ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.43]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විපක්ෂ නායකතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න අවස්ථාව ලැබුණු මේ මොහොතේ මම යම් කාරණයක් ගැන සඳහන් කරන්න කැමැතියි.

[ගරු අනුර කරුණාතිලක මහතා]

එතුමා ප්‍රජා ශක්ති ව්‍යාපාරය සම්බන්ධයෙන් සඳහනක් කළා. ගරු විපක්ෂ නායකතුමනි, ප්‍රජා ශක්ති ව්‍යාපාරය වෙනුවෙන් රජය මේ වනවිට බිලියන 25ක් වෙන් කර තිබෙනවා. ඒ බිලියන 25න් හැම ග්‍රාම නිලධාරි වසමකම අවම වශයෙන් එක ව්‍යාපෘතියක් හෝ ආරම්භ කරන්න අප බලාපොරොත්තු වෙනවා. එම ව්‍යාපෘතිවල නිර්ණායක පිළිබඳව ඔබතුමා හරියාකාර හැදෑරීමක් කළා නම් ඔබතුමාට ඒ සම්බන්ධව අවබෝධයක් ලබා ගන්න පුළුවන්. මොකද, ග්‍රාමීය නිෂ්පාදනය වැඩි වෙන්න ඕනෑ කොහොමද, සමාජ සවිබලගැන්වීම ඇති වෙන්න ඕනෑ කොහොමද කියන ඒ නිර්ණායකවලට අනුව එම ව්‍යාපෘති සැකසෙන්නේ කොහොමද කියන එක ඒ තුළ ඉතා පැහැදිලිව සඳහන් වෙනවා. ඒ නිසා මම එතුමාට ආරාධනා කරනවා, ප්‍රජා ශක්ති ව්‍යාපාරයට අදාළ චක්‍රලේඛය සහ එම ව්‍යාපෘතිය පිළිබඳව වැඩි විස්තර හදාරන්න කියලා. එතකොට ඔබතුමාගේ ප්‍රශ්නයට ඔබතුමාටම උත්තරයක් හොයා ගන්න පුළුවන්, ගරු විපක්ෂ නායකතුමනි.

අපේ ඩී.වී. චානක මන්ත්‍රීතුමා මේ වෙලාවේ Chamber එකේ ඉන්නා බවක් මට පෙනෙන්නේ නැහැ. එතුමා ප්‍රශ්නයක් ඇහුවා. මගේ කථාව තුළ මම එතුමාට උත්තරයක් ලබා දෙනවා. හැබැයි, මම කැමැතියි එතුමා Chamber එකේ ඉන්නා වෙලාවකම ඒකට උත්තර දෙන්න. ඒ නිසා මගේ මේ කථාව කොහේ හරි ඉඳිමින් එතුමා අහගෙන ඉන්නවා නම්, Chamber එකට එන්න කියා මම එතුමාට කියනවා. මම එතුමා අහපු ප්‍රශ්නයට එතුමා ඉස්සරහම උත්තර දෙන්න බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දින සභාව කල්තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව ගැන කථා කරනකොට, එහි හරයන් හැටියට කරුණු කිහිපයක් තිබෙන බව පෙනෙනවා. එකක් තමයි, අපි කවුරුත් දන්නා විධියට මැද පෙරදිග ඇති වෙලා තිබෙන යුදමය තත්ත්වය ලෝකයේ අනෙක් රටවලට වාගේම ලංකාවට ඇති කරනු ලබන සමාජ, ආර්ථික බලපෑම මොකක්ද කියන එක. ඒක මේ යෝජනාව තුළ තිබෙනවා. ඒ වාගේම ඒකත් එක්ක ඉදිරියේදී ඇති වේ යැයි පුරෝකථනය කර තිබෙන "එල් නිනෝ" සහ "ලා නිනෝ" වාගේ කාලගුණික විපර්යාසවලින් කෘෂිකර්මාන්තය, බලශක්තිය වාගේ ක්ෂේත්‍රවලට ඇති වන බලපෑම ගැනත් සඳහන් වෙලා තිබෙනවා. හැබැයි, එක තැනක තිබුණා, මේ සඳහා මුහුණ දෙන්න රට සූදානම් ද, නැද්ද කියන එක පෙනෙන්න නැහැ කියලා. මට මතකයි, කෘෂිකර්ම ඇමතිවරයා හැටියට අමාත්‍යාංශ නිලධාරින් එක්ක මේ ගැන සාකච්ඡාවක් පැවැත්වූවා, මේ සම්බන්ධව ගන්නා ඉදිරි පියවර මොනවාද කියලා. ඒ වාගේම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හැටියට එම අමාත්‍යවරයාගේ නායකත්වයෙන් ඒ පිළිබඳව සාකච්ඡාවක් තිබුණා. ඒ වාගේම බලශක්ති අමාත්‍යාංශය හැටියට අපිත් ඒ අදාළ නිලධාරින් එක්ක සාකච්ඡා කළා, මේකෙන් මොන වාගේ බලපෑමක් ද බලශක්ති ක්ෂේත්‍රයට ඇති වන්නේ, ඒ සඳහා ගන්න ඕනෑ පියවර මොනවාද කියලා. විශේෂයෙන් අපි පුරෝකථනය කර තිබෙනවා 2026 වසරේ ඉදිරි කාලය තුළ ගිගාවොට් පැය 127ක වාගේ ප්‍රමාණයක් අඩු වෙයි කියලා. අන්න ඒ වෙනුවට විකල්ප මොනවාද කියලා අපි දැනටමත් සාකච්ඡා කරලායි තිබෙන්නේ. ඒ නිසා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා යෝජනාවේ සඳහන් කරන රට සූදානම් නැහැ කියන පණිවුඩයට වඩා, ඒ සූදානම විපක්ෂය දකින්නේ නැහැ කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කළමනාකාරිත්වය පිළිබඳ ගැටලුවකුත් මෙහි සඳහන් වෙනවා. හැබැයි මේ කළමනාකාරිත්වය ගැන කථා කරන අය තමන් ආණ්ඩු කරන කාලයේ කොයි විධියටද ආණ්ඩුකරණය කළේ සහ ආර්ථිකය කළමනාකරණය කළේ කොහොමද කියන එක ගැනත් අපි කල්පනා කර බලලා තමයි ඒ ඇත්තන්ගේ උපදෙස්, අවවාද, අනුශාසනා පිළිගන්න ඕනෑ ද කියන එක හිතන්න වෙන්නේ. මම බැලුවා, මේ යෝජනාව ඉදිරිපත් කරපු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා 2015දී investment promotion භාරව, public enterprises භාරව, petroleum resources භාරව කටයුතු කරපු කාලයේ මේ රටේ ආර්ථිකයට මොකද වුණේ කියලා. 2015දී එතුමන්ලා රටේ ආර්ථිකය භාර ගන්නකොට රටේ ආර්ථික වර්ධන වේගය සියයට 4.8යි. අවුරුද්දක් ඇතුළත රටේ ආර්ථික වර්ධන වේගය සියයට 3.4ට අඩු වුණා. ඒ කියන්නේ, සියයට 1.6කින් ආර්ථික වර්ධන වේගය අඩු වුණා. 2019 වෙනකොට ආර්ථික වර්ධන වේගය සියයට 2.3ට අඩු වුණා. ඒ නිසා මේ ආර්ථික කළමනාකරණය පිළිබඳ අනෙක් අයගෙන් ප්‍රශ්න කරන අයගේ ආර්ථික කළමනාකාරිත්ව හැකියාව, මේ සියයට 4.8ක් වෙච්ච ආර්ථික වර්ධන වේගය සියයට 2.3 දක්වා අඩු වීම තුළ අපිට හොඳටම පෙනෙනවා. ජාතික ජන බලවේගය රජය හැටියට අවම වශයෙන් අපි මේ කාලය තුළ ආර්ථික වර්ධන වේගය සියයට 5 හා සියයට 5ට ආසන්නව තියා ගෙන යන්න සමත් වෙලා තිබෙනවා. එතකොට බලන්න පුළුවන් ආර්ථික කළමනාකරණයේදී වඩා දක්ෂතාවක් පෙන්වා තිබෙන්නේ කවුද කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ ආදායම් - government revenue - ගැන කථා කරන කොට 2015-2019 කාලය තුළ දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 14-19 අතර ප්‍රමාණයක තමයි තිබුණේ. හැබැයි, 2024-2025 කාලය තුළ රාජ්‍ය ආදායම සියයට 16.6 දක්වා වැඩි කරන්න සමත් වෙලා තිබෙනවා. 2001න් පස්සේ දළ ජාතික නිෂ්පාදනයට සාපේක්ෂව වැඩිම රාජ්‍ය ආදායම අත්පත් කරගෙන තිබෙන්නේ මෙන්න මේ 2025-2026 කාලයේ. එහෙම බැලුවාමත් ඔන්න සංඛ්‍යා සහිතව තවත් උදාහරණයක් තිබෙනවා කාටද වඩාත් දක්ෂතාව හා පළපුරුද්ද තිබෙන්නේ කියන එක ගැන.

ඒ වාගේම වැදගත් වන තවත් කාරණයක් තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමාත් බදු ගැන කථා කළා, ණය බර ගැන කථා කළා. හැබැයි 2015-2019 කාලය තුළ බාහිරින් ගත්ත ණය, ඒ කියන්නේ විදේශ රටවලින් අපි ගත්ත ණය කොහොමද අඩු වෙලා තිබෙන්නේ, වැඩි වෙලා තිබෙන්නේ කියලා අපි කල්පනා කර බැලුවොත්, 2015දී මේ රාජ්‍ය ණය බර - විදේශ ණය - ඩොලර් බිලියන 44යි තිබුණේ. හැබැයි, අවුරුදු 4ක, 5ක කාලය තුළ - 2015 සිට 2019 දක්වා වෙද්දී - මෙය ඩොලර් බිලියන 56ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කාලය තුළ ඩොලර් බිලියන 44ක් තිබුණු ණය බරට තවත් ඩොලර් බිලියන 12ක් එකතු කරලා තිබෙනවා. එතකොට, මේ ණය බර වැඩි වීම කෙරෙහි වැඩිම දායකත්වයක් දක්වා තිබෙන්නේ මොන කාලයේද කියලා අපට බලන්න පුළුවන් වෙනවා. කොහොම වුණත්, අපට පිළිගන්න වන කාරණයක් තමයි, විශේෂයෙන්ම මැද පෙරදිග යුද්ධයත් එක්ක ඇති වූ තත්ත්වයන් හේතුවෙන් මේ මාර්තු මාසයේ ඉඳලා අපි දුෂ්කරතාවකට පත් වෙලා ඉන්නවා කියන එක. සමහරුන් පුරෝකථනය කරනවා වාගේ, අපට ඒ දුෂ්කරතාව දෙස බලන්න වෙන්නේ, එය අපේ රටේ ආර්ථික කඩා වැටීමක් දක්වා වැඩි වෙන්න පුළුවන්ද කියන කාරණයත් එක්කයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් ආර්ථික දුෂ්කරතාවක් ඇති වන්නේ, එහෙම නැත්නම් ආර්ථිකය තුළ කිසියම් හැල හැප්පීමක් ඇති වන්නේ අභ්‍යන්තර සාධක මත නම්, ඒකම ආර්ථික අර්බුදයක් දක්වා වර්ධනය කිරීමේ අවදානමක් තිබෙනවා. ඒ වාගේම ඒ ආර්ථික අවදානමම, ඒ ආර්ථික අර්බුදයම නැවත වරක් දේශපාලන අර්බුදයක් දක්වා යෑමේ අවදානමක්ද

තිබෙනවා. නමුත්, මේ කාරණයේදී අපේ රට අභ්‍යන්තරයේ විනිමය සොයා ගැනීමේ බරපතළ විධියේ ප්‍රශ්නයක් තිබෙනවා නම්, අන්න එතැනදී අපට බලන්න පුළුවන් ආර්ථික අර්බුදයට බලපා තිබෙන කාරණා මොනවාද කියලා. විදේශ ප්‍රේෂණ අඩු වෙලා තිබෙනවා නම්, සංචාරක ව්‍යාපාරයෙන් අපට ලැබෙන ආදායම අඩු වෙලා තිබෙනවා නම්, අපේ අපනයන ආදායම අඩු වෙලා තිබෙනවා නම්, අන්න එතැන විනිමය පිළිබඳ අභ්‍යන්තර අර්බුදයක් ඇති වනවා. ඒ වාගේම, රටේ එදිනෙදා වියදම් සඳහා අවශ්‍ය වන රුපියල් සොයා ගන්න අපට අමාරු නම්, රාජ්‍ය ආදායම අඩු වෙලා තිබෙනවා නම්, අභ්‍යන්තර වශයෙන් අපට ගැටලුවක් ඇති වෙනවා. හැබැයි, අප කථා කරන මේ මොහොතේ තිබෙන ආර්ථික දුෂ්කරතාව, එහෙම නැත්නම් ආර්ථිකයේ තිබෙන අමාරුකම මේ එක කාරණයක් නිසාවත් ඇති වුණු දෙයක් නොවෙයි. අපි දන්නවා, මැද පෙරදිග යුද්ධයක් ඇති වෙලා තිබෙනවා, සැපයීම් ජාලවල ගැටලුවක් පැන නැඟිලා තිබෙනවා කියා. විශේෂයෙන්ම ඉන්ධන සම්බන්ධයෙන්. මොකද, ඉන්ධන මිල විශාල වශයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. මේ තත්ත්වය පෙරළා මුළු ලෝකයටම බලපෑම් ඇති කරද්දී, අපේ වාගේ රටවලට ටිකක් වැඩියෙන් බලපෑම් කර තිබෙනවා. අන්න ඒක තමයි අද මේ කථා කරන ආර්ථික දුෂ්කරතාව විධියට අප දකින්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හේතුව නිසා මේ ආර්ථිකයේ කඩා වැටීමක් ගැන කවුරු හරි බලාපොරොත්තුවෙන් ඉන්නවා නම්, මේ තත්ත්වය ආර්ථික අර්බුදයක් දක්වා වර්ධනය වෙයි කියා හිතනවා නම්, ඒ ආර්ථික අර්බුදය මුල් කරගෙන දේශපාලන අර්බුදයක් ඇති වෙයි කියා කවුරු හරි පුරෝකථනය කරනවා නම්, බලාපොරොත්තුවෙන් ඉන්නවා නම්, මට ඒ අයට කියන්න තිබෙන්නේ, "sorry" කියලා තමයි.

හැබැයි, මැද පෙරදිග යුද්ධයත් එක්ක පසුගිය කාලයේ ඉන්ධන මිල ඉහළ යෑම හේතුවෙන් - අවස්ථා 7කදී - ඉන්ධන මිල වැඩි කරන්න අපට සිද්ධ වුණා. අපි ඒ දත්ත පිළිබඳව කල්පනා කර බලන කොට ඉන්ධන ආනයනය කරන අපේ වාගේ රටවල - සමහර රටවල - ඉන්ධන මිල ඉහළ යෑමත්, අපේ රටේ ඉන්ධන මිල ඉහළ යෑමත් කොයි වගේ තැනක තිබෙනවාද කියලාත් සොයා බලන්න ඕනෑ. මම මුලින්ම පෙට්‍රල් මිල ගත්තොත්, මේ කාලය තුළ පාකිස්තානයේ පෙට්‍රල් සියයට 51.7කින් වැඩි වුණා; පිලිපීනයේ සියයට 72.5කින් වැඩි වුණා; මියන්මාරයේ සියයට 89.1කින් වැඩි වුණා. ඇමෙරිකා එක්සත් ජනපදයත් - USAත්, එනම් යුද්ධය පටන් ගන්න කලින් වෙනිසියුලාවේ තෙල් අත් පත් කරගෙන කටයුතු කරපු රටත් පෙට්‍රල් මිල සියයට 42.7කින් වැඩි කළා. ඒ වාගේම ඩීසල් ගත්තොත්, මේ තත්ත්වය තවත් භයානක තැනකට ගිහිල්ලා තිබෙනවා. පාකිස්තානයේ ඩීසල් මිල සියයට 43.4කින් ඉහළ ගොස් තිබෙනවා. එය සියයට 58කින් වැඩ කර තිබුණත්, පසුව තමයි ඔවුන් එය සියයට 43.4 දක්වා අඩු කළේ. නේපාලයේ ඩීසල් මිල සියයට 58.6කින් සහ ඉන්ධනවල hub එකක් හැටියට තිබෙන රට වන සිංගප්පූරුවේත් සියයට 61.4කින් වැඩි කරගෙන තිබෙනවා. ඒ වාගේම, ඇමෙරිකා එක්සත් ජනපදය ඩීසල් මිල සියයට 43.7කින් වැඩි කර තිබෙනවා. හැබැයි, අපේ රටේ? අපේ රටේ ඉන්ධන මිල වැඩි වීම ගත්තොත්, Petrol 95 Octane සියයට 45.59කින්, Petrol 92 Octane සියයට 48.12කින්, ලංකා සුදු ඩීසල් සියයට 44.84කින් වැඩි වෙලා තිබෙනවා. සාමාන්‍යය ගත්තොත්, සියයට 45කට ආසන්න ගණනකින් තමයි අපේ රටේ තෙල් මිල වැඩි වීම සිදු වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවේ අවසාන කාලයේදීවත් ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා මේ සභාවට එන බවක් පෙනෙන්නට නැහැ. කොහොම වුණත්, එතුමා කැමැති මාතෘකාවක් ගැන මම කථා කරන්නම්. ගල් අඟුරුවල ප්‍රමිතිය අඩු වීම නිසා අපට ඇති වුණු බලපෑම සම්බන්ධයෙන් මේ වන කොට මොකක්ද වෙලා තිබෙන්නේ කියන එක රටේ ජනතාවට වැදගත්. මේ කියන ප්‍රමිතිය පිළිබඳ ගැටලුව පැන නැඟුණු නිසා දැනට අපි දඩ හැටියට ඇමෙරිකානු ඩොලර් මිලියන 29.87ක්, ඒ කියන්නේ රුපියල්වලින් ගත්තොත් බිලියන 9.8ක් රඳවාගෙන තිබෙනවා. ඒ වාගේම Performance Tender එක ඩොලර් මිලියන 14.7ක්; රුපියල්වලින් ගත්තොත් බිලියන 4.875ක්. ඒ කියන්නේ, සම්පූර්ණයෙන්ම රුපියල් බිලියන 14.72කට මේ ප්‍රමාණය රඳවාගෙන ඉන්නවා. හැබැයි මේ කාලය තුළ අදාළ සමාගම් විසින් ගණනය කර තිබෙනවා, මේ ගල් අඟුරුවල ප්‍රමිතිය පිළිබඳ කාරණය නිසා අපට කොච්චර අලාභයක් සිදු වෙලා තිබෙනවාද කියලා. National System Operatorගේ - NSOගේ - ගණන් හැදීම අනුව එය ජනවාරිවල ඉඳලා අප්‍රේල් දක්වා බිලියන 4.5යි. Generation කරන සමාගමේ හෙවත් ජනන සමාගමේ ගණන් බැලීම අනුව එයාලාට වෙච්ච පාඩුව මැයි දක්වා බිලියන 3.1යි. මේ ඔක්කොම දිහා බැලුවාම, දැනට ගණන් බලා තිබෙන විධියට රුපියල් බිලියන 7.6ක විතර පාඩුවක් තමයි ගල් අඟුරුවල ප්‍රමිතිය පිළිබඳ ගැටලුව නිසා ඇති වෙලා තිබෙන්නේ. මේ ප්‍රමාණය තව ටිකක් වැඩි වෙන්න පුළුවන්. මොකද, අප හැම දාම කියනවා වාගේ මේ ක්‍රියාවලිය සම්පූර්ණ වුණාට පසුව තමයි අපට සම්පූර්ණ අලාභය ගණනය කරන්න පුළුවන්කම ලැබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, කාලය අවසන්.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මට තව විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි හිතන විධියට, අලාභය රුපියල් බිලියන 10ක්, 11ක් විතර ප්‍රමාණයක් එන්න පුළුවන්. දැනට තිබෙන ගණන් බැලීම අනුව. නමුත් අපි මේ වනකොට රුපියල් බිලියන 14.72ක් රඳවාගෙන තිබෙන නිසා මේකේ බර ජනතාවට දීමේ අවශ්‍යතාවක් පැන නඟින්නේ නැහැ කියන එක මම මතක් කරන්න කැමැතියි.

අවසාන වශයෙන්, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නයට මම උත්තරයක් දෙන්න ඕනෑ. අපි දන්නවා, හදිසි - emergency - මිල දී ගැනීම්වල පස්වැනි නැවේ Load Port Analysis Report එක ගත්තාම, ඒ Report එකේ ගැටලුවක් තිබෙන බව. ඒ ගැටලුව නිසාම අපි පසුගිය ජූනි මාසයේ 09වැනි දා ඒ අදාළ සමාගමට දැනුම් දීලා තිබෙනවා, මේ ගැටලුව නිසා මේ නෞකාවේ shipment එක භාර ගැනීමේ හැකියාවක් අපට නැහැ කියලා. ඒ නිසා අපි ඒ අයට විකල්ප යෝජනා 5ක් දීලා එක තැනක සඳහන් කරනවා, සැප්තැම්බර් මාසයේ පළමුවැනිදාට කලින් අලුත් නැවක් ගේන්න, එහෙම නැති වුණොත් අදාළ ටෙන්ඩර් දැන්වීමේ තිබෙන පරිදි දඩ අය කර ගැනීම සඳහා අපි කටයුතු කරනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කාලය ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. M.K.M. ASLAM left the Chair and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 2.58]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ වර්තමාන ආර්ථික තත්ත්වය ගැන, ආර්ථික අර්බුදය ගැන අපේ හිතවත් කබීර් හෂීම් මැතිතුමා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙන ආවා. අපි බලන්න ඕනෑ, මේ රටේ ගොවි ජනතාවට මේ ආර්ථික අර්බුදය බලපාන්නේ කොහොමද කියලා. මට පෙර කථා කළ ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා ප්‍රගතිය ගැන කිව්වා; එතුමාගේ සංඛ්‍යාලේඛන ගැන කිව්වා. මම දන්නේ නැහැ, මේවා ජනතාවට කොහොම දැනෙනවාද කියලා.

අද වන විට මේ රටේ සියයට 26ක් ඉන්නේ ගොවි ජනතාවයි. මේ ගොවි ජනතාව තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ අද අන්තිම අසරණ තත්ත්වයට පත් වෙලායි ඉන්නේ. මේ සියයට 26 මේ රටේ අපට කන්න දෙනවා. පසුගිය මහ කන්නයේ මේ රටේ ගොවියෝ වී මෙට්‍රික් ටොන් මිලියනව ලක්ෂයක් නිෂ්පාදනය කළා. වැස්ස හරියාකාරව ලැබුණා; ගොවිතැන හරියාකාරව කළා. තමුන්නාන්සේලාගේ ගණනය අනුව වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 90ක්, 100ක් ගොවියාට වියදම් වෙනවා. තමුන්නාන්සේලා වෙළඳපොළ වීවලට රුපියල් 120ක, රුපියල් 125ක සහතික මිලක් දීලා තිබෙනවා. අපි තමුන්නාන්සේලාගෙන් අහනවා, ගොවියා දැන් ඒක ලබනවාද කියලා. මම ඉන්නේ මොනරාගල දිස්ත්‍රික්කයේ. ඒක ගොවීන් ඉන්න දිස්ත්‍රික්කයක්. එය අපේ ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමාගේ දිස්ත්‍රික්කයට අල්ලපු දිස්ත්‍රික්කය.

ඒ වාගේම, ඊයේ පෙරේදා අපි අම්පාරට, මඩකලපුවට ගියා. ගොවියාට අද වී කිලෝ එකක් විකුණන්න වෙලා තිබෙන්නේ රුපියල් 90ට, 95ට. නිෂ්පාදන වියදමවත් ඒකෙන් පියවාගන්න බැහැ, ඔවුන්ට. මොනවාද තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කළේ? ගිය මහ කන්නයෙන් හොඳම අස්වැන්නක් එද්දී, යල අස්වැන්න හැටියට මෙට්‍රික් ටොන් 2,900,000ක් එන්න තිබියදී තමුන්නාන්සේලා ඉන්දියාවෙන් හාල් ගෙනැල්ලා තිබෙනවා. අප්‍රේල් මාසයේ විතරක් හාල් මෙට්‍රික්ටොන් 64,581ක් ගෙනැල්ලා තිබෙනවා. මැයි මාසයේ ගෙනැල්ලා තිබෙනවා හාල් මෙට්‍රික්ටොන් 91,256ක්. ඒ අනුව, හාල් මෙට්‍රික්ටොන් 155,000ක් පමණ ගෙනැල්ලා තිබෙනවා. දැන් වී මිල කඩා වැටිලා විකුණාගන්න විධියක් නැහැ. ඇයි තමුන්නාන්සේලා මේ හාල් ගෙනාවේ? ගෙනාවේ කීරි සම්බා වෙනුවට ආදේශකයක් කියලායි. කීරි සම්බා වෙනුවට තමුන්නාන්සේලා ගෙනැල්ලා තිබෙන්නේ ඉන්දියාවේ තිබෙන ආදේශක කීරි පොන්නි සම්බා එකක්. මොකක්ද දැන් වෙලා තිබෙන්නේ? කීරි සම්බා මිල අඩු වුණාද? නැහැ. කීරි සම්බා විකුණන්නේ කිලෝ එකක් රුපියල් 380ට, 390ට, 400ට. තමුන්නාන්සේලා පිට රටින් හාල් ගෙනාවා කියලා වෙළෙඳ පොළේ කීරි සම්බා මිල අඩු වෙලා නැහැ. මොකද, තමුන්නාන්සේලාගේ සහල් මෝල් මාෆියාවක් තිබෙනවා. ඒගොල්ලන් මොනවාද කරන්නේ? තමුන්නාන්සේලාගේ කීරි සම්බා කිලෝ එකක සහතික මිල රුපියල් 260යි. මොනවාටද මේ සහතික මිල? කීරි සම්බා කිලෝ එකක් විකුණන්නේ රුපියල් 390ට. ඒගොල්ලන් මොකද කරන්නේ එතකොට? රුපියල් 260ට බිල දෙනවා, අත යටින් ඉතිරි සල්ලි ටික ගන්නවා. ඒක නේද කරන්නේ? තමුන්නාන්සේලාට මේවා පාලනය කරන්න හැකියාවක් නැහැ. මට මතකයි, ජනාධිපතිතුමා බලයට ආපු ගමන් මේසයට ගහලා කිව්වා, "මම මේ සහල් මෝල් මාෆියාව නවත්වනවා, මම ඒක පාලනය කරනවා" කියලා. දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් ඒගොල්ලන් තිබුණාට වඩා හොඳට කරගෙන යනවා. ලොකු හාල් මෝල් හිමියන්ගෙන් ඇහුවොත් හොඳම ජනාධිපති මෙතුමා කියයි. ගොවීන්ගෙන් ඇහුවොත් නරකම ජනාධිපති මෙතුමා කියයි.

හෙට අනිද්දා වෙනකොට යල කන්නයේ අස්වැන්න එනවා. ගොවීන්ට යල කන්නයත් හරියට කරගන්න පුළුවන්කම තිබුණේ නැහැ. තමුන්නාන්සේලා වෙලාවට පොහොර ටික දුන්නේ නැහැ. තමුන්නාන්සේලා කිව්වා, ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් ඕනෑ තරම් ගොවීන්ට පොහොර දෙනවා කියලා. මා දන්නා විධියට අවශ්‍ය පොහොර ටික - මඩ පොහොර ටිකවත්, යූරියා ටිකවත්, TDMවත් - ඔවුන්ට හම්බ වුණේ නැහැ. මේ සැරේ අස්වැන්න අඩු වෙයි. ඒක බලාගෙනද දන්නේ නැහැ පිට රටින් හාල් ගෙනෙන්නේ. අද වෙලා තිබෙන්නේ මොකක්ද? තමුන්නාන්සේලා ගොවියාට තිබුණු පොහොර සහනාධාරය කපලා තිබෙනවා. 2020 අවුරුද්දේ - අපි එදා බලයේ හිටපු අවුරුද්දට පසු අවුරුද්දේ - පොහොර සහනාධාරයට රුපියල් බිලියන 36.45ක් දීලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් ගිය අවුරුද්දේ කීයක්ද දීලා තිබෙන්නේ? තමුන්නාන්සේලා මහ කන්නයේ දීලා තිබෙන්නේ රුපියල් බිලියන 18යි, යල කන්නයේ දීලා තිබෙන්නේ රුපියල් බිලියන 13යි. ඔක්කොම රුපියල් බිලියන 31යි. ඒ කියන්නේ, මේ රටේ ගොවියාගේ පොහොර සහනාධාරය තමුන්නාන්සේලා අඩු කරලා තිබෙනවා. මේ රටේ ගොවීන්

කිව්වාම, වී ගොවීන් විතරක් නොවෙයි, තවත් සියයට 50ක් විතර ඉන්නවා අතුරු භෝග වවන, එළවලු වවන, පලතුරු වවන ගොවීන්. ඒගොල්ලන් දැන් පොහොර මිටියක් ගන්න ඕනෑ, රුපියල් 16,000කට, 17,000කට විතර. තමුන්නාන්සේලා එහෙමයි මේ රටේ ගොවියාට සලකා තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ පොහොර සහනාධාරය අඩු කරලා තිබෙනවා. මා දන්නා විධියට පසුගිය අවුරුදු 10, 15 තුළ රුපියල් බිලියන 35ක්, 40ක් දුන්නා, පොහොර සහනාධාරය හැටියට. තමුන්නාන්සේලා මොකද කළේ? කොටසකට විතරක් සහනාධාරය දීලා, ගොවීන්ට කිව්වා බැංකු පොතට මුදල් දමනවා කියලා. බැංකු පොතට මුදල් දමන්නේ පොහොර ගහලා, ගොයම් කපලා, වී ටික විකුණුවායින් පස්සේ. ඒ තත්ත්වයට ගොවියා අසරණ කර තිබෙනවා තමුන්නාන්සේලා. අද ගොවියා ගොවිතැනින් අයින් වෙලා තිබෙනවා. මම මේ කාරණය කියන්නම් තමුන්නාන්සේලාට. ගොවියා ගොවිතැනින් අයින් වෙච්ච විධිය කියන්නම්. 2020 වෙනකොට මේ රටේ ජනතාවගෙන් සියයට 27.5ක් ගොවිතැන් කරලා තිබෙනවා. ගිය

අවුරුද්ද -2025- වෙනකොට ඒක සියයට 25කට බැහැලා තිබෙනවා. ගොවියා දැන් ගොවිතැනින් ඈත් වෙනවා. ඇයි? ගොවියාට දැන් ලාභ නැහැ. ගොවියා තමයි මේ රටේ ඉන්න අන්තිම දුප්පත්ම කොටස. මට මතකයි, එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව - රණසිංහ ප්‍රේමදාස ආණ්ඩුව - තිබියදී මේ රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 22ක් වුණා, ගොවියාගේ පංගුව. දැන් ඒක සියයට 8ට බැහැලා තිබෙනවා. ගරු අනුර කරුණාතිලක ඇමතිතුමනි, ඔබතුමාගේ දැන ගැනීමටත් එක්කයි මම මේක කියන්නේ. පසුගිය ආණ්ඩුවත් ඒකට වග කියන්න ඕනෑ. ගොවියාගේ පොහොර සහනාධාරය නැති කළා. ඒ කියන්නේ, අනෙක් අයට සාපේක්ෂව අපේ රටේ ගොවියා දුප්පත් වෙලා තිබෙනවා. අපේ රටේ ගොවිතැන තවම නවීකරණය කරලා නැහැ. මම ළඟදී ගියා මහවැලි ගම්මානවලට. ඒ ව්‍යාපාරයේ කුඹුරුවලින් ඉස්සර අක්කර දෙකහමාරෙන් වී කිලෝ 7,000ක් විතර අරගෙන තිබෙනවා. දැන් ගන්නේ 4,500යි. දැන් කියපු සංඛ්‍යාලේඛන මා සතුව තිබෙනවා. මේ සංඛ්‍යාලේඛනවලට අනුව 2020 අවුරුද්දේ හෙක්ටෙයාර් එකක ඵලදාව වී කිලෝ 4,821යි. ගිය අවුරුද්ද වෙනකොට ඒක 3,914ට බැහැලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් තමයි කිව්වේ, "අපි බොහොම උගත්, දන්නා කට්ටියක් ගෙනාවා මේ රටේ ආර්ථිකය හදන්න" කියලා. අපි ඒ කථාවට අගෞරව කරනවා නොවෙයි. නමුත් ගොවියාගේ ආර්ථිකය වැටිලා තිබෙන්නේ මෙහෙමයි. අපේ රටේ සියයට 26ක විතර ගොවි ජනතාවක් ඉන්නවා. රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කරන්න ගියාම රුපියල් බිලියන ගණනක් වෙන් කරනවා. මමත් හිටපු රාජ්‍ය පරිපාලන ඇමතිවරයෙක්. අපිත් රාජ්‍ය සේවකයන්ට වැටුප් වැඩි කළා. ඒ වාගේම ගොවියාගේ පංගුවත් වැඩි කරන්න ඕනෑ. ගොවියාගේ පංගුව තමුන්නාන්සේලා වැඩි කරලා නැහැ. අනෙක් අයගේ ඒවා වැඩි කරලා තිබෙනවා.

තමුන්නාන්සේලා වෙන දේවල්වලට දෙන ආධාර වැඩි කරලා තිබෙනවා. තමුන්නාන්සේලා ගොවියාට සහනාධාර විධියට අවුරුද්දටම දෙන්නේ රුපියල් බිලියන 31යි. මම ඒ කිව්වේ ගිය අවුරුද්දේ සංඛ්‍යාලේඛන. මේ අවුරුද්ද වෙනකොට වියදම තව වැඩිවෙලා තිබෙනවා. එදා රුපියල් 277ට තිබුණු ඩීසල් ලීටරය අද රුපියල් 407ක් වෙලා තිබෙනවා. සියයට 50කට කිට්ටු වෙන්න වැඩි වෙලා තිබෙනවා. ඉස්සර සීසෑමට ගත්තේ රුපියල් 20,000යි. දැන් රුපියල් 30,000ක් විතර ගන්නවා. ගොයම් පාගන්නත් එහෙමයි. යහ පාලන ආණ්ඩුව ගැන අපේ ඇමතිතුමා කිව්වා. හැම ගොවියෙකුටම සහනාධාරයක් විධියට ඕනෑම කඩේකින් ගන්න පුළුවන් විධියට පොහොර හොන්ඩරයක් රුපියල් 1,500කට දුන්නා. දැන් පොහොර ගන්න ඕනෑ ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් විතරයි. ඒවායේත් දැන් පොහොර නැහැ. එතැනත් පොහොර මිටියක් රුපියල් 10,000යි. පිටින් ගන්නවා නම් රුපියල් 16,000යි, 17,000යි. කොහොමද මේ විධියට ගොවියා ගොවිතැන් කරන්නේ? ඒක තමයි ගොවියා ගොවිතැනින් අයින් වෙලා තිබෙන්නේ. මේ එන කන්නය වෙනකොට පොහොර මිලයි, ඩීසල් මිලයි, ට්‍රැක්ටර් කුලියයි, බෙහෙත් මිලයි බැලුවාම අඩු තරමේ රුපියල් 120ක්වත් වැය වෙයි වී කිලෝ එකක් නිෂ්පාදනය කරන්න. දැන් වී මිල වැඩි කරන්න. තමුන්නාන්සේලා වී මිල වැඩි කරන්නේ නැහැ. තමුන්නාන්සේලා වී අළෙවි මණ්ඩලයට සල්ලි දෙන්නේ නැහැ වී ගන්න. තමුන්නාන්සේලා මොනවාද කරන්නේ? තමුන්නාන්සේලා ඉන්දියාවෙන් හාල් ගේනවා. කවදාවත් යල අස්වැන්න එන්න තිබියදී ඉන්දියාවෙන් හාල් ගේන්නේ නැහැ. මහා හොඳ අස්වැන්නක් රටේ තිබියදී එහෙම හාල් ගෙන්වන්නේ නැහැ. අපි අහන්නේ පොහොර සහනාධාරය ගැනයි. තමුන්නාන්සේලාට පුළුවන් නම් අපට කියන්න, මේ පොහොර සහනාධාරය වෙනුවෙන් තමුන්නාන්සේලා වෙන මොකක් හරි කරනවා ද කියලා. දැන් ලොකුම ප්‍රශ්නය තිබෙන්නේ වී ගොවියාට විතරයි.

ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලා මේ වී ගොවිතැන නවීකරණය කරන්න. තමුන්නාන්සේලාගේ එහෙම මොකුත් වැඩ පිළිවෙළක් නැහැ නේ. තමුන්නාන්සේලා කරන්නේ මොකක්ද? තමුන්නාන්සේලා ආණ්ඩුවේ ආදායම වැඩි කර ගන්න බලන්නේ, තිබෙන දේවල්වල බදු වැඩි කරලා. ඊට පස්සේ කියනවා, "අපි ආදායම වැඩි කළා." කියලා. තමුන්නාන්සේලා කිව්වා, "අපි ළඟ ඕනෑ තරම් සල්ලි තිබෙනවා, පිටරටින් වාහන ගෙන්වන්න ඕනෑ තරම් ණයවර ලිපි විවෘත කරන්න, අපි ළඟ සල්ලි තිබෙනවා" කිව්වා. මොකක්ද අන්තිමට වුණේ? අපේ කබීර් හෂීම් මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඩොලර් එක තමුන්නාන්සේලාට පාලනය කර ගන්න බැරි තැනකට ගෙනිච්චා. පසුගිය කාලයේ ආනයන සීමා කරලා තිබුණා. තමුන්නාන්නසේලා අපනයන වැඩි කළා ද කියලා මට කියන්න බලන්න? දැන් අවුරුදු දෙකකට කිට්ටු වෙනවා. පටන් ගත්ත එක ව්‍යාපෘතියක් කියන්න? පටන් ගත්ත එක කර්මාන්තශාලාවක් කියන්න? හදපු එක වැවක් කියන්න? තමුන්නාන්සේලා ඒවා මොකුත් කරලා නැහැ. අවුරුදු 76ක් තිස්සේ මේ රටේ පක්ෂ දෙකම වැඩ කළා. මම කියනවා අපි වැඩියෙන් වැඩ කළා කියලා. අපේ කෘෂිකර්ම විප්ලවයෙනුත්, කර්මාන්ත විප්ලවයෙනුත් කරපු නිෂ්පාදනවලට, ඒ ව්‍යාපාරිකයන්ට බදු ගහන එක විතරයි අද තමුන්නාන්සේලා කරන්නේ. *[බාධා කිරීමක්]* අපේ බිමල් රත්නායක මිත්‍රයා කථා කරනවා. එතුමා ඊයේත් බොහෝ උත්සාහ කළා, transport ගැන කථා කරන්න. අද බස් ගාස්තුත් වැඩි වෙලා තිබෙනවා. නේද, බිමල් රත්නායක ඇමතිතුමා? තමුන්නාන්සේලා බලයට ආපු දවස්වල වාගේ නොවෙයි, දැන් බස් ගාස්තු. ඒ වාගේම තමයි අවුරුද්දක් වෙනවා, තවම number plate එකක් ගන්න අපට බැරි වුණා. Number plates ගන්න කොච්චර කල් යාවිද දන්නේ නැහැ. ඔන්න, තමුන්නාන්සේලාගේ කාර්යක්ෂමතාව. එතුමා අහනවා, - *[බාධා කිරීමක්]* මම ගොවියා ගැන කථා කළේ. ගොවියා වෙනුවෙන් තමුන්නාන්සේලාගේ මැති ඇමතිවරු හිටියේ, කුඹුරට බැහැලා. ගොයම් කැවා එතුමන්ලා, මට මතක විධියට.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගොයම් කැවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔව්, ගොයම් කැවා. දැන් ඉතින් ගොයම් කන තත්ත්වයට තමයි පත් වෙන්නේ. අපි කියනවා පුළුවන් නම්, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අපේ දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාගේ කාලය මට ගන්න කිව්වා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමාගේ වෙලාව තිබෙනවා නේද තව?

අද තමුන්නාන්සේලා පුළුවන් නම් ගිහිල්ලා ගොවීන් මුණ ගැහෙන්න. අපේ හිතවත් ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. මොනරාගල දිස්ත්‍රික්කයේ ආර්ථිකයේ බොහොම ශක්තිමත් කොටසක් තමයි උක් කර්මාන්තය. උක් කර්මාන්තශාලා තුනක් තිබෙනවා. ඒවායේ

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

හත්අටදාහක් පමණ වැඩ කරනවා. මොනරාගල ගොවියෝ දැන් උක් ගස් ගලවනවා. නමුත්, නියම වෙලාවට ඒවාට මුදල් ගෙවන්නේ නැහැ. දැන් ලාභයක් නැහැ. උක් කර්මාන්තය කඩා වැටෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ, අපි එදා ආරම්භ කරපු කර්මාන්තශාලා. සෙවනගල පැත්තේ ආර්ථිකය ශක්තිමත් වුණා, සෙවනගල සීනි සමාගමෙන්; බුත්තල, වැල්ලවාය, පැල්වත්ත සීනි සමාගමෙන්. දුප්පත්ව තිබුණු සියඹලාණ්ඩුව දැන් ශක්තිමත්ව ඉන්නේ ඇතිමලේ සීනි සමාගම නිසා. තමුන්නාන්සේලා අද පිට රටින් සීනි ටික ගෙනෙනවා. අපි නිෂ්පාදනය කරනවා සියයට 15ක් විතර. තමුන්නාන්සේලා ඒක වහන තත්ත්වයට පත් කරලා තිබෙන්නේ.

මට මතකයි, ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා එක දවසක් කිව්වා, අපට පිට රටින් සීනි ගෙනෙන එක ලාභයි කියලා. ඉතින්, මේ සීනි කර්මාන්තශාලා වහන්න කටයුතු කරනවාද, පිට රටින් සීනි ගේනවාද, නැත්නම් ඒ කර්මාන්තශාලා ආරක්ෂා කරනවාද කියලා මම අහනවා. තමුන්නාන්සේලා උත්තරයක් දෙන්න. අපේ ගොවියෝ දැන් ඒකෙන් ටික ටික මේවායෙන් අයින් වෙනවා.

අනෙක් එක තමයි බඩ ඉරිඟු. අපේ මොනරාගල දිස්ත්‍රික්කයේ බඩ ඉරිඟු තිබෙනවා, උක් කර්මාන්තය තිබෙනවා, රබර් තිබෙනවා. රබර්වල මිල කොහොම වෙයිද කියලා මම දන්නේ නැහැ. ඩොනල්ඩ් ට්‍රම්ප්, ආනයන සඳහා ඉස්සර වෙලා සියයට 20ක බද්දක් පැනෙව්වා. දැන් තවත් සියයට 12.5ක බද්දක් පනවා තිබෙනවා. අපේ රබර්වලින් වැඩි ප්‍රමාණයක් යන්නේ ඇමෙරිකාවට. අපි දන්නේ නැහැ, රබර් මිලට ඒකෙන් බලපෑමක් ඇති වෙයිද කියලා. ඒ සම්බන්ධයෙන් ගන්න පියවර මොකක්ද කියලා අපි ආණ්ඩුවෙන් අහනවා. මිනිස්සු ජීවත් වෙන්නේ බොහොම අමාරුවෙන්. පසුගිය කාලයේ අස්වැන්න එන කාලයට තමුන්නාන්සේලා බඩ ඉරිඟුත් පිට රටින් ගෙනාවා. ඇයි එහෙම බඩ ඉරිඟු පිට රටින් ගෙනාවේ? ඒ ගෙනෙන බඩ ඉරිඟුවලින් කොටසක් යනවා molasses හදන්න, spirit හදන්න. ඒකෙන් ප්‍රශ්නය වෙන්නේ අපේ ගොවියාට. ඉතින් ඒවාට බද්දක් පනවන්න. කුකුළු කෑමවලට, පරිභෝජනයට තිබෙන බඩ ඉරිඟු ගැන අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් වැඩි කොටසක් යනවා, spirit හදන්න. කරුණාකරලා ඒවා පාලනය කරන්න. අඩු ගණනේ අවුරුද්දට ටොන් ලක්ෂ දෙකක්, දෙකහමාරක් විතර බඩ ඉරිඟු ගෙනෙනවා. ඒකෙන් පීඩා විඳින්නේ අපේ ගොවීන්. ඊයේ පෙරේදා බඩ ඉරිඟු මිල ටිකක් බැස්සා, තමුන්නාන්සේලා පිට රටින් ගෙනාපු නිසා. ඉතින් මම කියනවා, කරුණාකරලා ඒ ගොවියා ආරක්ෂා කරන්න කටයුතු කරන්න කියලා. තමුන්නාන්සේලාව බලයට ගෙන එන්න ඒ ගොවියෝ ඡන්දය දුන්නා. නමුත් ඒ ගොවීන්ට අද ඉන්න තැනින් පහළට බහින්න වෙලා තිබෙනවා.

මට පෙනෙන විධියට තමුන්නාන්සේලාගේ මේ ප්‍රතිපත්තිය නිසා එන යල කන්නය වෙනකොට වී කිලෝ එකක් රුපියල් 90ටවත් විකුණා ගන්න පුළුවන් වෙයිද දන්නේ නැහැ. ඒකට පියවරක් ගන්න. මට ආරංචි විධියට, පිට රටින් ගෙනාපු හාල් මෙට්‍රික් ටොන් එක්ලක්ෂ පනස්හයදාහක් තිබෙනවා. තමුන්නාන්සේලාගේ ගබඩාවලත් තිබෙනවාලු, වී කිලෝ ලක්ෂයක්. එහෙම වුණොත් අපේ ගොවියාට මොකද වෙන්නේ? කරුණාකරලා ඒකට පියවරක් ගන්න. *[බාධා කිරීමක්]* නැහැ, මා ළඟ මේ සංඛ්‍යාලේඛන තිබෙනවා. *[බාධා කිරීමක්]* පිට රටින් ගෙනාපු ඒවාද? තමුන්නාන්සේලා අප්‍රේල් මාසයේ ගෙනැල්ලා තිබෙනවා, මෙට්‍රික් ටොන් 64,581ක්; මැයි මාසයේ 91,256ක්. මෙට්‍රික් ටොන් 156,000ක් ගෙනැල්ලා තිබෙනවා. මේ සංඛ්‍යාලේඛන - *[බාධා කිරීමක්]* වී stocks නොවෙයි, පිට රටින් හාල් ගෙනාපු ඒවා. මම කනගාටු වෙනවා, සභානායකතුමා. මම සංඛ්‍යාලේඛන ටික එවන්නම්, අපේ ළඟ තිබෙනවා. මම කනගාටු වෙනවා. ඔබතුමා ඉතින් ගොවිතැන් ප්‍රදේශයක කෙනෙක් නොවෙයි නේ. ඔබතුමා කොළඹ ඉන්නේ. එහෙම නේද? කරුණාකරලා මේ වී ගොවීන් ආරක්ෂා කරන්න, අනෙක් ගොවීනුත් ආරක්ෂා කරන්න කටයුතු කරන්න.

මම ඉස්සර වෙලා කිව්වා, පොහොර සහනාධාරය ක්‍රමානුකූලව කපාගෙන යනවා කියලා. මේ රටේ ගොවීන්ට අවුරුදු 10ක් 15ක් තිස්සේ, හැම අවුරුද්දේම රුපියල් බිලියන 36ක්, 40ක් පොහොර සහනාධාර දුන්නා. නමුත් ගිය අවුරුද්දේ දීලා තිබෙන්නේ රුපියල් බිලියන 31යි. මේ අවුරුද්දේ ඒ ටිකත් නැහැ. ඒ නිසා කරුණාකරලා ගොවියා බේරාගන්න කටයුතු කරන්න.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
**(The Hon. Presiding Member)**

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.15]

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
**(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)**
**(The Hon. Asitha Niroshana Egoda Vithana)**

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරපු එල් නිනෝ තත්ත්වය සහ එහි පසු තත්ත්වය පිළිබඳ යෝජනාව සම්බන්ධයෙන් කරුණු දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

මධ්‍යම සහ නිවර්තන පැසිෆික් සාගරයේ මුහුදේ මතුපිට උෂ්ණත්වය ඉහළ යාම නිසා උෂ්ණත්වයෙන් ඉහළ තාප තරංග - උණුසුම් වායු ධාරා - ඉහළ වායුගෝලයට නිදහස් වීමත් එක්ක, ඒවා සාමාන්‍ය විධියට දකුණු ආසියානු පැත්තට හමා යනවා වෙනුවට දකුණු ඇමෙරිකානු කලාපයට ගලාගෙන යනවා. ඒ උණුසුම් වායු ධාරා ගලා යන කලාපයට අධික වැසි තත්ත්වයක් සහ ඒ උණුසුම් වායු ධාරා ගලා යා යුතුව තිබුණු දකුණු ආසියානු කලාපයට නියං තත්ත්වයක් වැනි විශේෂ දේශගුණික තත්ත්වයක් මතු වීම එල් නිනෝ තත්ත්වය විධියට සරලව පැහැදිලි කරන්න පුළුවන්. මේ හේතුවෙන් ආසියානු කලාපයට යම් නියං තත්ත්වයක් ඇති වීම සම්බන්ධයෙන් පුරෝකථනයක් තිබෙනවා. ඒ වාගේම ලෝකයේ සමහර කලාපවලට අධික වැසි සහ ගංවතුර තත්ත්වයන් ඇති වීම සම්බන්ධවත් පුරෝකථන තිබෙනවා. මෙවැනි තත්ත්වයකදී අපි වැනි රටක පූර්ව සූදානම මොන වාගේ විය යුතුද, ඒකට අනුව අපේ ආර්ථිකයේ වෙනස්කම් සිදු කරන්නේ කොහොමද, කටයුතු සූදානම් කරගන්නේ කොහොමද කියන එක පිළිබඳව සාකච්ඡාව තමයි අපි පාර්ලිමේන්තුව විධියට, වගකිව යුතු මහජන නියෝජිතයන් විධියට කළ යුතු වන්නේ. මේ සම්බන්ධයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරු අදහස් දැක්වුවා. හැබැයි, මෙවැනි බරපතළ යෝජනාවක් විපක්ෂය පැත්තෙන් මතු වෙද්දී, විපක්ෂ නායකතුමා එල් නිනෝ තත්ත්වය පිළිබඳව හරබර දේශනයක් මේ පාර්ලිමේන්තුවේ කරයි කියලා අපි බලාපොරොත්තු වුණා. පැසිෆික් සාගරයේ ජීවත්වන මත්ස්‍ය විශේෂ පිළිබඳව, මරියානා ආගාධයේ දිග, පළල, ගැඹුර පිළිබඳව, මත්ස්‍යයින් කන්න එන විශේෂ පක්ෂි වර්ගවල විශේෂත්වය පිළිබඳව යම් අධ්‍යාපනික තොරතුරු ප්‍රමාණයක් එතුමාගෙන් ලබා ගන්න අපි බලාපොරොත්තු වුණා. නමුත් එතුමා එල් නිනෝ තත්ත්වය ගැන කථා නොකර, එතුමාට ලැබුණු පෞද්ගලික ලියුම් දෙකක් මේ සභාවට ඉදිරිපත් කළා.

ඒ වාගේම රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා ඇහුවා, වාහනවල අංක තහඩු ගන්න පුළුවන් කවදාද කියලා. ගිය සතියේ වාහනවල අංක තහඩු ලබා දෙන්න පටන් ගත්තා, ගරු මන්ත්‍රීතුමනි. Bud කරපු වාහනයක් නොවෙයි නම්, බොඩි එක bud කරලා චැසියේ අංකය කොටපු ව්‍යාජ වාහනයක් නොවෙයි නම්, ඔබතුමාට පුළුවන් DMT එකට ගිහිල්ලා වාහනයේ අංක තහඩුව ඉල්ලා ගන්න. ගිය සතියේ ඒවා ලබා දෙන්න පටන් ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ එල් නිනෝ තත්ත්වය පිළිබඳව කථා කරනවා වෙනුවට බොහෝ විට ඉදිරිපත් වුණේ, ආණ්ඩුවට මේක කළමනාකරණය කරගන්න බැහැ; ඉදිරිය අපහැදිලියි, ආර්ථිකය බිඳ වැටිලා, මේක පාලනය කර ගන්න බැරි තත්ත්වයක් මතුවෙලා තිබෙනවා, අපට අත්දැකීම් නැහැ ආදී කරුණු. දස වැනි පාර්ලිමේන්තුව පුරාවටම මේ අඳෝනාව තමයි අපට විපක්ෂයෙන් ඇහෙන්නේ. ගිය සතියේ නවීන් දිසානායක හිටපු මන්ත්‍රීවරයා ප්‍රකාශයක් කර තිබුණා, මේ තත්ත්වයට මුහුණ දෙන්න රනිල්ගේ ඔළුවයි, සජිත්ගේ කඳයි සෙට් කරන්න ඕනෑ කියලා. රනිල්ගේ ඔළුවයි, සජිත්ගේ කඳයි කියලා එතුමා උපකල්පනය කළේ සජිත්ට ඔළුවක් නැහැ කියන එකද? ඒ විධියට තමයි ඔවුන් එක්කම හිටපු මන්ත්‍රීවරු ඔවුන්ව තක්සේරු කරන්නේ. ඒ අඳෝනාව ඇහෙද්දී අපට මතක් වෙනවා, පාසල් කාලය. A/L පන්තියේදීවත්; A/L පන්තියේ අන්තිම අවුරුද්දේදීවත් ගැහැණු ළමයෙක් සෙට් කරගන්න බැරිව ඉන්නකොට, 9 වසරේ කොල්ලෙක් ගැහැණු ළමයෙක් සෙට් කරගෙන කියලා දැනගත්තාම හද කකියන වේදනාවක් දැනෙනවා නේ. පොඩි එකෙකුත් කෙල්ලෙක් සෙට් කරගෙන, මම දැන් A/L, හෙට අනිද්දා ඉස්කෝලෙන් අයින්වෙන්න වෙනවා, නමුත් තවමත් මට ගැහැණු ළමයෙක් සෙට් කර ගන්න බැරි වුණා කියලා වේදනාවක් දැනෙනවා. පන්තියේ නායකකමත් දරලා තිබෙනවා; පාසලේ ප්‍රධාන ශිෂ්‍යනායකකමත් දරලා තිබෙනවා; ක්‍රීඩා උත්සවයේ නිවාස නායකකමත් දරලා තිබෙනවා; හැබැයි, ගැහැනු ළමයෙක් යාළු කර ගන්න විධියක් නැහැ. අන්න ඒ වාගේ අඳෝනාවක් තමයි මේ තිබෙන්නේ. කලින් බලය දරලා තිබෙනවා; බලයේ හිටපු පරම්පරාවල, පවුල්වල ඉඳලා තිබෙනවා; ඒ බලය රහ විඳලා තිබෙනවා; ඉතිහාසයේ විවිධ නායකකම් දරලා තිබෙනවා. හැබැයි, දැන් මිනිස්සු බලය දෙන්නේ නැහැ. බලය ගන්න බැහැ, ජනතාව ප්‍රතික්ෂේප කරලා. ඒ නිසා දුර්වල විපක්ෂයක් විධියට මේ අඳෝනාව නඟන එක හැරෙන්න වෙන මොනවාද මේගොල්ලන්ට කරන්න පුළුවන්? ඒ නිසා තමුන්නාන්සේලා ආණ්ඩුවට විරුද්ධව අවලාද නඟමින්, අතට අහුවෙන එකෙන් දමලා ගහනවා.

දැන් බලනවා, එල් නිනෝ එකෙන් කොහොමද පහර ගහන්නේ කියලා. මීට කලින් මැද පෙරදිග යුද තත්ත්වය පවතින අතර ඉරානයේ නැව එනකොට මෙතැන mike පැළුවා, නැවේ කිරිකැටි දරුවෝ 300ක් ඉන්නවා, ඒ දරුවන් ගන්නේ නැද්ද, ගන්නේ නැද්ද, නැවත් එක්ක විනාශ වෙනකන් ද ඉන්නේ කියලා. හැබැයි, අපි නැව භාර ගන්න කොට ඒ දරුවෝ වැඩිවියට පත් වෙලා, හමුදාවටත් බැඳිලා, සොල්දාදුවෝ විධියට තමයි වරායට ගොඩ බැස්සේ. ඒ තරම් කඩි කුලප්පුවක් තිබුණේ. අතට අහු වෙන එකෙන් දමලා ගහනවා, අන්තිමට ඇනගන්නවා. අදේශපාලනිකයි, අපරිණතයි, අත්දැකීම් නැහැ කියලා ආණ්ඩු පක්ෂයට චෝදනා කරන අය අපරිණත, අත්දැකීම් නැති, බාල වර්ගයේ දේශපාලන විවේචන සහිතව කටයුතු කරනවා කියන එක ඇස් පනාපිට ඔප්පු වුණා. දැන් එල් නිනෝ තත්ත්වය අරගෙන බලනවා, මොකක්ද කරන්න පුළුවන් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේගොල්ලන් මොනවාද නොකිව්වේ? අපට ලොවෙත් බලයට එන්න බැහැ කියලා නේ කිව්වේ. සියයට තුනේ අය ලොවෙත් බලයට එන්නේ කොහොමද ඇහුවා. අන්තිමට අපි තුනෙන් දෙකේ බලයක් අරගෙන නතර වුණේ, සියලු බලය සහිතව. බලය ගත්තාට පස්සේ කිව්වා, අපි ඉන්නේ මාස තුනයි, මාස හයයි කියලා. දැන් අපි නොදැවී අවුරුදු එකහමාරත් පහු කරලා තිබෙනවා. මාස තුනයි, මාස හයයි කියලා ගණන් හැදුවා. දැන් ඒ ගණන් හදන එක පොඞ්ඩක් නතර වෙලාද කොහේද තිබෙන්නේ.

ඒ වාගේම බොහොම නීරෝගී දේශපාලන සෞඛ්‍යයක් සහිතව එකම කණ්ඩායමක් විධියට අපි කටයුතු කරනවා. ඊට පස්සේ කිව්වා, අපට රාජ්‍ය පාලනය තේරෙන්නේ නැහැ කියලා. හැබැයි, ඉතිහාසයේ අදූෂිතම ආණ්ඩුව අපි හැදුවා. නාස්තියෙන්, දූෂණයෙන් තොර ආණ්ඩුවක් අපි දැන් හදලා තිබෙනවා. ඉතාම අල්පේච්ඡ ජීවිත ගත කරන මහජන නියෝජිතයෝ හදලා තිබෙනවා. ජනතාවගේ රුපියලක් නාස්ති නොකරන පාලනයක් හදලා තිබෙනවා. ඕනෑ තරම් ආණ්ඩු හදන්න පුළුවන්. හැබැයි, අදූෂිත ආණ්ඩු හදන්න බැහැ. ඒ අදූෂිත ආණ්ඩුව අපි හදලා තිබෙනවා.

අද පැය කිහිපයකට කලින් පළ වුණු පුවෘත්තිය මොකක්ද? ගෝලීය සාම දර්ශකයේ රටවල් 163ක් අතුරින් 67වැනි ස්ථානයට අපි ඇවිල්ලා තිබෙනවා. 2025දී එම දර්ශකයේ අපි හිටියේ 97වැනි ස්ථානයේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආසියාවේ ජීවත් වීමට සුදුසු, සාමකාමී රටවල් අතුරින් දෙවැනි රට අපේ රටයි. එක භූතානය, දෙක ශ්‍රී ලංකාව. අපරිණතයිලු; පාලනය තේරෙන්නේ නැහැලු; අත්දැකීම් නැහැලු; වසරක් ඇතුළත ගෝලීය සාම දර්ශකයේ රටවල් 30ක් පසුපසට යවා 67වැනි ස්ථානයට අපි ආවා. කොහොමද එහෙම කරන්නේ? අපරිණත නම් ඒක කරන්න පුළුවන්ද, දේශපාලනය නොතේරෙනවා නම් ඒක කරන්න පුළුවන්ද, ඒවා නිකම්ම එන තත්ත්වයන්ද? ලෝකයේ ජාතිවාදී යුද ගැටුම් ඇති වෙද්දී, දැවැන්ත ආර්ථික අර්බුද ඇති වෙද්දී, කලාපය තුළ දැවැන්ත ප්‍රශ්න ඇති වෙද්දී ලංකාව ඒ අස්ථාවර තත්ත්වයේ ඉඳලා ස්ථාවර තත්ත්වයට ගේන්නේ කොහොමද, සාමකාමී තත්ත්වයට ගේන්නේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඒ අයට අපි ඕනෑ තරම් උත්තර දීලා තිබෙනවා.

ඩී.වී. චානක මන්ත්‍රීවරයා ප්‍රකාශ කළා, තත්ත්වය බරපතළයි කියලා. මන්ත්‍රීතුමනි, ඔව්, අපට තේරෙනවා, තත්ත්වය බරපතළයි තමයි. සුරේෂ් සලේ කට ඇරියාට පස්සේ තත්ත්වය බරපතළයි තමයි. ඒ මන්ත්‍රීතුමා කියනවා, ඒ අය ආණ්ඩුවට විරුද්ධව එළියට බහින්නේ නැහැයි කියලා. එළියට බැස්සා, පිටකොටුවට 150ක් එකතු කර ගන්න බැහැ. හැබැයි කියන්න ඕනෑ, විමල් වීරවංශ මහත්මයා, ගම්මන්පිල මහත්මයා නම් අවංකවම ඒකට බැස්සා කියන එක. විමල් වීරවංශ මහත්මයාගේ මුළු පක්ෂයම පිටකොටුවට ගෙනාවා, ඔවුන් බැස්සේ වෑන් එකකින්. ගම්මන්පිල මහත්මයා ත්‍රී වීලර් එකකින් බැස්සා. මුළු පක්ෂයම බැස්සුවේ ඒ කණ්ඩායම් දෙක විතරයි. 150යි, අන්තිමට මොකද වුණේ? ආනන්ද විජේපාල ඇමතිවරයා සලේගේ පැටිකිරිය මෙතැනදී ප්‍රකාශ කරද්දී, අවසානයේ ඒ hut එක අකුළා ගෙන යන්න සිද්ධ වුණා. මහජන විරෝධය අන්න අද කොටුවට ඇවිල්ලා, හයට හැකිළුවා. අද මේ අයට මහජන බලයක් නැහැ. තත්ත්වය බරපතළයි තමයි, චානක මන්ත්‍රීතුමනි. බරපතළයි, භයානකයි. දැන් ඒ නිසා ඔබතුමන්ලා ආරක්ෂා වෙන්න මොකක් හරි කර ගන්න.

සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරපු කබීර් හෂීම් මන්ත්‍රීතුමා කිව්වේ මොකක්ද? ඩොලරය සම්පූර්ණයෙන්ම නැඟලාලු, රුපියල වැටිලාලු. මේගොල්ලන් 1977දී පටන් ගන්න කොට ඩොලරයේ අගය කීයද? රුපියල් 8.60යි. 1977 නොවැම්බර්වලට කලින් තිබුණේ රුපියල් 8.60යි. 1977

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

නොවැම්බර්වලින් පස්සේ රුපියල් 16යි. එක රැයින් 16 කළා. 1985දී ඩොලරය රුපියල් 27යි; 1990දී රුපියල් 40යි; 1994දී රුපියල් 49යි. ආණ්ඩුව භාර දෙනකොට රුපියල් 49යි, ගන්න කොට රුපියල් 8.60යි. ඔන්න, රට පාලනය කරපු විධිය. ඊට පස්සේ ඔහොම ඇවිල්ලා 2015දී ඩොලරය රුපියල් 131ට තිබියදී රට භාර ගත්තා. 2015දී බැහැලා යනකොට ඩොලරය රුපියල් 180යි. ඩොලරය බැස්සුවාද? රුපියල නැග්ගුවාද? නැහැ, වට්ටලා තිබෙන්නේ. 2018දී ඩොලරය රුපියල් 180යි; 2022දී රුපියල් 370යි; 2024 අගෝස්තුවලදී රුපියල් 300යි; 2025 ජනවාරි පටන් ගන්න කොට රුපියල් 298යි.

වසරකදී අපි සමත් වුණා, ඩොලරය රුපියල් 300ක සීමාවේ තබාගන්න. යුදමය තත්ත්වය වර්ධනය වෙද්දි පෙබරවාරි මාසයේදී තෙල්වලට ඩොලර් මිලියන 93ක් වැය වුණා. මැයි මාසයේදී එම ප්‍රමාණය ඩොලර් මිලියන 822ට වැඩි වෙද්දි ඒ තත්ත්වය පාලනය කර ගන්න අපට අභ්‍යන්තරව හැකියාවක් නැහැ. මොකද, ඒක ජාත්‍යන්තරයෙන් මතු වෙච්ච ප්‍රශ්නයක්. හැබැයි 2025 වසරේදී අපි සමත් වුණා, ඩොලරය රුපියල් 300 සීමාව ආසන්නයේ තබාගන්න. බාහිර යුද කම්පනයන් අපට වළක්වන්න බැහැ. නමුත් ඇයි ඒක සාධාරණ විවේචනයක් බවට පත් නොවන්නේ? ඇයි කුහක විධියට ඒ ගැන ප්‍රශ්න කරන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
රටේ අභ්‍යන්තර තත්ත්වයන් ඉතා හොඳින් ශක්තිමත් කරලා, පරිපාලනය ශක්තිමත් කරලා, වංචා දූෂණ නතර කරලා, අභ්‍යන්තර දේශපාලන සංස්කෘතියක් ගොඩනගලා අපි ඒ ආදර්ශය දීලා රටේ ආර්ථිකය වේගයෙන් ඉහළට අරගෙන මේ තත්ත්වයට ඔරොත්තු දෙන මට්ටමේ රටක් ගොඩනගලා තිබෙනවා. එම නිසා එල් නිනෝ තත්ත්වය ඇතිවන්න පෙර අපි ඒ උපාය උපක්‍රම සකස් කරමින්, ඊට අදාළ කරන පෙර සූදානම ඇති කරමින්, ජනතාවට එයින් අවම හානියක් වන විධියේ රාජ්‍ය පාලනයක් සඳහා ඒ පරිණතභාවය සහිත ආණ්ඩුව අපි දැන් ගොඩනගලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.27]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව ගැන අදහස් ඉදිරිපත් කරන්න කලින් මම මේ කාරණය කියන්න ඕනෑ. මම ඊයේ දවසේ දැක්කා, මේ පාර්ලිමේන්තුව තුළ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කරන චෝදනා. විශේෂයෙන්ම ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමතිවරයෙක් විපක්ෂ නායකතුමාට කියනවා, "AI සජිත්" කියලා. මම දැක්කා, පාර්ලිමේන්තුවේදී විපක්ෂ නායකවරයාට දිගින් දිගටම ඒ චෝදනාව කරනවා. පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 'ආ' කොටසේ අංක 4 යටතේ පැහැදිලිව තිබෙනවා, පාර්ලිමේන්තුව තුළදී, ඒ වාගේම සභා ගර්භයේදී, කාරක සභාවකදී මන්ත්‍රීවරයකුට නින්දා අපහාස, බාධා කරන්න බැහැ කියලා. මේ අවස්ථාවේදී මා පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ ඊට අදාළ කොටස ඇතුළත් ලේඛනයකුත්, අද "දිනමිණ" පත්තරයේ තිබෙන ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා කරපු ප්‍රකාශය ඇතුළත් පිටුවත් **සභාගත*** කරනවා.

ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී කරපු ප්‍රකාශය "දිනමිණ" පත්තරයේ ඒ විධියටම පළකොට තිබෙනවා. පාර්ලිමේන්තුව තුළදී විපක්ෂ නායකතුමාට ඒ විධියට අපහාස කරන්න බැහැ. එතුමාගේ නම කියලා ඕනෑ විධියකට කථා කරන්න පුළුවන්. හැබැයි, "AI" කියන එක අපට තේරෙන්නේ නැහැ. ආණ්ඩුව පැත්තේ කිසිම මන්ත්‍රීවරයෙකුට, ඇමතිවරයෙකුට, ජනාධිපතිතුමා ඇතුළු අගමැතිතුමියට අපි කවදාවත් එහෙම අපහාස කරන්නේ නැහැ. අපි හැම කෙනෙකුටම, "ගරු" කියලා ඒ දෙන්න තිබෙන උපරිම ගරුත්වය දීලා තමයි කථා කරන්නේ. එම නිසා මා කියනවා, එහෙම කරන්න එපා කියලා. *[බාධා කිරීමක්]* විපක්ෂ නායකතුමා නොවෙයි, කිසිම කෙනෙකුට ඒ චෝදනාව කරන්න එපා. අපි එහෙම කරන්නේ නැහැ. එහෙම කරන උදවියත් ඇති. ඒ අයත් එක්ක සුහදව කථා කරන්න පුළුවන්, ඇයි මන්ත්‍රීතුමා එහෙම ප්‍රකාශ කරන්නේ කියලා. විශේෂයෙන්ම ඒ පිළිබඳව පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේම තිබෙනවා. මම ඒ කොටස සභාගත කළේ ඒ නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවේ තිබුණේ රටේ වර්තමාන තත්ත්වය ගැන. විශේෂයෙන්ම ගොවි ජනපදයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මම පොඩ්ඩක් මතක් කරලා දෙන්න ඕනෑ, අද රටේ තත්ත්වය ගැන. අද අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අහස උසට ගිහිල්ලා තිබෙනවා. මේවා තමයි අපි පාර්ලිමේන්තුවේ කථා කරන්න ඕනෑ. විපක්ෂය කරන දේවල් මෙතැන කියලා වැඩක් නැහැ. විපක්ෂය මෙහෙම හැසිරුණා, අරහෙම හැසිරුණා, මෙහෙම දේවල් කිව්වා කියලා වැඩක් නැහැ. මොකද, ජනතාවට මේවා වැඩක් නැහැ. ජනතාව ඔබතුමන්ලාට අසීමිත බලයක් ලබා දුන්නේ මේ රටේ තිබෙන දැවෙන ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන්න. ඔබතුමන්ලා බලයට එන්න කලින් මේ රට වැටිලා තිබෙන තත්ත්වය ගැන බොහොම අවබෝධයෙන් කථා කළා. ඒවාට විසඳුම් ලබාදෙන්න පුළුවන් කිව්වා. එහෙම නම් එදා මැතිවරණ වේදිකාවේ කියන්න තිබුණා, “මේ රට විනාශ වෙලා තිබෙන්නේ, මේ රට වැටිලා තිබෙන අගාධයෙන් ගොඩගන්න අමාරුයි, අපට අවුරුද්දකට බලය දෙන්න” කියලා. හැබැයි, ඔබතුමන්ලා එහෙම කිව්වේ නැහැ. ඔබතුමන්ලා එහෙම කියන්නේ නැතුව බලයට ඇවිල්ලා සියලු වරප්‍රසාද භුක්ති විඳිමින් අද කියනවා, විපක්ෂය හින්දා තමයි මේ තත්ත්වය ඇති වුණේ කියලා.

නමුත්, ජනතාව ඒ ගැන දැනගෙන හිටියා. ඒ නිසාම තමයි වත්මන් ජනාධිපතිතුමාට බලය ලබා දීලා, පාර්ලිමේන්තු මැතිවරණයෙන් 159දෙනෙක් මේ උත්තරීතර සභාවට එව්වේ. ඒ නිසා අද විපක්ෂයට චෝදනා කරලා වැඩක් නැහැ.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

2024දී සීනි කිලෝවක් රුපියල් 190යි; අද රුපියල් 240යි. ගෑස් සිලින්ඩරයක මිල කීයද? ගෑස් සිලින්ඩරයක් 2024දී රුපියල් 3,780යි; අද රුපියල් 6,370යි. කිරි පිටි ග්‍රෑම් 400 පැකැට්ටුවක මිල 2024දී රුපියල් 870යි; අද රුපියල් 1,200යි. කරවල කිලෝවක් 2024දී රුපියල් 800යි; අද රුපියල් 1,500යි. ජනතාවට සහන ලබා දෙනවා කියලා ඔබතුමන්ලා ජනතාව පැත්තේ ඉඳගෙන කථා කරලා ආවේ මෙන්න මේවා තමයි කියන එක පැහැදිලි කරලා දෙන්නයි මම මේ හදන්නේ.

බලන්න, අද පොහොර මිටියක මිල කීයද කියලා. 2024දී පොහොර මිටියක් රුපියල් 8,000යි; අද රුපියල් 18,000යි. MOP පොහොර මිටියක් 2024දී රුපියල් 9,000යි; අද රුපියල් 14,000යි. TSP පොහොර මිටියක් 2024දී රුපියල් 10,000යි; අද රුපියල් 14,000යි. මෙන්න මේවා තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විපක්ෂයක් විධියට පෙන්වා දෙන්නේ. මොකද, සහන ලබා දෙනවා කියලා ජනතාවට පොරොන්දු දීලා තමයි ඔබතුමන්ලා බලයට පත් වුණේ. අද වනකොට ජනතාව නොමැරී මැරෙනවා. විශේෂයෙන්ම අද වනකොට ජනතාවට ජීවත් වෙන්න අමාරුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජය නිර්දේශ කරනවා, හෙක්ටෙයාරයකට යූරියා කිලෝ 225ක් අවශ්‍යයි කියලා. එතකොට යූරියා කිලෝ 225ක් හෙක්ටෙයාරයකට - අක්කර දෙකහමාරකට - අවශ්‍ය නම් ගොවියාට ඒ සඳහා රුපියල් 83,250ක් වැය වෙනවා. එතකොට, පොහොර සහනාධාරය වශයෙන් හෙක්ටෙයාරයකට රුපියල් 30,000ක් දෙනවා. දැන් මේ සහනාධාරය සමහර ගොවීන්ට ලැබිලා තිබෙනවා. නමුත්, සමහර ගොවීන්ට ලැබිලා නැහැ. එතකොට මේ ලැබුණු පොහොර සහනාධාරය එක්ක ගොවියා කොහොම හරි මඩ වැඩත් කරලා, දැන් මාසයකටත් වැඩි කාලයක් කුඹුරත් එක්ක ගැටිලා යම්කිසි තැනකට ඇවිල්ලා තිබෙනවා නේ. එතකොට මහ කන්නයේ වීවලට අද වනකොට මොනවාද වෙලා තිබෙන්නේ? මහ කන්නයේ වීවලට අද වනකොට මිලක් නැහැ. අපේ මහ ලේකම් ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා, මහ කන්නයේ අස්වැන්න අද ගෙවල්වල තියාගෙනයි ඉන්නේ කියලා. මොකද අස්වැන්න ගෙවල්වල තියාගෙන ඉන්නේ? ගරු සභානායකතුමනි, මැයි මාසය පහු වනකොටත් නාඩු හාල් කිලෝවක් රුපියල් 125ට, රුපියල් 130ට දුන්නා. සියයට 14ක ප්‍රමිතියට තිබෙන වේළපු වී ටික තමයි ඒ මිලට දුන්නේ. අද වී කිලෝවක් කීයද? රුපියල් 90යි, 95යි. එතකොට ඔබතුමන්ලා වේදිකාවල වාගේම මේ පාර්ලිමේන්තුවේදී පොරොන්දු දෙමින් කිව්වා, හාල් ඇටයක්වත් පිට රටින් ආනයනය කරන්නේ නැහැ කියලා. හාල් පිට රටින් ගෙනෙන්න ඕනෑ තමයි. හාල් පිට රටින් ගෙනෙන්න ඕනෑ වෙලාවට ගෙනෙන්න ඕනෑ. හැබැයි, වැරදි වෙලාවට හාල් පිට රටින් ගෙනාපු නිසාම තමයි අද මහ කන්නයේ වී ටික විකුණා ගන්න බැරි වෙලා තිබෙන්නේ.

අද වනකොට යූරියා මිටියක් ගන්න වී ගෝනි තුනක් විකුණන්න සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම තව මාසයකින්, එකහමාරකින් විතර යල කන්නයේ අස්වැන්න නෙළනවා. එතකොට තෙත වීවලට කොහොමත් මිලක් නැහැ. හැබැයි, රජය වේළපු වීවලට රුපියල් 120ක සහතික මිලක් ලබා දුන්නා. දැන් ඒ ගැන කථාවකුත් නැහැ. එතකොට ගොවියා අපෙන් අහනවා, වේළපු වී කිලෝවකට රුපියල් 120ක සහතික මිලක් ලබා දීලා තිබියදී, වී කිලෝවක් මිලදී ගන්නේ රුපියල් 90ට, 95ට නම් අපි මේවා කාටද විකුණන්නේ කියලා. යල කන්නයේ නෙළන අස්වැන්න ගත්තොත්, මම හිතන විධියට, තෙත වී කිලෝවක් රුපියල් 80-85 අතර වෙයි. එතකොට මේ ගොවීන්ට අත් වන තත්ත්වය මොකක්ද? ගොවියා අද වනකොට කොතැනටද වැටිලා තිබෙන්නේ?

මේ රටේ ජාතික ආර්ථිකයට ශක්තියක් ලබා දෙන ගොවියා සම්බන්ධයෙන් අද වනකොට රජය විධියට ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ මොකක්ද? ඒ නිසා තමයි මම නිරන්තරයෙන්ම මේ පාර්ලිමේන්තුවේදී කියන්නේ, ඔබතුමන්ලාට ගොවියා සම්බන්ධයෙන් විශේෂ වැඩ පිළිවෙළක් තිබෙනවා නම් අඩුම ගාණේ මේ යල කන්නයේ අස්වැන්න නෙළන්න කලින් ඒක ගොවියාට කියන්න කියලා. එතකොට ගොවියා මොකක් හරි විකල්පයක් හොයා ගනීවි. එහෙම නැති වුණොත් ණය බරින් ඉන්න ගොවීන් සතුව තිබෙන ගෙවල් ගමේ ඉන්න පොලී මුදලාලිට සින්න වෙලා, බැංකුවලට සින්න වෙලා ඔවුන්ට උන් හිටි තැනුත් නැති වෙලා යාවි. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කරන්න කියලා මම කියනවා.

මම මේ සභාවට ඇවිල්ලා කිව්වා, පොළොන්නරුවේ, උතුරු මැද පළාතේ ගොවියාට වෙච්ච ඉරණම මොකක්ද කියන එක. හැබැයි, ඒ ගැන කියලා මේ සභාවෙන් එළියට යන්න මට ලැබුණේ නැහැ, අපේ පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්ම කියනවා, කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා වරප්‍රසාදවලට මුවා වෙලා බොරු කියනවා කියලා. මම ඒ මන්ත්‍රීතුමාට පහුවෙනිදාම අභියෝග කළා, පුළුවන් නම් අපේ ගොවි ජනපදවලට ඇවිල්ලා, ගොවි සංවිධාන ටික කැඳවලා, ඔබතුමා කිව්ව දේ පොඩ්ඩක් නිවැරදිද කියලා කියන්න කියලා. මම කිව්ව දේ බොරුවක් නම් ගොවි සංවිධාන තීරණය කරයි, කිංස් නෙල්සන් මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට මුවා වෙලා බොරු කියනවා කියලා. මම මේ සභාවට ඇවිල්ලා මේවා කියන්නේ ඒ ගැන අපි එළියේදී කථා කරන්නේ නැති නිසායි. මෙතැන තමයි අපට ඒවා ගැන කියන්න තිබෙන තැන. ඒ නිසා මේ පාර්ලිමේන්තුව තුළදී අපි යම්කිසි දෙයක් කියනවා නම් වගකීමක් ඇතුව තමයි ඒවා කියන්නේ. එහෙම නැතුව මම කවදාවත් පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට මුවා වෙලා කිසිම කෙනෙකුට චෝදනා කරලා නැහැ. එහෙම කරන්න බලාපොරොත්තුවකුත් නැහැ. ජනතාව මට ඡන්දය දීලා පාර්ලිමේන්තුවට එවලා තිබෙන්නේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, මේ රටේ සමස්ත ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරන්නයි. ඒ ප්‍රශ්න ගැන කිව්වාම ආණ්ඩුව පැත්තේ අය ඒක වැරැදි විධියට දකිනවා නම් මට ඒකට කරන්න දෙයකුත් නැහැ කියන එක මම කියනවා.

අලි-මිනිස් ගැටුම ගැනත් මම කියන්න ඕනෑ. අලි-මිනිස් ගැටුම අවසන් කරන්න ඔබතුමන්ලා ගත්ත උත්සාහය වරදක් කියලා මම කියන්නේ නැහැ. ඒ කටයුත්ත කිසිම රජයකට කර ගන්න බැරි වුණා. හැබැයි, ඔබතුමන්ලාට ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් තිබෙනවා කියලා ඔබතුමන්ලා මුලදී කිව්වා නේ. මම කියන්නේ ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියායි. එදා ඔබතුමන්ලාගේ මැතිවරණ ජයග්‍රහණයත් එක්ක, අලි එහෙට පන්නනවා, මෙහෙට පන්නනවා, රිළවු ගණන් කරනවා වාගේම විශාල වියදමක් දරලා ඒ වෙනුවෙන් ලොකු වෙහෙසක් දැරුවා වාගේ දෙයක් TV එකේ පෙන්වනවා මම දැක්කා. ඒ වාගේම ගුවන් විදුලියේත් ඒ සම්බන්ධයෙන් කියනවා මම අහගෙන හිටියා. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දවස් කිහිපය ගත්තාම, 6වැනි දා ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වයස අවුරුදු 80ක අම්මා කෙනෙකු තමන්ගේ ගෙදර මිදුලේදීම උදේ 9.00ට විතර අලියෙක් පහර දීම නිසා මිය ගියා. එදිනම ඒ ගමේම වයස අවුරුදු 60ක තාත්තා කෙනෙක් - ගොවි මහත්මයෙක් - ඔහුගේ නිවස ඉදිරියේදීම අලියෙක් පහර දීම නිසා මිය ගියා. ඒ වාගේම එදින ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේම කුඹුරට ගිය ගොවි

[ගරු කිංස් නෙල්සන් මහතා]

මහත්මයෙකු අලියෙක් පහර දීම නිසා තුවාල වුණා. ඊයේ දවසේ මනම්පිටිය පාලම ළඟ පාර අයිනේ හිටපු අහිංසක මනුස්සයෙකු අලි පහර දීම නිසා මිය ගියා. දිගින් දිගටම මේ සිද්ධිය සිදු වෙනවා. එක පැත්තකින් අලි මැරෙනවා. අනෙක් පැත්තෙන් අපේ මිනිස්සු ඝාතනය වෙනවා; දේපළ හානි වෙනවා. මේකට මොකක් හරි විකල්පයක් අපි යොදන්න වෙනවා. මේක දිගින් දිගටම සිදු වෙනවා; අපිත් දිගින් දිගටම මේක ගැන කියනවා. නමුත්, කිසිම කෙනෙක් මේකට ඇහුම්කන් දෙන්නේ නැහැ. මේ ගැන අඩුම ගණනේ ප්‍රකාශයක්වත් කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වන අලියෙක් පහර දීලා කවුරුන් හෝ මිය ගියොත් රුපියල් ලක්ෂ දහයක් දෙනවාය කියනවා. ඒ රුපියල් ලක්ෂ දහය ගන්න මම හිතන විධියට මාස ගණනාවක් ගත වෙනවා. සල්ලි නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. එක පැත්තකින් මේ අලි මැරෙන එක නවත්වන්න වෙනවා. අනෙක් පැත්තෙන් මිනිස්සු ඝාතනය වන එක නවත්වන්න වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, මේ සම්බන්ධව කටයුතු කරන්න වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් සිවිල් ආරක්ෂක නිලධාරින් 5,000ක් අනුයුක්ත කළ බව. ඒ විධියට පොලීසියටත් අනුයුක්ත වුණා. ඒ වාගේම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත් අනුයුක්ත වුණා. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත වුණු ඒ සිවිල් ආරක්ෂක නිලධාරින්ට රුපියල් 25,200ක් දීමනාවක් විධියට ලබා දෙනවාය කිව්වා. ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමනි, පොලීසිවලට අනුයුක්ත වුණු අයට ඒ දීමනාව ලබා දෙනවා. හැබැයි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත වුණු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන්ට ඒ දීමනාව මෙතෙක් ලබා දීලා නැහැ. ඒ අයගෙන් බොහෝදෙනා දැන් සේවය අත්හැර දාලා ගිහිල්ලා තිබෙනවා. විශ්‍රාම යෑමේ වයසට ආසන්න වෙච්ච සමහර අය ඉන්නවා. මම දන්නවා, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විශ්‍රාම යෑමට තව අවුරුද්දක හෝ දෙකක කාලයක් තිබුණු අය දැන් සේවය අත්හැර දාලා ගිහිල්ලා තිබෙන බව. ඒගොල්ලන් කියනවා, "මන්ත්‍රීතුමා, අපට මේක කරන්න බැහැ, අපිට සේවයට යන්න මෝටර් බයිසිකලයට තෙල් ගහගන්න තරම්වත් සල්ලි නැහැ" කියලා. මෙන්න මේවා තමයි අපි විශේෂයෙන්ම පෙන්වා දෙන්න උත්සාහ කරන්නේ.

ඒ වාගේම මම කියන්න ඕනෑ, මෙතැනදී අපේ විපක්ෂ නායකතුමාට චෝදනා කරලා වැඩක් නැහැ කියන එක. විපක්ෂ නායකතුමා සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා නම් අපි ඒක බලා ගන්නම්. එක්සත් ජාතික පක්ෂයෙන් යම් ප්‍රකාශ කරනවා නම් ඒවා ගැන අපි ඒගොල්ලන් එක්ක කථා කරලා බේරා ගන්නම්. හැබැයි, ඒවා ආණ්ඩුව පැත්තෙන් පෙන්වා දීමේ අවශ්‍යතාවක් නැහැ. ජනතාව ඒවාට ඇහුම්කන් දෙන්නේත් නැහැ. ජනතාවට ඊට වඩා ප්‍රශ්න තිබෙනවා, මේ මහ පොළොවේ. ඒ නිසා ඔබතුමන්ලා මේ රටේ ජනතාවට දුන්නු පොරොන්දු ටික ඉෂ්ට සිද්ධ කරලා දෙන්න වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ තිබෙන දැවෙන ප්‍රශ්නවලට අපිට විසඳුම් ටික ලබා දෙන්න වෙනවා. පසුගිය කාලයේ ඔය වාගේ දේවල් කරලා ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට සිද්ධ වුණේ මොකක්ද කියන එකත් අපි සියලුදෙනාම දන්නවා නේ. ඉතින්, ඔබතුමන්ලාට තව කාලයක් තිබෙනවා. කවුරුවත් කියන්නේ නැහැ, හෙට ඡන්දයක් තියලා අපට ඡන්දය දීලා මේක කරන්න බලය දෙන්න කියලා. ඔබතුමන්ලාට තව දීර්ඝ කාලයක් තිබෙනවා. අපි විපක්ෂය විධියට ඉල්ලා සිටින්නේ ඔබතුමන්ලා දුන්නු පොරොන්දු ටික ඉෂ්ට කරලා, විශේෂයෙන් මේ රටේ ගොවි ජනතාවට සාධාරණයක් ඉෂ්ට සිද්ධ කරලා දෙන්න කියන එකයි. අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.40]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කළා, අපට තව දීර්ඝ කාලයක් තිබෙනවා කියලා. ඔව්, වසර ගණනාවක් කැප කිරීම් කරලා මේ ජයග්‍රහණය ගත්තේ මේ රටේ දුක් විඳපු ජනතාවගේ ඒ දීර්ඝ කාලීන ප්‍රශ්න ටික විසඳන්න මිසක් ආපස්සට හැරෙන්න නොවෙයි කියන එක අපි මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම අපේ කබීර් හෂීම් මන්ත්‍රීතුමා මේ ඉදිරිපත් කළ යෝජනාව ආරම්භ වෙන්නේ, "පවතින අයහපත් ආර්ථික කළමනාකරණය, නිවැරදි දත්ත මත පදනම් වූ පුරෝකථනයන්හි අඩු පාඩු සහ ප්‍රමුඛතා මත ක්‍රියා නොකිරීම..." යනුවෙන්. අයහපත් ආර්ථික කළමනාකරණයක් ඉතිහාසයේ කවුද පවත්වාගෙන ආවේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? 2024න් එහා ඒ පවත්වාගෙන ආපු අයහපත් ආර්ථික කළමනාකරණයේ ප්‍රතිඵලය, ඒ අභාවාචික අත්දැකීම් තමයි මේ රටේ ජනතාව දැනුත් මේ භුක්ති විඳින්නේ. දැනුත් මඩ ගොහොරුවල, සමහර තැන්වල මේ රටේ ජනතාවට ලගින්න සිද්ධ වෙලා තිබෙන්නේ ඉතිහාසයේ ඒ අභාවාචික, අයහපත් ආර්ථික කළමනාකරණය නිසාය කියන එක අපි මේ මොහොතේදී කියන්නට ඕනෑ. මේ රටේ ජනතාව භුක්ති විඳිමින් සිටි, ඉතිහාසයේ වසර 76ක අයහපත් ආර්ථික කළමනාකරණයේ ප්‍රතිඵල තමයි අපි 2024 ඉඳලා ක්‍රමානුකූලව වෙනස් කරමින් ඉන්නේ කියන එකත් මේ මොහොතේදී මතක් කරලා දෙන්න ඕනෑකම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කළ කබීර් හෂීම් මන්ත්‍රීතුමා මේ වෙලාවේ සභාවේ හිටියා නම් හොඳයි. මේ යෝජනාවත් යල් පැනලා තිබෙන්නේ. මොකද අයහපත් ආර්ථික කළමනාකරණය තිබුණේ අපේ නොවෙයි නේ. අපි පසුගිය මාස 20ක් ඇතුළේ යහපත් කළමනාකරණයක් පෙන්වපු හින්දා නේ 2025 අවුරුද්දේ අදූෂිත රටවල් අතරින් රටවල් 14ක් අබිබවා අපි ඉස්සරහට ආවේ. ඒක නේ යහපත් කළමනාකරණය. ඒක නේ රටවල් 14ක් පහු කරගෙන අපි ඉස්සරහට එන්නේ. අන්න, යහපත් කළමනාකරණය.

අපි දැක්කා විපක්ෂයේ ඉන්න බොහෝදෙනෙකු 2022-2023 කාලයේදී අයහපත් කළමනාකරණය ඇතුළේ පොහොර නැවක් ගෙන්වා ගන්න බැරිව ඩොලර් හිඟා කෑවා. බිඳ වට්ටපු ආර්ථිකය ඇතුළේ 2022-2023 කාලයේදී තෙල් නැවක් ගෙන්වා ගන්න බැරිව ඩොලර් හිඟා කාපු ආණ්ඩුවක් හිටියේ. තැන් තැන්වල අගුපිල්වල ලැගලා දැන් එක තැනකට ගාල් වෙලා අපේ ආණ්ඩුව අප්‍රසාදයට පත් කරන්න හදනවා වර්තමානයේදීත්, මේ මොහොතේ මේ යෝජනාව ගෙනැල්ලා. මේ යෝජනාව ගේන්නේ මොකටද? එල් නිනෝ තත්ත්වය ගැන කථා කරන්න. නමුත් දැන් එල් නිනෝ තත්ත්වය ගැන කථා කරන්නේ නැහැ. අපි

ආණ්ඩුවක් විධියට එල් නිනෝ තත්ත්වයට මැදිහත් වෙන්න, අපේ රටේ ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් මැදිහත් වෙන්න ආහාර සුරක්ෂිතතා කමිටුව රැස්වෙලා තීන්දු තීරණ ගත්තා. අපි ඒකට ආරම්භයක් තිබ්බා, ඒ අනතුර අපි වේලාසනින් දැක්කා. ඒ අනතුර වේලාසනින් දැකපු නිසා තමයි 2025 අවුරුද්දේ අවසානයේ ආව "දිට්වා" හානිය සඳහා භාණ්ඩාගාරයෙන් කෝටි 87,000කට වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කරලා රට යථාවත් කරන්න මැදිහත් වෙන්න හැකි වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර කථා කළ මන්ත්‍රීවරු කිව්වා අපේ රටට හාල් ආනයනය කරලා තිබෙන එක ගැන. ඔව්, අපි දන්නවා පසුගිය ඉතිහාසය පුරාවට, පසුගිය ආණ්ඩු කාලයේ ගොවියාට හරියට සහනාධාර ටික හම්බ වුණේ නැහැ කියලා. රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා මේ වෙලාවේ සභාවේ හිටියා නම් හොඳයි. එතුමා කථා කරලා පැනලා ගිහිල්ලා. ගොවි ජනතාවගේ පොහොර සහනාධාරය කප්පාදු කළා කියලා එතුමා කිව්වා. කෝ දැන් එතුමා? නැහැ. 2024දී අපි බලයට එන විට, අපි ජයග්‍රහණය කරනකොට හෙක්ටෙයාර එකකට පොහොර සහනාධාරය දුන්නේ රුපියල් 15,000යි. ඒ 15,000 අපි 2024දී රුපියල් 25,000 දක්වා වැඩි කළා, රුපියල් 10,000කින්. ලෝක යුදමය තත්ත්වයක් ආවා. අපි දැනගත්තා ඒ යුදමය තත්ත්වය තුළ මේ රටේ ජනතාවට අමාරුයි, ගොවි ජනතාවට අමාරුයි, මේ රටේ ජනතාවට ඩීසල්වලට සහනාධාරයක් දෙන්න ඕනෑ, පොහොරවලට සහනාධාරයක් දෙන්න ඕනෑ කියලා. ඒ තත්ත්වය තුළ අපි හෙක්ටෙයාර එකකට රුපියල් 25,000ක් තිබුණු පොහොර සහනාධාරය තවත් 5,000කින් වැඩි කරලා 30,000ක් දුන්නා; සියයට 100කින් වැඩි කරලා තිබෙනවා. කෝ, දැන් ඒ මන්ත්‍රීතුමා?

ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා එළියේ කථා කරන්නේ නැහැ, පාර්ලිමේන්තුවට ඇවිල්ලා තමයි මේවා කියන්න තිබෙන්නේ කියලා. ඇයි, එළියේ කථා කළොත් සමහර ඒවාට දාන්න වෙන්නේ නඩු නේ; එළියේ කථා කළොත් ක්‍රියාත්මක කරන්න වෙන්නේ නීතිය. පාර්ලිමේන්තුව බොරු කියන තැනක්, බොරු පිඹින තැනක් බවට පොදු විපක්ෂය විසින් පත් කරගෙන තිබෙනවා; ඒ තැනට පත් වෙලා තිබෙන්නේ.

රටේ කිරි සම්බා අවශ්‍යතාව සම්පූර්ණ කරන්න අපේ රටේ ගොවි ජනතාව තවම හරියට පෙලඹිලා නැහැ. මොකද, 2024ට පෙර ගොවීන්ව අධෛර්යවත් කළා. ඒක නිසා කිරි සම්බා වගාවෙන් ගොවි ජනතාව ඈත් වුණා. කිරි සම්බාවලට ගොවියාට හරියට මිලක් හම්බ වුණේ නැහැ; සහනයක් හම්බ වුණේ නැහැ. ඒ නිසා කිරි සම්බා වගාවෙන් ගොවි ජනතාව ඈත් වුණා. දැන් ගොවීන් ටික ටික කිරි සම්බා වගා කරන්න පටන් අරගෙන තිබෙනවා. මේ මොහොතේ රටේ අවශ්‍යතාව සම්පූර්ණ කරන්න කිරි සම්බා වෙනුවට අන්න, අදේශකයක් ගෙන්වූවා. එහෙම නැතුව, අපේ රටේ වී ගොවියා අනාථ කරන්න නොවෙයි එහෙම කළේ. සමස්ත ලංකා ගොවිජන සම්මේලනය විධියට අපි ගොවියා එක්ක පාරේ සටන් කළේ, ගොවියාගේ වී මිල වෙනුවෙන්, පොහොර සහනාධාර වෙනුවෙන් සහ ගොවියාට පහසුකම් දෙන්නයි. අපි ගොවියාගේ දුක හොඳට හඳුනන, ප්‍රශ්න ටික හොඳට හඳුනන ආණ්ඩුවක්. අපි ගොවියාව අනාථ කරලා නැහැ. 2024දී අපි ජයග්‍රහණය කරනකොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වී කිලෝ එකකට නියම කර තිබුණු සහතික මිල රුපියල් 105යි. එතකොට තිබුණේ ඔය කෑ ගහන කට්ටියගේ ආණ්ඩු. රුපියල් 105ක් ලෙස නියම කර තිබුණු වී කිලෝ එකක සහතික මිල අපි රුපියල් 120 දක්වා ඉහළ දැමුවා. වී කිලෝව රුපියල් 80ට, රුපියල් 85ට විකුණපු ගොවියාට රුපියල් 100න් උඩ ස්ථාවර මිලක් දැන් ලබා දීලා තිබෙනවා. ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමනි, ආසන්න කාලයේ, මේ දවස් කිහිපය ඇතුළේ වී කිලෝවක මිල රුපියල් 90, රුපියල් 95 දක්වා අඩු වෙලා තිබෙන එක ඇත්ත. ඒක හරි. ඒක අපි පිළිගන්නවා. හැබැයි, රුපියල්-

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
මගේ වෙලාව මට දෙන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමනි, දීර්ඝ පැහැදිලි කිරීමකට ඉඩ දෙන්න බැහැ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
එතුමා මගේ නම කිව්වා නේ. මට උත්තරයක් දෙන්න අවස්ථාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
උත්තර දෙන්න වැඩි කාලයක් ගන්න බැහැ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමාට බාධා කරන්නේ නැහැ. ඔබතුමා කිව්වා, ඒ කාලයේ වී කිලෝවක සහතික මිල රුපියල් 105යි කියලා. එදා නිෂ්පාදන වියදම කීයද? ඉන්ධනවල මිල කීයද? ඔබතුමා පිළිගන්න ඕනෑ, වී කිලෝ එකක් නිෂ්පාදනය කරන්න අද රුපියල් 130ක වියදමක් යන බව. එදා රුපියල් 105 වුණාට-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු මන්ත්‍රීතුමනි, වී කිලෝ එක රුපියල් 105ට තිබුණු කාලයේ නිෂ්පාදන පිරිවැය අහගන්න ඕනෑද? පොහොර මිටිය රුපියල් 40,000ට, රුපියල් 45,000ට අරගෙන වගාවට යෙදුවේ. නිෂ්පාදන පිරිවැය කීයද? රුපියල් 105ක සහතික මිල තීරණය කරලා තිබෙනකොට පොහොර මිටිය ගත්තේ රුපියල් 40,000කට, රුපියල් 45,000කට. ඒ කාලයේ නිෂ්පාදන පිරිවැය වැඩි වෙලා තිබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ආණ්ඩුවක් විධියට ගොවියාගේ ප්‍රශ්නය විසඳමින් තිබෙනවා.

මෙහිදී විශේෂ කාරණයක් මතු කරන්න තිබෙනවා. මේ කන්නයේදී මේ ප්‍රශ්න එනකොට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු ලාල් කාන්ත ඇමතිතුමා, නියෝජ්‍ය ඇමතිවරු, කාර්ය මණ්ඩලවල සියලුදෙනා, රාජ්‍ය පොහොර සමාගම සහ පෞද්ගලික සමාගම් ටික එක්කහු වෙලා මාර්තු මාසයේ මුල් භාගයේදී සාකච්ඡාවක් කළා. ඒ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් විධියට ගොවි ජනතාවට ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා සියයට 65ක් පොහොර බෙදන්න තීරණය කළා.

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

ඊළඟට, වී අලෙවි මණ්ඩලය ගැන කථා කළා. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා, වී අලෙවි මණ්ඩලයට වී ගන්නේ නැහැලු. ඒ කාලයේ වී අලෙවි මණ්ඩලය කාබාසිනියා කර තිබුණු කට්ටිය, වී අලෙවි මණ්ඩලය විකුණන්න දාලා තිබුණු අය දැන් කථා කරනවා, වී අලෙවි මණ්ඩලය ගැන. ඒ කාලයේ වී අලෙවි මණ්ඩලය වී ටික ගත්තේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යල කන්නයේ යූරියා පොහොර අවශ්‍යතාව මෙට්‍රික්ටොන් 125,000යි. ඒ මෙට්‍රික්ටොන් 125,000න් අපි මේ වනකොට ගොවි ජනතාවට බෙදා දීලා තිබෙනවා, මෙට්‍රික්ටොන් 101,543ක්. තව බොහොම පොඩි ප්‍රමාණයයි දෙන්න තිබෙන්නේ. ඉතිහාසයේ පළමු වතාවට අපි ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තා. රාජ්‍ය කෝටා එක තිබුණේ රාජ්‍ය පොහොර සමාගමේ සියයට 7යි, 8යි. ඒක සියයට11 දක්වා වර්ධනය කළා. කොටසක් ආනයනය කළේ පෞද්ගලික සමාගම්. ඒ කොටසත් අපි ගෙනැල්ලා ගොවියාට සහනයක් විධියට දුන්නා. මේකේ විශේෂ කාරණය මොකක්ද? දැන් කියනවා නේ, "ගොවියාට සහන දුන්නේ නැහැ, සහන දුන්නේ නැහැ" කියලා. සහන නොදුන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොහොර මිටිය රුපියල් 10,200ට ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා දෙනකොට, මෙට්‍රික්ටොන් 25,000ක් මේ ආසන්න කාලයේ පෞද්ගලික සමාගම් ගෙන්වූවා. ඒ ගෙන්වපු මෙට්‍රික්ටොන් 25,000නුත් මෙට්‍රික්ටොන් 15,000ක් කැබිනට් මණ්ඩලය තීරණයක් අරගෙන පොහොර මිටිය රුපියල් 10,200ට දෙන්න තීරණයක් ගත්තා. රුපියල් 16,000ක්, රුපියල් 17,000ක් වන පොහොර මිටිය සඳහා ආණ්ඩුවෙන් තවත් වැය බරක් දරලා තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවියාට මේ සහනාධාරය දෙන්නේ.

මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා, හෙක්ටෙයාරයකට යන වියදම. ඒ වියදමට අනුව ගණන් හැදුවොත්, හෙක්ටෙයාරයකට පොහොර වෙනුවෙන් රුපියල් 70,000කට, රුපියල් 75,000කට ආසන්න වියදමක් යනවා. අපි මේ වනකොට හෙක්ටෙයාරයකට රුපියල් 30,000ක් මුදලිනුත් දෙනවා. ඒ වාගේම දැන් දෙන පොහොර මිටියට ආණ්ඩුවෙනුත් රුපියල් 5,000ක විතර තව වැය බරක් දරලා තිබෙනවා. මේ ගණන් බැලීම ගත්තොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියයට 50ක පොහොර සහනාධාරයක් රජයෙන් ලබා දෙනවා. උදාහරණයක් විධියට හෙක්ටෙයාරයකට රුපියල් 70,000ක් වියදම් වනවා නම්, රුපියල් 35,000ක් විතර දරලා තිබෙන්නේ රජයෙන්. ගොවියාට පොහොර මිටියකට වැය වෙන්නේ රුපියල් 5,000ක් හෝ රුපියල් 6,000 හෝ රුපියල් 6,500ක් අතර මුදලක්. අපි ගොවියාට එහෙමයි සහන දීලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර තැන්වල යම් අඩු පාඩු ඇති.

අපි දන්නවා, තිබුණු තත්ත්වය තුළ 2019 ඉඳලා රාජ්‍ය සේවය කප්පාදු කරලයි තිබුණේ කියලා; කප්පාදු කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
මට තව විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සමහර ගොවිජන සේවා මධ්‍යස්ථානවල පුරප්පාඩු බොහොමයක් තිබෙනවා. අපි දන්නවා, ඈත ප්‍රදේශවලට යනකොට කෘෂිකර්ම නිලධාරින්ගේ පුරප්පාඩු විශාල ප්‍රමාණයක් තිබෙන බව. සමහර DO මහත්වරු ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙක තුන බලනවා. ඒ තත්ත්වයට පත් වෙලායි තිබෙන්නේ. පොහොර ටික වෙලාවට දී ගන්න බැරි වුණු සමහර තැන් ඇති. හැබැයි, අපි ආණ්ඩුව විධියට ඒ අඩු පාඩු සොයා බලමින්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලු කාර්ය මණ්ඩලය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සියලු මැදිහත්වීම් කරමින් පොහොර ටික ගොවි ජනතාවට ලබා දීමට අදාළ මැදිහත්වීම කරමින් ඉන්නවා. ඒ නිසා විපක්ෂයේ කට්ටියට එල්ලෙන්න මාතෘකා නැතිව මේ වන විට ගොවියා ගැන කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියනවා, ඉතිහාසයේ පළමුවැනි වතාවට ගොවියා රැක ගන්න ආණ්ඩුවක් ඇවිල්ලා තිබෙන බව, ගොවියා බලා ගන්නා ආණ්ඩුවක් ඇවිල්ලා තිබෙන බව, ගොවියාට පහසුකම් සපයන ආණ්ඩුවක් ඇවිල්ලා තිබෙන බව. වී අලෙවි මණ්ඩලය අලුත් තාක්ෂණය එකතු කරගෙන dryers ලබා දීලා, ගොවියාගේ වී ටික මිල දී ගන්න පුළුවන් ඉදිරි වැඩ පිළිවෙළක් හදමිනුයි තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය අඳබල යෝජනා ඉදිරිපත් කළාට ඒවාට මේ රටේ ජනතාව ඇහුම්කන් දෙන්නේ කොහොමද කියන එක එළියට ගිහිල්ලා බලාගන්න පුළුවන්, අර අකුළාගෙන ගිය සත්‍යාග්‍රහ දිහා බැලුවාම. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ගරු මන්ත්‍රීතුමා වැදගත් ප්‍රශ්නයක් යොමු කළා, සිවිල් ආරක්ෂක සේවය ගැන. මම දැන් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමාට කථා කළා. ගරු මන්ත්‍රීතුමනි, පෙබරවාරි පළමුවැනි දා තමයි සිවිල් ආරක්ෂක සේවය තමන්ගේ range එකෙන් පිටට ගිහිල්ලා වැඩ කරන නිලධාරින්ට රුපියල් 25,200ක් අනුමත වුණේ. ඒ රුපියල් 25,200 දැනට 3,500කට ගෙවනවා; තමන්ගේ range එකෙන් පිට අයට ගෙවනවා. තමන්ගේ range එකේ ඉන්නවා නම් ඒක ලැබෙන්නේ නැහැ. එය ගෙවන්න පටන් අරගෙන තිබෙනවා. ඒක කියන්න තමයි මම මේ අවස්ථාව ලබා ගත්තේ. අපි දන්නවා, ඒගොල්ලන් වැදගත් පිරිසක් බව. නමුත්, මේකේ දෙපැත්තක් තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමාටත් අවබෝධයක් ඇති. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව ආරම්භ කරන්න.

[பி.ப. 3.52]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இங்கு உரையாற்றி பலரும் அத்தியாவசியப் பொருட்களின் விலை சம்பந்தமாகப் பேசினார்கள். உண்மையிலேயே மக்களுக்குப் பிரச்சினை இருக்கின்றது. மக்களுக்குத் தேவையான அத்தியாவசியப் பொருட்களின் விலை அதிகரிக்கப்பட்டு இருக்கின்றது. இதனால் சாதாரண குடிமக்களுக்கு வாழமுடியாத நிலை ஏற்பட்டிருக்கின்றது. இதை அரசாங்கம் கவனத்திற்கொள்ள வேண்டும். எமது பிரதேசத்தில்கூட நெல்லை உற்பத்தி செய்தவர்கள் அதனை விற்க முடியாமல் இருக்கிறார்கள். நெல்லுக்கான விலை இறக்கம் மற்றும் அரிசி இறக்குமதி என்பவற்றால் அவர்கள் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். எனவே, இது குறித்து அரசாங்கம் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இந்த நாட்டின் வரலாற்றில் மறக்க முடியாத ஒரு முக்கிய சம்பவம்தான் உயிர்த்த ஞாயிறு தாக்குதல். அந்தச் சம்பவத்தால் பல நூற்றுக்கணக்கான கத்தோலிக்க மக்களுடைய உயிர்கள் காவுகொள்ளப்பட்டன: பலர் காயப்பட்டார்கள். வெளிநாட்டவர்கள்கூட பலியானார்கள். இவ்வாறு பல கஷ்டங்களை கத்தோலிக்க சமூகம் அனுபவித்ததை யாராலும் மறக்க முடியாது. இன்னும் எத்தனையோ பேர் நோயாளிகளாக கட்டிலிலிருந்து எழும்ப முடியாமல் கஷ்டத்தோடு இருக்கிறார்கள். இவ்வாறு பாதிப்புக்கு உள்ளானவர்கள், தங்களுக்கு நீதி கிடைக்க வேண்டும், யார் இந்த அநியாயத்தைச் செய்தார்கள்? இதற்குப் பின்னணியில் யார் இருந்தார்கள்? என எதிர்பார்ப்பது சாதாரண ஒரு விடயமாகும்.

மாறி மாறி ஆட்சிக்கு வந்த அரசாங்கங்கள் ஒவ்வொரு வகையில் இதற்குப் பதிலைத் தேடினாலும், இந்த அரசாங்கம் அண்மைக் காலமாக முன்னெடுத்து வருகின்ற விசாரணை நடவடிக்கைகள்மூலம் தங்களுக்கு நல்லதொரு முடிவு கிடைக்கும், நியாயம் கிடைக்கும், உண்மையான குற்றவாளிகள் தண்டிக்கப்படுவார்கள், இனிமேல் இந்த நாட்டில் இவ்வாறான சம்பவங்கள் இடம்பெறாத நிலை ஏற்படுமென பாதிக்கப்பட்ட கத்தோலிக்க சமூகத்தினரும், இந்தச் சம்பவத்தால் பல்வேறு இன்னல்களுக்கு உள்ளாக்கப்பட்ட முஸ்லிம் சமூகத்தினரும் எதிர்பார்த்துக்கொண்டு இருக்கும்பொழுதுதான், கோட்டை புகையிரத நிலையத்துக்கு முன்பாக முன்னாள் அமைச்சர்கள் சிலர் சத்தியாக்கிரகத்தில் ஈடுபட்டு இருக்கிறார்கள்.

கைதுசெய்யப்பட்டுள்ள State Intelligence Serviceஇன் Chiefஆக இருந்த சுரேஷ் சலே அவர்கள் தவறு செய்யவில்லை என்றால், அச்சமில்லாமல் விசாரணைகளுக்கு முகங்கொடுத்து, இந்த நாட்டில் இருக்கின்ற நீதிமன்றத்தினூடாக தான் நிரபராதி என்பதை நிரூபிக்க முயற்சிக்க வேண்டுமே ஒழிய, உண்ணாவிரதம் இருந்து "நான் சாகப் போகிறேன், என்னுடைய விசாரணை அதிகாரியை மாற்றுங்கள்" என்று கேட்பது மிகவும் சிறுபிள்ளைத்தனமானது. இந்த விசாரணையைத் திசைதிருப்புகின்ற ஒரு செயலாகவே நாங்கள் இதனைப் பார்க்கின்றோம். அதுமாத்திரமல்ல, அவரைக் கைதுசெய்தமைக்கு எதிராக விமல் வீரவங்ச போன்ற இனவாத சக்திகள் இன்று கோட்டை புகையிரத நிலையத்துக்கு முன்பாக ஆர்ப்பாட்டம் செய்து, உண்ணாவிரதம் இருந்து, இந்த நாட்டில் இருக்கும் சிங்கள மக்கள் மத்தியில் மீண்டும் இனவாதத்தைத் தூண்டி, அதன்மூலம் இந்த விசாரணையைத் திசைதிருப்ப நினைப்பார்களாக இருந்தால், நிச்சயமாக அவர்கள் தங்களுக்கே அநியாயம் செய்தவர்களாக மாறுவார்கள் என்பதில் சந்தேகம் கிடையாது.

எங்களுடைய நாடு ஓர் அழகான நாடு! நாம் சுதந்திரம் பெற்றபொழுது, இந்த நாட்டின் பொருளாதாரம் யப்பானுக்கு அடுத்த நிலையிலே இருந்தது. இன்று நாங்கள் எங்கே நிற்கிறோம்? இன்று எத்தனையோ குடும்பங்கள் ஒரு நேரம்தான் சாப்பிடுகின்றன. இன்று எமது நாடு கையேந்துகின்ற நாடாக மாறியிருக்கின்றது. நாங்கள் 50 பில்லியன் டொலருக்கும் மேல் உலக நாடுகளுக்கு கடன் செலுத்த வேண்டியவர்களாக இருக்கின்றோம். ஒவ்வொரு குடும்பமும் எத்தனை இலட்சம் ரூபாய் கடனாளியாக இருக்கின்றது? இவ்வாறு நிலைமை இருக்கும்போது, இந்த அழகான நாட்டுக்குள் மீண்டும் இனவாதத்தையும் மதவாதத்தையும் தூண்டி, நாட்டைக் குட்டிச்சுவராக்கி, இங்கே வாழ முடியாது என்ற நிலையில், சிறுபான்மை மக்கள் நாட்டைவிட்டு ஓடுகின்ற, தங்களது வியாபாரத்தை மூடிவிட்டுச் செல்கின்ற ஒரு துர்பாக்கிய நிலைமையை ஒருசில கயவர்கள் செய்வார்களாக இருந்தால், இந்த நாட்டில் வாழுகின்ற பெரும்பான்மை இனத்தைச் சேர்ந்த மதகுருமாரும் ஒருசில ஊடகங்களும் அவர்களுக்குச் சாதகமானவர்களும் அதற்கு இடம்கொடுப்பார்களாக இருந்தால், இந்த நாட்டைக் காப்பாற்ற முடியாது; இந்த நாட்டைக் கடனிலிருந்து மீட்க முடியாது. இந்த நாட்டின் எதிர்காலத்தைப் பாதுகாக்க முடியாது.

உயிர்த்த ஞாயிறு தாக்குதல் சம்பவத்தால் நாங்கள் நிறையப் பேர் பாதிக்கப்பட்டோம். நேற்று கோட்டை புகையிரத நிலையத்துக்கு முன்பாக நின்று ஒரு தேரர் சொல்கிறார், "சலே ஒரு முஸ்லிம்; அவர் முஸ்லிமாக இருந்தாலும், நாங்கள் அவருக்காகப் பேசுகிறோம்" என்று. அந்தத் தேரரிடத்தில் நான் கேட்கிறேன், "ஜமாஅத்தே இஸ்லாமி அமைப்பின் தலைவரை அநியாயமாக சிறையில் அடைத்தார்களே! அவர் முஸ்லிம் அல்லவா? அவர் முஸ்லிம் என்பதற்காக அன்று அவருக்காகப் பேசினீர்களா?" என்று.

இன்று சலே என்பவருக்கு 3 மாதங்கள்கூட சிறையில் இருக்க முடியவில்லை. இந்த நாட்டின் பிரபல சட்டத்தரணியான ஹிஜாஸ் ஹிஸ்புல்லாஹ் அவர்களை அன்று 2 வருடங்கள் - 24 மாதங்கள் - எலிகள் புழங்குகின்ற CID அறைக்குள் வைத்தார்கள். அந்த நேரத்தில் இந்தத் தேரர்கள், இனவாதிகள் யாராவது அவருக்காகப் பேசினார்களா? அதேபோல்தான், அசாத் சாலிக்கும். கவிதைப் புத்தகமொன்றை எழுதினார் என்பதற்காக ஜாமிஆ நளீமிய்யாவில் படித்துக்கொண்டிருந்த எங்களுடைய பிரதேசத்தைச் சேர்ந்த மாணவனான அஹ்னாப் ஜஸீம் என்பவரை 2 வருடங்களுக்கும் மேல் சிறையில் அடைத்து வைத்திருந்தார்கள். இவ்வாறு எத்தனையோ பேரை சிறையில் அடைத்தார்கள். என்னுடைய சகோதரரையும் கைதுசெய்து சிறையில் அடைத்தார்கள். ஒரு வருடத்துக்குப் பிறகு, அவர் நிரபராதி என்று விடுதலை செய்யப்பட்டார். மீண்டும் றிஸாட் பதியுதீனின் தம்பியைக் கைதுசெய்யுமாறு மஹிந்தானந்த அலுத்கமகேவின் தலைமையில், அன்று கோட்டபாயவின் அரசாங்கத்தில் இருந்த 100 MPs sig பண்ணிய ஆவணத்தை கோட்டாபய அவர்களிடத்தில் கொடுத்த பிறகு, அவர் இரண்டாவது முறையாகக் கைதுசெய்யப்பட்டு, மேலும் ஒன்றரை வருடங்கள் சிறையில் அடைக்கப்பட்டார். அவர் ஒரு முஸ்லிம் என்று அந்த நேரத்தில் இந்தத் தேரர்களுக்கு அல்லது இந்த இனவாதிகளுக்கு விளங்கவில்லையா? சலே மாத்திரம்தானா இந்த நாட்டில் இருக்கின்ற ஒரேயொரு முஸ்லிமா? எனக் கேட்கின்றேன்.

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

இந்த விடயத்துடன் சம்பந்தப்பட்ட விசாரணைகளுக்கு இந்த அரசாங்கம் எடுக்கின்ற முயற்சிகளுக்கு எங்களுடைய முழுமையான ஆதரவை வழங்குகின்றோம். இந்த நாட்டில் வாழுகின்ற கத்தோலிக்க மற்றும் முஸ்லிம் மக்கள், இதன் உண்மையான குற்றவாளிகள் யார்? இதற்குப் பின்னால் இருந்த சதி என்ன? இதற்குப் பின்னால் யார் இருந்தார்கள்? இதனால் யார் இலாபமடைந்தார்கள்? போன்ற தகவல்கள் வெளிவருமென எதிர்பார்த்துக்கொண்டு இருக்கிறார்கள். இவ்வாறானதொரு நிலை இனி ஏற்படக்கூடாதெனவும் அவர்கள் கருதுகின்றார்கள். இந்த குண்டு வெடிப்பால் எத்தனையோ உலமாக்கள், எத்தனையோ வியாபாரிகள் சிறையில் அடைக்கப்பட்டார்கள். அதுமாத்திரமன்றி, எத்தனையோ கடைகள் மூடப்பட்டன. முஸ்லிம்களின் தேநீர் கடைகளில் பெரும்பான்மை இனத்தவர்கள் சாப்பிடப் பயந்தார்கள். உலமாக்கள் மாத்திரமல்ல, கல்விமான்கள், இளைஞர்கள் என எத்தனையோ பேர் சிறையில் மரணித்திருக்கிறார்கள். நாங்கள் எத்தனையோ மரண வீடுகளுக்குச் சென்றோம். இன்றும் எத்தனையோ பேர் சிறையில் இருக்கிறார்கள். மேலும், வெளிநாட்டு வேலைவாய்ப்புகளுக்குச் சென்று, leaveஇல் நாட்டுக்கு வந்த எத்தனையோ பேர் மீண்டும் போக முடியாத நிலையில் இருக்கிறார்கள். பெரிய நிறுவனங்களில் பெரிய பெரிய பதவிகளில் இருந்த எத்தனையோ பேர் தங்களது தொழில்களை இழந்திருக்கிறார்கள். தொப்பி போட்டுக்கொண்டு, அபாயா போட்டுக்கொண்டு பாதையில் செல்லமுடியாத நிலை இருந்தது; அலுவலகங்களுக்குச் செல்ல முடியாத நிலை இருந்தது. இவ்வாறு பல கஷ்டங்களுக்கு எமது முஸ்லிம் சமூகம் உள்ளானபொழுது, இந்தத் தேரர்கள் அல்லது இந்த இனவாதிகள் எதையும் கருத்திற்கொள்ளாமல் இனவாதத்தை மேலும் தூண்டிவிட்டார்கள்.

அதுமாத்திரமன்றி, குருணாகலில் எத்தனையோ பள்ளிவாசல்களை உடைத்தார்கள். நான்கு சிறிய பிள்ளைகளின் தந்தையான அமீர் என்ற முஸ்லிம் சகோதரர் தன்னுடைய வீட்டுக்கு முன்னால் வேலைசெய்துகொண்டு இருக்கும்பொழுது, இதே இனவாதக் கூட்டத்தின் agents அந்தப் பாதையால் ஆர்ப்பாட்டம் செய்துகொண்டுபோய், அந்தச் சகோதரரை அவருடைய நான்கு பிள்ளைகளுக்கு முன்னாலே acid வீசி கொலை செய்தார்கள். அவருடைய நான்கு பிள்ளைகளும் அநாதைகளாக்கப்பட்டார்கள். இவ்வாறு இந்த நாட்டில் எத்தனையோ கஷ்டங்களை அனுபவித்த எங்களுடைய முஸ்லிம் சமூகம், உண்மையான குற்றவாளிகள் யார் என்பது கண்டுபிடிக்கப்பட வேண்டுமென எதிர்பார்த்துக்கொண்டு இருக்கின்றது. சலே நிரபராதியாக இருந்தால், அவர் அச்சமில்லாமல் தான் நிரபராதி என்பதை நிரூபிக்க வேண்டுமே ஒழிய, இவ்வாறு தூண்டிவிட்டு, உண்ணாவிரதம் இருந்து ஷானி அபேசேகரவை அல்லது விசாரணை அதிகாரிகளை மாற்ற வேண்டுமெனக் கோரக்கூடாது. ஏனெனில், ஷானி அபேசேகரவைவிட உயர்ந்த பதவியில் இருந்தவர்தான் சலே! இவ்வாறானவர்கள் தான் தவறு செய்யவில்லை என்றால், விசாரணைகளுக்கு முகங்கொடுக்க வேண்டும்.

இந்தச் சம்பவத்துடன் எந்தச் சம்பந்தமும் இல்லாத என்னைக்கூட கைதுசெய்து சிறையில் அடைத்தார்கள். நான் பாராளுமன்ற அமர்வு முடிந்து வீடு சென்ற பிறகு, அதிகாலை 3.00 மணியளவில் 300-400 பொலிஸ்காரர்களுடன் முழு areaவையும் சுற்றிவளைத்து, மதிலால் குதித்துப் பாய்ந்து, என்னுடைய வீட்டின் கதவுகளை உடைத்துக்கொண்டு உள்ளே வந்துதான் என்னைக் கைதுசெய்து கொண்டு போனார்கள். நான் செய்த குற்றம் என்ன? நான் பல மாதங்கள் சிறையில் இருந்தேன். எங்களுக்கு இலட்சக்கணக்கான மக்களின் ஆதரவு இருந்தும், எங்களை விடுதலை செய்யுமாறு யாரும் ஆர்ப்பாட்டம் செய்யவில்லை. நாங்கள் நீதிமன்றத்தின் ஊடாகத்தான் நிரபராதியென வெளியே வந்தோம். நான் கைதுசெய்யப்பட்ட அன்றைய தினம் இரவு, என்னுடைய இரண்டாவது மகள் அடுத்த நாள் நடைபெறவுள்ள G.C.E. O/L Examக்காகப் படித்துக்கொண்டிருந்தார். அந்தப் பிள்ளைக்கு அடுத்தநாள் exam எழுதுவது எவ்வளவு கடினமாக இருந்திருக்கும் என்பதைச் சிந்தித்துப் பாருங்கள்! அதுமாத்திரமல்ல, என்னுடைய பிள்ளைகள் பாடசாலைக்குப் போகமுடியாத துர்ப்பாக்கிய நிலையும் ஏற்பட்டது. அத்தனை ஊடகங்களிலும் 'මහ මොළකාරයා' என்று காட்டுகின்ற அளவுக்கு இந்த நாட்டில் பொய்யை விதைத்தார்கள். இவ்வாறெல்லாம் செய்துவிட்டு, இன்று தங்களைப் பாதுகாத்துக்கொள்வதற்காக, இந்த நாட்டில் மீண்டும் இனவாதத்தை உருவாக்குவதற்காக சில மதகுருமாரைத் தூண்டிவிடுகிறார்கள். தாங்கள் நிபராதி என்று நிரூபிப்பதற்காக எத்தனையோ சதிகளை நடத்திக்கொண்டு இருக்கிறார்கள்.

நான் ஒன்றைச் சொல்ல விரும்புகின்றேன். அதாவது, அரசாங்கமானது இவ்வாறான அச்சுறுத்தல்களுக்கு அடிபணியாமல், இந்த விசாரணையை நேர்மையாகவும் தூய்மையாகவும் முன்னெடுத்துச் சென்று, உண்மையான குற்றவாளிகள் யார்? இதற்குப் பின்னால் யார் இருந்தார்கள்? யார் சதி செய்தார்கள்? என்பதைக் கண்டுபிடித்து, அவர்களுடைய குற்றங்களை நிரூபித்து, அவர்களுக்கு உரிய தண்டனைகளை வழங்க வேண்டும் என்பதுடன், பாதிக்கப்பட்டவர்களுக்கும் அநியாயம் இழைக்கப்பட்டவர்களுக்கும் நீதியை வழங்க வேண்டுமெனவும் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුජිබර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, මූලාසනය සඳහා ගරු සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සේන නානායක්කාර මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 4.03]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට, මේ රටේ ආදරණීය, අවංක හෘදය සාක්ෂිය තමයි අපේ මන්ත්‍රීතුමාත් මේ මොහොතේ පැහැදිලි කළේ. රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමනි, අවාසනාවකට අද උදේ සමගි ජන බලවේගය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් අත්අඩංගුවට ගැනීම සහ වර්තමාන රජය පවත්වාගෙන යන පරීක්ෂණයට විරුද්ධව අදහස් දැක්වීම ඇත්තටම බේදනීය තත්ත්වයක්.

අපි මේ මැතිවරණය තුළ පොරොන්දුවක් දුන්නා. පාස්කු ඉරු දින ප්‍රහාරයේ මහ මොළකරුවන් පිළිබඳව සාධාරණ, අවංක පරීක්ෂණයක් පවත්වන වගට අපි මේ රටේ ජනතාවට පොරොන්දුවක් ලබා දීලා තමයි මේ බලය ලබා ගත්තේ. අපි හැම කෙනාම දන්නවා, 2019දී සිද්ධ වෙච්ච ඒ අවාසනාවන්ත සිද්ධියෙන්, ඒ ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් විශාල පිරිසකට ජීවිත අහිමි වුණු බව. ඒ වාගේම එයින් විශාල පිරිසක් තුවාල ලැබුවා. කතෝලික ප්‍රජාවට විතරක් නොවෙයි, මුළු රටටම ඒ හරහා විශාල හානිදායක තත්ත්වයක් ඇති වුණු වග අපි හැම කෙනාම ඉතා හොඳින්ම දන්නවා.

අද මේ රටේ ආර්ථිකය පිළිබඳව, සමාජ තත්ත්වය පිළිබඳව, ආර්ථික කඩා වැටීම් පිළිබඳව කථා කරන විපක්ෂයට මම කාරණයක් කියන්න කැමැතියි. මතක් කරලා බලන්න, ඔබ සියලුදෙනාම එකතු වෙලා මේ රටේ ආර්ථිකය විතරක් නොවෙයි කඩා වැට්ටුවේ. මේ රටේ ජනතාව අතර තිබුණු විශ්වාසයත් කඩා වැට්ටුවා. සැකය වර්ධනය කළා. වෛරය වර්ධනය කළා. එකිනෙකාගේ ගෞරවය නැති කරන තත්ත්වයක් ඇති කළා. ඒ වාගේ ඉතාම අසික්කිත, අශීලාචාර සමාජයක් තමයි ඔබ ආණ්ඩු කරන කාලයේ මේ රට තුළ බිහි කළේ. ආර්ථික වර්ධනය පැත්තක තියලා, සැකය වර්ධනය කරන තත්ත්වයකට, අවිශ්වාසය වර්ධනය කරන තත්ත්වයකට තමයි මේ රට ගෙනාවේ. මේ මොහොතේ අපි හැම කෙනාටම විශාල වගකීමක් තිබෙනවා. රජයක් ලෙස අපටත් ඒ වගකීම තිබෙනවා. ඒ වගකීම නිසා තමයි මේ රජය ගෙන යන වැඩ පිළිවෙළ පිළිබඳව අද විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුත් ප්‍රශංසා මුඛයෙන් කථා කරන තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ.

විශේෂයෙන් මට කලින් කථා කරපු මන්ත්‍රීවරයා මේ කාරණය පිළිගනීවි. ඒ මොහොතේ බලය තිබුණු ආණ්ඩුව තමයි යහ පාලන ආණ්ඩුව. යහ පාලන ආණ්ඩු සමය තුළ තමයි ඔය සියලු අත් අඩංගුවට ගැනීම් ඇතුළු සියලු දේම සිද්ධ වුණේ. ඒක මතක් කරන්න ඕනෑ. එවැනි අසාධාරණ අත්අඩංගුවට ගැනීම් සිද්ධ වෙනකොට එතුමා සමඟ එකට වාඩි වෙච්ච මන්ත්‍රීවරුන්ට, කැබිනට් මණ්ඩලයේ හිටපු ඇමතිවරුන්ට පවා අඩුම තරමින් ඒවාට එරෙහිව, ඒවාට විරුද්ධව ඒවා වැරැදියි කියලා කථා කරන්න තරම් කොන්දක් තිබුණේ නැහැ. එවැනි රජයක් තමයි ඒ මොහොතේ තිබුණේ.

විශේෂයෙන්ම අපි ඊයේ දැක්කා, සමහරු කිඹුල් කඳුළු හෙළනවා. සමහරු කියනවා, සලේ මුස්ලිම් නිසා ඔහු වෙනුවෙන් පෙනී සිටිනවා කියලා. හැබැයි, එවැනි මිනිස්සුන්ගේ අනුකම්පාව, එවැනි මිනිස්සුන්ගේ උදව් අපට අවශ්‍ය වෙන්නේ නැහැ. අපට මේ රටේ ඉන්න සමස්ත ශ්‍රී ලාංකික ජනතාව ඉන්නවා, ඒ වෙනුවෙන් කටයුතු කරන්න කියන කාරණාව මම මතක් කරන්න කැමැතියි. අසාධාරණ විධියට, ඉතාම වැරැදි විධියට බොහෝ අත්අඩංගුවට ගැනීම් සිද්ධ වුණා. මෙතැනදී මතක් කළා වාගේම කිසිම හේතුවකින් තොරව විශාල පිරිසක් අත් අඩංගුවට ගන්නකොට, ඒ සියලුදෙනාම ඒ අභියෝගය භාරගෙන ඒ සියලු පරීක්ෂණවලට මුහුණ දීලා ඒ බොහෝ අය නිදොස් කොට නිදහස් වෙලා තමයි එළියට ආවේ. විශේෂයෙන් වර්තමාන රජය මේ පරීක්ෂණය පවත්වන්නේ ඉතා සාධාරණ සහ යුක්තිසහගත විධියට. ඒ විධියට මේ පරීක්ෂණය කරනකොට තමන් ඒ වැරැද්ද කරලා නැත්නම්, තමන් ඒ පාපයට සම්බන්ධ නැත්නම්, තමන් ඒක කුමන්ත්‍රණය කළේ නැත්නම් ඇයි භය වෙන්නේ? ඇයි ඒ වෙනුවෙන් මෙවැනි කටයුතු කරන්නේ? මේ අය අත්අඩංගුවට ගත්තාට පස්සේ කවුද ඒ අය වෙනුවෙන් පෙනී සිටින අය? මතක් කරලා බලන්න, මේගොල්ලන්ගේ පැටිකිරිය එකින් එක කියන්න පුළුවන්.

අම්පාරේ කඩයක කොත්තුවක් තුළ පිටි ගුලියක් හමු වූ වෙලාවේ ඒක "වඳ කොත්තුවක්" කියලා සඳහන් කරමින්, ඒ ප්‍රදේශය තුළ ප්‍රචණ්ඩත්වය ඇති කරපු කෙනා තමයි, සාමය කඩ කරපු කෙනා තමයි අද ඇවිල්ලා සාධාරණය වෙනුවෙන්, යුක්තිය වෙනුවෙන්, අවංකත්වය වෙනුවෙන් මැදිහත් වෙන්න හදන්නේ. ජාතිවාදය වපුරමින්, වෛරය වපුරමින් විවිධ අවස්ථාවලදී විවිධ අය පාස්කු ප්‍රහාරයට සම්බන්ධ මහ මොළකරුවන් ලෙස හඳුන්වා දුන්නා. තමන් ඒ කරපු පාපයෙන් විඳවන නිසා, තමන්ගේ හෘදය සාක්ෂිය හැම විටම එය අවදි කරන නිසා එකිනෙකාට චෝදනා කරමින් අද වැරදිකරුවන් ආරක්ෂා කිරීම සඳහා සමහරු සූදානම් වෙනවා.

ඒ විතරක් නොවෙයි. මතක් කරලා බලන්න, පාස්කු ප්‍රහාරයෙන් පස්සේ මිනුවන්ගොඩ ප්‍රදේශය තුළ විතරක් නොවෙයි, මෙතැන සඳහන් කළා වාගේම, කොට්ටාරමුල්ල ෆවුසුල් අමීර්ලා කරපු පාපය කුමක්ද? අපි හැම කෙනාම දන්නවා, බෞද්ධ දර්ශනය තුළ සඳහන් දිට්ඨධම්ම වේදනීය කර්මය අනුව මෙලොවදීම ඵල විපාක ලැබෙන බව. ඒ කියන්නේ වැරැද්දක් කළොත් අනිවාර්යයෙන්ම ඒ කර්මය හැම විටම අප පසුපස එනවා. ඒ වාගේමෙ කොතැන හිටියත්, කොහේ හිටියත් අනිවාර්යයෙන්ම කර්මය ඔවුන් පසුපස එනවා.

මම දැක්කා එක්තරා යූටියුබ් නාළිකාවක තිබුණා, "අඛණ්ඩ සත්‍යාග්‍රහය කන්න නවත්වලා" කියලා. අඛණ්ඩ සත්‍යාග්‍රහය කන්න නවත්වලා! අද සත්‍යාග්‍රහයක් කර ගන්න තරම් මිනිස්සු එකතු කර ගන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඇයි ඒ? මිනිස්සු දන්නවා, ඔවුන් සමඟ ඉන්න මිනිස්සුත් දන්නවා, හෘදය සාක්ෂියට අනුව මේක වැරදියි කියලා. මේක නොවිය යුතු දෙයක් කියන එක ඔවුන් දන්නවා. මුළු රටම සම්පූර්ණයෙන්ම වෙනස් අතකට යොමු කළා. අපි හැම කෙනාම දන්නවා, මේ ප්‍රහාරය නිසා ආර්ථික වශයෙන් රටට වෙච්ච හානිය කොපමණද කියා. සංචාරක ක්ෂේත්‍රය කඩා වැටුණා. ආර්ථිකයට සම්බන්ධ තවත් ක්ෂේත්‍ර රාශියක් කඩා වැටුණා. හෘදය සාක්ෂිය තිබෙන මිනිස්සු මොවුන් සමඟ තවදුරටත් හිට ගන්නේ නැහැ. ඒක තමයි ඊයේ අකුළාගෙන ගිය සත්‍යාග්‍රහයෙන් ඔප්පු වුණේ.

ඒ වාගේම මේ මොහොතේ මතක් කළ යුතු දෙයක් තිබෙනවා. මෙවැනි තත්ත්වයක් නැවත ඇති නොවීම සඳහා වැඩ කිරීම අප සියලුදෙනාගේම වගකීමක් ලෙස මම දකිනවා. ඒ නිසා, වගකිව යුතු රජයක් ලෙස විශේෂයෙන් ඒ සම්බන්ධයෙන් අපට කළ හැකි දේ පිළිබඳව අවශ්‍ය පියවර ගැනීම සඳහා අපි සාකච්ඡා කළ යුතුයි කියා මා විශ්වාස කරනවා.

හිර ගෙවල්වල රැඳවුම් ස්ථානවල සිටින මීයන් ඇතුළු එක එක සතුන් පිළිබඳව අද මතක් කරන අය ඊයේ දිනයේදී සත්‍යාග්‍රහය හකුළාගෙන යනකොට ඒ මුහුණුවල තිබුණු භයානක බව අප හොඳින්ම දැක්කා. ඒ අය පාස්කු ප්‍රහාරය නිසා බලය ලබා ගත්තා

[ගරු මුනීර් මුලාෆර් මහතා]

විතරක් නොවෙයි, ලබා ගත්ත බලයෙන් කොතරම් දුරට මුස්ලිම් සමාජයට කෙනෙහිලිකම් කළාද කියලා අපි දන්නවා. කොතරම් දුරට එහෙම කළාද කිව්වොත්, මැරිච්ච මළමිනියකිනුත් පළිගන්නා තරම් නරුම තත්ත්වයකට ඒ පාලකයෝ පත් වුණා. විශේෂයෙන්ම මුස්ලිම් සමාජයක් තුළ, මුස්ලිම් සංස්කෘතියක් තුළ මළ මිනියක් භූමදානය තමයි පිළිගත්ත දේ. හැබැයි කොවිඩ් සමය තුළ ඒ භූමදානය සිදු නොකොට, බලහත්කාරයෙන් ආදාහනය කරලා එතැනිනුත් රිද්දවන්න පුළුවන්ද කියලා තමයි ඒ පාලකයෝ හැම විටම කල්පනා කළේ.

ඒ විතරක් නොවෙයි. ඒ අය විවිධ නාට්‍යයන් රඟදැක්වූවා. විශේෂයෙන් මෙහිදී දොස්තර සාෆි පිළිබඳව මතක් කළ යුතුයි. ඒ වෛද්‍යවරයාගේ දරුවන්ට පාසල් යෑමත් අහිමි කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මේගොල්ලන් ඒ වෛද්‍යවරයාගේ දරුවන්ට පාසල් යෑම අහිමි කළත්, විවිධ වද දුන්නත්, ඒ දරුවන්ට ඉතා හොඳින් විභාගවලින් සමත් වෙන්න පුළුවන් වුණා කියන එකත් මම මතක් කරන්න කැමැතියි.

நான் இந்தச் சந்தர்ப்பத்தில் குறிப்பாக, முஸ்லிம் சமூகத்தைப் பிரதிநிதித்துவப்படுத்தி ஊடகங்களைக் கையாள்கின்றவர்களுக்கு ஒருசில விடயங்களைச் சொல்ல விரும்புகின்றேன். மீண்டும் மீண்டும் இந்த நாட்டை இனவாதத்துக்குள் தள்ளி, இனவாதிகளோடு பயணிக்கின்ற அந்தப் பயணத்தையா நீங்கள் விரும்புகின்றீர்கள்? எனக் கேட்கின்றேன். கடந்த ஹஜ்ஜுப் பெருநாள் காலத்திலே வெசாக் வாரமும் பிரகடனப்படுத்தப்பட்டு இருந்தமை உங்களுக்குத் தெரியும்! அதை இவர்கள் ஊடகங்கள்மூலம் பெரிதுபடுத்தி, இனங்களுக்கு இடையில் முறுகல் நிலையை உருவாக்க முயற்சித்தார்கள். எனினும், நாங்கள் இந்த விடயத்தை மிகக் கவனமாகக் கையாண்டு அந்த முயற்சியை முறியடித்தோம்.

இன்று பேசுவதற்குத் தலைப்பில்லாதவர்கள், ஹஜ்ஜின் மகத்துவத்தைப் பற்றி புரியாதவர்கள் அல்லது ஹஜ் பயணத்தின்போது ஏற்படுகின்ற கஷ்டங்களை ஆன்மீக ரீதியாக ஏற்றுக்கொண்டு, அந்தப் பயணத்தின் பின்னர் தன்னைச் சிறந்த முறையில் மாற்றிக்கொள்ள வேண்டும் என்பதைப் புரியாதவர்கள் அந்த இபாதத்தைக்கூட அரசியல்மயப்படுத்தி, துச்சமான நிலைக்கு மாற்றுகின்ற அரசியல்வாதிகளாக மாறியிருக்கின்றார்கள். மினாவில் ஏற்படுகின்ற அசௌகரியங்கள் பற்றி பாராளுமன்றத்தில் கேள்வி எழுப்புகிறார்கள். அவை மார்க்கத்தோடு - ஆன்மீகத்தோடு - தொடர்புபட்ட விடயங்கள். ஷேக் ஸலா பா உஸ்மான் அவர்களுடைய 4,000 மில்லியன் டொலர் சம்பந்தமான தகவல்கள் எம்மிடம் இருக்கின்றன என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

DCC கூட்டத்தை நல்ல முறையில் நடத்துவதற்குக்கூட இடங்கொடுக்காமல் குழப்புகின்றவர்கள், மினாவில் ஹஜ்ஜாஜிகள் எதிர்கொண்ட கஷ்டங்கள் பற்றி பேசுகின்ற நிலைக்கு மாறியிருக்கிறார்கள். எமது அரசாங்கமானது ஹஜ் சம்பந்தமான விடயத்தில் கரிசனை செலுத்தி, அதனை ஒழுங்குபடுத்தி, அடுத்த வருடம் இதனைவிடச் சிறப்பான முறையில் செய்வதற்கான அனைத்து வேலைத் திட்டங்களையும் மேற்கொள்ளும். இவ்விடயம் சம்பந்தமான எத்தகைய விசாரணைகளுக்கும் எமது ஹஜ் குழு தயாராக இருக்கின்றது என்பதை இந்தச் சந்தர்ப்பத்தில் மிகத் தெளிவாகக் கூறி, விடை பெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.14]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ යෝජනාව කොටස් කරගෙන කථා කළොත්, මෙහි හරය විධියට කියනවා වර්තමානයේ තිබෙන්නේ අයහපත් ආර්ථික කළමනාකරණයක් කියලා. උද්ධමනය, රුපියල අවප්‍රමාණය වීම විශාල ගැටලුවක් හැටියට තිබෙනවා කියලා කියනවා. ඊළඟට කියනවා, එල් නිනෝ තත්ත්වයක් ඉස්සරහට එනවා, ඒකට මුහුණ දෙන්න ආණ්ඩුව සූදානම් නැහැ කියලා. නිෂ්පාදනය අනතුරේ කියලාත් කියනවා. සහල් ආනයනය නිසා ගැටලුවක් ඇති වෙනවා කියලාත් කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක වර්තමානයේ තිබෙන තත්ත්වය නොවෙයි. හැබැයි මේ විපක්ෂය බලාපොරොත්තු වෙච්ච තත්ත්වය තමයි මේක. මේ මොහොත වනකොට මේ වාගේ තත්ත්වයක් පැනනඟියි කියලා එතුමන්ලා බලාපොරොත්තු වුණා. ඒ නිසා මේ යෝජනාව කලින් ලියපු එකක් කියලායි මට හිතෙන්නේ. මෙය ඉදිරි අනාගතයේදී ඉදිරිපත් කරන්න බලාපොරොත්තුවෙන් ලියලා තිබෙන යෝජනාවක් කියලා මට හිතෙනවා. මේක විපක්ෂ නායක කාර්යාලයේ - office එකේ - ලාච්චුවේ තිබිච්ච යෝජනාවක්. විපක්ෂයෙන් යෝජනාවක් දෙන්න කියලා කිව්වාට පස්සේ එහි කාර්ය මණ්ඩලයේ කවුරු හරි මේක අරගෙන ඇවිල්ලා අපේ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට දෙන්න ඇති කියලා තමයි මම හිතන්නේ. මොකද, මෙහි තිබෙන්නේ, දැන් තිබෙන තත්ත්වයක් ගැන නොවෙයි. එක්කෝ, කබීර් හෂීම් මන්ත්‍රීතුමා එළියෙන් හිටගෙන මේක ලියලා තිබෙනවා වෙන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එළියෙන් හිට ගත්තාම තිබෙන දේ ඇනෙක් පැත්තට තමයි අපට පෙනෙන්නේ. ඒ නිසා කබීර් හෂීම් මන්ත්‍රීතුමාට සාධාරණයක් කරන්න නම් එළියෙන් හිටගෙන තමයි මම මෙතැන කථා කරන්න ඕනෑ. එතකොට මේ යෝජනාව ගැන කථා කරනවා නම්, මේ මේසය උඩ හිටගෙන මම මයික් එකට කථා කරන්න ඕනෑ.

මෙතුමන්ලා බලාපොරොත්තු වෙච්ච දේ, මෙතුමන්ලා ප්‍රාර්ථනා කරපු දේ තමයි මෙහි තිබෙන්නේ. අවුරුද්දක්, හමාරක් යනකොට මේ ආණ්ඩුව ඉවරයි කියලා ඒගොල්ලෝ කිව්වා. ඒගොල්ලෝ එහෙම කල්පනා කළා. "දිට්වා" සුළි කුණාටුව ආවා. ඒක ඉතාම ව්‍යසනකාරී තත්ත්වයක්. මේකෙන් ආණ්ඩුව ඉවරයි; මේකෙන් නාගන්නවා, මේකෙන් කාගන්නවා කියන එක තමයි ඒගොල්ලන් බලාපොරොත්තු වුණේ. ඊට පස්සේ ලෝක යුද තත්ත්වයක් ආවා. ඒකෙන් ආණ්ඩුව තවත් අවුල් වෙයි කියලා ඒගොල්ලන් බලාපොරොත්තු වුණා. ඒ නිසා ඇත්තටම පසුගිය සති කිහිපය ඇතුළත යම් ප්‍රමාණයකින් රුපියල අවප්‍රමාණය වුණාට පස්සේ ඩොලරයේ අගය රුපියල් 370ට විතර යයි කියලා ඒගොල්ලෝ හිතුවා. ඒ නිසා මේක ඩොලරයේ අගය රුපියල් 370කට විතර ගියාට පස්සේ කථා කරන්න බලාපොරොත්තු වෙච්ච යෝජනාවක්. හැබැයි, එහෙම වුණේ නැහැ. ඒක නිසා මේ යෝජනාව තුළින් ඉදිරිපත් කර තිබෙන තත්ත්වය නොවෙයි, දැන් පවතින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවක් හැටියට ගත්තාම අපි සියයට 100ක්ම මේ දේවල් සියල්ල සම්පූර්ණ කරගෙන තිබෙනවා කියලා මම කියන්නේ නැහැ. ඇත්තටම එහෙම නම් විපක්ෂය හැටියට කරන්න ඕනෑ, මේකට සාධාරණයක් ඉෂ්ට

කරන එකයි. එහෙම සාධාරණයක් ඉෂ්ට කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා නම් කීයටවත් මේ යෝජනාව ඉදිරිපත් කරලා ගෙදර ගිහින් නිදියන්නේ නැහැ. අඩුම ගණනේ මේ යෝජනාව ගැන කථා කරලා අවසන් වෙනතෙක්වත් මේ යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා මෙතැන ඉන්න ඕනෑ. සාමාන්‍යයෙන් සදාචාරය විය යුත්තේ එහෙමයි. ඒ වුණාට යෝජනාව ඉදිරිපත් කරලා එතුමා යන්න ගියා. අපි කියන එකක්වත් දන්නේ නැහැ. ආණ්ඩුව මේකට දක්වන ප්‍රතිචාරය මොකක්ද කියලා දන්නේත් නැහැ, යන්න ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපි ජනතාවගේ කිසිදු අවශ්‍යතාවක් අත් හැර නැහැ. මේ යෝජනාව තුළ සඳහන් වෙනවා, එල් නිනෝ තත්ත්වයට මුහුණ දෙන්න ජනතාව සූදානම් නැහැ කියලා. හැබැයි මම සඳහන් කරන්න කැමැතියි, මේ වෙලාවේත් ජනාධිපතිතුමා ඒ පිළිබඳව සාකච්ඡාවක් පවත්වන බව. අපි 16වැනි දා මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික්කය තුළ වෙනම කමිටුවක් පත් කර තිබෙනවා. නමුත් ඔවුන් කියන්නේ සූදානමක්වත් නැහැ කියලායි. ඇත්තටම ආණ්ඩුව - අපේ අමාත්‍යාංශ, අපේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු, ඒ වාගේම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු - විසින් හිතා බලා, මේ තත්ත්වයට මුහුණ දීම සඳහා සියල්ල සූදානම් කරනවා. මේ හේතුව නිසා ජල ප්‍රශ්නය එන්න පුළුවන්. විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කය තුළ දැනටත් ජල ප්‍රශ්නය තිබෙනවා. ඒකට හේතුව තමයි 2020 වසරේදී කොළඹට තිබුණු ජල ව්‍යාපෘතිය අතරමඟ නතර කිරීම. එහෙම නතර කරලා නිකම් හිටියා. ඒ නිසා මේ මොහොත වනවිට කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවට සාමාන්‍යයෙන් ලැබිය යුතු වතුර ප්‍රමාණයවත් ලැබෙන්නේ නැහැ. එම ව්‍යාපෘති අතරමඟ නතර කළා. එහෙම කිරීම නිසා ඊට පසුව අවුරුදු පහකින්, හයකින් එන තත්ත්වයට මුහුණ දෙන්නේ කොහොමද කියන කාරණය ගැන හිටපු ආණ්ඩුවලට සැලැස්මක් තබා, මේ ලෝකයේ දෙයක් තිබුණේ නැහැ. දැන් තමයි ඒවා ගැනත් කටයුතු කරන්නේ. ඒ විතරක් නොවෙයි. ඉදිරි අවුරුදු 15කට, 20කට අදාළ කටයුතු සිදු කළ යුත්තේ කොහොමද කියන කාරණය සම්බන්ධව ගත්තත්, ඇත්තටම දැන් තමයි ආණ්ඩුවක් හැටියට බොහොම වගකීමෙන් යුතුව එම කටයුතු සිදු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන අපේ රටේ ජනතාව දන්නවා; ගම්වල මිනිස්සු දන්නවා. මේ ආණ්ඩුව මොන තරම් කැප කිරීමක් කර තිබෙනවාද කියා ජනතාව දන්නවා. තිබුණු තත්ත්වය වෙනස් කරලා රටට හොඳක් කරන්න, ජනතාවට ලස්සන ජීවිතයක් ගත කරන්න පුළුවන් වාතාවරණයක් ගොඩ නඟන්න අපි ආණ්ඩුවක් හැටියට කොයි තරම් කැප කිරීමක් කරනවාද කියලා මේ රටේ ජනතාව දන්නවා. හැබැයි, විපක්ෂයේ මේගොල්ලන්ට ඒ ගැන දැන ගන්න විධියක් නැහැ. මොකද, මම හිතන විධියට මේගොල්ලන් ජනතාව ඇඟින්වත් දකින්නේ නැහැ. මේගොල්ලන් ගමකට බහින්නේ නැහැ. මම දන්නේ නැහැ, අපට නම් හමු වෙන්නේ නැහැ.

මේ එල් නිනෝ තත්ත්වයට අපි මුහුණ දෙන්න ඕනෑ. ඒක ආණ්ඩුවකට වඩා රටකට තිබෙන වගකීමක්. එහෙම නම් අඩුම ගණනේ මේවා ගැන සාකච්ඡා කරන තැනකට ඔය විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙකුවත් එන්න ඕනෑ. නමුත් එහෙම එන්නේ නැහැ. මම කොළඹ දිස්ත්‍රික්කයේ නිසා දන්නවා, සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා නියෝජනය කරන්නේ කොළඹ දිස්ත්‍රික්කය. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරනවා. මරික්කාර් මන්ත්‍රීතුමා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරනවා. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරනවා. නමුත් අඩුම ගණනේ මේවා ගැන සාකච්ඡා කරන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවකට, අනුකමිටුවකට - මේ කිසි දේකට - පැත්ත පළාතක ඒ අය එන්නේ නැහැ. ජනතාව සම්බන්ධව ඒ අයට ඇත්තටම කැක්කුමක් තිබෙනවා නම්, විපක්ෂයට ගියාට පසුව හෝ මේවා සම්බන්ධව ඒගොල්ලන්ට සංවේදීකමක් තිබෙනවා නම් අඩුම ගණනේ මේ සම්බන්ධව කටයුතු කරන්න අපි හදාගෙන තිබෙන ව්‍යුහයන් තුළ මේගොල්ලන් ඉන්න ඕනෑ; ඒවා ඇතුළේ ජීවත් වෙන්න ඕනෑ. නමුත් මේ අය ඒවා ඇතුළේ නැහැ. ඒ නිසා සම්පූර්ණයෙන්ම මේ යෝජනාව තුළ තිබෙන්නේ ආණ්ඩුවට විරුද්ධව මොනවා හරි දෙයක් කියලා සමාජ මාධ්‍යවලට ඒක යවා ගන්න තිබෙන වුවමනාවක් පමණයි කියන කාරණය අපට පෙනී යනවා.

අද මේ යෝජනාව සම්බන්ධව කථා කරනකොට විපක්ෂයේ සංවිධායකතුමා කිව්වා, "ඔයගොල්ලන් අපෙන් හෝ ඉගෙන ගන්න. නිහතමානීව අපෙන් ඉගෙන ගන්න. ඔයගොල්ලන්ගේ පන්ති පහ විතරක් කරලා හරියන්නේ නැහැ. ඒ නිසා අපෙන් ඉගෙන ගන්න" කියලා. ඇත්තටම, අවංකවම එතුමන්ලාගෙන් ඉගෙන ගන්න දෙයක් තිබෙනවා නම් අපි ඉගෙන ගන්නවා. අපි එහෙම අවංක මිනිස්සු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි, අපි ඒගොල්ලන්ගෙන් ඉගෙන ගෙන ඉවරයි. අපි ජීවිත අවබෝධය ලැබුවේ ඒගොල්ලන්ගෙන්. ඒගොල්ලන්ගේ පාලනයන් ගැන ඉගෙන ගෙන තමයි අපි මේ වැඩ කටයුතු කරන්නේ. ඒ නිසා අපි හොඳට ඉගෙන ගෙන තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජේ.ආර්. ජයවර්ධනගෙන් අපි ඉගෙන ගෙන තිබෙනවා. අපි ඒගොල්ලන්ගෙන් ජීවිත අවබෝධය ලබා ගෙන තිබෙනවා. රණසිංහ ප්‍රේමදාසගෙන් අපි ඒ අවබෝධය ලබා ගෙන තිබෙනවා. රනිල් වික්‍රමසිංහගෙන් අපි ඒ අවබෝධය ලබා ගෙන තිබෙනවා. ඒ නිසා අපි හොඳට ඒගොල්ලන්ගෙන් ඉගෙන ගෙන තිබෙනවා. හොඳට ජීවිත අවබෝධය ලබා ගෙන තිබෙනවා. හැබැයි, ඒගොල්ලන්ට තවත් අපට මොනවා හෝ උගන්වන්න තිබෙනවා නම් රෑ පන්තියක් හරි දාන්න, අපි එනවා. අපි එහෙම මිනිස්සු; එහෙම නිහතමානී මිනිස්සු. ඇත්තටම ඒගොල්ලන් හිතනවා නම් අපට තවදුරටත් උගන්වන්න දෙයක් ඒගොල්ලන්ට තිබෙනවා කියලා, රෑ පන්තියක් හරි දාන්න, අපි ඉගෙන ගන්න එනවා. අපි කැමැතියි, හර්ෂ ද සිල්වාගෙන් ඉගෙන ගන්න. අපි කැමැතියි, කබීර් හෂීම්ලාගෙන් ඉගෙන ගන්න. දාන්න රෑ පන්තියක් හරි, අපි එනවා. හැබැයි අපි දන්නවා, ඔයගොල්ලන්ගෙන් ඉගෙන ගන්න දෙයක් අපට නැහැ කියලා. ඔයගොල්ලන්ගෙන් ඉගෙන ගන්න දේවල් ටිකක් තිබෙනවා. හැබැයි, ඒවා ඉගෙන ගන්න අපි කැමැති නැහැ. මොකද, ඒ subject අපි කරන්නේ නැහැ. ඒවා අපට වැඩක් නැහැ. ඒ උගන්වන්න කථා කරන එකේ තිබෙන්නේ ඒ දේවල්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම IMF එක සම්බන්ධව මෙතැනදී සාකච්ඡා කළා. අපි බලය ගන්න ඉස්සෙල්ලා කිව්වේ කොහොමද? එතකොට කිව්වේ බලය ගත්ත ගමන් IMF එක අපව දාලා යනවා කියලායි. දැන් කියන්නේ මොනවාද? IMF එක කියන විධියට අපි වැඩ කරනවාලු. ඒගොල්ලන් හිටියා නම් එහෙම තමයි. නමුත්, දැන් වෙන්නේ එහෙම එකක් නොවෙයි. IMF එක අපට යට වෙලාත් නැහැ, අපි IMF එකට යට වෙලාත් නැහැ. එහෙම වෙන්න ඕනෑත් නැහැ. ඒ නිසා බොහෝ දේවල් ඒගොල්ලන් හිර කරපු තැනක් තිබෙනවා, ඒගොල්ලන් ගෙනැල්ලා අතහැරපු තැනක් තිබෙනවා. එතැනට හිර වෙලා ඉන්නේ නැතිව අපේ ඇමතිවරුන්, ජනාධිපතිතුමා IMF එකත් එක්ක සාකච්ඡා කරමින් අපට මැද තැනක ඉන්න පුළුවන් විධියට ඉදිමින් තමයි අපි රාජ්‍ය පාලනය ගෙන යන්නේ. හැබැයි, අද කියන්න යන්නේ ඒකේ අනෙක් පැත්ත, IMF එක කියන විධියට අපි වැඩ කරනවා, ඒකට අනුව තමයි අපි වැඩ කරන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම කියන්න දෙයක් නැතිවට කියන දේවල් තමයි මේ. ඇත්තටම කියනවා නම් වේදනාවට කථා කරන දේවල් තමයි මේ. මේ යෝජනා ඇතුළේ තිබෙන්නේත් ඒකයි. එල් නිනෝ තත්ත්වයක් ඇවිල්ලා හරි කමක්

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා]

නැහැ, මේ රට විනාශ වෙනවා නම් හරි කැමැත්තෙන් ඉන්නේ. මොකක් හරි එකකින් අපි විනාශයකට ගොදුරු වෙනවා නම් කැමැතියි. ඒගොල්ලන්ට ජනතාව සම්බන්ධ නැහැ, රට සම්බන්ධ නැහැ. එහෙම මොකක් හරි ස්වාභාවික ව්‍යසනයක් ඇවිල්ලා හරි මේ රට විනාශ වෙලා යනවා නම් කැමැත්තෙන් තමයි මේ ඉන්නේ. එහෙම නැතිව මේ යෝජනා ඇතුළේ තිබෙන්නේ අවංකකමක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 07ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.26]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, Easter attackஇன் உண்மைகளை நாளுக்கு நாள் வெளிக்கொண்டுவரும் விதத்திலும், உண்மையான குற்றவாளிகளை விரைவாக நாட்டு மக்களுக்குக் காண்பித்து இத்தாக்குதலில் உயிரிழந்த, அங்கவீனமுற்ற, காயமடைந்த மற்றும் பாதிப்புகளுக்குள்ளான சமூகத்தினருக்கு ஆறுதலை அளிக்கக்கூடிய விதத்திலும் மாண்புமிகு சனாதிபதி அநுரகுமார திஸாநாயக்க தலைமையிலான இந்த அரசாங்கம் செயற்படுமென்ற நம்பிக்கை இருக்கின்றது. இது தொடர்பில் முயற்சி எடுக்கும் அரசாங்கத்துக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்தத் தாக்குதல் இடம்பெற்ற காலகட்டத்தில் இலங்கையில் அல்-குர்ஆன் மற்றும் சுன்னாவைப் பின்பற்றியவர்களை, சிலர் திட்டமிட்டுக் காட்டிக்கொடுத்தும் பிழையான தகவல்களை வழங்கியும் கஷ்டங்களுக்கு உள்ளாக்கினார்கள். அதுமாத்திரமன்றி, பள்ளிவாசல்களுக்குப் பாதிப்பு ஏற்படும் விதத்திலும் செயற்பட்டார்கள். அவ்வாறு செயற்பட்ட அந்தக் குழுவினரையும் விரைவாக விசாரிக்க வேண்டும். இந்தத் தாக்குதலால் கிட்டத்தட்ட 2,000 உலமாக்கள் பாதிக்கப்பட்டார்கள். அல்-குர்ஆனையோ, அரபு மொழிப் புத்தகத்தையோ வீட்டில் வைத்திருக்க முடியாத நிலைமை அன்று இருந்தது. எனவே, பொய்க் குற்றச்சாட்டுகளைச் சுமத்தி, அவர்களைக் காட்டிக்கொடுத்தவர்களை விரைவாக கைதுசெய்யக்கூடிய விதத்தில் விசாரணைக் குழுவொன்றை நியமிக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

தற்போது இந்த நாட்டில் போர் இல்லை. எனினும், தன்னுடைய பாடலினூடாக சில கருத்துகளை வெளிப்படுத்தியதற்காக சங்கீத்சன் என்பவரை அவசரகாலச் சட்டத்தின்கீழ் கைதுசெய்து இருக்கிறார்கள். நீங்கள் ஆட்சிக்கு வருவதற்கு முன்னர் கூறிய பிரதான விடயம் என்னவெனில், "நாங்கள் ஆட்சிக்கு வந்தவுடன் பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்குவோம்" என்றுதான். ஆனால், இன்று இஸ்ரேலுக்கு எதிராக யாராவது கதைத்தால் உடனே அவரை பயங்கரவாத தடைச் சட்டத்தைப் பயன்படுத்தி கைதுசெய்கிறீர்கள். இன்றைக்கு இந்த நாட்டில் போர் இல்லாத சூழ்நிலையிலே, சங்கீத்சன் தன்னுடைய கருத்தைப் பாடலூடாகச் சொன்னார். அந்தப் பாடலைக் கேட்பதால் பாரிய பிரச்சினை ஏற்படப் போவதில்லை. எனவே, கைதுசெய்யப்பட்டுள்ள சங்கீத்சனை விரைவாக விடுதலை செய்வதோடு, அன்று நீங்கள் கூறியதுபோன்று பயங்கரவாதத் தடைச் சட்டத்தையும் விரைவாக நீக்க வேண்டுமென கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து இன்னொரு விடயத்தைக் கூற விரும்புகின்றேன். அரசாங்கமானது அரிசியை இறக்குமதி செய்ததால், வடக்கு, கிழக்கு மாகாணங்களில் பெரும்போகத்தின்போது உற்பத்தி செய்யப்பட்ட நெல்லை மக்கள் இன்னும் விற்க முடியாமல் இருக்கின்றார்கள். தற்பொழுது, எங்களுடைய பகுதிகளில் சிறுபோக அறுவடையும் நடைபெறுகின்றது. அப்படியானால் இந்த நெல்லை எப்படி விற்பனை செய்வது? எனக் கேட்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தேவையான அரசிதான் இறக்குமதி செய்யப்பட்டதென ஆளுந்தரப்பால் கூறப்படுகின்றது. கீரி சம்பாவுக்குப் பதிலான அரிசியை மட்டும் இறக்குமதி செய்திருந்தால் பரவாயில்லை! பால்பொன்னி அரிசிதான் அதற்குப் பொருத்தமெனக் கூறுகின்றார்கள். ஆனால், பொன்னி சம்பாவை இறக்குமதி செய்து எல்லா வகையான அரிசி சம்பந்தமாகவும் பிரச்சினையை ஏற்படுத்திவிட்டார்கள். இதனால் விவசாயிகளுக்குப் பாரிய பாதிப்பு ஏற்பட்டுள்ளது. இந்த அரசாங்கத்தில் நல்ல விடயங்கள் நடப்பதுபோல் மக்களுக்குப் பாதிப்பான விடயங்களும் நடக்கின்றன. எனினும், இவ்வாறான செயற்பாடுகளால் விவசாயிகள் விவசாய நடவடிக்கைகளிலிருந்து ஒதுங்கவேண்டிய நிலைமை ஏற்படும். எனவே, இந்த விடயத்தில் அரசாங்கம் கவனம் செலுத்தி, விவசாயிகளைப் பாதிக்காத வகையில் செயற்பாடுகளைச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

மாண்புமிகு சனாதிபதி அவர்கள் எமது மாவட்டத்துக்கு வருகை தந்தபோது, அங்கு 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட மீனவர்களுக்கு உலருணவுப் பொதியொன்றைக் கொடுக்குமாறு கூறினார். ஏனென்றால், அவர்கள் பல நாட்கள் தொழிலுக்குப் போகாமல் இருந்தார்கள். இது சம்பந்தமாக நல்லதொரு முடிவை எடுத்து, அதனை வழங்குவதற்குரிய நடவடிக்கைகளை எடுக்குமாறு சனாதிபதி அவர்கள் அன்று சொன்னார். எனினும், அவர்களுக்கு உலருணவுப் பொதி வழங்கப்படவில்லை. வானிலை மாற்றம் காரணமாக, குறிப்பாக காற்றழுத்தம் காரணமாக மீனவர்கள் அடிக்கடி பாதிக்கப்படுகிறார்கள். முல்லைத்தீவு, மன்னார், கிளிநொச்சி, யாழ்ப்பாணம் போன்ற மாவட்டங்களிலும் கிழக்கு மாகாணத்திலும் இவ்வாறான நிலைமை காணப்படுகின்றது. எனவே, 'தித்வா' அனர்த்த காலத்தில் அவர்களுக்கு வழங்கப்படாத நிவாரணத்தைக் கொடுப்பதற்குரிய ஏற்பாடுகளைச் செய்யுமாறு கேட்டுக் கொள்கின்றேன்.

அண்மையில் நாங்கள் அம்பாறை மாவட்டத்துக்குச் சென்றிருந்தவேளை, அங்குள்ள மக்கள் மிகவும் ஆதங்கப்பட்டார்கள். ஏனெனில், ஒலுவில் வர்த்தகத் துறைமுகத்தைச் சரியான திட்டமிடல் இல்லாமல் அமைத்ததாக அந்தச் சமூகத்தின் விடிவுக்காகப் பாடுபட்ட தலைவர் மர்ஹூம் அஷ்ரஃப் அவர்கள்மீது குற்றம் சுமத்தியிருந்தமைதான். அந்தக் குற்றச்சாட்டை முஸ்லிம் சமூகம் நிராகரிக்கின்றது. அதிகாரிகள் சிலர் சொல்கிறார்கள்

என்பதற்காக நேரடியாக சனாதிபதி அவர்கள் அவ்வாறான குற்றச்சாட்டுகளை முன்வைக்கக் கூடாது. அதன் உண்மைத் தன்மை தெரியாமல், அவர் மர்ஹூம் அஷ்ரப் அவர்கள்மீது குற்றச்சாட்டுகளை சுமத்தியதையிட்டு நாங்கள் மிகுந்த மனவேதனை அடைகின்றோம்.

அம்பாறை மாவட்டத்தில் ஆழ்கடல் மீன்பிடியில் ஈடுபடுகின்றவர்கள் கல்முனை, சாய்ந்தமருது, மாளிகைக்காடு போன்ற பிரதேசங்களிலே அதிகமாக இருக்கின்றார்கள். இவர்கள் தங்களுடைய boatsஐ 70 கிலோமீற்றர் தூரத்துக்கு அப்பால் இருக்கும் வாழைச்சேனை பகுதியிலே கட்டவேண்டி இருக்கிறது. எனவே, அவர்களுக்கு ஒரு மீன்பிடித்துறைமுகம் அவசியமாகத் தேவைப்படுகின்றது. அதனைப் பொருத்தமானதோர் இடத்தில் அமைத்துக் கொடுப்பதற்குரிய ஏற்பாடுகளைச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
தயவுசெய்து, ஒரு நிமிடம் தாருங்கள்!

கடற்கொள்ளையர்களால் ஆழ்கடல் மீனவர்களுக்குப் பாரிய பிரச்சினை ஏற்பட்டுள்ளது. 40 horsepower கொண்ட steamboatsஇல் வந்துதான் கடற்கொள்ளையர்கள் கொள்ளையடிக்கிறார்கள். இதனை உடனடியாக தடுத்து நிறுத்தும் வகையில், Navyஆனது steamboatsக்கும் pass கொடுக்கின்ற systemஐக் கொண்டுவர வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
தயவுசெய்து, 10 வினாடிகள் தாருங்கள்!

கல்முனை - நிந்தவூர் - அட்டாளைச்சேனை - அக்கரைப்பற்று கடற்கரை பகுதி கடலரிப்புக்கு உள்ளாகியுள்ளது. இதனால் கல்முனைக்குடி கடற்கரை பள்ளிவாசல் அழியக்கூடிய நிலையில் இருக்கின்றது. உடனடியாக அதனைப் பாதுகாப்பதற்குரிய நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். அங்கு கடலரிப்பைத் தடுப்பதற்குரிய வேலைகள் நடந்தாலும், அவை மிகவும் slowஆகவே நடக்கின்றன. இப்படியே போனால் இன்னும் பாரிய அழிவுகள் ஏற்படும். எனவே, இதற்குரிய நிதியை அதிகமாக ஒதுக்கிக்கொடுத்து, அந்த வேலைகளை விரைவுபடுத்துமாறு கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිශාන්ත ජයවීර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.34]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ සභාව කල් තැබීමේ යෝජනාවේ මුලින්ම තිබෙන්නේ "පවතින අයහපත් ආර්ථික කළමනාකරණය..." කියායි. අයහපත් ආර්ථික කළමනාකරණය කියන එක කියන්න තිබුණේ මීට අවුරුදු දෙකතුනකට සහ ඊට පෙර අවුරුදු සම්බන්ධයෙනුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික කළමනාකරණය අයහපත් නම් අපි 2026 අවුරුද්දේදී මැද පෙරදිග අර්බුදයෙන් පීඩාවට පත් වුණු ජනතාව වෙනුවෙන් රුපියල් බිලියන 100ක මුදලක් සහනාධාර වශයෙන් ලබා දෙන්න වෙන් කරලා තිබෙන්නේ කොහොමද? අපේ ආර්ථිකය එහෙම අයහපත් විධියට කළමනාකරණය කළා නම් ඒ රුපියල් බිලියන 100 වෙන් කරන්නේ කොහොමද? ඊට අමතරව "දිට්වා" සුළි කුණාටුව නිසා විපතට පත් වුණු ජනතාව නඟාසිටුවන්න රුපියල් බිලියන 500ක් වෙන් කරනවා. මෙන්න මෙවැනි විශාල අරමුදල් ප්‍රමාණයක් වෙන් කරන්නේ බාහිරින් ණය ගන්නේ නැතුවයි. ආර්ථික කළමනාකරණය අයහපත් නම් එහෙම රුපියල් බිලියන 500ක් වෙන් කරන්න හැකියාවක් තිබෙනවාද?

අනික් කාරණය මේකයි. අපි දැන් ජනතාවට සහන දෙන්නේ නැහැ කියනවා. නමුත්, අපි ජනතාවට සහන ලබා දෙන්න මොනවාද කර තිබෙන්නේ කියා මෙතුමන්ලා සොයා බලන්න ඕනෑ. විශේෂයෙන්ම රජය විසින් ඉදිරිපත් කළ රුපියල් බිලියන 100ක සහන පැකේජය තුළින් විදුලි බිල වැඩි වීම වෙනුවෙන් ජනතාවට සහනයක් ලබා දෙන්න මෑතකදී අපි තීරණය කර තිබෙනවා. ලෝක අර්බුදය හමුවේ ඉන්ධන මිල සහ වෙනත් ගාස්තු වැඩි වීම හේතුවෙන් විදුලි බිල වැඩි වීම සියයට පහකට විතරක් සීමා කරලා, ජනතාව වෙනුවෙන් ලබා දෙන සහනය රජය විසින් මාස තුනක් සඳහා දරා ගන්න අදාළ කටයුතු කර තිබෙනවා.

ඊට අමතරව ධීවර යාත්‍රාවක් වෙනුවෙන් ඉන්ධන ලීටර් 25ක් බැගින් මසකට උපරිම දින 25ක් දක්වා ලීටරයට රුපියල් 50ක් බැගින් සහනාධාරයක් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ඊට අමතරව යල කන්නය සඳහා හෙක්ටෙයාරයකට ලබා දෙන පොහොර සහනාධාරය වැඩි කර තිබෙනවා. පොහොර සහනාධාරය හැටියට රුපියල් 15,000ක් තමයි කලින් තිබුණේ. අපි ආවට පසුව ඒ සහනාධාරය රුපියල් 25,000ක් කළා. ඒ රුපියල් 25,000 මුදල නැවත රුපියල් 30,000ක් දක්වා වැඩි කරන්නත් අපි කටයුතු කර තිබෙනවා. ඊට අමතරව කුඹුරුවල වී වගාවට අමතරව වගා කරනු ලබන අතිරේක භෝග සඳහා ලබා දෙන පොහොර සහනාධාරය හෙක්ටෙයාරයකට රුපියල් 18,000 දක්වා වැඩි කරන්නත්, යල කන්නය සඳහා යූරියා කිලෝග්‍රෑම් 50ක පොහොර මිටියක් රුපියල් 10,200ක ස්ථාවර මිලකට ලබා දෙන්නත් අපි කටයුතු කර තිබෙනවා. මොකද, මේ අර්බුදය හමුවේ පොහොර මිල, ඉන්ධන මිල ආදී සියලු දේවල්වල මිල වැඩි වෙනවා. ඒ වැඩි වන මිල රජය විසින් දරාගෙන යූරියා පොහොර ස්ථාවර මිලකට ගොවීන් වෙත ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ඊටත් අමතරව අස්වැසුම ප්‍රතිලාභීන්ට රුපියල් 7,500ක්, 5,000ක් සහ 2,500ක් වශයෙන් ඒ දීමනාව වැඩි කරන්නත් කටයුතු කර තිබෙනවා.

බහුදින ධීවර යාත්‍රාවක් සඳහා රුපියල් 150,000ක එකවර ගෙවනු ලබන දීමනාවක් ලබා දෙන්නත් අපි කටයුතු කර තිබෙනවා. එතැනිනුත් එහාට ගිහිල්ලා රුපියල් 4,000ක පොහොර

[ගරු නිශාන්ත ජයවීර මහතා]

සහනාධාරය ලබා දෙන කුඩා තේ වතු සඳහා පොහොර කිලෝග්‍රෑම් 50ක මිටියකට රුපියල් 5,000ක එක්වරක් පමණක් ගෙවන දීමනාවක් ලබා දෙන්නත් කටයුතු කර තිබෙනවා. ඒ කටයුතු සඳහා රුපියල් බිලියන 100ක අමතර වියදමක් දරන්න සමත් වුණේ රජය වඩාත් හොඳින්, ඉතාම නිවැරදිව මේ ආර්ථිකය කළමනාකරණය කිරීම නිසායි.

ඊට අමතරව අපි රුපියල් බිලියන 500ක් වෙන් කළා, "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වූ ජනතාව නඟාසිටුවන්න. එතැනින් රුපියල් බිලියන 100ක මුදලක් හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කර ගැනීම වෙනුවෙන් සහ නැවත ගොඩනැඟීම වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. ඊටත් අමතරව "දිට්වා" සුළි කුණාටුව නිසා හානියට පත් වුණු පාලම්, බෝක්කු, පාරවල්, ගොඩනැඟිලි යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා රුපියල් බිලියන 250ක පමණ මුදලක් වෙන් කරන්න සමත් වෙලා තිබෙනවා.

එම ආපදාවෙන් විපතට පත් වුණු සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් නඟාසිටුවන්නත් අපි කටයුතු කර තිබෙනවා. මොකද, ඒ ආපදාවෙන් විපතට පත් වුණු සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් විශාල ප්‍රමාණයක් හිටපු බව අපි දන්නවා. ඔවුන් නඟාසිටුවන්න අවශ්‍ය කටයුතු අපි කළේ නැත්නම් මේ ආර්ථිකය ඉහළට ගෙන ඒමේ කටයුත්තට අපට ඒගොල්ලන්ගේ දායකත්වය ලබා ගන්න බැරි වෙනවා. ඒක ආර්ථික වර්ධනය ලබා ගන්න බැරි වීමට ප්‍රශ්නයක් වන නිසා අපි ඒ වෙනුවෙන් රුපියල් බිලියන 150ක මුදලක් වෙන් කළා. ඔන්න ඔය විධියට අපි මේ ආර්ථිකය තුළ ඒ වෙනුවෙන් රුපියල් බිලියන 500ක මුදලක් වෙන් කර තිබෙනවා. අපි පිටින් ණය ගත්තේ නැතුවයි ඒ දේවල් කළේ.

පසුගිය අය වැය තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙනුවෙන් සහන පොලියට ණය ලබා දෙන යෝජනා ක්‍රම කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ සඳහා රුපියල් බිලියන 95ක මුදලක් වෙන් කර තිබෙනවා. ඊටත් අමතරව පසුගිය අය වැයෙන් අපි රාජ්‍ය සේවකයින්ගේ වැටුප් අදියර තුනකින් වැඩි කරන්න කටයුතු කළා. මෑත කාලීන ඉතිහාසයේ රාජ්‍ය සේවකයින්ගේ මූලික වැටුප ඉතා විශාල මුදලකින් වැඩි කළ පළමු අවස්ථාව තමයි ඒ. ඒ වෙනුවෙන් එක් අවුරුද්දකට රුපියල් බිලියන 110ක පමණ වියදමක් දරනවා. අවුරුදු තුනේදී වැටුප් වැඩි කිරීම වෙනුවෙන් රුපියල් බිලියන 330ක පමණ වියදමක් දරන්න අපට සිද්ධ වෙනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මධ්‍යම කඳුකරයේ, මලෙයහම් ජනතාවගේ; ඒ වතු කම්කරු ජනතාවගේ දෛනික වැටුප වැඩි කරන්න සහ ඊට සමගාමීව පෞද්ගලික අංශයේ අවම වැටුප වැඩි කරන්න අවශ්‍ය සියලු කටයුතු කරලා තිබෙනවා. අපේ ආර්ථිකය හොඳින් කළමනාකරණය කළේ නැත්නම් මේවා කරන්නේ කොහොමද කියලා මම විපක්ෂයෙන් අහන්න කැමැතියි. ඊටත් අමතරව, අපි 2026 ජාතික අය වැයෙන් - පුරවැසි අය වැයෙන් - සිද්ධ කර තිබෙන සියලුම දේවල් ඕනෑම පුරවැසියෙකුට බලා ගන්න පුළුවන් විධියට මුදල් අමාත්‍යාංශයේ website එකට ඇතුළත් කර තිබෙනවා. මම විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට ආරාධනා කරනවා, ඒ website එකට ගිහිල්ලා මේ තොරතුරු අරගෙන බලන්න කියලා. එතකොට, අපි මේ අය වැයෙන් මොකක්ද කරලා තිබෙන්නේ, මොන සහනාධාරද දීලා තිබෙන්නේ කියලා ඉතා පැහැදිලිව බලන්න පුළුවන්. මේක හරියට කියෙව්වොත් පේනවා, මේ වාගේ සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කරන්න හේතුවකුත් නැහැ කියලා.

මෙහිදී අපේ ජනතාවට දැනෙන විශේෂ කාරණයක් විධියට අපේ ප්‍රවාහන පද්ධතිය ගන්න පුළුවන්. ප්‍රවාහන පද්ධතිය ගත්තොත්, ජාතික මාර්ග කිලෝමීටර 12,500ක් වැඩිදියුණු කරන්න, ඊටත් අමතරව පළාත් මාර්ග කිලෝමීටර 12,800ක් වැඩිදියුණු කරන්න, ග්‍රාමීය මාර්ග කිලෝමීටර 100,000ක් වැඩිදියුණු කරන්න සහ අධිවේගී මාර්ග කිලෝමීටර 50ක් අලුතින් ඉදිකරන්න අපි මේ අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඊට අමතරව කුරුණෑගල සිට දඹුල්ල දක්වා වන අධිවේගී මාර්ගයේ වැඩකටයුතු නොවැම්බර් මාසයේ සිට ආරම්භ කරන්නත් අපි මෑතකදී තීරණයක් ගත්තා. ඒ වාගේම නව දුම්රිය බලවේග කට්ටල 6ක් සහ නව බස් රථ 600ක් අලුතින් ගෙන්වන්නත්, තවත් බස් රථ 300ක් අලුත්වැඩියා කරන්නත් කටයුතු කරනවා. ඒ යටිතල පහසුකම් වැඩි කරන්න සහ සංවර්ධන කටයුතු වෙනුවෙන් විශාල මුදලක් වැය කරලා තිබෙනවා. ඉතින්, අපි ජනතාවට සහන දුන්නේ නැහැ කියලා විපක්ෂය කිව්වත්, ඉතා විශාල සහන පැකේජයක් මේ අය වැය ඇතුළේ තිබෙනවා. අපි විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට ආරාධනා කරනවා, මේක හොඳින් පරිශීලනය කරන්න කියලා. එතකොට, එතුමන්ලාට දැන ගන්න පුළුවන්, අපි ආර්ථිකය වෙනුවෙන් මොකක්ද කරලා තිබෙන්නේ කියලා.

මේවාට අමතරව විශේෂයෙන් කිව යුතු තව දෙයක් තිබෙනවා. 2025 වසරේ ඉදිරිපත් කළ අය වැය තුළ අපේ අයහපත් ආර්ථික කළමනාකරණයක් තිබෙනවා නම් කොහොමද මෙන්න මේ කියන කාරණා මෙහෙම වෙන්නේ? විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුළු සියලු ජාත්‍යන්තර මූල්‍ය ආයතන පැහැදිලිව ප්‍රකාශයට පත් කර තිබෙනවා, "ශ්‍රී ලංකා රජය විසින් ගත් සාධනීය පියවර ඇතුළේ ආර්ථිකය වඩාත් හොඳින් කළමනාකරණය කර තිබෙනවා, ඒ කළමනාකරණය කිරීම ඇතුළේ තමයි බාහිර කම්පනයන්වලදී පිටින් ආධාර ගන්නේ නැතුව ශක්තිමත් විධියට මුහුණ දෙන්න රජයට හැකියාව ලැබෙන්නේ" කියලා. ඉතින්, අපි අය වැයේ සංඛ්‍යාලේඛන ටිකක් බැලුවොත්, අපි සියයට 5ක ආර්ථික වර්ධන වේගයක් අත් පත් කර ගන්න සමත්වෙලා තිබෙනවා. හැබැයි, 2025 අවුරුද්දේ අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 3.5ක වාගේ මට්ටමකට එයි කියලා තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රකාශයට පත් කළේ, එහෙම නැත්නම් ඔවුන් බලාපොරොත්තු වුණේ. "දිට්වා" සුළි කුණාටුවටත් මුහුණ දෙමින් අපි ඒ පුරෝකථනවලින් එහාට ගිහිල්ලා අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 5ක මට්ටමේ පවත්වාගන්න සමත් වුණා. නමුත්, අපේ මේ සියයට 5ක ආර්ථික වර්ධන වේගය ගැන විපක්ෂය විසින් ප්‍රශ්න කළා. එතුමන්ලා බලයේ හිටපු සමහර කාලවල ආර්ථික වර්ධන වේගය සියයට 1.22යි, ඒ වාගේම සෘණ ගණනුත් තිබුණා. ඒ විධියට තිබුණු ආර්ථිකයක් තමයි අපි ක්‍රමානුකූලව වර්ධනය කර ගන්න අවශ්‍ය කටයුතු කරන්නේ.

අපි පිළිගන්නවා, සියයට 5ක ආර්ථික වර්ධන වේගය තව වැඩි කරන්න ඕනෑ බව. ආර්ථික වර්ධන වේගය සියයට 7ක මට්ටමකට අරගෙන යන්න අවශ්‍ය අපේ මධ්‍ය කාලීන ප්‍රතිපත්තිය තමයි අපේ මේ අය වැයේ සඳහන් කර තිබෙන්නේ. අන්න ඒ ප්‍රතිපත්තියට අනුකූල වන විධියට තමයි අපි අය වැය සකස් කර තිබෙන්නේ. ඉතින්, ඒ විධියට ඉදිරියේදී අපේ අය වැය යෝජනා ක්‍රියාත්මක වෙමින් යටිතල පහසුකම් දියුණු වෙනකොට ආර්ථික වර්ධන වේගය සියයට 7 මට්ටමට අරගෙන යන එක තමයි අපේ මධ්‍යකාලීන ප්‍රතිපත්තිය වෙන්නේ. අපි එතැනට යන ගමනේදී විශේෂ ජයග්‍රහණ රාශියක් ලබාගෙන තිබෙනවා. ඇමෙරිකානු ඩොලර් බිලියන 99ක්ව තිබුණු අපේ දළ ජාතික නිෂ්පාදනය, ඇමෙරිකානු ඩොලර් බිලියන 109 දක්වා අරගෙන යන්න අපට පුළුවන් වුණා. ඊට අමතරව ඒකපුද්ගල ආදායම ඩොලර් 5,000 මට්ටමට අරගෙන ගියා. 2025 අවුරුද්ද ගත්තොත්, රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 16.7ක් දක්වා ඉහළ නංවන්න සමත් වෙනවා. ඊටත් අමතරව, අය වැය හිඟය සියයට 2.3ක් වාගේ ප්‍රමාණයකට - අඩු අගයකට - ගෙනයන්න, ප්‍රාථමික ශේෂය සියයට 5.4ක් වාගේ වැඩි අගයකට - ධන අගයකට - ගෙනයන්න සමත් වෙනවා. මෙන්න, මේ සියලු කටයුතු කරන්න

සමත් වෙන්නේ මේ ආර්ථිකය වඩාත් හොඳින් කළමනාකරණය කිරීම තුළයි. මෙහි ප්‍රතිඵල අපි දකිනවා, 2026 අවුරුද්දට යනකොට. 2026 අවුරුද්දේ පළමු මාස තුන ගත්තාම, ඒ මාස 3 ඇතුළේ අපි 2025 අවුරුද්දේ කළමනාකරණය කළාටත් වඩා, වඩාත් හොඳින් ආර්ථිකය කළමනාකරණය කර තිබෙනවා. ඒ මාස 3හි සංඛ්‍යාලේඛන අපි බැලුවොත්, අය වැය හිඟයක් නොවෙයි, අය වැය අතිරික්තයක් බවට පත් කරගන්න සමත් වෙලා තිබෙනවා. ඒත් එක්කම, ප්‍රාථමික ශේෂය වඩාත් ඉහළ අගයකට ගෙනයන්න සමත් වෙලා තිබෙනවා. ඊටත් අමතරව, මේ දවස්වල පවතින ලෝක අර්බුදය - මැද පෙරදිග යුද්ධය - හමුවේ තමයි විනිමය අනුපාතය යම් විචලනයකට ලක් වන්නේ. නමුත්, ඒකත් කළමනාකරණය කරන්න අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග, මහ බැංකුව විසින් ගන්න ඕනෑ සියලු ක්‍රියාමාර්ග මේ වනකොට අරගෙන තිබෙනවා.

විපක්ෂය තව කාරණයක් මතු කළා, රුපියලේ අගය අවප්‍රමාණ වීම තුළ ගෙවන්න තිබෙන විදේශ ණය ප්‍රමාණය වැඩි වෙනවා කියලා. රුපියලේ අගය දිගින් දිගටම අවප්‍රමාණ වීම කොහොමත් සිදු වෙන්නේ නැහැ. අපේ ඉදිරි ක්‍රියාමාර්ග ඇතුළේ ඉදිරියේදී රුපියලේ අගය තව ශක්තිමත් වෙනවා. එතකොට ඒ තුළ පැහැදිලිවම අපි ගෙවන්න තිබෙන ණය ප්‍රමාණ අඩු වෙනවා. විපක්ෂය මොන කාරණා කිව්වත් අපි ආර්ථිකය වඩා හොඳින් ශක්තිමත් කරලා, ජනතාවට එහි ප්‍රතිඵල ඉදිරියේදීත් ලබා දෙන්න කටයුතු කරන බව ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.46]

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ මේ යෝජනාව ගෙනෙන්නේ විපක්ෂයෙන්. විපක්ෂයෙන් මේ යෝජනාව ගෙනැල්ලා අපට කියන්නේ, වර්තමාන ආණ්ඩුව ආර්ථිකය හසුරුවන විධිය විධිමත් නැහැ; අවිධිමත්, ක්‍රමානුකූල නැහැ, අවිද්‍යාත්මකයි කියලායි. මෙවැනි කරුණු ගොඩක් කියලා තමයි විපක්ෂයෙන් මේ යෝජනාව ඉදිරිපත් කළේ. ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමාගේ යෝජනාවේ කියලා තිබෙන්නේ එහෙමයි. දැන් අද මේ යෝජනාව ඉදිරිපත් කරපු කට්ටිය දෙස බැලුවොත්, දැන් ඒ කවුරුවත් මේ සභාවේ නැහැ. අජිත් ප්‍රසාද් මන්ත්‍රීතුමාත් දැන් තමයි මේ සභාවට ආවේ. යෝජනාව ඉදිරිපත් කරලා, අපට උපදෙස් දීලා දැන් ඒ කවුරුවත් මේ සභාවේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතනවා මේ යෝජනාව ඉදිරිපත් කරලා, කරුණු ඉදිරිපත් කරනකොට විපක්ෂයේ මන්ත්‍රීවරු ගණනාවක් ඉදිරිපත් කරපු කරුණුවලට පුංචි හෝ උත්තරයක් දිය යුතුයි කියලා.

අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන සජබයේ ලේකම්තුමා මීට කලිනුත් පාර්ලිමේන්තුවේ කරුණු ඉදිරිපත් කරපු හැම දවසකම කියනවා මම දැක්කා, "මේ රට වැටිලා තිබෙන්නේ, ඒ නිසා මෙහෙමයි.." කියලා. ඒ වාගේම, දිස්ත්‍රික්කයේ කිසිවක් කෙරෙන්නේ නැහැ වාගේ, මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව ගැන තමයි කථා කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ නායකතුමා පසුගිය දවස්වල බුත්තල කුඹුරකට බැස්සා. මම ඒ බුත්තල නියෝජනය කරපු මොනරාගල දිස්ත්‍රික්කයේ එකම සජබ මන්ත්‍රීතුමාගෙන් ඇහුවා, ඇයි විපක්ෂ නායකතුමාව ඔය තරම් හැල්ලුවට ලක් කරන්නේ කියලා. "මොනවා කරන්නද මන්ත්‍රීතුමා, කිව්වාට අහන්නේ නැහැ නේ" කිව්වා. මම ඇහුවා, ඔබතුමාගේ අක්කර 10ක කුඹුරුවලට පොහොර ලැබුණාද කියලා. "මට සියලුම පොහොර ලැබුණා, මට විතරක් නොවෙයි, ඒ පැත්තේ ඔක්කොටම පොහොර හම්බ වුණා" කියලා කිව්වා. ඔක්කොටම පොහොර ලැබී තිබියදී විපක්ෂ නායකතුමා ගොවියෝ ටිකක් එකතු කරලා දෙන්න කිව්වාලු, "මට මේ මීඩියා වැඩක් කරන්න" කියලා. අන්න, එතුමා ඒකට පාරේ හිටපු ගොවියෝ ටිකක් එකතු කරලා දීලා. අප්‍රේල් මාසයේ 12වැනි දාට සමස්ත යායේම කුඹුරු වපුරන්න තීරණය කරලා තිබියදී විපක්ෂ නායකතුමා බැහැපු කුඹුර විතරක් අප්‍රේල් මාසයේ 23වැනි දා වැපිරුවා. අප්‍රේල් මාසයේ 12වැනි දා වපුරපු ඔක්කොම කුඹුරුවලට පොහොර ලැබී තිබියදී අර අප්‍රේල් මාසයේ 23වන දා වපුරපු කුඹුරට පොහොර ලැබෙන්නේ නැහැ. ඒක තමයි ඇත්ත. ඉතින් ඔන්න ඔය වාගේ කථා කියන කට්ටිය තමයි විරුද්ධ පක්ෂය පැත්තේ ඉන්නේ.

ඊළඟට, රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා ඇහුවා, පැල්වත්ත සහ සෙවනගල ෆැක්ටරි වහනවාද කියලා. නැහැ, ෆැක්ටරි වහන්නේ නැහැ. ඒවා වහන්න තමයි පසුගිය කාලයේ ලැහැස්ති කරලා තිබුණේ. පසුගියකාලයේ මේ ෆැක්ටරි දෙක ඉතාම දුර්වල තත්ත්වයට පත් කළේ කවුද? ප්‍රධාන වශයෙන්ම පසුගිය කාලයේ පැවැති පාලනයන් තුළ මේ ආයතනවලට සේවකයින් පිරෙව්වා. කිසිදු අරමුණක් නැතිව සේවකයින් පුරවලා, මේ ආයතන පවත්වාගෙන යන්න බැරි තත්ත්වයට පත් කර තිබුණා. මිලියන පන්දහස් ගණනකට වැඩි මුදලක් බාහිර පාර්ශ්වයන්ට ගෙවන්නේ නැතිව නවත්වා තිබුණු ෆැක්ටරි දෙකක් තමයි අපි භාර ගත්තේ. රුපියල් මිලියන පන්දාහකට වැඩි ප්‍රමාණයක් ගෙවන්න තිබෙන බව අප තහවුරු කළේ පසුගිය දවස්වල කරන ලද සමීක්ෂණයකින්. එහෙම නම්, රුපියල් මිලියන පන්දාහකට වැඩි මුදලක් ගෙවන්නේ නැතිව තිබුණු ෆැක්ටරි දෙකක් තමයි අපට දීලා තිබුණේ. දැන් අහනවා ඒ ෆැක්ටරි දෙක වහනවාද කියලා. වහන්නේ නැහැ. ඊළඟට එතුමා කියනවා, "ඒ ෆැක්ටරිවලට අවශ්‍ය උක්ගස් වවන ගොවීන්ට මුදල් ගෙවන්නේ නැති නිසා ඔවුන් අයින් වෙනවා" කියලා. මේ වනකොට ගොවීන්ට තිබිච්ච ගෙවීම් සියල්ලම ගෙවා අවසන් කළා. තව බාහිර පාර්ශ්වයන්ට ගෙවන්න තිබෙන ඒවාත් ගෙවනවා, වෙලාවට පඩිත් ගෙවනවා. ලංකා සීනි සමාගමේ මේ ෆැක්ටරි දෙකම දැන් මේ මට්ටමට ගෙනැල්ලා තිබෙනවා. හැබැයි, එතුමාගේ සහෝදරයා කළමනාකරණය කරන Ethimale Plantations එක ගැන නම් තවම අපි දන්නේ නැහැ. හැබැයි, දැන් ඒකත් චුට්ටක් balance කරගෙන යනවා කියලා ආරංචියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකා සීනි සමාගමේ ෆැක්ටරි දෙක නැවත හොඳින් පවත්වා ගන්න අදාළ කටයුතු කරමින් තිබියදී කළේ මොකක්ද කියලා ඔබතුමාත් දන්නවා. පසුගිය දවස්වල සෙවනගල ෆැක්ටරි එකට අයිති උක්ගස් මෙට්‍රික්ටොන් 20,000කට වැඩි ප්‍රමාණයක් ගිනි තැබුවා. ඒ ගිනි තියපු සිද්ධියේ පිටුපස තිබුණේ දේශපාලනයයි. ඒ ගිනි තියපු සිද්ධිය පිටුපස තිබුණා දේශපාලනය! සජබයත්, පොහොට්ටුවත් දෙගොල්ලන්ම එකතු වෙලා සංවිධානාත්මකව තමයි සෙවනගල ෆැක්ටරි එකට අයිති උක්ගස් මෙට්‍රික්ටොන් 20,000කට වැඩි ප්‍රමාණයක් ගිනි තිබ්බේ. කෙසේ වෙතත්, ඒ ගිනි තැබීම කළේ දේශපාලන වුවමනාවක් වෙනුවෙන් වුණත් ජනාධිපතිතුමා ඇතුළු අපි ඒ වෙනුවෙන් මැදිහත් වෙලා භාණ්ඩාගාරය හරහා රුපියල් මිලියන 133ක වන්දි ගෙවනවා. අපි එසේ වන්දි ගෙවලා ඒ ගොවීන්ට සාධාරණයක් කරනවා.

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව මඟින් ඉදිරිපත් වුණු දෙවැනි කාරණයට මම දැන් එන්නම්. දැන් විපක්ෂය විසින් මේ සභාවේදී කියා සිටියා, සහල් ගෙනාපු නිසා තමයි වී විකුණා ගන්න බැරි කියලා. "සහල්" කියලා කියන්නේ පොදු නාමයක්. "සහල්" කියන්නේ පොදු නාමය. හැබැයි, ඒ නාමය ඇතුළේ සහල් වර්ග ගණනාවක් තිබෙනවා. දකුණු පළාතේ ගාල්ල, මාතර හම්බන්තොට ඇතුළුව සමහර ප්‍රදේශවල මිනිස්සු රතු සහල් විතරයි කන්නේ. රතු සහල් පරිභෝජනය කරන ප්‍රදේශවල මිනිස්සු පොන්නි සහල් හෝ සම්බා අරන් ගිහිල්ලා කන්නේ නැහැ. ඒ ප්‍රදේශවල හෝටල්වල නම් පොන්නි සහල් හෝ සම්බා උයනවා ඇති. එහෙම නැතිව පොදු සමාජයේ මිනිස්සු ඒ සහල් පරිභෝජනය කරන්නේ නැහැ. කොළඹ ආශ්‍රිත නගරාසන්න ප්‍රදේශ ඇතුළු සමහර ප්‍රදේශවල නාඩු සහල් තමයි වැඩියෙන් කන්නේ. අපේ රටේ වැඩිම පිරිසක් කන්නේ නාඩු සහල්. ඒ නාඩු සහල් කාලා පුරුදු අය පොන්නි සහල් හෝ සම්බා සහල් අරගෙන ගිහිල්ලා තියාගෙන කන්නේ නැහැ. ඒ නිසා පසුගිය දවස්වල වෙළෙඳ අමාත්‍යාංශයත්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ඇතුළු ඔක්කෝම එකතු වෙලා සාකච්ඡා කරලා තීන්දුවක් ගත්තා. පසුගිය වසර ගණනාවකම සිට කීරි සම්බා සහල්වල මිල ඉහළ මට්ටමකට ගෙන ගියා.

මේ විධියට කීරි සම්බා සහල්වල මිල ඉහළ තත්ත්වයක තියාගෙන යන එක අඛණ්ඩව පවත්වාගෙන යන එකට අපි උත්තරයක් හොයන්න ඕනෑ. ඒ නිසා ඒකට ආදේශකයක් ගේන්න ඕනෑ කියලා තමයි පොන්නි සම්බා සහල් ගෙනාවේ. ඒ ගෙනාවේ මොකටද දන්නවාද? ඒ සහල් හෝටල්වලට සහ වෙනත් කටයුතුවලට පාවිච්චි කරන කණ්ඩායමක් ඉන්නවා. සියයට 15ක විතර පිරිසක් තමයි කීරි සම්බා ඇතුළු සම්බා සහල් භාවිත කරන්නේ. ඒ පිරිසට අවශ්‍ය සහල් ගෙන්වීමේ වුවමනාව වෙනුවෙන් තමයි මේ කටයුත්ත කළේ. එහෙම නම්, ඒ සහල් ගෙන්වපු නිසා අපේ වී මිල වැටිලා කියන එක සත්‍යයක් නොවෙයි. ඒක සම්පූර්ණයෙන්ම බොරුවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය විපක්ෂය විසින් සමාජයට, විශේෂයෙන්ම වී ගොවිතැන් කරන ගොවි ජනතාවට භීතියක් හදන්න හදපු මතවාදයක් මිස සත්‍යයක් නොවෙයි. එහෙම නම්, ඒක වුණේ කොහොමද? අපි වී මිල දී ගත්තා. මෙතැනදී කිව්වා, ආණ්ඩුව වී මිල දී ගත්තේ නැහැ; ඒවා කළේ නැහැ කියලා. අප්‍රේල් මාසයේ 12වැනි දා වනකල් ලංකාවේ ආණ්ඩුව හැටියට අපි වී මිල දී ගැනීම කළා. වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 120ට තමයි මිල දී ගත්තේ. කිලෝග්‍රෑම් එක රුපියල් 120 බැගින් මිල දී ගත්තු වී ටික දැන් අපේ ගබඩාවල තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ ඉන්න අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමා දිගින් දිගටම කිව්වා, ගිය කන්නයේ වී මෙට්‍රික්ටොන් 29,000ක් නිෂ්පාදනය වුණා කියලා. ඇත්ත, වී මෙට්‍රික්ටොන් 29,000ක් නිෂ්පාදනය වනකොට ඊට කලින් කන්නයේ වීත් - ඒ කන්න දෙකේම වී - තිබුණා. දැන් වී අතිරික්තයක් තිබෙනවා අපේ ගබඩාවල. තවම සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් ළඟ වී තොග තිබෙනවා. ඒ වාගේම, මහ මෝල් හිමියන් ළඟත් වී තොග තිබෙනවා. මෙතුමන්ලා අපේ වී අලෙවි මණ්ඩලයට අයත්ව තිබුණු ගබඩා ඔක්කෝම වහලා, වී මිල දී ගැනීම අත් හැර තිබුණු වෙලාවක, වී මිල දී ගන්නා ක්‍රියාවලිය නවත්වා ගබඩා දිරන්න ඇරලා තිබ්බ වෙලාවක අපි වී මිල දී ගැනීම ආරම්භ කළා. ඒ ගත්තු වී ටික තවමත් අපේ ගබඩාවල තිබෙනවා. එහෙම නම්, එම වී ගබඩාවලින් එළියට දමන්න නම් දැන් මොකක්ද කරන්න ඕනෑ? එම වී සහල් බවට පත් කරලා වෙළෙඳ පොළට දමන්න ඕනෑ. වී සහල් බවට පත් කරලා වෙළෙඳ පොළට දමන රතු කැකුළු වාගේ සහල් කිලෝග්‍රෑම් එකක තොග මිල දැන් රුපියල් 150 ඉඳන් තිබෙනවා. ඒ වාගේම, සුදු සහල් කිලෝග්‍රෑම් එක රුපියල් 160 වාගේ ඉඳන් තිබෙනවා. තොග මිල ඒ මට්ටමේ තිබෙන විට, අප රුපියල් 120ට මිල දී ගත්තු වී කිලෝ එකක් හාල් බවට පත් කරන විට රුපියල් 190 ගණනක් වෙනවා. එහෙම නම් දැන් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මොකක්ද? දැන් අතිරික්ත වී නිෂ්පාදනයක් රට ඇතුළේ තිබෙනවා; ගබඩා පිරිලා තිබෙනවා. ඒත් එක්කම වී මිල දී ගැනීමේ ක්‍රියාවලිය නතර වෙලා තිබෙනවා. පසුගිය අප්‍රේල් 12වැනි දායින් පසුව ආණ්ඩුව හැටියට වී මිල දී ගන්නා එක අපි තවම කළේ නැහැ. ඒකත් එක්ක වෙළෙඳ පොළේ රුපියල් 95, 100, 105 අතර වාගෙයි වී කිලෝවක මිල තිබෙන්නේ; රුපියල් 95-100 අතර මිලට දැනටත් තිබෙනවා. එහෙම නම් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මොකක්ද? මේ විපක්ෂය දැන් දිගින් දිගටම කියන කරුණු දිහා බැලුවාම පෙනෙන්නේ ඒවා සාවද්‍ය තොරතුරු, සමාජය බිය ගන්වන තොරතුරු බවයි. ඇත්ත වෙනුවට සමාජයට බොරු කියලා, මේ සමාජයේ මනෝභාවයන් විකෘති කරන්න, බිය වැද්දීම සඳහා ගෙනෙන යෝජනා තමයි වැඩිපුර ගෙනැල්ලා තිබෙන්නේ. ඒ නිසා ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමන්ලාට අපි මේ කාරණය කියන්න ඕනෑ. එතුමන්ලාගේ ආණ්ඩුවකුත් තිබුණා. හිටපු මන්ත්‍රීවරයෙක් පසුගිය දවස්වල කිව්වා නේ, අරයාගේ ඔළුවයි, මෙයාගේ කඳයි තැබුවාම හරියනවා කියලා. ඔය ඔළුවයි කඳයි දෙකම එකට තියලා තමයි 2015 ඉඳලා 2019 දක්වා ආණ්ඩුව තිබුණේ. ඒකේ ඇමතිකම් කරපු කට්ටිය තමයි අද විපක්ෂයේ ඉන්නේ. කබීර් හෂීම්, සජිත් ප්‍රේමදාස ඇතුළුව විපක්ෂයේ ඉන්න මේ ගොඩක් අය ඒ පැවැති ආණ්ඩුවේ හිටපු ඇමතිවරු; මහා දැවැන්ත ඇමතිකම් කරපු කට්ටිය. එයාලා ඇමතිකම් දරමින් කරපු ආණ්ඩුව කාලයේ මොකද වුණේ?

2015දී සියයට 5.2ක්ව තිබුණු ආර්ථික වර්ධන වේගය 2019දී කොපමණද? මෙතුමන්ලාගේ සැලසුම් සහගත, අවබෝධයක් තිබෙන, දක්ෂ කට්ටිය ඔක්කෝම ඇමතිකම් කරලා එළියට බහින කොට ආර්ථික වර්ධන වේගය සියයට 2.2 දක්වා අඩු වුණා. ඒ අයගේ සැලසුම් සහගත ආර්ථික ක්‍රියාවලිය අවසානයේදී අපට පෙනෙන්නට තිබෙන එක දෙයක් තිබෙනවා. ඒක තමයි මේ අවස්ථාවේදී අප විශේෂයෙන්ම කියන්න ඕනෑ. එතුමන්ලාගේ සැලසුම්ගත ආර්ථික ක්‍රියාවලිය ඇතුළේ අවසානයට ඉතුරු වුණේ සෘණ අගයක් දක්වා ගමන් කරන ආර්ථික තත්ත්වයක්. එහෙම නම් අපට ඒ උපදෙස්වලින් වැඩක් නැහැ කියන කාරණය කියමින්, මේ ආණ්ඩුව පිහිටුවපු අපි සැලසුම් සහගතව අපගේ යෝජනා ක්‍රියාවට නංවලා, ජනතාවට දෙන්න බලාපොරොත්තු වන සහන ටික, නියෝජ්‍ය ඇමතිතුමාත් කිව්ව සහන ටික ඔක්කෝම දීලා, ජනතාවගේ ජීවිත යහපත් තත්ත්වයට ගෙන එන්න වැඩ කටයුතු කරනවා කියන සහතිකය ලබා දෙමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[පි.ප. 4.56]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கொண்டுவரப்பட்டு இருக்கின்ற நாட்டின் தற்போதை நிலை தொடர்பான ஒத்திவைப்புவேளைப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு சில விடயங்களைப் பதிவுசெய்ய விரும்புகின்றேன்.

கடந்த மே மாதம் 27ஆம் திகதி புதன்கிழமை கடலுக்குச் சென்ற, யாழ்ப்பாண மாவட்டத்தின் பருத்தித்துறை முனைப்பகுதி மற்றும் கற்கோவளம் பகுதியைச் சேர்ந்த 4 மீனவர்கள் இதுவரை வீடு திரும்பவில்லை. அவர்களைத் தேடிக் கண்டுபிடிப்பதற்கான சரியான நடவடிக்கைகள் அரசாங்கத்தால் உரிய நேரத்தில் மேற்கொள்ளப் படவில்லையென அந்தப் பகுதியைச் சேர்ந்த எங்களுடைய மீனவச் சகோதரர்கள் எங்களிடம் முறையிட்டார்கள். 37 வயதுடைய சுமியோம்பிள்ளை சுஜிக்குமார், 52 வயதுடைய கதிர்காமம் சோதிலிங்கம், 53 வயதுடைய பாலசூரியமூர்த்தி ராமகிருஷ்ணன், 28 வயதுடைய ராமகிருஷ்ணன் ரவிராஜ் ஆகியோரே இவ்வாறு காணாமல்போய் இருக்கிறார்கள். இவர்களில் ராமகிருஷ்ணனும், ரவிராஜும் தந்தையும் மகனுமாவர். இவர்களுக்கு என்ன நடந்திருக்கிறது என்பதை இன்னும் அரசு பொறுப்போடு வெளியிடவில்லை. அதுமாத்திரமன்றி, அரசிடமிருந்து சரியான பதில் எதுவும் அவர்களுடைய உறவினர்களுக்குக் கிடைக்கவில்லை என்பதையும் நான் இந்த இடத்தில் பதிவுசெய்ய விரும்புகின்றேன்.

மீன்பிடித்துறை அமைச்சர் மற்றும் இந்த நாட்டில் உயர் பதவிகளில் இருக்கின்றவர்கள், அந்த மக்களுக்கு நம்பிக்கை ஏற்படக்கூடிய வகையில், அந்த மீனவர்கள் காற்றில் சிக்குப்பட்டு இருக்கிறார்களா அல்லது அவர்களுடைய வள்ளங்கள் கடலில் மூழ்கியிருக்கிறதா அல்லது அவர்கள் வேறு நாடுகளில் கரையொதுங்கி இருக்கிறார்களா என்பதைக் கண்டறிந்து சொல்ல வேண்டும். அவர்களுடைய குடும்பங்கள் நிர்க்கதியாகி இருக்கின்றன. அந்தக் குடும்பங்களுக்கான நிவாரணம் என்ன, நல்ல செய்தி என்ன என்பதை அரசாங்கம் சொல்ல வேண்டும். இது மிக முக்கியமானது. நான் இந்த உயர்ந்த சபையில் மீன்பிடித்துறை அமைச்சர் மற்றும் ஏனையவர்களை மிக மரியாதையோடு கேட்டுக்கொள்வது என்னவெனில், இந்த மக்களுக்கான பதிலை விரைவாகத் தரவேண்டும் என்றுதான்.

கடந்த மே மாதம் 18ஆம் திகதி கொழும்பில் நடந்த வணக்க நிகழ்வொன்றின்பொழுது, அருட்தந்தை ஜீவந்த பீரிஸ் அவர்கள் இந்த நாட்டில் நடந்த இனப்படுகொலை தொடர்பில் தன்னுடைய கருத்தைப் பதிவு செய்திருந்தார். இந்த நாட்டில் பெரியதோர் இனவழிப்பு நடந்தது, தொடர்ந்தும் அது நடந்துகொண்டுதான் இருக்கிறது, அதையிட்டு இந்த நாடு வெட்கித் தலைகுனிய வேண்டும், அதனால் பாதிக்கப்பட்டவர்களுக்கு நீதி கிடைக்க வேண்டும் என்பதை வலியுறுத்துகின்ற வகையிலே அவர் தன்னுடைய கருத்துகளைப் பதிவுசெய்திருந்தார். பெரும்பான்மை இனத்தைச் சேர்ந்த ஜீவந்த பீரிஸ் அவர்கள் பாதிக்கப்பட்ட மக்கள் சார்பாக குரல்கொடுத்ததற்கு, கர்தினால் தலைமையிலான கிறிஸ்தவ அமைப்புக்கூட, அவரைக் கண்டிக்கின்ற அளவுக்கு அல்லது அவரை இம்சிக்கிற அளவுக்குத் தன்னுடைய நிலையை மாற்றியிருக்கிறது. இதுவொரு சிங்கள - பௌத்த நாடு என்பதற்கு அப்பால், ஒரு கிறிஸ்தவ - பௌத்த நாடா என்று யோசிக்கிற அளவுக்கு, கர்தினாலும் அவருடைய தலைமையிலான சபையும் முக்கியத்துவம் கொடுப்பதை நாங்கள் பார்க்கின்றோம்.

இந்த நாட்டில் இவ்வளவு மக்கள் அநியாயமாகக் கொல்லப்பட்டார்கள் என்பதைச் சொல்வதற்கு 'ஈஸ்டர்' தாக்குதலுக்கு எதிராக இன்றுவரை குரல்கொடுக்கின்ற இந்த நாட்டின் கர்தினால் அவர்களும் அவருடைய சபையைச் சார்ந்தவர்களும் ஏன் இன்னும் தயக்கம் காட்டுகிறார்கள் என்பதுதான் தமிழ் மக்களாகிய எங்களுக்கு கிறிஸ்தவ - கத்தோலிக்க அமைப்பின்மீது மிகப் பெரிய சந்தேகத்தை ஏற்படுத்தி இருக்கின்றது.

மன்னார் மாவட்ட ஆயராக இருந்த மறைந்த இராயப்பு ஜோசப் அவர்கள், நல்லிணக்க ஆணைக்குழுவுக்கு முன்னால் தன்னுடைய நிலைப்பாட்டை எழுத்துமூலம் ஆதாரபூர்வமாகக் கொடுத்திருந்தார். "2008ஆம் ஆண்டிலிருந்து 2009ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் முள்ளிவாய்க்கால்வரை கொண்டுசொல்லப்பட்ட மக்களில் பல்லாயிரக் கணக்கானவர்கள் காணாமல்போய் இருக்கிறார்கள்; கொல்லப்பட்டும் இருக்கிறார்கள். இது ஒரு வெளிப்படையான இனவழிப்பு! இதற்கான நீதி என்ன?" என்பதை அவர் வெளிப்படையாகக் கேட்டிருந்தார். இன்று அவர் உயிரோடு இல்லை. அவருடைய அந்தக் கூற்றுக்கள் இன்றும் உலகத்தில் இருக்கின்றன. அதற்கான ஒரு நல்ல செய்தியைச் சொல்வதற்கு இதுவரை கத்தோலிக்க திருச்சபை தயாரில்லை. நீதியை நிலைநாட்ட அவர்கள் இயேசு பிரான் வழியில் தயாராக இல்லை என்பதைத்தான் இன்றும்கூட நாங்கள் பார்க்கிறோம். அருட்தந்தை ஜீவந்த பிரீஸ் அவர்கள் முன்வைத்த கருத்துகளை நாங்கள் ஏற்றுக்கொள்கிறோம். பாதிக்கப்பட்ட மக்களுக்காக அவர் மனிதாபிமான அடிப்படையிலே தனது கருத்துகளைச் சொல்லியிருக்கிறார். இந்த நாட்டில் இன்றும் இனவழிப்பு நடந்துகொண்டு இருப்பதாக அவர் குறிப்பிட்டிருப்பது மிகவும் முக்கியத்துவம் வாய்ந்தது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 1990ஆம் ஆண்டு யாழ்ப்பாண மாவட்டத்தின் மயிலிட்டி பகுதியிலிருந்து மக்கள் இடம்பெயர்ந்தார்கள். அந்த மக்களுடைய வரலாற்றை நீங்கள் சற்று பாருங்கள்! அவர்கள் இன்னும் அந்த இடத்துக்குத் திரும்ப முடியாமல் இருக்கிறார்கள். எதிர்வரும் 15ஆம் திகதி திங்கட்கிழமை, அவர்கள் அங்கிருந்து வெளியேறி 35 ஆண்டுகள் பூர்த்தியாகின்றது. அவர்கள் சொல்கின்றார்கள், "எங்களை எங்களுடைய மண்ணிலிருந்து துரத்தினார்கள். அதனால் நாங்கள் கலைக்கப்பட்டோம்" என்று. அவர்கள் இராணுவத்தால் வலுக்கட்டாயமாகக் கலைக்கப்பட்டார்கள். அவ்வாறு கலைக்கப்பட்டு 35 ஆண்டுகள் பூர்த்தியாகின்ற நிலையிலும், அவர்கள் தங்களுடைய சொந்த நிலத்துக்குப் போக முடியாமல் இருக்கிறார்கள். அதற்காக அவர்கள் இப்பொழுது ஒவ்வொரு வெள்ளிக்கிழமையிலும் மயிலிட்டியில், “எங்களுடைய நிலத்தை எங்களிடம் தாருங்கள்” என்று கோரி போராட்டமென்றை முன்னெடுக்கிறார்கள். அவர்கள் போராட்டம் நடத்துகின்ற இடத்துக்கு முன்னாலே அவர்களுடைய சொந்த நிலம் இருக்கிறது. அதில் இராணுவம் தோட்டம் செய்கிறது; ஆனால், அங்கு குடியிருக்கவில்லை. யாழ்ப்பாணத்தில் இராணுவம் சலூன் நடத்துகிறது; கடைகளை நடத்துகிறது; மக்களுடைய காணிகளில் தோட்டம் செய்கிறது; அங்கு உற்பத்தியாகின்ற மரக்கறி வகைகளைச் சந்தையில் கொண்டுவந்து விற்கிறது; முன்பள்ளிகளை நடத்துகிறது. இந்த நாட்டில் அரசு மாறியும்கூட, இந்த நிலை இன்னும் மாறவில்லை. சனாதிபதி அவர்கள் வலிகாமம் வடக்குக்கு வந்தபோது, "மக்களுடைய காணிகளை விடுவியுங்கள்! அந்த இடங்களில் அந்த மக்களைக் குடியேற விடுங்கள்!" என்று நாங்கள் கேட்டோம்.

இங்கு நீங்கள் “தித்வா” புயலைப் பற்றி பேசுகிறீர்கள்; அரிசி விலை பற்றி பேசுகிறீர்கள்; பொருளாதாரத்தின் நிலை பற்றி பேசுகிறீர்கள். தையிட்டி, மயிலிட்டி, காங்கேசன்துறை, பலாலி, வசாவிளான், தோலகட்டி போன்ற இடங்கள் கொடி முந்திரிகைச் செய்கையில் - திராட்சை செய்கையில் - வெற்றிபெற்ற இடங்கள்; வெற்றிலைச் செய்கையில் வெற்றிபெற்ற இடங்கள்; மரக்கறிச் செய்கையில் வெற்றிபெற்ற இடங்கள். ஒரு நாளைக்கு குறைந்தது 4 அல்லது 5 பாரவூர்திகளில் தம்புள்ளை சந்தைக்கு மரக்கறிகளை அங்குள்ள மக்கள் அனுப்பி வைத்தார்கள். ஆனால், இன்று

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

அவர்கள் உற்பத்தி செய்ய முடியாமல் தெருக்களில் காத்திருக்கிறார்கள். இன்றைக்கு அவர்கள் தொடர்ந்து போராடுகிறார்கள். எனினும், இந்த நாட்டின் தலைமையும் அரசாங்கமும் அதனைக் கண்டுகொள்ளாமல் இருப்பது மிகவும் வேதனையளிக்கிறது. இந்த அரசாங்கம் பதவியேற்று இரண்டு ஆண்டுகள் நிறைவடைந்திருக்கின்ற நிலையில், இந்த நாட்டின் பொறுப்பு வாய்ந்தவர்களாக இருக்கின்ற நீங்கள், உண்மையை உணர்ந்த நீங்கள், மனிதாபிமானத்தை நேசிக்கின்ற நீங்கள், நல்லிணக்கம் பற்றி பேசுகின்ற நீங்கள், அந்த மக்களை அவர்களது சொந்த நிலத்தில் குடியேற விடுங்கள்!

கௌரவ ரவிகரன் அவர்கள் இந்தப் பாராளுமன்றத்தில் பிரிகேடியர் பால்ராஜ் பற்றி பேசிவிட்டார் என்றுகூறி, நேற்று பாராளுமன்றத்துக்கு வெளியில் கொஞ்சப் பேர் போராட்டம் நடத்தினார்கள். ஆனால், இந்த நாட்டில் எங்களுடைய மக்கள் சொந்த இடங்களுக்கு இன்னும் போக முடியவில்லை. அவர்கள் 35 ஆண்டுகளுக்கும் மேலாக யாழ்ப்பாணத்தில் அகதிகளாக இருக்கிறார்கள்; உறவினர், நண்பர் வீடுகளில் இருக்கிறார்கள். 'உயர் பாதுகாப்பு வலயம்' என்ற போர்வையில் அந்தக் காணிகளை இந்த நாட்டின் இராணுவம் பிடித்து வைத்திருப்பதற்கு எதிராகப் போராட, எந்தச் சிங்களக் குடிமகன் - சிங்களச் சகோதரன், சிங்களச் சகோதரி - முன்வருவார்? அப்படி வந்தால், அவர்களுக்கும் 'இனவாதி' என்ற முத்திரையைக் குத்துவார்கள்.

அதனால்தான் நாங்கள் திரும்பத் திரும்ப கேட்கிறோம், மயிலிட்டியிலிருந்து வெளியேற்றப்பட்ட மக்களுடைய நியாயமான கோரிக்கைகளை ஏற்றுக்கொள்ளுமாறு. அந்த மக்களுடைய காணிகளை உடனே விடுவியுங்கள்! தயவுசெய்து, அந்த மக்களுக்குப் பொய்யான வாக்குறுதிகளை வழங்க வேண்டாம். உங்களுடைய பாராளுமன்ற அமைச்சர்கள், உறுப்பினர்கள் மாறிமாறி பொய் சொல்வதை விடுத்து, அந்த மக்களுடைய காணிகளை உடனே விடுவிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். மயிலிட்டி, தையிட்டி, தோலகட்டி, வசாவிளான், பலாலி போன்ற பிரதேசங்களைச் சேர்ந்த மக்கள் தங்களுடைய இடங்களில் சென்று குடியேற அனுமதிக்குமாறு மீண்டும் வலியுறுத்தி விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.05]

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ කබීර් හෂීම් මන්ත්‍රීතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේදී ගෙන එන ලද යෝජනාවට අදාළව අදහස් පළ කරන්න කලින් මම මේ ගරු පාර්ලිමේන්තුවට යෝජනා කරන්න කැමැතියි, මෙවැනි සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් භාර ගන්න කලින් ඒ යෝජනාව ගෙන එන අයගෙන් විවාදය ඉවර වෙනකල් පාර්ලිමේන්තුවේ ඉන්නවා කියලා අඩු ගණනේ දිවුරුම් ප්‍රකාශයක්වත් ගන්න කියලා. මොකද, අද මේ විවාදයට අදාළ යෝජනාව ඉදිරිපත් කළ මනුස්සයාත් මේ වෙලාවේ සභාවේ නැහැ. ඒ යෝජනාව ස්ථිර කරපු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් සභාවේ නැහැ. ඒ යෝජනාවට අදාළව කථා කළ විපක්ෂ නායකතුමාත් සභාවේ නැහැ. ඊළඟට කථා කරන්න කථික ලැයිස්තුවේ ඉන්න විපක්ෂයේ මන්ත්‍රීවරුත් සභාවේ නැහැ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විතරයි මේ සභාවේ ඉන්නේ. ඉතින්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මෙවැනි විවාදයක් කර ගන්න ඕනෑ නම්, අපට ඒක පැලවත්ත කාර්යාලයේ වුණත් කර ගන්න පුළුවන්, ජනතාවගේ බදු මුදල් සහ මේ පාර්ලිමේන්තුවේ කාලය නාස්ති නොකර. ඒ නිසා මම යෝජනා කරනවා, ඉදිරියේදී විපක්ෂයෙන් සභාව කල් තබන අවස්ථාවේ යෝජනා ගෙන එද්දී විවාදය අවසන් වෙනකල් ඒ කථා කරන්න නියමිත මන්ත්‍රීවරුවත් සභාවේ රැඳිලා ඉන්න බවට පුළුවන් නම් දිවුරුම් ප්‍රකාශයක්වත් ගන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ගෙනාපු කබීර් හෂීම් මන්ත්‍රීවරයා, අමාත්‍ය ධුර රැසක් දරපු හිටපු ඇමතිවරයා උත්සාහ කළා, වර්තමානයේ මේ ලෝකයේ ඇති වෙලා තිබෙන යුද්මය තත්ත්වය, ඒ එක්කම ලෝකයේ රටවල් ගණනාවක ඇති වෙලා තිබෙන මේ විනිමය අනුපාත අවප්‍රමාණ වීමේ තත්ත්වය එක්ක අපේ රටේ මේ ඇති වෙලා තිබෙන තත්ත්වය, අපේ රජයේ ආර්ථික කළමනාකරණයේ දුර්වලතාවක් නිසා ඇති වෙච්ච එකක්ය කියලා සනාථ කරන්න. ඒක හුවා දක්වන්න මේ යෝජනාව ගෙනාපු බව තමයි අපට පෙනුණේ, විපක්ෂයේ මන්ත්‍රීවරු, විශේෂයෙන්ම මේ යෝජනාව ගෙනාපු කබීර් හෂීම් මන්ත්‍රීවරයා දක්වපු අදහස්වලින්. විනිමය අනුපාත අවප්‍රමාණ වීම, ඉන්ධන ආනයන වියදම වැඩි වීම වාගේ දේවල් ආණ්ඩුවේ ආර්ථික කළමනාකරණයේ දුර්වලතාවක් ලෙස හුවා දක්වන්න උත්සාහ කළා, එතුමාගේ අදහස් දැක්වීම ඇතුළේ. එතුමාට අත්දැකීමක් ඇති, ආර්ථික අර්බුදයක් ඇති වෙන්නේ කොහොමද කියන එක ගැන. එතුමාට අත්දැකීමක් තිබෙනවා. මොකද, 2022 ආර්ථික අර්බුදයේදී චෝදනාවට ලක් වුණේ ගෝඨාභය ප්‍රමුඛ පොහොට්ටු ආණ්ඩුවට වුණාට, පැනලා යන්න වුණේ ගෝඨාභයට වුණාට, ගෝඨාභයට පැනලා යන්න සිද්ධ වෙච්ච ආර්ථික අර්බුදයේ ටයිම් බෝම්බය සෙට් කළේ, 2015 යහපාලන ආණ්ඩුව කාලයේ.

ඒකට උදාහරණ තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මගේ ළඟ තිබෙනවා, ආසියානු සංවර්ධන බැංකුව විසින් 2026 පෙබරවාරි මාසයේ ඉදිරිපත් කරපු "Sri Lanka's Debt Crisis: A Crisis of Governance" නැමැති වාර්තාව. ඒකේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා, ශ්‍රී ලංකාව 2022දී ආර්ථික අර්බුදයකට ගියේ ලෝක අර්බුදයක් නිසාවත්, වෙන කාගේවත් වරදක් නිසාවත් නොවෙයි, ආණ්ඩුකරණයේ අසමත් වීම නිසා කියලා. ඒ වාගේම twin deficit එක ගැනත් එහි පැහැදිලිව සඳහන් කර තිබෙනවා. එහි තිබෙනවා, ගෙවුම් ශේෂ ලේඛනයේ හිඟය සහ අය වැය ලේඛනයේ හිඟය දීර්ඝ කාලයක් තිස්සේ හිඟයක් ලෙස පැවතීම, විදේශ ණය මත රඳා පැවැත්ම වැඩිවීම සහ රාජ්‍ය යන්ත්‍රණයේ තිබුණු දූෂණය යනාදිය ගැන. විශේෂයෙන්ම මේ වාර්තාවේ වෙනම ඡේදයක සඳහන් කර තිබෙනවා, මහ බැංකු බැඳුම්කර වංචාවත් ඒකට හේතුවක් වුණා කියලා. ඒ නිසා ලංකාව බංකොලොත් වෙන විදියට, ගෙවා ගන්න බැරි විදියට ණය වැඩි ප්‍රමාණයක් ලබා ගත් යහපාලන ආණ්ඩුවේ හිටපු ඇමතිවරයකු විදියට කබීර් හෂීම් මන්ත්‍රීවරයා හොඳාකාරවම දන්නවා, ආර්ථික අර්බුදයක් ඇතිවෙන ආකාරයෙන් ආණ්ඩුවක් කරන්නේ කොහොමද කියලා. ඒ නිසා ආර්ථික අර්බුදයක් වළක්වා ගන්නේ කොහොමද කියන එක පිළිබඳව විපක්ෂයෙන් උපදෙස් ගන්නවා වෙනුවට, ඉදිරියේදී එන ආණ්ඩුවකට ආර්ථික අර්බුදයකට මුහුණ දෙන්න සිදුවෙලා, පැනලා යන්න සිද්ධ වෙන ආකාරයෙන් ආණ්ඩුවක් කරන්නේ කොහොමද කියන එක ගැන කබීර් හෂීම් මන්ත්‍රීවරයාගෙන් උපදෙස් ගන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

2015-2019 අතර කාලයේ තමයි ලංකාව වැඩිම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර අරගෙන තිබෙන්නේ. ගිනි පොලියට තමයි ණය අරගෙන තිබෙන්නේ. ඒ අනුව, ඩොලර් බිලියන 10කට වැඩි ණය ප්‍රමාණයක් අවුරුදු 5ක් අරගෙන තිබෙනවා. ඒවා ගෙවන්න බැරි ණය. ගිනි පොලියට අරගෙන තිබෙන්නේ. ඒවා වාණිජ ණය. විශේෂයෙන්ම ලංකාව 2022දී ණය ගෙවා ගන්න බැරි තත්ත්වයකට පත් වුණේ, අන්න ඒ ණය නිසායි. ඒ නිසා ගෝඨාභය රාජපක්ෂට විතරක් චෝදනා කරලා; පොහොට්ටුවට විතරක් චෝදනා කරලා, මහලොකු ආර්ථික විශාරදයින්, ආර්ථික විශේෂඥයින් වෙන්න උත්සාහ කරන කබීර් හෂීම්ලාට, හර්ෂ ද සිල්වාට කියන්න තිබෙන්නේ, ගෝඨාභයට පැනලා යන්න සිද්ධ වුණු ආර්ථිකය කඩා වැටෙන time bomb එක සෙට් කළේ ඔබතුමන්ලා කියන එකයි. 2022 දී ලංකාවට ආර්ථික අර්බුදයකට මුහුණ දෙන්න සිද්ධ වුණා නම්, ඒකට හේතු වෙච්ච කාරණා ගැන සලකා බැලුවොත් ඒවාට සම්බන්ධ පාර්ශ්වකරුවන්ගෙන් වැඩි පංගුවක් සමගි ජන බලවේගයේ සහ එවකට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ හිටපු මේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් භාර ගත යුතුයි.

ඒ වාගේම මෙතුමන්ලා දිගටම කියන්න උත්සාහ කළා, විනිමය අනුපාතිකය අවප්‍රමාණ වීම ගැන. මේ වර්ෂයේ මාර්තු සහ අප්‍රේල් මාසවල විනිමය අනුපාතිකය යම් ප්‍රමාණයක් අවප්‍රමාණ වීම හේතුවෙන් ඉදිරියේදී ආර්ථික අර්බුදයක් ඇතිවෙන්න පුළුවන් කියන එක තමයි මේ විවාදයේදී මතු කරන්න උත්සාහ කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා පිළිගන්න තිබුණා අපිත් ආර්ථික විද්‍යාව පිළිබඳව මොනවත් ඉගෙන ගෙන තිබුණේ නැතිනම්. අපි හැමෝම දන්නවා, වර්තමානය වෙනකොට ලෝකයේ ඇතිවෙලා තිබෙන තත්ත්වය. අද හෝමුස් සමුද්‍ර සන්ධිය ආපසු වැහුවා. එතකොට ලංකාවේ විතරක් නොවෙයි, විනිමය අනුපාතිකය අවප්‍රමාණ වෙලා තිබෙන්නේ. අප අවට තිබෙන ඉන්දියාව, නේපාලය, ඉන්දුනීසියාව, තායිලන්තය වැනි රටවලට - ඉන්ධන ආනයනය මත යැපෙන ගොඩක් රටවලට - මැදපෙරදිග ඇතිවෙලා තිබෙන ඒ යුද්ධමය තත්ත්වය බලපා තිබෙනවා. එතකොට, මම කලින් සඳහන් කළ හැම රටකම අපේ රටේ වෙච්ච අවප්‍රමාණයට සමාන ප්‍රමාණයකින් විනිමය අනුපාතිකය අවප්‍රමාණ වෙලා තිබෙනවා. ඒක ඉබේ සිද්ධ වෙච්ච දෙයක් නොවෙයි. ඒක හිතාමතා සැලසුම් කරලා, - අපි බාහිර කම්පනවලදී විනිමය අනුපාතිකය යම් ප්‍රමාණයකින් අවප්‍රමාණ වෙන්න ඉඩහරිනවා. මොකද, විනිමය අනුපාතිකය කියන්නේ බාහිර කම්පනයක් ආර්ථිකයට ළඟා වෙනකොට, බාහිර කම්පනයක බලපෑම ආර්ථිකයට දැනෙනකොට ඒ කම්පනය absorb කරගන්න, ඒ කම්පනය දරාගන්න තිබෙන විවල්‍යයක්.

විනිමය අනුපාතිකය අවප්‍රමාණ වීමට ඉඩහරින එකෙන් බාහිර කම්පනයේ බර, බාහිර කම්පනය හේතුවෙන් අභ්‍යන්තර ආර්ථිකයට වෙන්න පුළුවන් බලපෑම අවම කරගන්න අපට පුළුවන්. ඒක තමයි මේ විනිමය අනුපාතිකය අවප්‍රමාණ වීමෙන් සිදුවෙලා තිබෙන්නේ. විනිමය අනුපාතිකය අවප්‍රමාණය, ඒ ප්‍රමාණයෙන් හරි සිද්ධ වීම නිසා තමයි අපේ ආනයන වියදම මේ ප්‍රමාණයෙන් හරි අඩුවෙලා තිබෙන්නේ. එහෙම නැත්නම් යම් ප්‍රමාණයක් හරි අඩු කරන්න අපට පුළුවන් වෙලා තිබෙන්නේ. ඒ නිසා, ආර්ථික විද්‍යාව දන්නේ තමන් විතරයි, ආර්ථික විශේෂඥයෝ තමන් විතරයි කියලා හිතාගෙන ඉන්න අයට මේ පාර්ලිමේන්තුවේ බොරු කියන්න අපි ඉඩ දෙන්නේ නැහැ. පැහැදිලිවම කියන්න ඕනෑ, මැදපෙරදිග යුද්ධමය අර්බුදයත් එක්ක ආපු බාහිර කම්පනයට අපි සාර්ථකව මුහුණ දෙමින් ඉන්නවා කියන එක. අපට එහෙම මුහුණ දෙන්න පුළුවන් වුණේ, බාහිර කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව අභ්‍යන්තර ආර්ථිකය තුළින් වාගේම බාහිර ආර්ථිකය තුළිනුත් පසුගිය අවුරුදු එකහමාර තිස්සේ අපි වර්ධනය කර ගැනීම නිසායි. ඒ අර්බුදය වෙලාවේත්, පසුගිය කාර්තුවේත්, මැද පෙරදිග විදේශ රැකියාවල සේවය කරන ශ්‍රමිකයන් එවූ විදේශ ප්‍රේෂණ ප්‍රමාණය සියයට 25කින් වර්ධනය වෙලා තිබෙනවා. ඇයි ඒ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ආර්ථිකය කළමනාකරණය කරන ආකාරය, ආර්ථික ස්ථාවරභාවය සම්බන්ධයෙන් ඔවුන්ට විශ්වාසයක් තිබෙනවා. ඒ නිසා වැඩි වැඩියෙන් විදේශ ප්‍රේෂණ එවනවා. අපේ ආර්ථිකය කඩා වැටෙන්න එනවා නම්; අපේ ආර්ථිකය හරි ආකාරයෙන් කළමනාකරණය කරන්නේ නැත්නම්; විදේශ ශ්‍රමිකයන් අපට එවන ප්‍රේෂණ ප්‍රමාණය එහෙම වැඩි කරයිද? ඒත් එක්කම, ආසියානු සංවර්ධන බැංකුව අපට තවත් මූල්‍ය ආධාරයක් දෙන්න යනවා. IMF එක දෙන්න තිබුණු ණය වාරික දෙකක් අපට එකට දුන්නා. අපේ ආර්ථිකය කඩා වැටෙන්න යනවා නම්, අපේ ආර්ථිකය දුර්වලයි නම්, අපේ ආර්ථික කළමනාකරණය දුර්වලයි නම්, වැරදියි නම් අපට ඒවා ලබා දෙයිද? අර සමගි ජන බලවේගයේ සජිත් ප්‍රේමදාස මහත්මයාගේ කථා අහන කට්ටියක් ඉන්නවා නේ. අන්න ඒ අයට නම් ඔය කථා හොඳයි. මේ රටේ ජනතාවට ඕවා හරියන්නේ නැහැ.

අපේ ණය ගෙවීමේ හැකියාව සම්බන්ධයෙන් කථා කළා. අපි මේ වෙනකොට ඩොලර් බිලියන 7කට ආසන්න ප්‍රමාණයක විදේශ සංචිත පවත්වාගෙන යනවා. මේ කට්ටිය ආර්ථිකය පවත්වාගෙන යන කාලයේ, අර ඩොලර් බිලියන 10ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ණයට ගත්ත කාලයේත් ලංකාවේ විදේශ සංචිත තිබුණේ, උපරිම ඩොලර් බිලියන 8යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ වැඩිම තිබුණු වැඩිම විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 8යි. 2015, 2016, 2017, 2018 කාලයේ මොන අර්බුද ද ලංකාවේ තිබුණේ? ඒ කාලයේ ලෝකයේත් අර්බුද තිබුණේ නැහැ. ඩොලර් බිලියන 10ක ණය අරගෙනත් විදේශ සංචිත තිබුණේ ඩොලර් බිලියන 8යි. අපි දැන් මෙච්චර අර්බුද මැද, බංකොලොත්භාවයකින් නැඟිටින ගමන්, මේ සියලු ආනයන කටයුතුත් කරන ගමන්, ඩොලර් බිලියන 7ක සංචිතයක් පවත්වාගෙන යනවා. ගිය අවුරුද්දේ වාහනත් ආනයනය කළා. ඒ නිසා ණය ගෙවීම සම්බන්ධයෙන් කිසි ප්‍රශ්නයක් නැහැ. අපට ලබන අවුරුද්දේ ඩොලර් බිලියන 3.7ක විදේශ ණය ගෙවන්න තිබෙනවා. 2027 අවුරුද්දේ ඩොලර් බිලියන 2.8ක විදේශ ණය ගෙවන්න තිබෙනවා. අපේ විදේශ සංචිත ඩොලර් බිලියන 7ක් තිබෙනවා. ඒ අනුව ගෙවන්න තිබෙන ණය ප්‍රමාණය සහ අපේ සංචිත අතර ලොකු පරතරයක් තිබෙනවා. ඒ නිසා අපට ඒ ණය ගෙවීම සම්බන්ධයෙන් කිසිදු නොහැකියාවක් නැහැ කියලා විශ්වාසයක් තිබෙනවා.

අද ලැබුණු ප්‍රවෘත්තියක් ගැනත් සඳහන් කරලා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගෝලීය සාම දර්ශකයේ - Global Peace Index - 2026 වර්ෂයට අදාළ වාර්තාව නිකුත් වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මම අවසන් කරන්නම්. මට තව විනාඩි 2ක් ලබා දෙන්න.

2026 වර්ෂයේදී ලංකාව ගෝලීය සාම දර්ශකයේ - Global Peace Index එකේ - තවත් ස්ථාන 14ක් ඉදිරියට ඇවිත් දැන් 67වන ස්ථානයේ ඉන්නවා කියලා එහි දැක්වෙනවා. දකුණු ආසියාවේ අංක දෙකට අපි ඇවිල්ලා තිබෙනවා. භූතානය විතරයි අපට ඉදිරියෙන් ඉන්නේ. භූතානයේ තිබෙන්නේ වෙනම සමාජ ක්‍රමයක්, වෙනම දර්ශනයක්. සන්තුෂ්ටිය, සාමය සම්බන්ධ කථාවේදී ඔවුන් අපට වඩා ඉදිරියෙන් සිටිනවා. අපි 2026 අවුරුද්දේදී දකුණු ආසියාවේ දෙවන ස්ථානයට ඇවිත් තිබෙනවා. ඒ කොහොමද? රට තුළ අභ්‍යන්තර ගැටුම් තිබෙනවාද, රට බාහිර රටවල් එක්ක සම්බන්ධතා පවත්වන්නේ කොහොමද කියලා තමයි මේ දර්ශකයේදී බලන්නේ. මෙන්න මේ දේවල් තමයි බලන්නේ. එහෙම බැලුවාම අපේ රට තුළ සාමය වර්ධනය වෙලා, ගැටුම් නිරාකරණය වෙලා, ගැටුම් අවම වෙලා, ලෝකයේ පිළිගැනීම වැඩිවෙලා තිබෙනවා. විපක්ෂයට මේවා දරාගන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
අවසාන වශයෙන් මේ කාරණාවත් මම කියන්න ඕනෑ. පාස්කු ඉරුදින ප්‍රහාරයට අදාළව සිදු වන පරීක්ෂණ සම්බන්ධයෙන් ජනතාව අතර අවිශ්වාසයක් ඇති කරන්න මේ විපක්ෂයේ උදවිය යම් යම් කථා කියමින් ඉන්නවා. විපක්ෂයේ මුජිබුර් රහුමාන් වාගේ මන්ත්‍රීවරු මේවා දැක්කේ නැහැ වාගේ දැන් සද්දයක්වත් නැතිව ඉන්නවා. මුලින්ම ඒ අයව උසාවි දමද්දීත් එතුමන්ලා විරුද්ධ වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මට තව තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රටේ ජනතාව වැටුප් ගෙවලා, රණවිරුවෝ කියලා වන්දනාමාන කරපු පිරිසක් මේ පාස්කු ඉරුදින ප්‍රහාරයට සම්බන්ධයි කියලා දැන් හෙළි වෙලා තිබෙනවා. හිටපු බුද්ධි අධ්‍යක්ෂවරයකු මේ ප්‍රහාරයට සම්බන්ධයි, මේ සම්බන්ධව කුමන්ත්‍රණය කළා කියලා දැන් කරුණු අනාවරණ වෙලා තිබෙනවා. ජනතාව ගරු කරපු, ආදරය කරපු, තමන් ආරක්ෂා කරගනියි කියලා ජනතාව විශ්වාස කරපු අය මෙවැනි කුමන්ත්‍රණයක් මේ රටට කළා නම්, ඒක ජනතාද්‍රෝහි ක්‍රියාවක්. ඒ නිසා, ඒ කුමන්ත්‍රණය කරන්න ඔවුන්ට උපදෙස් දීපු, ඒ වෙනුවෙන් ඔවුන් පොලඹවපු දේශපාලන අධිකාරිය කවුද කියන එකත් සම්පූර්ණයෙන් පරීක්ෂා කළ යුතුයි කියන එක අපි අද මේ පාර්ලිමේන්තුවට මතක් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.17]

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ වත්මන් ආර්ථික තත්ත්වය පිළිබඳව විපක්ෂය විසින් ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳ විවාදයේදී මට කථා කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වෙනවා. එම කථාවට යන්න ප්‍රථම, අද උදේ වරුවේ බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී චාමර සම්පත් දසනායක මැතිතුමා විසින් අපේ බණ්ඩාරවෙල ධර්මදූත විද්‍යාලයේ සිසුවෙක් සම්බන්ධව කළ කථාව ගැන මම යමක් මතක් කරන්නට ඕනෑ. ඒ වෙලාවේම අපේ බිමල් රත්නායක ඇමතිතුමා කිව්වා, ඒ සම්බන්ධව කථා කරලා ජනාධිපති අරමුදලින් ඒ මුදල ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කරනවා කියලා. මමත් ඒ සම්බන්ධව කථා කළා. ඒ කාරණය ජනාධිපති අරමුදලට යොමු කරමින්, ඒ දරුවාට අධ්‍යාපනය සඳහා මූල්‍ය ආධාරයක් හැටියට හොඳම විධියේ ගෙවීම් ක්‍රමයක් මාස් පතා ලබා දීමට කටයුතු කර තිබෙනවා කියන එක මම කියන්න කැමැතියි.

මේ රටේ වත්මන් ආර්ථික තත්ත්වය ගැන කථා කරනකොට, ඒ සම්බන්ධයෙන් යම් කිසි පැහැදිලි කිරීමක් කරන්නට ඕනෑ. ඒ වාගේම මෙන්න මේ කාරණාව ගැනත් යමක් කියන්නට ඕනෑ. විශේෂයෙන්ම මේ කාලවකවානුව තුළ කථා කළා කඳුකරය නියෝජනය කරන අපේ කඳුකර ජනතාව ගැන. ජනතා නියෝජිතයකු හැටියට මම ආඩම්බරයෙන් කියන්න කැමැතියි, ජනතාව බලාපොරොත්තු වෙච්ච ඒ වෙනස අද ඇති වෙලා තිබෙන බව. මෙතැන ඉන්න අයත්, රටේ ජීවත් වන බොහෝ අයත් ඒකට එකඟ වෙයි කියලා මම හිතනවා.

ඒගොල්ලන් system change එකක් ඇති කරලා බලාපොරොත්තු වුණේ මොකක්ද? විශේෂයෙන්ම කඳුකරයේ නායකයින්ව පහ කරමින් අපි වාගේ සාමාන්‍ය අයව ගෙනාවේත් ඒ ජීවිතවල වෙනසක් ඇති කරන්න ඕනෑ නිසායි. ඒ වෙනස කියන්නේ, මීට කලින් අවුරුදු 76ක කාලයක් තිස්සේ හිටපු අය බලාපොරොත්තු වන බිල්ඩින් හදන එකයි, ලොකු ලොකු ව්‍යාපෘති කරන එකයි විතරක්ම නොවෙයි. අපි පොහොසත් රටක ලස්සන ජීවිතයක් හදලා දෙනවා කියලා පොරොන්දු වෙලා ආවේ. ඒකයි මේ ඉෂ්ට කරන්නේ. ඒ බලාපොරොත්තුව ඉෂ්ට කරනකොට අපට පටන් ගන්න වෙලා තිබෙන්නේ මූලික අවශ්‍යතාවක් වන ඒ බිම් මට්ටමේ තිබෙන අවශ්‍යතා ඉෂ්ට කිරීමෙනුයි. ඒවා ඉෂ්ට කිරීමේ ඉඳන් ලොකු ලොකු ව්‍යාපෘතිවලට යනතෙක් ඒ ඔක්කෝම දේවල් කරන්න තිබෙන්නේ ජාතික ජන බලවේගය හැටියට අපේ ආණ්ඩුවටයි. ආණ්ඩුවේ ලොකු ව්‍යාපෘතිත් යනවා, ඒ අතර අනික් අවශ්‍යතාත් අපි ඉටු කරනවා.

මූලික අයිතිවාසිකමක්වත් ඉෂ්ට කරලා දෙන්නේ නැතුව ළඟදි එක්කෙනෙක් කියනවා, අවුරුදු 76ක් තිස්සේ පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක් හැටියට කවුරුවත් නොකරපු ඒවා කරනවා කියලා. ඇත්තටම ජාතික ජන බලවේගයේ ආණ්ඩුව හැටියට අපට කරන්න වෙලා තිබෙන්නේ අවුරුදු 76ක් තිස්සේ කරපු නැති ඒවා තමයි. මොකද, ඒගොල්ලන් කරපු ඒවා අපට කරන්න බැහැ. ඒගොල්ලන් කරපු දූෂණ ක්‍රියාවලිය අපට කරන්න බැහැ. අපරාධකරුවෝ නිසා දැන් ගිහිල්ලා, අපරාධකාරයෙක් කියලා සැක කරන මිනිස්සු වෙනුවෙන් උපවාස කරමින්, උද්ඝෝෂණ කරමින් මහ පාරේ හිටගෙන ඉන්නවා. බන්ධනාගාරවලට ගිහිල්ලා අපරාධකාරයින්ව බලලා ඇවිල්ලා, ඇයි අපට ප්‍රශ්නයක්ද කියලා අහනවා. ඒ මිනිස්සුන්ගෙන් මම දැන් අහනවා, මගේ මිනිස්සුන්ගේ මූලික අයිතිවාසිකම්, මගේ දරුවන්ගේ මූලික අයිතිවාසිකම් ඉෂ්ට කිරීම ඔයගොල්ලන්ට ප්‍රශ්නයක්ද කියලා. මොකද, ඔයගොල්ලන්

හිතන පහත් වැඩ, ඔයගොල්ලන් පහත් වැඩ කියලා වෙන් කරගෙන ඉන්න ඒ කටයුත්ත මගේ දරුවන්ගේ සෞඛ්‍යමය අවශ්‍යතාවක්. ඒ සෞඛ්‍ය අවශ්‍යතාව ඉෂ්ට කරන්නේ නීරෝගී අනාගතයක්, නීරෝගී පරම්පරාවක් බිහි කිරීම පිණිසයි. ඒ වෙනුවෙන් ඊට වඩා පහත් වැඩක් කරන්න වුණත් අපි ලැහැස්තියි. ඒක ප්‍රශ්නයක්ද කියලා වැරදිකාර, අපරාධ කරන අයගෙන් මම අහනවා. මා ගැන මම ආඩම්බර වෙනවා. මොකද, කියපු දේ අපි කරනවා. අපේ ජනතාව අපෙන් බලාපොරොත්තු වුණේ, ජාතික ජන බලවේගයෙන් බලාපොරොත්තු වුණේ, මූලික අයිතිවාසිකම්වත් සපුරා නැති මිනිසුන් සිටින සමාජයක, කඳුළින් අමාරුවෙන් ජීවත් වන ඒ කඳුකර ජනතාවගේ ජීවිත ගොඩනඟන එක. ඒක තමයි ආණ්ඩුවක් හැටියට අපි දැන් ඉටු කරන්නේ.

ඒ වාගේම මෙතැන එක්කෙනෙක් කියනවා, වත්මන් වාතාවරණය තුළ අපි මොකුත් කළේ නැහැ කියලා. අපි නොයෙක් දේවල් කරනවා. "දිට්වා" ආපදාව ඇති වෙච්ච ගමන්, අදාළ අයට සහන ලබා දීමේදී අපි බැලුවේ නැහැ, ඒ කඳුකරයද කියලා; සිංහල, මුස්ලිම් භේද අපි බැලුවේ නැහැ. සියලුදෙනාටම නිවාස ආධාර දීලා අපි ගෙවල් හදලා දෙනවා. දැනටත් අපි මුල්ගල් තබා තිබෙනවා, වතුකර ජනතාවගේ නිවාස සෑදීම සඳහා. ඒ වාගේම ඒ ආපදාවෙන් කැඩුණු පාලම්, බෝක්කු, පාරවල් අපි හදලා තිබෙනවා. "දිට්වා" කුණාටුවෙන් ආපදාවට පත් වෙච්ච සියලු දේවල් යථා තත්ත්වයට පත් කරගෙන අපි දැන් ක්‍රියාත්මක වෙනවා. අවුරුදු 76ක් තිස්සේ මේ රට පාලනය කරමින් මිනිස්සු අතරට ගියේ නැති අයට ඒවා වැඩක් නැති වුණාට අපට ව්‍යාපෘති කරමින් රට ඉහළට ගෙනියන්නත් පුළුවන්; සමාජ ජීවිත ඉහළ නංවමින් ඉදිරියට ගෙනියන්නත් පුළුවන්. ඒ නිසා ඒ විධියට එවැනි අත්‍යවශ්‍යම දේවල් සම්බන්ධව පහත් ලෙස සිතන එකම, ඒ මානසිකත්වයම, මන්ද මානසිකත්වයක් කියලා මා හිතනවා.

இன்றைய தினம் நாங்கள் நாட்டின் தற்போதைய நிலை குறித்துப் பேசிக்கொண்டு இருக்கின்றோம். இன்று உலகம் பல்வேறு சவால்களை எதிர்கொண்டு வருகின்றது. குறிப்பாக, மத்திய கிழக்கு நாடுகளில் நிலவும் பதற்றமான சூழ்நிலை, உலகளாவிய எரிபொருள் நெருக்கடி, காலநிலை மாற்றத்தால் ஏற்படும் இயற்கை அனர்த்தங்களுக்கு உலக நாடுகள் முகங்கொடுத்துள்ளன. இதனால் பல நாடுகளின் பொருளாதாரம் மட்டுமல்ல, வளர்ந்துவரும் நாடுகளிலுள்ள மக்களின் வாழ்வாதாரமும் கடுமையாகப் பாதிக்கப்பட்டுள்ளது. உலக பொருளாதார வளர்ச்சி மந்தமடைந்து வருவது குறித்தும், உணவுப் பாதுகாப்பு மற்றும் எரிசக்தி பாதுகாப்பு குறித்தும் நாடுகள் கூடுதல் கவனம் செலுத்த வேண்டுமென ஐக்கிய நாடுகள் சபை, உலக வங்கி, சர்வதேச நாணய நிதியம் போன்ற சர்வதேச அமைப்புகள் எச்சரிக்கை விடுத்துள்ளது.

இந்தச் சூழ்நிலையிலும், நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மலையகத்தில் 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட மக்களுக்கான கொடுப்பனவுகள் கொடுக்கப்பட்டுள்ளன; வீடுகளை அமைத்துக் கொடுப்பதற்கான வேலைத்திட்டங்கள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன; பாதைகள் மற்றும் பாலங்கள் நிர்மாணிக்கப்பட்டு வருகின்றன. இவ்வாறு மக்களின் வாழ்க்கையை இயல்புநிலைக்குக் கொண்டுவருவதற்கான எல்லா வேலைகளும் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. அதுமாத்திரமல்ல, மக்கள் சிறந்த வாழ்க்கையை வாழ்வதற்கான வேலைத்திட்டங்களையும் நாங்கள் முன்னெடுத்திருக்கிறோம்.

இவ்வாறான கடுமையான சூழ்நிலையிலும், நேற்றைய தினம் அத்தியாவசிய உணவுப் பொருட்களின் விலைகள் குறைக்கப்பட்டு இருக்கின்றன. மேலும், தோட்டத் தொழிலாளர்களின் சம்பளம் உயர்த்தப்பட்டு இருக்கின்றது. இன்று நாட்டில் ஏற்பட்டுள்ள பொருளாதார நெருக்கடியைக் காரணம்காட்டி, நாங்கள் மக்களுடைய ஊதியத்தில் கைவைக்கவில்லை; அதனைத் தொடர்ந்து வழங்கி வருகின்றோம். அதுமாத்திரமல்ல, மக்களுடைய வாழ்வாதாரத்தையும் வாழ்க்கையையும் மென்மேலும் உயர்த்துகின்ற நடவடிக்கைகளிலும் நாங்கள் ஈடுபட்டு இருக்கின்றோம். வளமான நாட்டில் அழகான வாழ்க்கையை முழு சமூகத்தினருக்கும் பெற்றுக்கொடுப்பதற்கான எல்லா வேலைத்திட்டங்களையும் நாங்கள் செய்வோமெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.26]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින දිවා ආහාරයෙන් පස්සේ අපි මේ පවත්වන්නේ, විපක්ෂය විසින් ගෙන එන ලද සභාව කල් තැබීමේ යෝජනාවක් සම්බන්ධයෙන් වූ විවාදයක්. අපි දන්නවා, කල් තැබීමේ යෝජනා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන විධිය. මේක රටේ වර්තමාන තත්ත්වය පිළිබඳව විපක්ෂය විසින් ගෙන එන ලද කල් තැබීමේ යෝජනාවක්. ඒක කියවා බැලුවාම පෙනෙනවා, ලෝකයේ තත්ත්වය, ඉස්සරහට එන්න පුළුවන් පාරිසරික ප්‍රශ්න, කෘෂිකාර්මික ප්‍රශ්න, වෙළෙඳ ප්‍රශ්න, ආර්ථික ප්‍රශ්න හා බලශක්ති ප්‍රශ්න ආදී වශයෙන් ඔක්කෝම දේවල් ඇතුළත් ලොකු මාතෘකාවක් තමයි මේ මඟින් යෝජනා කරලා තිබෙන්නේ කියලා. හැබැයි, මේ කල් තැබීමේ විවාදය තවම අවසන් වී නැති තත්ත්වයක් තුළ, මෙහි සහභාගිත්වය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කිසිම විවාදයකට ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ හැමෝටම එන්න බැහැ. අපි එහෙම කියන්නේත් නැහැ. දේශපාලනය කරන මන්ත්‍රීවරුන් විධියට මේක ඇතුළේම ඉන්න එක විතරක්ම නොවෙයි අපට කරන්න තිබෙන්නේ. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන අයට නම් අමාත්‍යාංශවලට යන්න වනවා. අනික් අයටත් ඒ විධියට නොයෙක් වැඩවලට යන්න වනවා. හැබැයි, අඩුම තරමින් මේ විවාදය පුරා කිහිපදෙනෙක් - හතරපස්දෙනෙක්, කවුරු හරි - ඉන්න එපායැ. එම නිසා මේ විධියට කල් තැබීමේ යෝජනා ගන්න එකේ තේරුමක් තිබෙනවාද කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්තටම කලින් කථා කරපු මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ අපි අපිම කථා කර ගන්නා එකක් බවට මේ යෝජනා පත් වෙලා තිබෙනවා. ඒ නිසා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් සභාවේ ඉන්න අවස්ථාවේදී අපි යෝජනා කරනවා, ඊළඟ Parliamentary Business Committee එකේදී මේවා සම්බන්ධව මොකක් හෝ ක්‍රමවේදයක් හදාගන්න කියලා. ඇත්තටම අපටත් කල් තැබීමේ යෝජනා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. එම නිසා මේ සම්බන්ධව මොකක් හෝ ක්‍රමවේදයක් හදන්න ඕනෑය කියලා මම පාර්ලිමේන්තුවට යෝජනා කරනවා.

අද කථා කරන මාතෘකාවට ආවොත්, අපි දන්නවා අද තිබෙන මේ සියලු ප්‍රශ්න සලකා බැලුවොත්, ගෝලීයව ඇති වෙලා තිබෙන තත්ත්වය ඒකට මූලබීජයක් වෙලා තිබෙන බව. පසුගිය දවසක මැද පෙරදිග ආරම්භ වුණු යුද්ධයට අදට දවස් 103ක් සම්පූර්ණ වෙලා තිබෙනවා. මේ අතර කාලයේ යුද ගැටුම් අඩු වෙනවා, වැඩි

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

වෙනවා. එහෙම යන තත්ත්වයක් ඇතුළේ අද දවස වනකොට නැවතත් හෝමුස් සමුද්‍ර සන්ධිය මුළුමනින්ම වසා දමන්නත් කටයුතු කර තිබෙනවා. ඒ අනුව යුද්ධයේ අලුත් පියවරක්, අලුත් වැඩිවීමක් අපට දකින්න ලැබෙනවා. අපි දන්නේ නැහැ, ඉස්සරහට ඒක කොහොමද වෙන්නේ, අඩු වෙනවාද, වැඩි වෙනවාද කියලා. හැබැයි, අපි එකක් දන්නවා. ඒ තමයි, මේක අපට බලපානවා, මේක ලෝකයට බලපානවා කියන එක. මේක ආනයනික ඉන්ධන, බලශක්තිය පාවිච්චි කරන අප වාගේ රටවල් සියල්ලට බලපානවා. එතකොට එහෙම තත්ත්වයක් මැදින් තමයි, මාස තුනක්, මාස තුනහමාරක් ආණ්ඩුව මේ ගමන ඇවිල්ලා තිබෙන්නේ. එතකොට ඒකට මුහුණ දෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ වෙන මොනවත් නිසා නොවෙයි. අපි අලුතින් තෙල් හඳන්න පටන් ගත් නිසා නොවෙයි, එහෙම නැත්නම් අපට අඩුවට තෙල් ලැබුණු නිසා නොවෙයි. මේ වාගේ ගෝලීය අර්බුදයක් සමඟ හැම රටක්ම පොර බදන මොහොතක, අපට මේකට මේ මට්ටමින් හරි මුහුණ දෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ, පසුගිය අවුරුදු එකහමාර තුළ අපි අත් පත් කර ගත් ආර්ථික ජයග්‍රහණ නිසායි. ඒක ඩොලර් සංචිත වෙන්න පුළුවන්, ඒක අපේ රටේ තිබෙන රුපියල් සංචිතය වෙන්න පුළුවන්, මුදල් නියෝජ්‍ය ඇමතිතුමා පැහැදිලි කරපු විධියට ඒක අපේ ආර්ථිකයේ අනෙක් දර්ශකවල තිබෙන සවිබලගැන්වීම වෙන්න පුළුවන්. ඒ නිසා මේකට මුහුණ දීමයි අපට කරන්න තිබෙන්නේ.

කෙසේ වුවත්, මෙහිදී අපේ පාලනයෙන් තොර කලාපයක් තිබෙනවා. මේක 2022දී අපේ රටේ පැවතුණු ආණ්ඩුව කරපු දේවල් නිසා, අනෙක් රටවල් ඔක්කෝම හොඳට තිබියදී අපේ රට බංකොලොත් කර ගත් අවස්ථාවක් නොවෙයි. මේක අපේ කලාපයට සහ ලෝකයටම බලපාන තත්ත්වයක්. ඒ තත්ත්වයට අපි මුහුණ දෙමින් ඉස්සරහට යනවා. ඒකේ සාර්ථකත්වය, එහෙම නැත්නම් ආණ්ඩුවක තිබෙන සූදානම සහ හැකියාව මේ වෙද්දි අපි ක්‍රියාකාරිත්වයෙන් පෙන්වා තිබෙනවා. අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේක අමාරු කාලයක් බව. අපි කොහොම කළත් ලෝකයටම මේ අමාරුව ඇති වෙද්දි අපේ රටේ ජනතාවටත් මේක දැනෙනවා. කලින්ට වඩා ඔවුන්ගේ ජීවිත පවත්වාගෙන යෑම යම් අපහසු තත්ත්වයකට පත් වනවා. ආණ්ඩුවක් විධියට අපි ඒ තත්ත්වය අවම කරන්න අදාළ කොන්දේසි සහ දේවල් සපුරමින් ඉන්නවා; ඒකට අදාළ වැඩ කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ඉතිරි වෙලාවේදී මට විශේෂයෙන්ම තවත් කාරණයක් ගැන අදහසක් දක්වන්න ඕනෑ. අදත් පාර්ලිමේන්තුවේ කථා වුණා, පාස්කු ප්‍රහාරය සහ ඒක ආශ්‍රිත විමර්ශනය ගැන. මම හිතන විධියට, විමර්ශන කටයුත්තක් තිබෙන නිසා, අපි මේ ගැන වාද විවාද කරන එක නොවෙයි විය යුත්තේ. මේ සම්බන්ධව විමර්ශන කටයුත්තක් කෙරෙනවා. නමුත් අපි කැමැති වුණත්, අකැමැති වුණත් අදත් පාර්ලිමේන්තුවේදී ඒ සම්බන්ධයෙන් සාකච්ඡාවක් මතු වෙලා තිබෙනවා. මේක අද නොවෙයි, පසුගිය සති දෙකේ, තුනේ ටිකක් වැඩිපුර මතු වුණා. අපි දැක්කා, පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම්, නඩු කටයුතු දවසින් දවස ඉස්සරහට ගිය බව. හැබැයි, හිටපු හමුදා බුද්ධි අංශ ප්‍රධානි සුරේෂ් සලේ අත්අඩංගුවට ගත්තාට පස්සේ ඒ සම්බන්ධව විවිධ විරෝධතා තිබුණා. හැබැයි, සති දෙකකට විතර කලින් ඒ විරෝධතා ටිකක් අමුතු විධියට වැඩි වුණා. දවස් 80ක්, 90ක් තිස්සේ සුරේෂ් සලේ කැවේ මොනවාද කියලා මොකුත් දන්නේ නැති අය, දැන් සතියකට, දෙකකට කලින් යම් යම් අධිකරණ තීන්දු ආවාට පස්සේ, විශේෂයෙන් තමතමන්ගේ පක්ෂයට සම්බන්ධ අයට අදාළ තීන්දු ආවාට පස්සේ, නොයෙක් කථා කියන්න පටන් ගත්තා; සුරේෂ් සලේට කන්න දුන්නේ රාබුයි, බතුයි කියලා, ඒ විධියේ කථා කියන්න ගත්තා.

හැබැයි, ඊට කලින් ගත වෙච්ච දවස් 80 තුළ ඔහු රාබුද කැවේ, ගෝවාද කැවේ කියලා මේ සභාවේදී කවුරුවත් මොකුත් කථා කළේ නැහැ. හැබැයි, බොහොම පැහැදිලියි, මේගොල්ලන්මේක දේශපාලනික කාරණයක් බවට පත් කර ගන්නවාය කියන එක. විමර්ශනවලට සහාය දෙනවා නම් ඒවාට සහාය දෙන්න එපායැ. ඒ වෙනුවට යම් පිරිසක් තමන්ගේ දේශපාලන ව්‍යවමනාවක් සහ දේශපාලන අභිලාෂයක් එක්ක ඒකට විරුද්ධව කටයුතු කරනවාය කියන එක අපට පෙනෙන්න තිබෙනවා. හැබැයි, මම හිතන විධියට, ඊයේ හවසින් පස්සේ ඒ කථා පොඩ්ඩක් අඩු වෙලා තිබෙන බව පෙනෙනවා. ඊයේ හවස වෙනකම් ටිකක් ලොකු සද්දයක් තිබුණා. අපි දැක්කා, කට්ටියක් ඇවිල්ලා "අයියණ්ඩිය බිය නොවන්න මැරෙනා සැටි මම පෙන්වන්නම්" කියලා වාඩි වනවා. හැබැයි, දවස් දෙකක් ගත වුණාට පස්සේ මොකක්ද වුණේ? දවස් දෙකක් ගත වුණාට පස්සේ ඒ ප්‍රහාරයේ වින්දිතයෝ වුණු කටුවාපිටියේ, මෝදර, මට්ටක්කුලියේ මිනිස්සු පරීක්ෂණවලට බාධා කිරීමට විරුද්ධව විරෝධතා දක්වනවා කියන පණිවුඩය ලැබුණාට පසුව කට්ටිය ආවාට වඩා වේගයෙන් අකුළාගෙන ගියා. සාධාරණය ඉටු වනතුරු නවතින්නේ නැහැ කියපු කට්ටිය ඊට පස්සේ හොයා ගන්නවත් නැහැ. ඊයේ හවස ඉඳන් ඒ කථාවේ අඩුවක් තිබෙනවාය කියන එකත් අපි පිළිගන්න ඕනෑ. ඔය සත්‍යග්‍රහයේ, බේරා ගැනීමේ සටනේ ප්‍රධාන අනුග්‍රහය වාගේ හිටියේ පොහොට්ටුව නේ.

ඩී.වී. චානක මන්ත්‍රීතුමා අද කථා කළා. නමුත්, එතුමා ඒ ගැන වචනයක්වත් කිව්වේ නැහැ නේ. සලේ හිරේද කියලාවත් එතුමා කිව්වේ නැහැ. එතුමා වෙන වෙන ප්‍රශ්න ගොඩක් ගැන කථා කරලා ගියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

හැබැයි, තිබෙන ප්‍රශ්නය මේකයි. ඩී.වී. චානක මන්ත්‍රීතුමා වෙන වෙන කථා කියද්දී, පොහොට්ටුවත් නිශ්ශබ්ද වෙද්දී, අද සමගි ජන බලවේගයේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඒ පරීක්ෂණ ගැන ඉතා දීර්ඝ වශයෙන් අදහස් දැක්වීමක් කළාය කියන එක අපි සඳහන් කරන්න ඕනෑ, සලකුණු කරන්න ඕනෑ වාගේම ඒ ගැන ප්‍රශ්න කරන්න ඕනෑ. විශේෂයෙන්ම පොහොට්ටුව විසින් පසුගිය කාලයක් තිස්සේ දිගින් දිගටම ඉදිරිපත් කළ තර්ක ටික ඒ පිළිවෙළටම එතුමා කිව්වා. ඒක ISIS වැඩක් කියලා දැන් හැම රටින්ම කියලා තිබෙන්නේ, ඇයි ඉතින් නිකම් බොරුවට මහන්සි වෙන්නේ, මේක ජාතික ලැයිස්තුවේ හිටපු කෙනෙක් කරලා තිබෙන්නේ කියලා එතුමා කිව්වා. ඒගොල්ලන් ආණ්ඩු කළ කාලයේ - ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ - තමයි ඒ මනුස්සයාට ඇප දීලා තිබෙන්නේ; තවම නඩුවෙන් අයින් කරලාත් නැහැ. ඊට පස්සේ ඒ පරීක්ෂණ කරන නිලධාරින්ට විරුද්ධව චෝදනා ගොඩක් එල්ල කළා. මේ, පොහොට්ටුව ඉදිරිපත් කළ තර්ක. හැබැයි, අද මේ ගැන පාර්ලිමේන්තුවේදී කථා කළේ දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයා. එතකොට, දැන් තිබෙන ප්‍රශ්නය මොකක්ද? පාස්කු ප්‍රහාරය කියන්නේ සෙල්ලමක්වත්, විගඩමක්වත් නොවෙයි, මේ රටේ දරුවන් ඇතුළු වඳින්න ගිය මිනිස්සු 278ක් ඝාතනය කළ සිද්ධියක්. අදටත් ඒකෙන් ආබාධිත වුණු, හානියට පත් වුණු මිනිස්සු සිය ගාණක් මේ රටේ ඉන්නවා.

දරුවෝ නැති වෙච්ච අම්මලා, අම්මලා නැති වෙච්ච දරුවෝ, සහෝදරයෝ නැති වෙච්ච සහෝදරියෝ, බිරින්දෑවරු නැති වෙච්ච ස්වාමි පුරුෂයෝ - ඒ හැමෝම - ඉන්නවා. එහෙම සිද්ධියක් දේශපාලන කුමන්ත්‍රණයක්ද, නැත්නම් ඒකට ඒ වාගේ පැත්තක් තිබෙනවාද කියලා සොයා බලන්න පරීක්ෂණ පවත්වනකොට මොනවාද මේ කරන්නේ? මෙච්චර කල් ඒක කරන්න අපොහොසත් වුණා නේ.

දයාසිරි මන්ත්‍රීතුමා පාස්කු ප්‍රහාරය එල්ල කරද්දි ඒ ආණ්ඩුවේත් හිටියා. පාස්කු ප්‍රහාරයෙන් පස්සේ රට බේරා ගන්න කියලා ආණ්ඩුවක් ආවා නේ. ඒ ආණ්ඩුවේත් එතුමා හිටියා. ඒ ආණ්ඩු දෙකේම ඉඳලා දැන් අපි පරීක්ෂණ කරද්දි එතුමා ඇවිල්ලා අහනවා, ඇයි කරන්නේ, ISIS නොවෙයිද, එහෙම නේ කියන්නේ වාගේ ඒවා. ඇත්තටම ඒක හෙළා දකින්න ඕනෑ, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි. මම ඔබතුමාගෙන් අහනවා, ඒක සමගි ජන බලවේගයේ මතයද කියලා. මම දන්නා විධියට සමගි ජන බලවේගය මෙහෙම අදහසක් නොවෙයි කිව්වේ. මම බලාපොරොත්තු වෙනවා, ඔබතුමන්ලා ඒ ගැන අදහසක් දක්වයි කියලා. දයාසිරි මන්ත්‍රීතුමාගේ මතයද, සමගි ජන බලවේගයේ මතය? එහෙම නම් ඔබතුමන්ලාට ප්‍රශ්නයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙකක් වැඩිපුර ලබා දෙන්න පුළුවන් නම් මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්නම්.

ඊළඟට, කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා කථා කරද්දි කිව්වා, ආණ්ඩු පක්ෂය විසින් විපක්ෂ නායකතුමාට අපහාස කරනවාය කියලා. මම ඒක මුළුමනින්ම ප්‍රතික්ෂේප කරනවා. අපි කිසිම වෙලාවක එතුමාට අපහාස කරලා නැහැ. එතුමා කිව්වා, "AI සජිත්", "AI සජිත්" කියලා අපි එතුමාට අපහාස කරනවා කියලා. ඔබතුමා වාගේම අපි කවුරුත් දන්නවා, අපි එහෙම කථාවක් එතුමාට කියලා නැහැ කියන එක. අපි එතුමාට අදාළ ගරුත්වය ලබා දීලා තමයි වැඩ කරගෙන යන්නේ. එතුමාට "AI" කියලා අපහාස කළේ එතුමාගේම පක්ෂයේ නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා, ගම්මන්පිල පාස්කු ප්‍රහාරය ගැන ලියපු පොත එළිදක්වන්න ගියපු වෙලාවේ. අපටත් හිතුණා, ඒක "AI" නම් හොඳයි කියලා. මොකද, ඒක එහෙම වෙන එක අපටත් බලාගෙන ඉන්න අමාරු නිසා. හැබැයි, ඒක කිව්වේ නලින් බණ්ඩාර. අපි කොහේදීවත් එතුමාට අපහාස කළේ නැහැ. එහෙම අපහාස කරලා දැන් ඇවිල්ලා ඒක ආණ්ඩුව පිටින් දමන්න එපා. අපි එතුමාට අපහාස කරන්නේ නැහැ. නමුත්, උදය ගම්මන්පිල පාස්කු ප්‍රහාරය ගැන ලියපු පොත එළිදක්වන අවස්ථාවට විපක්ෂ නායකතුමා ගිය වෙලාවේ තමන්ගේම පක්ෂයේ කෙනෙක් තමයි එතුමාට එහෙම කිව්වේ කියන එකත් මම කියන්න ඕනෑ. මොකද, අපි එහෙම කිව්වේ නැහැ නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්නම්. විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා ක්‍රීඩා කටයුත්තක් සම්බන්ධ නිශ්චිත සිදුවීමක් ගැන චෝදනාවක් එල්ල කළා. ක්‍රීඩා විෂය භාර සුනිල් කුමාර ගමගේ අමාත්‍යතුමා සභාවේ නැති වෙලාවේ ලබා දුන් පණිවුඩයක් තිබෙනවා. මම ඒ ගැන කියලා විනාඩියකින් ඉවර කරන්නම්. කොරියානු සංචාරයක් සම්බන්ධයෙන් Men's XV's Rugby කණ්ඩායමට වීසා සහ ටිකට් ලබා ගැනීමේදී සිදු වෙච්ච පමාවක් ගැන විපක්ෂ නායකතුමා කරුණු ඉදිරිපත් කළා. ඒ වෙනුවෙන් ඇමතිතුමා සහ අමාත්‍යාංශය මැදිහත් වෙලා තිබෙනවා. නමුත්, රගර් කණ්ඩායමේ වීසා සහ ටිකට් සම්බන්ධව කටයුතු කිරීම Rugby Federation එක සතු කාර්යයක්. එම කාර්යය සිදු කිරීමේදී යම්කිසි පැහැර හැරීමක්, පමාවක් සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන් නියමිත කාලය තුළ අදාළ ලිපි ගොනු භාර දීලා ඉල්ලීම් නොකිරීමේ ප්‍රශ්නයක් නිසා තමයි මේ සිදුවීම වෙලා තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය මැදිහත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමා කොරියානු තානාපතිතුමිය එක්ක මේ ගැන සෘජුව සාකච්ඡා කරලාත් තිබෙනවා. නමුත් තිබෙන ප්‍රශ්නය මේකයි. ඊයේ වන තුරුත් අවශ්‍ය ලිපි ගොනු භාර නොදීමේ ප්‍රශ්නය තුළ ඒ පමාව සිදු වෙමින් තිබෙනවා. ඒකට අමාත්‍යාංශය මැදිහත් වෙමින් ඉන්නවා. විශේෂයෙන්ම තමන්ගේ වගකීම පැහැර හැරීමේ ප්‍රශ්නයක් තිබෙන්නේ. අපි දන්නවා, Federation එකේ ප්‍රශ්න තිබෙන බව. එහෙම පැහැර හැරීමක් කරලා තිබෙනවා නම් ඒ ගැන සොයා බලන්න අමාත්‍යාංශය මැදිහත් වෙලා විශේෂ පරීක්ෂණයකුත් ආරම්භ කරනවාය කියලා ඇමතිතුමා දැනුම් දීලා තිබෙනවා. අපේ රජය පැත්තෙන් ඒ වෙනුවෙන් උපරිම මැදිහත් වීම අපි කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.37]

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තැබීමේ යෝජනාව හැටියට විශේෂ යෝජනාවක් විපක්ෂය විසින් ගරු සභාවට ඉදිරිපත් කළා. අපේ රජය ආර්ථික කළමනාකරණය අතින් දුර්වල වෙලා තිබෙනවා, සමාජ ප්‍රශ්න උග්‍ර වෙලා තිබෙනවා, ඒවා කළමනාකරණය කර ගන්න බැරි වෙමින් තිබෙනවා, දේශපාලන අර්බුදයක් නිර්මාණය වෙමින් තිබෙනවා, ඉදිරියේදී එල් නිනෝ තත්ත්වයක් එනවා, ඒකට මුහුණ දෙන්න සැලසුමක් නැහැ ආදී වශයෙන් කරුණු ඇතුළත් යෝජනාවක් මෙහිදී ඉදිරිපත් වුණා. එම යෝජනාව බොහොම සද්භාවයෙන්, රටේ ජනතාව වෙනුවෙන් ඉදිරිපත් වුණා කියලා හිතුවොත් ඒක වැරදියි කියලා මම කියනවා. මොකද, ඒ වාගේ අරමුණකින් යෝජනාවක් ඉදිරිපත් වුණා නම් ඒ යෝජනාව ඉදිරිපත් කරපු පාර්ශ්වය සභාවේ ඉන්න ඕනෑ. නමුත්, යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමාත් සභාවේ දැන් නැහැ. අද මෙම යෝජනාව ගැන කථා කරන්න හිටපු විපක්ෂයේ මන්ත්‍රීවරු කිහිපදෙනෙකුත් මම හිතන විධියට කථා කළේත් නැහැ. එක දිගටම ආණ්ඩු පක්ෂයෙන් තමයි කථා කරන්නේ. දැන් මම ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් කථා කරන්නේත් විපක්ෂයෙන් කවුරුවත් කථා කරන්න නැති නිසායි. ඒ ගැන අපි කනගාටු වනවා. ආණ්ඩුවේ ආර්ථික කළමනාකරණයක් නැහැ කියලා කියන ඒ කණ්ඩායමට මේ යෝජනාව සම්බන්ධයෙන්වත් කළමනාකරණයක් තිබුණාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. මම හිතනවා, රටක්, ජනතාවක් වෙනුවෙන් මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ යෝජනාවක් ඉදිරිපත් කළාම ඊට සාධාරණයක් ඉටු වෙන්න ඕනෑ කියලා.

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොහොම නමුත්, මෙම යෝජනාව ගැන කථා කරද්දී මම මේ කාරණයත් කියන්න කැමතියි. මෙතැන ඉදිරිපත් කළ කරුණු අනුවත් මේ රටේ ජනතාව තේරුම් ගන්න ඕනෑ, මේ රටේ පවතින්නේ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවක් නොවෙයි නම් රටේ ඇති වන තත්ත්වය කුමක්ද කියලා. එහා පැත්තේ කණ්ඩායම් ආණ්ඩු කළා නම් බලා ගන්න තිබුණා, අද රටේ කළමනාකරණය කොහොමද කියලා. එහෙම වුණා නම් ආපහු තෙල් පෝලිම්, ගෑස් පෝලිම්, පොහොර නැති ප්‍රශ්න, පඩි ගෙවා ගන්න බැරි ප්‍රශ්න පෙන්නුම් කරයි. මට ඒක මැවිලා පෙනෙනවා. එහෙම වෙන්න හේතු කිහිපයක් තිබෙනවා.

"දිට්වා" වාගේ දැවැන්ත අර්බුදයකට පෙර තිබුණු ආණ්ඩුවලට මුහුණ දෙන්න සිදු වුණේ නැහැ. එවැනි දැවැන්ත ස්වාභාවික උපද්‍රවයක් පෙර තිබුණු ආණ්ඩු කාලයේ ඇවිත් තිබුණේ නැහැ. එය මනා ලෙස, සැලකිය යුතු ලෙස අපි කළමනාකරණය කර ගත්තා.

ඒ වාගේම තමයි, දැන් ජාත්‍යන්තර මට්ටමින් ඇති වෙලා තිබෙන යුදමය තත්ත්වය. ඒක සැලකිය යුතු මට්ටමින් අපි කළමනාකරණය කරමින් තිබෙනවා. නමුත්, අර වාගේ කණ්ඩායමක් ආණ්ඩු කළා නම් ඒවා කළමනාකරණය කරන්න බැරි වෙනවා. මොකද, පෙර පරිදිම රටේ නීතියක් රීතියක් නැතුව, දැවැන්ත ඇමති මණ්ඩලයක් හදාගෙන, සුරසැප විඳගෙන, වංචා හා දූෂණ කරගෙන ගියාම ජනතා ප්‍රශ්න විසඳන්න බැහැ. ඒවා ඉතිහාසය විසින් නිත්‍ය ලෙස ඔප්පු කළ කාරණා. එම නිසා මම හිතනවා, මේ රටේ ජනතාව ඒවා තේරුම් ගන්න ඕනෑය කියලා.

අපි මේ රජය භාර අරගෙන අවුරුද්දයි මාස අටක වාගේ කාලයක් තමයි මේ වනවිට ගෙවෙමින් තිබෙන්නේ. අපි භාර ගත්තෙත් විශාල අර්බුදයක් තිබුණු රටක්. ඒ වාගේම රට භාර අරගෙන කටයුතු කරගෙන යද්දීත් අපට දැවැන්ත අභියෝගවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. එතුමන්ලා පාලනය කළ අවුරුදු 76ක කාලය තුළ මුහුණ නොදුන් ස්වාභාවික විපතකට අප මුහුණ දුන්නා. මම පෙර කිව්වා වාගේ "දිට්වා" සුළි කුණාටුව ආවා. අපි ඒකට මුහුණ දුන්නා. ඒ ආපදාවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම වෙනුවෙන් සල්ලි අච්චු ගැහුවෙත් නැහැ; ලෝකයෙන් ණය ගත්තෙත් නැහැ. ජනාධිපතිතුමාම පාර්ලිමේන්තුවට ඇවිල්ලා, ඉතිහාසයේ කවදාවත් ඒ වාගේ පීඩාවට පත් වුණු ජනතාවට නොබෙදපු ආකාරයට රුපියල් කෝටි 50,000ක වාගේ මුදලක් වෙන් කර දීලා, ඒ ප්‍රශ්නය කළමනාකරණය කරනු ලැබුවා.

දැන් ගල්ෆ් කලාපයේ ඇති වෙලා තිබෙන යුදමය තත්ත්වයත් එක්ක මේ රටේ ඇති වෙලා තිබෙන ආර්ථික අර්බුදය කළමනාකරණය කරන්න රජය කෝටි 10,000ක් වෙන් කළා. විදුලි බිල ජනතාවට බරක් නොවන විධියට විදුලි ඒකක 180ට අඩුවෙන් පරිභෝජනය කරන කිසි කෙනෙකුට විදුලි බිල වැඩි නොකර රජය එය කළමනාකරණය කරනවා. ඒ වාගේම තෙල් මිල වැඩි කරනකොට ඒ වැඩි වීමෙන් කොටසකුත් ආණ්ඩුව භාර ගනිමින්, පොහොර සහනාධාරය සමහර ක්ෂේත්‍රවලට දෙවන වටයටත් දෙමින් ඒවා කළමනාකරණය කරනු ලැබුවා. මම මේ රටේ ජනතාවගෙන් අහනවා, මේ වෙලාවේ බලයේ හිටියේ මේ ආණ්ඩුව නොවෙයි නම් ඒ කට්ටිය මෙය කොහොම කළමනාකරණය කරයිද කියලා. ඉතිහාසය ඒවාට උත්තර දෙනවා.

අද මේ සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළ කබීර් හෂීම් මන්ත්‍රීතුමා මේ වාගේම ප්‍රශ්නයකට 2022 ජූලි 06වැනි දා පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කළ අදහසත් මම මේ අවස්ථාවේදී මතු කරන්න කැමැතියි. අද මෙතැනදී එතුමා කිව්වා, "ආණ්ඩුව දැන් IMF එකේ පදයට නටනවා. උඩ පනින්න කිව්වොත් පනිනවා" කියලා. එහෙම කියලා එතුමා පැනලා ගියා. අද එතුමා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විවේචනය කළා.

හැබැයි, 2022දී එතුමා එහෙම කථාවක් නොවෙයි කියලා තිබෙන්නේ. 2022 ජූලි 6වැනි දා එතුමා කළ ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1540හි මෙසේ සඳහන් වනවා:

> "IMF එක ගැන ලංකාවේ අය අතර ලොකු බයක් තිබෙනවා. ඒක යකෙක්, භූතයෙක් කියලා මෙතැන ඉන්න මන්ත්‍රීවරු කථා කරනවා. හැබැයි, විකල්පයක් ගැන කියන්නේ නැහැ. IMF එක භූතයෙක් කියා හිතනවා නම්, විකල්පයක් කියන්න. ඉතිහාසය තුළ IMF එක මැදිහත් වුණු සමහර රටවල් සාර්ථක වෙලා තිබෙනවා. සමහර රටවල් අසාර්ථක වෙලා තිබෙනවා. හැබැයි, ඒ IMF එක නිසා නොවෙයි."

එහෙමයි කබීර් හෂීම් මහත්මයා එදා කිව්වේ. හැබැයි, අද මෙතැන කියන්නේ වෙන කථාවක්.

මේ අර්බුදය ගැන කථා කරද්දී, එම හැන්සාඩ් වාර්තාවෙන්ම මම තවත් ප්‍රකාශයක් උදාහරණයට ගත්තා. ඒ, එවකට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා; මේ යෝජනාව ඉදිරිපත් කරපු පාර්ශ්වයේ හිටපු නායකතුමා කළ ප්‍රකාශයක්. මෙන්න, අර්බුදය; මෙන්න කළමනාකරණයේ කථාව.

එතුමාගේ ප්‍රකාශය එම හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1495හි මෙසේ සඳහන් වෙනවා:

> "ඖෂධ හිඟයට බලපා ඇත්තේ රට තුළ ඇති ඩොලර් හිඟයයි. එහෙත් අපගේ ඉල්ලීම පරිදි ජාත්‍යන්තර සංවිධාන මෙන්ම, අපගේ මිත්‍ර රාජ්‍ය විසින් ද අපට අවශ්‍ය ඩොලර් මිලියන 75ක පමණ අත්‍යවශ්‍ය ඖෂධ සපයා දීමට මේ වන විටත් කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ දේවල් වෙනුවෙන් තවත් ඩොලර් මිලියන 31ක පමණ ආධාර ලැබෙමින් තිබෙනවා."

බෙහෙත් ටික ගන්න බැරි කාලයක් එදා තිබුණේ. ඉන්දියාවේ යාචකයින් - මම ඒ අයට නිග්‍රහ කරනවා නොවෙයි - ආධාර එකතු කරලා රටට එව්වා. එහෙම ඒවා තිබුණා. ඒ කාලය ඔබතුමන්ලාට අමතකයි නම්, මේ තිබෙන්නේ පුවත් පත්වල පළ වෙච්ච දේවල්. "තෙල් නැති විදුලිය නැති රටේ මිනිසුන්" කියලා ප්‍රවෘත්තියක් පළ වෙලා තිබෙනවා. ඔන්න අර්බුද තිබුණු විධිය. තවත් ප්‍රවෘත්තියක් තිබෙනවා, "විදුලි බිල මාස 14කදී සියයට 400කින් වැඩි කරලා" යනුවෙන්. ඔන්න, අර්බුද කළමනාකරණය කරපු හැටි. කළමනාකරණය උගන්වන්න ආපු කණ්ඩායමට මම මේ කියන්නේ. "පොහොර නැතිව යල කන්නය ඉවරයි" කියලාත් ප්‍රවෘත්තියක් පළ වෙලා තිබෙනවා. ඒ, 2020-2021 කාලයේ. මේ තිබෙන්නේ තවත් ප්‍රවෘත්තියක්. එය සඳහන් වෙන්නේ, "විදුලි බිලට විදුලි සැර වදී. විදුලි ඒකක 30ට අඩු අයට වැඩි කිරීම සියයට 264යි" කියලායි. ඒ, ඒකක 30ට අඩු අය. මෙච්චර අර්බුදයක් ඇවිල්ලාත් අපි ඒකක 180ට අඩු අයට වැඩි කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේවා හරියට තේරුම් ගන්න ඕනෑ. මේක යහපත් අරමුණෙන් ගෙනාපු යෝජනාවක් නොවෙයි කියලා මම කිව්වේ ඒකයි. අපි පිළිගන්නවා, රටේ මේ මොහොතේ බඩු මිලෙහි - සමහර ඒවායේ - යම් වැඩිකමක් තිබෙන බව. තෙල් මිල වැඩි කරන්න වුණා. උද්ධමනයක් යම් මට්ටමකට රටේ තිබෙනවා. අමාරුකමක් තිබෙනවා. ඒ අමාරුකම ආවේ විපක්ෂයේ ඔබ ආණ්ඩු කරපු කාලයේ වාගේ නොවෙයි. ඔබ ආණ්ඩු කරපු කාලයේ ආවේ අභ්‍යන්තර ගැටලු. ඒ කියන්නේ, කළමනාකරණයේ දෝෂයෙන් ආපු ගැටලු; ආණ්ඩුවේ කළමනාකරණ දෝෂයෙන් ආපු ගැටලු. හැබැයි, අපි මේක කරගෙන යනකොට ආපු ගැටලු ඒ විධියේ ගැටලු නොවෙයි. අපි ඒක කළමනාකරණය කර ගන්න ඕනෑ. අපි ඒක පිළිගන්නවා. ස්වභාව ධර්මය විසින් ඇති කරපු ගැටලුවක් තිබෙනවා. ඒ තමයි, "දිට්වා" සුළි කුණාටුව. ඒක ඇති වුණේ ආණ්ඩුවේ දෝෂයක් නිසා නොවෙයි. ගල්ෆ් කලාපයේ ඇති වෙච්ච යුද්ධයක් තිබෙනවා. ඒක ඇති වුණේ ආණ්ඩුවේ දෝෂයක් නිසා නොවෙයි. හැබැයි, මේ රටට දෝෂ උපන්නේ ඒ ආණ්ඩු කාලයේ. ණය අර්බුදයකට ගියේ කාගේ වරදින්ද? කොතැනද කළමනාකරණය වැරදුණේ? ඒවා

එතැන හදා ගත්තේ නැති නිසා මේ රටේ ජනතාව දහ දුක් වින්දා. ඒකයි මම කිව්වේ, වැරදිලාවත් අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් නොවන ආණ්ඩුවක් නම් මේ මොහොතේ තිබෙන්නේ, මේ රටේ නැවත අරගළ, මිනිස්සු පාරේ පෝලිම්වල මැරෙනවා කියලා. මතකද, එහෙම මිනිස්සු මැරුණා? ගෑස් සිලින්ඩර පිපිරුවා මතකද? තෙල් ගහ ගන්න බැරුව ත්‍රිවීලර් ඇතුළේ මිනිස්සු මැරුණා මතකද? එහෙම යුගයක් තිබුණා. අපි පිළිගන්නවා, මේ රටේ ජනතාවට යම් අමාරුවක්, අපහසුවක් තිබෙනවා කියලා. මම හිතනවා, බුද්ධියක් තිබෙන මේ රටේ ජනතාව ඒක තේරුම් ගනියි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ ප්‍රශ්නයක් තිබෙනකොට අපට වඩා බලවත් සහ ආර්ථික වශයෙන් පොහොසත් රටවල්වලටත් මේ සමහර ගැටලු මෙතරම්වත් කළමනාකරණය කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒක අපි ආඩම්බරයට කියන කථාවක් නොවෙයි. ඒක ලෝකයේ කවුරුත් දන්නවා. ඉතින් මේක ලෝකයේ පැසසුමටත් යම් විධියට ලක් වෙනවා. විපක්ෂයට තිබෙන රෝග මේවායින් සුව කරන්න පුළුවන්කමක් නැහැ. ඒ හින්දා මම කියන්න කැමැතියි, මෙතුමන්ලා කියන ජාතියේ ප්‍රශ්න අපේ රටේ නැහැ කියන එක.

අනික, මේ තිබෙන මිල වැඩිවීම්, අරවා මේවා ආවේ ජාතික ජන බලවේගය ආණ්ඩුවක් නිසා නම්, ඕස්ට්‍රේලියාවේ, ඇමෙරිකාවේ ප්‍රශ්න ඇවිල්ලා තිබෙන්නෙත් ඒ නිසාද? ඒවා ජාත්‍යන්තර ප්‍රශ්න. ඉතින්, ඔබතුමන්ලාට මේවා නොතේරෙනවා කියලා මම හිතන්නේ නැහැ. අනෙක තමයි, මේ වාගේ අර්බුදයක් එනවා නම් විපක්ෂය කැමැතියි. නැවතත් මේ රට අර්බුදයට යනවා නම් කැමැතියි. මොකද, පටු දේශපාලන හැඟීම් තිබෙන්නේ. බල ලෝභීත්වය තිබෙන්නේ. සාධාරණ විධියට රටේ තිබෙන මේ ප්‍රශ්න කළමනාකරණය කර ගන්නවා නම් ජනතාවට කියන්න ඕනෑ, "ඇත්ත ලෝකයේ ප්‍රශ්නයක් තිබෙනවා, අපි ඔක්කොම එකතු වෙලා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේවා කළමනාකරණය කර ගත යුතුයි, ඒ නිසා අරපරිස්සමින් වැඩ කරමු" කියලායි. අන්න ඒ tone එකෙන් ආවා නම් මේක පොඩි සාධනීය යෝජනාවක්. නමුත් මෙතැන ආවේ එහෙම නොවෙයි. මම හිතනවා, අපි ඒක තේරුම්ගත යුතුව තිබෙනවා කියලා.

යෝජනාව ස්ථිර කරපු ගරු මන්ත්‍රීතුමාත් පොහොර ප්‍රශ්නය සම්බන්ධයෙන් කථා කළ නිසා, මගේ අමාත්‍යාංශයටත් පොහොර ප්‍රශ්නය අයිති නිසා මම ඒ සම්බන්ධවත් කියන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 යල කන්නය ගත්තොත්, අපට යූරියා මෙට්‍රික් ටොන් 125,000ක් අවශ්‍යයි. දැන් අපි ගාව තොග විධියට මෙට්‍රික් ටොන් 151,037ක් තිබෙනවා. අවශ්‍ය මෙට්‍රික් ටොන් 125,000යි. නමුත් වැඩියෙන් තිබෙනවා. ඒ අතරේ අපි ඉදිරි කන්නය ගැනත් හිතලා කටයුතු කර තිබෙනවා. අද නැවක් ආවා, යූරියා මෙට්‍රික් ටොන් 17,000ක. හෙට නැවක් එනවා, MOP මෙට්‍රික් ටොන් 18,000ක. ඒ නිසා පොහොර ප්‍රශ්නයක් එන්නේ නැහැ. හැබැයි, අපි එකක් පිළිගන්නවා, පොහොරවල මිල ඉහළ යාමක් වෙනවා. මිල ඉහළ යන්න හේතුව තමයි ලෝක වෙළෙඳ පොළේ පොහොර මිල ඉහළ ගිහින් තිබීම. නැව්වල රක්ෂණ ගාස්තු ඉහළ ගිහින් තිබෙනවා. නැව් ගාස්තු ඉහළ ගිහිල්ලා තිබෙනවා. තෙල්වලටත් මේක බලපානවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ බඩු මිල, තෙල් මිල මේ විධියට වැඩි වෙන්න හේතුව ආණ්ඩුව කැමැත්තෙන් කරන දෙයක් නොවෙයි. කළමනාකරණය කර ගැනීමේදී එහෙම මිල වැඩි කිරීමක් කරන්න අපට සිද්ධ වෙනවා. මොකද, වෙනදාට වැඩිය ආනයන වියදම වැඩියි, අපනයන ආදායම අඩුයි. මේක සමපාත කරගන්න බැරි වුණොත් ඊට වැඩිය ලොකු ආර්ථික අර්බුදයක් එනවා. ඒ නිසා අපි ඒක කරමින් තිබෙනවා. පසුගිය දවස්වල අපි වාහනවලට අධිභාරයක් පැනෙව්වේ මෙහෙන් පිටට යන ඩොලර් ප්‍රමාණය නවත්වා ගන්නයි. මම එතුමන්ලාට ඒකත් මතක් කරන්න කැමැතියි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා තේ සම්බන්ධයෙන් විශේෂ ප්‍රශ්නයක් ඇහුවා. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විධියට අපි 2026 අවුරුද්දේ තේ පොහොර සහනාධාරය දීමට මිලියන 2,000ක් වෙන් කළා. මේ සැරේ තේ පොහොර සහනාධාරය දෙන්නේ QR කේතයක් මඟින්. අපි QR කේතය හරහා මේ රටේ කුඩා තේ වතු ගොවීන් 190,408කට පොහොර දීලා තිබෙනවා. දීපු පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 21,400යි. අපට පෙර මෙතුමන්ලා හිටපු කාලයේ - 2024දී - ගොවීන් 84,472කට තමයි පොහොර දීලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව ටික වේලාවක් දෙන්න.

ඊට වඩා ලක්ෂයකට වැඩි ප්‍රමාණයකට අපි පොහොර දීලා තිබෙනවා. ඒ නිසා අපි කියන්න කැමැතියි, ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් දේ අපි කරන බව.

ඒ වාගේම ලෝකයේ මේ යුදමය තත්ත්වය ආවාත් එක්කම ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, මේ අර්බුදය තුළ පොහොර මිල ඉහළ යන නිසා තේ වතු ගොවීන් වෙනුවෙන් නැවත පොහොර වටයක් දෙනවා කියලා. ඒ සඳහා භාණ්ඩාගාරයෙන් මිලියන 2,500ක් වෙන් කළා. අපි ජූලි මාසයේ ඉඳලා හැම කුඩා තේ වතු ගොවියෙකුටම QR කේතය හරහා - බැංකු ගිණුම් අංකය අරගෙන තිබෙනවා - ඔවුන්ට හිමි මුදල ඔවුන්ගේ ගිණුමට දානවා. ඒ අනුව අපි දෙවැනි වටයකට පොහොර දෙනවා. පොල් වගාකරුවන්ටත් දෙනවා, වී ගොවීන්ටත් දෙනවා. අපි බලයට එනකොට වී ගොවීන්ට පොහොර සහනාධාරය විධියට දුන්නේ හෙක්ටයාරයකට රුපියල් 15,000යි. මෙවර මේ යුදමය තත්ත්වයත් එක්ක ඒ මුදල රුපියල් 30,000 දක්වා වැඩි කළා. මම අහනවා, අපි මේ තත්ත්වය කළමනාකරණය කරලා නැද්ද, මිනිස්සුන්ට එන බර අඩු කරලා නැද්ද කියලා. අඩු කරලා තිබෙනවා. ඒවා තේරුම් ගත යුතුයි.

අනෙක, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ මහ බැංකුවේ අධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා පවතින ආර්ථික තත්ත්වය සම්බන්ධයෙන්, මහ බැංකුවේ කාර්යභාරය සම්බන්ධයෙන් සහ මේ රටේ මූල්‍ය ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මනා සම්මන්ත්‍රණයක් කළා. එතුමා ඒ ගැන හොඳින් පැහැදිලි කළා. ඒ අවස්ථාවට විපක්ෂ නායකතුමා ඇවිල්ලා හිටියා, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ඇවිල්ලා හිටියා. විපක්ෂ නායකතුමා අද මොනවාද වැල්වටාරම් ටිකක් කිව්වා. එතුමාට ආර්ථික වැටීමක් ගැන කියන්න බැහැ, ඒක අහගෙන හිටපු හින්දා. මහ බැංකුවේ අධිපතිතුමා පැහැදිලිව කිව්වා, ආර්ථික අර්බුදයක්, වැටීමක්, ප්‍රශ්නයක් එන්නේ නැහැ කියලා. ආර්ථිකය කළමනාකරණය කරමින් යන බව එතුමා හොඳින් පැහැදිලි කළා.

මම තව කාරණයක් මතක් කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි මේක කළමනාකරණය කරනවා කියලා තේරුම් ගන්නයි මම මේ කියන්නේ. ලංකා ඉතිහාසය ගත්තොත්, වසරේ මුල් මාස හතර තුළ වැඩිම අපනයන ආදායමක් උපයා ගත්ත අවුරුද්ද මොකක්ද? ඒ, මේ 2026 අවුරුද්ද. අපි අපනයන ආදායම ඩොලර් මිලියන 5,784ක් උපයා ගෙන තිබෙනවා. අමාරු තත්ත්වයන් ඇතුළේ වුණත් අපි වාර්තා තබමින් අපනයන ආදායම

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

වැඩි කරලා තිබෙනවා. ඒ හින්දා අපි මේක තේරුම් ගන්න ඕනෑ. අපට දැන් ඩොලර් බිලියන 6.8කට ආසන්න සංචිතයක් තිබෙනවා. හැබැයි, පසුගිය අවුරුද්දේ රටක් විදියට අපි ඩොලර් මිලියන 5,149ක් ණය ගෙවලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු අමාත්‍යතුමනි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවවිනාඩියක්, දෙකක් පමණ දෙන්න. මම අවසන් කරන්නම්.

අපි මේක වර්ධනය කරගෙන තිබෙනවා. සියලු දුෂ්කරතා මධ්‍යයේ ආර්ථිකයත් ගොඩනඟමින් යනවා. ඒ වාගේම මම මේ රටේ ජනතාවට කාරණයක් කියන්න කැමැතියි. අපට ඉන්ධන පිටින් ගේන්න, ආනයනය කරගැනීමට වෙනදාට වැඩිය වියදමක් යනවා. අප්‍රේල් මාසයේ ඉන්ධන ආනයන වියදම සියයට 149.9කින් වර්ධනය වුණා. ඒ බරෙන් ටිකක් ජනතාවටත් දීලා කොටසක් ආණ්ඩුවත් භාර ගත්තා.

ඒ වාගේම, මම කැමැතියි, එල් නිනෝ තත්ත්වය සම්බන්ධයෙනුත් කථා කරන්න. අද ගරු ජනාධිපතිතුමා ජනාධිපති ලේකම් කාර්යාලයට අදාළ නිලධාරින් ගෙන්වා එල් නිනෝ තත්ත්වයට සූදානම් වෙනවා මම දැක්කා. විපක්ෂයේ මෙතුමන්ලා යෝජනා දමනවා; අපි එහේ ඒකට සූදානම් වෙනවා. ඊයේ මගේ අමාත්‍යාංශයේ මාත් වාඩි වෙලා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හිටපු දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් දැනුම ඇති, කාලගුණ විද්‍යාඥයෙකු වෙච්ච ආචාර්ය රංජිත් පුණ්‍යවර්ධන මහත්මයා ගෙන්වා සාකච්ඡාවක් කළා. එතුමාව ගෙන්වා අපි අපේ නිලධාරින් එක්ක සාකච්ඡා කළා, වැවිලි කටයුතු අංශයෙන් අප ඒකට සූදානම් වෙන්නේ කොහොමද කියලා. ඒ වාගේම, ආහාර සුරක්ෂිතතා කමිටුව එක්ක කථා කළා; කෘෂිකර්ම අමාත්‍යාංශය එක්කත් කථා කළා. ඒ හින්දා වෙනදා වාගේ නොවෙයි, කල් ඇතුව සූදානම් වීම් වෙනවා. එතුමන්ලා කියපු කරුණු අනුව මම රටේ ජනතාවටත් පණිවුඩයක් දෙන්න ඕනෑ. මේ එල් නිනෝ තත්ත්වය ගැන විපක්ෂයේ සමහරුන් කියපු විධියේ, සමාජ මාධ්‍යයේ යන විධියේ අනවශ්‍ය බයක් ඇති කර ගන්න ඕනෑ නැහැ. ඒකෙන් කියන්නේ ඒකෙන් බලපෑමක් වෙන්නේ නැහැ කියන එක නොවෙයි. අවම බලපෑමක් වෙන්නේ. කොහොමටත් මේ අවුරුද්දේ ඔක්තෝබර් සහ නොවැම්බර් අතර වර්ෂාව වර්ධනය වෙයි කියලා ජ්‍යෙෂ්ඨ කාලගුණ විද්‍යාඥ මලිත් ප්‍රනාන්දු මහත්මයාත් කියලා තිබුණා මම අද දැක්කා. රංජිත් පුණ්‍යවර්ධන මහත්මයාත් ඊයේ ඒක තහවුරු කළා.

අපි මේ රටේ ජනතාවට මේ කාරණය කියන්න කැමැතියි. මේ රටේ ජනතාව තේරුම් ගන්න ඕනෑ, මේ රටට හිතැති බලවේග මොනවාද, රටට මිතුරු බලවේග මොනවාද, රටට හතුරු බලවේග මොනවාද කියලා. විවිධ හතුරු බලවේග කණ්ඩායම් මේ විධියට කලබල වෙන්න හේතුවක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මේ අවුරුද්දයි මාස 8 තුළ ආණ්ඩුව හැටියට අපි අවුස්සා ගන්න ඕනෑ කණ්ඩායම් ගොඩක් අවුස්සාගෙනයි ඉන්නේ. "හතුරෝ" කියන්නේ මෙවැනි පිරිසක්. වංචාවට, දූෂණයට එරෙහි වන කොට ඇවිස්සෙනවා; පාතාලයට එරෙහි වන කොට ඇවිස්සෙනවා; කුඩු ටික අල්ලන කොට ඇවිස්සෙනවා. අපි එවැනි ගොඩක් කණ්ඩායම් අවුස්සාගෙනයි ඉන්නේ. ඒ ඇවිස්සිච්ච කණ්ඩායම් ඇතුළේ හොඳ මුහුණු පේන කට්ටියත් ඉන්නවා. ඒ කට්ටියගෙන් සමහරු සුදු ඇඳගත්තු දේශපාලඥයන් වෙන්න පුළුවන්; සමහරු නිලධාරින් වෙන්න පුළුවන්, සමහරු අධිකරණයේ කටයුතු කරන කට්ටිය වෙන්න පුළුවන්, ආරක්ෂක අංශයේ අය වෙන්න පුළුවන්, බුද්ධි අංශයේ අය වෙන්න පුළුවන්, පූජ්‍ය පක්ෂයේ අය වෙන්න පුළුවන්. අපි ගොඩක් කණ්ඩායම් අවුස්සාගෙනයි තිබෙන්නේ. ඒ ඇවිස්සිච්ච ඔක්කෝම එකට කල්ලි ගැහිලා ඉන්නේ. ඔවුන් ආණ්ඩුවට ප්‍රහාරයක් එල්ල කරනවා. ඒ නිසා මම මේ රටේ මිතුරු බලවේගවලින් ඉල්ලනවා, මේවා ගැන තේරුම් ගන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර සත්‍යග්‍රහය ගැනත් කියන්න ඕනෑ. අඛණ්ඩව පවත්වනවා කියා ගිහිල්ලා සත්‍යග්‍රහය බණ්ඩනය වුණා. සත්‍යග්‍රහය බණ්ඩනය වුණාද, එහෙම නැත්නම් කන්න වෙනවා කියලා යන්න වුණාද කියලා තමයි මම අහන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කියන්න තිබෙන්නේ මේකයි. කොහොම වුණත්, මේ කරපු වැරැදිවල, වංචා, දූෂණවල පාපය ආපහු මේ රටේ ජනතාව පිට තියන්න බැහැ. අපි බලයට ආවේ ඒවාට අදාළව කටයුතු කරලා සාධාරණය ඉෂ්ට කරනවා කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධම්මපදයේ තිබෙන මේ ගාථාව ඔබතුමාත් හොඳින්ම දන්නවා:

"මනෝ පුබ්බංගමා ධම්මා
මනෝසෙට්ඨා මනෝමයා
මනසා චේ පදුට්ඨේන
භාසති වා කරෝති වා
තතෝ නං දුක්ඛමන්වේති
චක්කං'ව වහතෝ පදං"

වැරැදි සිතකින්; අයහපත් සිතකින්; පාපකාරී සිතකින් යමක් කළොත් විපාකය පස්සෙන් එනවා. ඒ විපාකය පස්සෙන් එන්නේ කොහොමද කියලා දන්නවාද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඔබතුමා ඒක ගැන හොඳටම දන්නවා. කරත්තයේ බැඳපු ගොනාගේ පස්සෙන් කරත්ත රෝදය එනවා නේ. ආං ඒ වාගෙයි විපාකය පස්සෙන් එන්නේ. ඒ හින්දා රාජපක්ෂ පස්සෙන් ගිය කට්ටියට, වික්‍රමසිංහ පස්සෙන් ගිය කට්ටියට අපට කියන්න තිබෙන්නේ, අර ගොනා බැඳි කරත්තයේ රෝදය පස්සෙන් විපාකය එනවා වාගේ නඩු ටික ගානට එනවා කියලායි. ඒක වළක්වන්න බැහැ. එතකොට ඇවිස්සෙනවා; එතකොට කලබල වෙනවා. ආං එහෙම වුණාම මේ වාගේ යෝජනා එන එක වළක්වන්න බැහැ. මේ මොන යෝජනාව ගෙනාවත් අප මේ රටේ ජනතාවට කියනවා, අප මේ රට වෙනුවෙන් කරන්න පුළුවන් උපරිම කැපකිරීම් කරලා ඔබ තමුන්නාන්සේලාට පොරොන්දු වෙච්ච ආකාරයට අපි මේ රට "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන තැනට ගෙන යනවා කියලා. එසේ ගෙන යන කොට අභියෝග එනවා. ඒ අභියෝගවලට සාර්ථක ලෙස මුහුණ දීලා ඔබේ සිතුම් පැතුම් ඉටු කරන්න අප සූදානම් කියන පණිවුඩය ලබා දෙමින් මම නවතිනවා. බෙහෙවින්ම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.55ට, 2026 ජූනි 12වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.55க்கு, பாராளுமன்றம் 2026 யூன் 12, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.55 p.m. until 9.30 a.m. on Friday, 12th June, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.